# ශ්‍රී ලංකා වරාය අධිකාරිය







# වාර්ෂික වාර්තාව 2011

## අපේ දැක්ම

ආසියානු කලාපයේ ප්‍රමුඛ සමුද්‍රික සේවා සැපයුම් මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව අත්පත් කර ගෙන ඇති තත්ත්වය තවදුරටත් ශක්තිමත් කර ගැනීම.

## අපේ මෙහෙය

විශිෂ්ය සේවාවක් හා ලොව පිළිගත් පහසුකම් තුළින් අපගේ ලාභදායිතාවය හා ගණුදෙනුකරුවන් සමුදාය ඉහළ නංවාලීම.

# පටුන


| | |
|---|---|
| අපේ ඉලක්කයන් සහ සාමූහික අරමුණු | 3 |
| වැදගත් මෙහෙයුම් තොරතුරු | 5 |
| වැදගත් මූල්‍යමය තොරතුරු | 8 |
| අපේ අමාත්‍යවරු | 9 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 10 |
| අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් | 13 |
| කළමනාකරණ කණ්ඩායම සහ විගණන කමිටුව | 19 |
| ව්‍යාපාර සංවර්ධනය | 21 |
| පොදු පරිපාලනය | 22 |
| මෙහෙයුම් සමාලෝචනය | 26 |
| මූල්‍ය සමාලෝචනය | 77 |
| සංස්ථාපිත සමාජ වගකීම් | 81 |
| මානව ප්‍රාග්ධනය | 82 |
| සංයුක්ත පාලන වාර්තාව | 85 |
| වරාය සංඛ්‍යාලේඛණ | 90 |
| වැදගත් සංධිස්ථාන | 94 |
| මූල්‍ය ප්‍රකාශ සටහන් | 98 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 99 |
| මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම | 102 |
| විගණන කමිටු වාර්තාව | 103 |
| ව්‍යවස්ථාපිත අනුකූලතා ප්‍රකාශය | 104 |
| මෙහෙයුම් හා මූල්‍ය වැදගත් කරුණු | 105 |
| ශේෂ පත්‍රය | 109 |
| ආදායම් ප්‍රකාශය | 110 |
| ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 111 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 112 |
| පොදු ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති | 113 |
| මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන් | 121 |
| දසවස් සාරාංශය | 146 |
| අත්කරගත් ප්‍රතිඵල සැකෙවින් | 148 |
| ගිණුම් සඳහා වූ පාරිභාෂිත වචන | 149 |
| විගණකාධිපති වාර්තාව | 151 |
| විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 163 |
| සංස්ථාපිත තොරතුරු | 179 |

**අපේ ඉලක්කයන්**

* ශ්‍රී ලංකාව සමුද්‍රික කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථාපනය කිරිම.
* බහළු මෙහෙයුම් සහ දකුණු ආසියා කලාපයේ සේවා සැපයුම් සඳහා ජාත්‍යන්තර මහා පරිමාන කේන්ද්‍රීය වරායක් ලෙස කොළඹ වරායේ පිහිටීම තහවුරු කිරිම.
* වාණිජ වරාය සේවාවන් සළසන අතරතුර වඩා ප්‍රියජනක මගී යාත්‍රා ගමනාන්තයක් ලෙස ගාල්ල වරාය සඳහා සැළසුම් සකස්කිරිම.
* නාවික කර්මාන්තය සඳහා පූර්ණ සේවාවක් සළසන අතරතුර මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ජාත්‍යන්තර නිදහස් කළාප/වරාය සහ සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් ලෙස පුළුල් කර වැඩි දියුණු කිරීම.
* විවේක කාලය ගතකිරීම සඳහා උසස් තත්ත්වයේ පහසුකම් සහ කර්මාන්ත වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාප්ත කරන ලද පහසුකම් සමඟින් ත්‍රිකුණාමලය වරාය හරිත වරායක් ලෙස වැඩිදියුණු කිරිම.
* කලාපීය සංවර්ධන ක්‍රියාදාමය සඳහා පිවිසුම් මාර්ග ලෙස ඔලුවිල්, පේදුරුතුඩුව සහ කන්කසන්තුරේ කලාපීය වරායයන් සංවර්ධනය කිරිම.

**සාමූහික අරමුණු**

* ශ්‍රී ලංකාවේ වාණිජ වරායන් වඩාත් නවතම උපකරණ මඟින් මෙහෙයුම් පහසුකම් වර්ධනය කිරිම හා අඛණ්ඩව පවත්වා ගෙනයාම.
* ඵළදායී සහ කාර්යක්ෂම අයුරින් වරාය සේවාවන් පවත්වා ගෙනයාම.
* පිරිවැය ඵළදායී කාර්යක්ෂම සහ විශ්වාසදායි සේවාවක් සැලසීම තුළින් ආනයන සහ අපනයනකරුවන්ට තරඟකාරිමය වශයෙන් වඩා වාසිදායක තත්ත්වයක් උදාකරදීම.
* නැව්, නැව්බඩු, වරාය සේවාලාභීන් සහ වරාය යටිතල පහසුකම්වල ආරක්ෂාව හා සුරක්ෂිතභාවය සහතික කිරීම.
* වරාය ව්‍යාපාරික කටයුතු හා සම්බන්ධ සැමට හිතකාමී කාර්යය සහ සේවා පරිසරයක් සැලසීම.
* රජයේ ජංගම හා ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට දායකවීම.
* කඩිනමින් නැව්වල වැඩ නිමකිරීම තුළින් උසස් මට්ටමේ ඵළදායීතාවයක් පවත්වා ගෙන යාම.
* වැඩි රැකියා අවස්ථාවන් උත්පාදනය කිරීම සඳහා සමුද්‍රික කටයුතු හා සම්බන්ධ ආනුෂාංගික සේවාවන් වැඩි දියුණු කිරීම.
* වරාය සේවාලාභීන් සඳහා උසස් මට්ටමේ සේවාවන් සළසමින් වාණිජ වරායන් තුළ ලාභදායි මෙහෙයුම් ක්‍රියාදාමයක් පවත්වා ගෙන යාම තුළින් විශ්වාසදායී කාර්යක්ෂම මෙහෙයුම්කරුවෙකු ලෙස කීර්තිය වර්ධනය කර ගැනීම.
* අන්තරාල වෙළඳාම් හා බෑඳුම්කර කටයුතු ඇතුළත්ව ප්‍රති නැව්ගත කිරීමේ අවස්ථාවන් තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා බහළු මෙහෙයුම් සම්බන්ධයෙන් තරඟකාරී හා උසස් මට්ටමේ සේවාවන් සැලසිම.

- සමුද්‍රාසන්න ප්‍රදේශ සංවර්ධනයේ ගාමක බලය ලෙස ක්‍රියාත්මක වීම පිණිස අවශ්‍ය කරන වරාය පහසුකම් සැලසීම තුළින් ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය උදෙසා දායකවීම.

- මිනිස් බල අවශ්‍යතාවයන් තක්සේරු කිරීම සහ පිරිස් බල අවශ්‍යතා ප්‍රතිශෝධනය ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලන හා සංවිධානමය කාර්යයන් වැඩි දියුණු කිරීම. විදේශ රැකියා මඟින් රටේ ආර්ථිකයට සැළසෙන වාසීන් සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය වැටුප් රහිත නිවාඩු මත විදේශ රැකියා සඳහා යාමේ පිළිවෙත තව තවත් දිරි ගැන්වෙනු ඇත. මෙම යෝජනා ක්‍රමය තුළින් පැන නගින පුහුණු සේවක අවශ්‍යතාවයන් සැලසීම සඳහා මහපොළ අභ්‍යාස ආයතනය වැඩිදුර පුහුණු කිරීම් සහ නැවත පුහුණු කිරීම් කරනු ලැබේ.

- දියබෙදී සිදු කරනු ලබන සේවාවන්, යාත්‍රාවලට තෙල් සැපයීමේ කටයුතු, පිරිසිදු ජල සැපයුම් හා බහළු අළුත්වැඩියාවන් වැනි වරාය විෂය ක්ෂේත්‍රයට අදාළ සේවාවන් සැපයීම තුළින් විවිධාංගීකරණය කිරීම.

- ඉහළ බඳු කාර්යක්ෂමතාවය, වඩා යහපත් ආයතනික ආයෝජන කළමනාකරණය හා වඩා දැඩි පිරිවැය පාලනයෙන් යුතු කළමණාකාරීත්වය මත පදනම් වූ මූල්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම.

**නෞකා පැමිණීම (සියළුම වරායයන්)**

| විස්තරය | 2010 | 2011 | වෙනස (%) |
|---|---|---|---|
| කොළඹ වරාය | 3,910 | 4,124 | 5.5 |
| ත්‍රිකුණාමලය වරාය | 109 | 126 | 15.6 |
| ගාල්ල වරාය | 48 | 73 | 52.1 |
| කන්කසන්තුරය, මයිලිඩ්ඩි, පේදුරුතුඩුව, කරෙයිනගර් | 8 | 26 | 225.0 |
| මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය හම්බන්තොට | 0 | 9 | - |
| එකතුව | 4,075 | 4,358 | 6.9 |

**කොළඹ වරාය නැව් බඩු මෙහෙයුම් ප්‍රමාණය**

| විස්තරය | 2010 | 2011 | වෙනස (%) |
|---|---|---|---|
| සමස්ථ නැව් බඩු ප්‍රමාණය මෙ.ටො.මිලියන | 61.3 | 65.1 | 6.2 |

**කොළඹ වරාය බහළු මෙහෙයුම් (විස්සේ සම ඒකක)**

| විස්තරය | 2010 | 2011 | වෙනස (%) |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශ්‍රීලවඅ)** | | | |
| ආනයන | 278,893 | 323,712 | 16.1 |
| අපනයන | 284,456 | 323,770 | 13.8 |
| ප්‍රති නැව්ගත කිරිම් | 1,533,845 | 1,583,195 | 3.2 |
| නැවත අඩුක්කු කිරීම | 69,979 | 68,769 | -1.7 |
| **එකතුව** | **2,167,173** | **2,299,446** | **6.1** |
| **එස් ඒ ජී ටී (SAGT)** | | | |
| ආනයන | 182,755 | 200,078 | 9.5 |
| අපනයන | 186,140 | 199,326 | 7.1 |
| ප්‍රති නැව්ගත කිරිම් | 1,561,744 | 1,540,633 | -1.4 |
| නැවත අඩුක්කු කිරීම | 39,629 | 23,404 | -40.9 |
| **එකතුව** | **1,970,268** | **1,963,441** | **-0.3** |
| **කොළඹ වරාය** | | | |
| ආනයන | 461,648 | 523,790 | 13.5 |
| අපනයන | 470,596 | 523,096 | 11.2 |
| ප්‍රති නැව්ගත කිරිම් | 3,095,589 | 3,123,828 | 0.9 |
| නැවත අඩුක්කු කිරීම | 109,608 | 92,173 | -15.9 |
| **එකතුව** | **4,137,441** | **4,262,887** | **3.0** |

කොළඹ වරාය නැව් බඩු ගොඩබෑම් - (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

| විස්තරය | 2010 | 2011 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 14,106 | 15,317 | 8.6 |
| තොග කඩන | 605 | 692 | 14.4 |
| වියළි තොග | 2,551 | 2,618 | 2.6 |
| දියර තොග | 4,130 | 4,499 | 8.9 |
| එකතුව | **21,392** | **23,126** | **8.1** |

කොළඹ වරාය නැව් බඩු පැටවුම් - (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

| විස්තරය | 2010 | 2011 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 12,328 | 12,795 | 3.8 |
| තොග කඩන | 22 | 30 | 36.4 |
| වියළි තොග | 4 | 2 | -50.0 |
| දියර තොග | 28 | 66 | 132.1 |
| එකතුව | **12,382** | **12,893** | **4.1** |

කොළඹ වරායෙන් මෙහෙය වූ සමස්ථ නැව් බඩු ප්‍රමාණය - (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

| විස්තරය | 2010 | 2011 | වෙනස (%) |
|---|---|---|---|
| බහළුගත | 26,434 | 28,112 | 6.3 |
| තොග කඩන | 627 | 722 | 15.2 |
| වියළි තොග | 2,555 | 2,620 | 2.5 |
| දියර තොග | 4,158 | 4,565 | 9.8 |
| එකතුව | **33,774** | **36,019** | **6.6** |

ත්‍රිකුණාමලය වරායෙන් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

| විස්තරය | 2010 | 2011 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 1,960 | 2,337 | 19.2 |
| පැටවීම් | 194 | 237 | 22.2 |
| එකතුව | **2,154** | **2,574** | **19.5** |

ගාල්ල වරායෙන් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

| විස්තරය | 2010 | 2011 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 317 | 464 | 46.1 |
| පැටවීම් | 1 | 0 | -100.0 |
| එකතුව | **318** | **464** | **45.9** |

කන්කසන්තුරෙයි, මයිලිඩ්ඩි, පේදුරුතුඩුව හා කරෙයිනගර් වරායයන්හි මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

| විස්තරය | 2010 | 2011 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | 11 | 28 | 154.5 |
| පැටවීම් | 0 | 0 | 0.0 |
| එකතුව | **11** | **28** | **154.5** |

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායෙන් මෙහෙය වූ නැව් බඩු ප්‍රමාණය - (ටොන් දහසේ ප්‍රමාණයෙන්)

| විස්තරය | 2010 | 2011 | වෙනස (%) |
|---|---|---|---|
| ගොඩබෑම් | - | 5 | - |
| පැටවීම් | - | 10 | - |
| **එකතුව** | **-** | **15** | **-** |

සමස්ථ සේවක සංඛ්‍යාව

| විස්තරය | 2010 | 2011 |
|---|---|---|
| කොළඹ වරාය | 11,726 | 10,083 |
| ත්‍රිකුණාමලය වරාය | 598 | 466 |
| ගාල්ල වරාය | 500 | 433 |
| **එකතුව** | **12,824** | **10,982** |

**සියළුම වරායයන් (රුපියල් මිලියන)**

| විස්තරය | 2010 | 2011 | වෙනස (%) |
|---|---|---|---|
| **ආදායම හා වියදම** | | | |
| සමස්ථ ආදායම | 28,279.3 | 31,250.5 | 10.5 |
| සමස්ථ වියදම | (23,892.4) | (22,958.6) | 3.9 |
| **මෙහෙයුම් ලාභය** | **4,386.9** | **8,291.8** | **89.0** |
| විදේශ ණය මත පොලී | (1,225.2) | (1,371.8) | (12.0) |
| විදේශ විනිමය (පාඩු)/ලැබීම් | (4,409.8) | (3,543.2) | 19.7 |
| ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනාවේ වියදම් | - | (2,594.6) | (100.0) |
| **බදුවලට පෙර සහ විදේශ විනිමය ලැබීමෙන් පසු (පාඩු)/ ලාභ** | **(1,248.1)** | **782.2** | **162.7** |
| **බදු** | | | |
| ආදායම් බදු | (156.9) | (24.0) | 84.7 |
| සැළකි ලාභාංශ බද්ද | - | (175.6) | (100.0) |
| විලම්භිත බදු | 342.9 | - | 100.0 |
| සමාජ වගකීම් බදු | (2.4) | - | 100.0 |
| | | | |
| **බදු ප්‍රතිපාදන සැලසීමෙන් පසු ශුද්ධ ලාභය/පාඩුව** | **(1,064.5)** | **582.6** | **154.7** |
| **ශේෂ පත්‍රය** | | | |
| ජංගම නොවන වත්කම් | 185,834.0 | 208,962.5 | 12.4 |
| ජංගම වත්කම් | 17,784.2 | 13,563.3 | (23.7) |
| ජංගම වගකීම් | 13,328.6 | 14,720.7 | (10.4) |
| ස්කන්ධගත සහ අනෙකුත් ප්‍රාග්ධන | 7,591.4 | 7,591.4 | (0.0) |
| වෙන්කිරීම් හා ප්‍රතිපාදන | 78,795.1 | 79,325.7 | (0.7) |
| ජංගම නොවන බැරකම් | 103,903.1 | 120,888.0 | (16.3) |
| **අනුපාත** | | | |
| ආදායමට මෙහෙයුම් මඟින් ලාභ | 15.5 | 26.5 | |
| වාර්ෂික ආදායමේ වර්ධනය | 21.2 | 10.5 | |
| ප්‍රාග්ධන යෙදවුම් මත ලාභය | 2.3 | 4.0 | |

**අතිගරු මහින්ද රාජපක්ෂ**
**ශ්‍රී ලංකා ජනාධිපති**
**සහ වරාය හා මහාමාර්ග අමාත්‍ය**

**ගරු රෝහිත අබේගුණවර්ධන**
**වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍ය**

**ගරු නිර්මල කොතලාවල**
**වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍ය**

2011 වසර පිළිබඳව මාගේ සිතුවිලි ඔබ සමඟ බෙදා හදා ගැනීම සඳහා මෙම පණිවුඩය නිකුත් කිරීම පිළිබඳව මම සතුටුවෙමි. තවද, ඵලදායීතාවය, වත්කම් වර්ධනය, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මානව සම්පත් සංවර්ධනය, පවත්නා යටිතල පහසුකම් සඳහා නව ජීවයක් ලබාදීම, නාස්තිය අවම කිරීම සහ මූල්‍ය පරිපාලනය යන කරුණු සම්බන්ධයෙන් 2011 වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය තවත් වැදගත් වර්ෂයක් සනිටුහන් කරන බව නිරීක්ෂණය කළෙමි. සත්‍ය වශයෙන්ම වරාය යටිතල සංවර්ධනය, බහළු මෙහෙයුම් උපකරණ සංචිතය ව්‍යාප්ත කිරීම, ගණුදෙනුකරුවන් වෙනුවෙන් කරන සේවයේ තත්ත්වය දියුණු කිරීම වැනි කරුණු පිළිබඳව වැදගත් සංධිස්ථාන සාර්ථක ලෙස සාක්ෂාත් කර ගැනීමට අපට හැකිවිය. කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය, මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය, ඔලුවිල් සහ කන්කසන්තුරය වරායයන් පිළිබඳව ප්‍රධාන වශයෙන් අපගේ අවධානය යොමු වූ නමුදු, අපගේ සියලු ගණුදෙනුකරුවන් සැහීමට පත්වන අන්දමින් සියලු වරායවල ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය නඟාසිටුවීම්ලා සේවාවන් වැඩි දියුණු කිරීම වෙනුවෙන් වැදගත් ක්‍රියාමාර්ග කිහිපයකට මුලපුරන ලදී. ඉදිරි වසරවලදී නැව් භාණ්ඩ හා බහළු පරිමාව මේ අන්දමින් වර්ධනය කිරීමටත්, වරාය සහ සේවා සැපයුම් ලබා දෙමින් වැඩි ආදායමක් උත්පාදනය කිරීම උදෙසාත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය තවදුරටත් උද්යෝගීමත්ව කටයුතු කිරීම පිළිබඳව මා දරණුයේ සර්ව ශුභවාදී මතයකි.

## කාර්ය සාධනය

2008 දී හඳුන්වා දෙන ලද තුන් අවුරුදු සංවර්ධන සැලැස්ම අප විසින් සාර්ථක අන්දමින් ඉදිරියට ගෙන යන ලද අතර, මෙම සැලැස්ම තුළින් උපයා ගන්නා ලද යහපත් ප්‍රතිඵල අපගේ හවුල්කරුවන් විසින් භුක්ති විඳිනු ලබයි. පසුගිය වසර කිහිපය තුළ කළාපයේ සිදු වූ සමුද්‍රික ප්‍රවාහනයේ වෙනස්කම් සහ සංවර්ධන කටයුතු කරන කොට ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියට අභියෝග කිහිපයකට මුහුණදීමට සිදුවිය. බටහිර රටවලට බලපෑ තරමට ලෝක ආර්ථික අර්බුදයේ ප්‍රතිඵල අපට නොදැනුනත් එහි යම් යම් බලපෑම් මෙරටට ද දැනිණ. තුන් අවුරුදු සංවර්ධන සැලැස්ම මගින් හඳුන්වා දෙන ලද ඇතැම් ක්‍රියාමාර්ග හේතු කොටගෙන මෙම තත්ත්වයෙන් සිදුවිය හැකිව තිබූ අයහපත් ප්‍රතිඵල වලකාලීමට හැකි වූ බව මම සතුටින් වාර්තා කරමි. තුන් අවුරුදු සංවර්ධන සැලැස්ම සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ශ්‍රම බලකාය සහ ගණුදෙනුකරුවන් තුළ තිබූ අවබෝධය සහ කැපවීම පිළිබඳව ස්තූතිවන්ත වන අතර 2012 සිට 2017 දක්වා පස් අවුරුදු සැලැස්ම යහපාලනය සඳහා වූ දෙවන පියවර වශයෙන් මාගේ සභාපතිත්වය යටතේ 2011 දෙසැම්බර් මාසයේදී දියත් කිරීමට හැකිවීම පිළිබඳව මම සතුටු වෙමි.

අපගේ පරිපාලන කාර්යක්ෂමතාවය සහ මෙහෙයුම් හැකියාවන් තුළින් ඔවුන්ගේ විශ්වාසය දිනාගත් බව අපගේ ගණුදෙනුකරුවන්ට පෙන්වා දී ඇත. 2011 වසර තුළදී ජය බහළු පර්යන්තය විසින් ආකර්ෂණය කර ගනු ලැබූ ප්‍රධාන නෞකා සේවාවන් 5 ක් සහ එක් පෝෂක සේවාවක් මෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අත්සන් කරන ලද පර්යන්ත සේවා ගිවිසුම් 5 ක් මඟින් මේ බව සනාථ වනු ඇත.

මීට අමතරව නවීනතම ග්‍රැන්ට් දොඹකර 6 ක්ද, භූවමාරු දොඹකර 30 ක්ද, පර්යන්ත ට්‍රැක්ටර් 50 ක්ද, පර්යන්ත ට්‍රේලර් 30 ක්ද එකතු කිරීමෙන් බහළු මෙහෙයුම් උපකරණ සංචිතය වඩාත් ශක්තිමත් කරන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කළමනාකරණය සහ මෙහෙයුම් කරනු ලබන බහළු පර්යන්ත සහ බහළු ගබඩා කරන මධ්‍යස්ථානවල කාර්යක්ෂමතාවය සහ සේවා ඵලදායීතාවය තවදුරටත් වර්ධනය කිරීමට මෙයින් ලැබුණු පිටුවහල ඉමහත්ය.

දේශීය හා ප්‍රතිඅපනයන පරිමාව අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහළු පර්යන්ත මෙහෙයුම් කරන ලද බහළු ධාරිතාවේ වර්ධනයක් පෙන්නුම් කරයි. 2011 වසරේදී දේශීය බහළු පරිමාව විස්සේ සම ඒකක 647,482 ක් වූ අතර, 2010 වර්ෂයේදී එම සංඛ්‍යාව විස්සේ සම ඒකක 563,349 ක් විය. මෙය 14.9% ක වර්ධනයකි. එමෙන්ම 2011 වසරේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහළු පර්යන්තය විසින් මෙහෙයුම් කරන ලද ප්‍රතිඅපනයන බහළු සංඛ්‍යාව විස්සේ සම ඒකක 1,583,195 ක් වූ අතර, 2010 වසරේදී මෙය විස්සේ සම ඒකක 1,533,845 ක් විය. මේ අනුව එය 3.2% ක වැඩිවීමක් පිළිබිඹු කරයි. 2010 වසරේදී මෙහෙය වන ලද සම්පූර්ණ බහළු සංඛ්‍යාව වන විස්සේ

සම ඒකක 2,167,173 ක් වූ අතර මෙය 2011 වසර තුළ මෙහෙයවන ලද විස්සේ සම ඒකක 2,299,446 හා සැසඳීමේදී 6.1% ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉතිහාසයේ වාර්තාගත ඉහළම සංඛ්‍යාව වේ. 2011 වසරේදි කොළඹ වරාය විසින් මෙහෙයුම් කරන ලද සමස්ථ බහළු පරිමාව වන විස්සේ සම ඒකක 4,262,887 කින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙළඳපොල කොටස 53.9% ක් වූ අතර සවුත් ඒෂියාගේට්වේ පර්යන්තය (SAGT) විසින් මෙහෙයුම් කරන ලද වෙළඳ පොළ කොටස් 46.1% ක ප්‍රමාණයක් පමණි.

## මූල්‍යය

මූල්‍ය ස්ථායීතාවය සලකා බැලීමේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය ශ්‍රී ලංකාවේ වඩාත් ස්ථාවර රාජ්‍ය ව්‍යවසායක් වේ. මෙම ආයතනය කාර්යක්ෂමතාවයෙන්ද, ලාභදායකත්වයෙන්ද, සම්පත් නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීමෙන්ද, වරාය සේවා සැපයීම සඳහා වගකිවයුතු වේ. ගණුදෙනුකරුවන්ගේ පහසුව සහ උසස් සේවා තත්ත්වයක් පවත්වා ගෙන යාමේදී විධික්‍රම දියුණු කිරීමේ පරික්ෂාව තුළින් සහ ඵලදායක ලෙස ක්‍රියාත්මක කිරීමෙන් අනුපූරණය කරන ලද ශක්තිමත් මූල්‍ය කළමනාකරණයක් ඇති කිරීම තුළින් මේ තත්ත්වය වඩාත් පහසු කොට ඇත. 2010 වසර තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් උපයන ලද ආදායම වන රුපියල් බිලියන 28 සමඟ සැසඳීමේදී 2011 වසර තුළදී අධිකාරිය විසින් උපයන ලද ආදායම රුපියල් බිලියන 31 වේ. මෙය 10.41% ක වර්ධනයකි.

වර්ධනය වන ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලනු වස් ශ්‍රී ලංකා වරාය අධිකාරිය කොළඹ දකුණු පර්යන්තය, හම්බන්තොට හා ඔළුවිල් වැනි දීර්ඝකාලීන වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදල් ආයෝජනය කර ඇත.

## සංවර්ධන ව්‍යාපෘති

මුහුදු වරාය සංවර්ධනය කිරීමේ, වර්ධනය කිරීමේ සහ නූතන විධික්‍රම වඩාත් සංවිධිත ලෙස භාවිතා කිරීමෙන් වරාය සංවර්ධනය කිරීමේ වැදගත්කම මෙරට සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා අත්‍යාවශ්‍ය පූර්ව අවශ්‍යතාවයක් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හඳුනා ගෙන ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ ඉදිකිරීම් කටයුතුවල පළමු අදියර සඳහා ඇ.ඩො.මිලියන 800 ක පමණ පිරිවැයක් දරමින් ඉදිරියට ගොස් ඇත. 2011 වර්ෂය තුළදී පෙට්‍රෝලියම් නිෂ්පාදන සමස්ථ ධාරිතාවය මෙ.ටො. 80,000 ට අධික ධාරිතාවයකින් යුත් ටැංකි 14 කින් සමන්විත තෙල් ටැංකි සංකීර්ණයක් සහ සම්පූර්ණ නැව් තෙල් ගොඩබෑමේ පහසුකම් ඉදිකිරීම නිමකර ඇත. එමෙන්ම එම වසර තුළදී කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ දියකඩනයන් ඉදිකිරීමේ කාර්යයේ විශාල ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. 2011 වසරේදී කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ පළමු පර්යන්තය ඉදිකිරීමේ කාර්යය කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්තය (CICT) නමැති ආයතනය වෙත ප්‍රදානය කර ඇත. මෙම ආයතනය සී/ස චයිනා මර්චන්ට් හෝල්ඩින්ග්ස් ජාත්‍යන්තර සමාගම , එයිට්කෙන් ස්පෙන්ස් සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යන ආයතනවලින් සමන්විත වන අතර පිළිවෙළින් 55%, 30% සහ 15% ක් වශයෙන් කොටස් හිමිකම් දරා ඇත. තවද සමාලෝචිත වර්ෂය තුළදී ගාලු වරාය, ත්‍රිකුණාමලය සහ ඔළුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතිය ද පවත්වා ගෙන යන ලදී.

## මානව සම්පත් සංවර්ධනය

කණ්ඩායමක් වශයෙන් කාර්යක්ෂම සහ ඵලදායී සේවක කාර්යය සාධනය සහතික කරනු වස් මානව සම්පත් සංවර්ධනය අප විසින් තවදුරටත් පවත්වා ගෙන ගොස් ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා දැනට වරාය තුළ විසිරී පවත්නා පාරිභෝගික සේවා මධ්‍යගත කිරීම වෙනුවෙන් කටයුතු කර ඇත. 2011 වසර තුළදී ශ්‍රම බලකාය සමබර කිරීමේ පළමු අදියර සාර්ථක ලෙස නිමකර ඇත. මෙය වාසිදායක ප්‍රතිඵල සහිත ක්‍රියාත්මක වන ක්‍රියාවලියක කොටසක් වේ.

නව තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගැනීම, සංනිවේදන නිපුණතා වර්ධනය කිරීම සහ තම සේවා තත්ත්වයන් වැඩි දියුණු කිරීම උදෙසා ආකල්පමය වෙනස්කම් ඇති කිරීම අරමුණු කර ගෙන සේවක සංවර්ධනය උදෙසා පුළුල් අවස්ථාවන් සලස්වා දී ඇත.

අනෙකුත් දේවල් අතර අපේක්ෂිත හෝ අවශ්‍ය කාර්යයා සාධන මට්ටම් ළඟාකර ගැනීම සඳහා මෙන්ම සේවක සුභසාධනය වැඩි දියුණු කිරීමෙහිලා තෝරාගත් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රම වැනි උචිත ක්‍රමෝපායන් සේවක කොටස්වලට හඳුනා ගත හැකි වන පරිදි සියලුම ක්‍රියාකාරී කොටස්වල සේවක කමිටු පිහිටුවා ඇත.

## අවසානය

අවසාන වශයෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ලාටත්, අමාත්‍යාංශයේ ලේකම් හා කාර්යය මණ්ඩලයටත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමණාකාරීත්වයටත් ඔවුන්ගේ වටිනා උපදෙස් වෙනුවෙන් මාගේ ස්තුතිය පුදකරමි. තවද, 2011 වසර තුළදී වරාය අධිකාරියේ අවශ්‍ය කාර්යයා සාධන මට්ටම් ළඟාකර ගැනීමෙහිලා ගණුදෙනුකරුවන්, සේවකයන් සහ විශේෂයෙන් වෘත්තීය සමිතිවලින් ලබා දෙන ලද නොමසුරු සහයෝගය සහ උපකාරය උදෙසා ද මාගේ ස්තුතිය හිමිවේ.



**ආචාර්ය ප්‍රියත් බී වික්‍රම**
**සභාපති**

**ආචාර්ය ප්‍රියත් බී වික්‍රම**
**සභාපති**

**පීඑච්ඩී (එ.රා.), පශ්චාත් උපාධි (ඩිප්ලෝමා)**
**බීඑස්සී ඉංජිනේරු (ගෞරව),**
**වරලත් ඉංජිනේරු එම්අයිඊ (ශ්‍රී ලංකා)**

ආචාර්ය ප්‍රියත් බී වික්‍රම මහතා 2008 වර්ෂයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි. 1979 දී පාර්ලිමේන්තු පනතක් මඟින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ස්ථාපනය කරනු ලැබුයේ අනෙකුත් කරුණු අතර ශ්‍රී ලංකාවේ මුහුදු වරායයන් තුළ සංවර්ධනය, නඩත්තුව, මෙහෙයුම් කිරීම සහ වරායන් සහ වෙනත් සේවාවන් සැපයීම අරමුණු ඇතිවය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා වශයෙන් ආයතනයේ ව්‍යාපාරික කටයුතු සහ වරාය කළමනාකරණය පිළිබඳව ඔහු වගකිවයුතු වේ. එමෙන්ම ප්‍රධාන සමුද්‍රික ජාතියක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නඟා සිටුවීම පහසු කිරීමෙහිලා මෙම ආයතනයේ සෑම අංශයක්ම ස්වයංපෝෂිත ව්‍යවසායක් ලෙස පවත්වා ගෙන යාම ඔහු විසින් සහතික කරනු ලැබේ.

ආචාර්ය වික්‍රම මහතා ශ්‍රී ලංකාවේ මොරටුව විශ්ව විද්‍යාලයෙන් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ලැබීය. එක්සත් රාජධානියේ ජාත්‍යන්තර ඇමරිකා විශ්ව විද්‍යාලය මඟින් මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධිය ඔහු වෙත ප්‍රදානය කරනු ලැබීය.

ආචාර්ය වික්‍රම මහතා 2001 වර්ෂයේදි යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට සම්බන්ධ විය. 2004 වසරේදී විධායක අධ්‍යක්ෂ (තාක්ෂණික සහ මානව සම්පත් සංවර්ධන) ධුරයට ඔහු පත් කරනු ලැබීය. එම තනතුරේ වසර 1 1/2 ක සේවා කාලයකින් ඇනතුරුව 2005 වර්ෂයේදී ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උපසභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබීය. වර්ෂ 2008 නොවැම්බර් මසදී ආචාර්ය වික්‍රම මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ධුරය භාර ගන්නා ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා වශයෙන් මෙරට මහා පරිමාණ වරාය සංවර්ධන ව්‍යාපෘති දෙකක් ඉදිකිරීමට මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබයි. පළමු වැන්න හරිත ක්ෂේත්‍ර වරාය ලෙස දකුණු ප්‍රදේශයේ මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ මෙහෙයුම් කටයුතු 2010 නොවැම්බර් 18 දින සිදු කෙරිණ. දෙවැන්න කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියයි. බහළු විස්සේ සම ඒකක මිලියන 2.4 දක්වා තවදුරටත් බහළු මෙහෙයුම් ධාරිතාවය වැඩිකරනු වස් වරාය ව්‍යාපෘතියේ පළමු අදියර 2014 මුල් භාගය වන විට සම්පූර්ණ කරනු ඇත. බහළු අංගනයක් ලෙස යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා භාවිතා කරන ලද නැගෙනහිර බහළු පර්යන්තයේ ඉඩකඩ ප්‍රමාණය තුළ මීටර් 450 ක් දිගැති මීටර් 18 ක් ගැඹුරැති නැංගුරම්පලක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉදිකරනු ලැබේ. මෙම වැඩ කටයුතු 2013 වසරේදී නිම කිරීමට නියමිතය.

2002 වසරේදී සංස්ථාගත කරන ලද මුළුමනින්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සීමිත සමාගමක් වන ජය බහළු පර්යන්ත සමාගමේ සභාපතිවරයා ලෙස ද ඔහු කටයුතු කරයි.

තවද, ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන සේවා සපයන්නා වන සී/ස ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා සමාගමේද සභාපතිවරයා ලෙස කටයුතු කරයි. මීට අමතරව සි/ස ජාතික කඩදාසි සමාගමේ සහ ශ්‍රී ලංකා නාගරික සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන කිහිපයකම ඔහු අධ්‍යක්ෂ තනතුර දරයි. තවද, සී/ස කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්ත සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද ඔහු කටයුතු කරයි.

ඔහු ජාත්‍යන්තර වරාය හා තොටුපල සංවිධානයේ වරාය සැළසුම් හා සංවර්ධන කමිටුවේ සාමාජිකයෙකු ද වේ. ආර්ථික දියුණුව සම්බන්ධව සෑම ක්ෂේත්‍රයක් තුළම ඔහු තුළ ඇති කාර්ය සාධන නිපුණත්වය පිළිගනිමින් 2010 වසරේදී හොංකොන් ඇන්ඩ් ෂැංහයි බැංකු ආයතනය මඟින්

ඔහු ශ්‍රී ලංකාවේ වඩාත්ම උසස් තරුණයා ලෙස තෝරා ගන්නා ලදී. 2011 වර්ෂයේදී ජාත්‍යන්තර සිංහ සමාජය විසින් ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සහ නඟා සිටුවීම උදෙසා ඔහුගේ දායකත්වය පිළිගන්නා ලදී. 2011 වසරේදී මැද පෙරදිග සහ ඉන්දියානු උප මහද්වීප කලාපයේ සමුද්‍රික වෙළඳාම පිළිබඳ හොඳම තරුණයා ලෙස ජයග්‍රහණය කළේය.

## ඉන්දික කරුණාජීව මහතා
## උප සභාපති

**සොලිසිටර් (එ.රා.), එල්එල්එම් (වර්වික්)**
**නීතිඥ**

කරුණාජීව මහතා 2010 ජූනි මසදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපතිවරයා වශයෙන් පත්කරනු ලැබීය. තවද, ඒ මහතා ශ්‍රී ලංකාවේ ගරු ජනාධිපතිතුමන්ගේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා වශයෙන් ද කටයුතු කරනු ලබයි.

කරුණාජීව මහතා කොළඹ රාජකීය විද්‍යාලයේදී මූලික අධ්‍යාපනය හදාරන ලදී. ඒ මහතා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේදී සිය නීති අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කළ අතර 2000 වර්ෂයේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් සිය වැඩ කටයුතු ආරම්භ කළේය.

කරුණාජීව මහතා පොදු අන්තර්ජාතික නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය එක්සත් රාජධානියේ වර්වික් (Warwick) විශ්ව විද්‍යාලයේදී හදාරන ලද අතර 2003 වර්ෂයේදී ගෞරව සහිතව උපාධිධාරියෙකු විය. විශේෂයෙන් ඔහු අපරාධ හා බුද්ධිමය දේපළ නීතිය සම්බන්ධව අධිකරණයන්හි දී නඩු කටයුතු ප්‍රගුණ කළේය.

ඒ මහතා එංගලන්තයේ සහ වේල්සයේ සොලිසිටර්වරයෙකුද වන්නේය.

2006 ජූලි මාසයේ සිට 2010 මැයි මාසය දක්වා ඒ මහතා එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ අමාත්‍ය උපදේශකවරයා වශයෙන් පත්කරනු ලැබීය.

## කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතා
## කළමණාකාර අධ්‍යක්ෂ

**මාස්ටර් මැරිනර්**
**(එම්බීඒ, එම්එන්අයි, එම්සීඅයිඑල්ටී)**

කැප්පෙටිපොළ මහතා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ආදී සිසුවෙකි.

කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතා කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් ශ්‍රී ලංකා නැව් සංස්ථාවට සම්බන්ධ වී බහළු නෞකා, සාමාන්‍ය නැව් බඩු නෞකා, තොග නැව් බඩු නෞකා, තෙල් සහ ගෑස් ටැන්කර් නෞකාවල යාත්‍රා කළේය.

1985 වසරේදී ඔහු ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න්හි සමුද්‍රීය විද්‍යාව සහ නාවුක යාත්‍රා පැදවීම පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගන්නා ලදී. Chepstow and Shipping (එක්සත් රාජධානිය), VShips (මොන්ටිකාලෝ) Ahrenkiel (ජර්මනිය), Pan Ocean (කොරියාව) වැනි ප්‍රධාන නැව් සමාගම් රාශියක සහ ශ්‍රී ලංකා නැව් සංස්ථාවේ කපිතාන්වරයෙකු ලෙස වසර ගණනාවක් නැව් ගමනාගමනයේ නිරතවීමෙන් අනතුරුව 1990 වසරේදී වරාය නියමුවරයෙකු ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියට එක්විය.

නියමුවරයෙකු ලෙස කොළඹ, ත්‍රිකුණාමලය, ගාල්ල යන සියලු වරායයන්හි සේවය කිරීමෙන් අනතුරුව ඒ මහතා 1999 වර්ෂයේදී සියලුම වරායයන්හි හාබර් මාස්ටර් ලෙස උසස් කරන ලදී.

විවිධ වකවානු තුළ ඉහළ කළමණාකාරීත්වයේ ඉල්ලීම් පරිදි ඒ මහතා හාබර් මාස්ටර් තනතුරේ රාජකාරි කටයුතුවලට අමතරව සමුද්‍රීය කර්මාන්තය හා සම්බන්ධ මෙහෙයුම් කටයුතු, ආරක්ෂාව සහ සේවා සැපයුම් වැනි විශේෂිත වූ කාර්යයන්හිද නිරත වන ලදී.

ඉන්පසු 2005 වසරේදී ඔහු අධ්‍යක්ෂ මෙහෙයුම් ලෙස ද, 2006 වසරේදී අතිරේක කළමනාකරණ අධ්‍යක්ෂ ලෙස ද උසස්වීම් ලැබීය. දැනට ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ ධුරය හොබවයි.

කපිතාන් කැප්පෙටිපොළ මහතා ජයබහළු පර්යන්ත සමාගමේ සහ කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්ත සමාගම්හි ද අධ්‍යක්ෂ වේ. ඔහු එක්සත් රාජධානියේ නාවික ආයතනයේ (ශ්‍රී ලංකා ශාඛාවේ) හිටපු සභාපතිවරයා මෙන්ම සේවා සැපයුම් හා වරලත් ප්‍රවාහන ආයතනයේ සාමාජිකයෙකු ද වේ.

කපිතාන් කැප්පෙටිපොළ මහතා ඩෙක් නිලධාරි පරීක්ෂක වශයෙන් වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයට අනුයුක්තව සිටී.

**වෛද්‍ය සංජය සේදර සෙනරත්**
**විධායක අධ්‍යක්ෂ**

වෛද්‍ය සංජය සේදර සෙනරත් මහතා මාතර රාහුල විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබීය. පාසැල් දිවිය තුළ ජනාධිපති බාලදක්ෂයෙකු වශයෙන්, පාඨශාලීය වර්ණලාභියෙකු හා ශ්‍රී ලංකා වර්ණලාභියෙකු වශයෙන් මෙන්ම විදුහලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා වශයෙන් ලද පන්නරය ඔහුගේ පරිණත ජීවිතය සඳහා පිටිවහලක් විය. එමගින් ලද පසුබිම තුළ මාතර රාහුල විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ කොළඹ ශාඛාවේ සභාපති වශයෙන් පත්වීමට ඒ මහතාට අවකාශ සැලසිණ.

උසස් පෙළ විභාගයෙන් පසු ඔහු නීති විද්‍යාලයට ඇතුලත් විය. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීතිය හදාරමින් සිටියදී රුසියාවේ මොස්කව් නුවර "පීපල්ස් ප්‍රෙන්ඩ්ෂිප්" විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබීමට සෙනරත් මහතාට ශිෂ්‍යත්වයක් ලැබුණු අතර එහිදී වෛද්‍ය උපාධිය මෙන්ම රුසියානු භාෂාව ඉගැන්වීම පිළිබඳ උපාධියක් ද හිමිකර ගැනීමට ඒ මහතාට හැකිවිය.

වෛද්‍ය උපාධිය ලැබීමෙන් අනතුරුව වෛද්‍ය සෙනරත් මහතා මාතර මහ රෝහලේ වෛද්‍ය නිලධාරියෙකු වශයෙන් සේවය කළේය.

ඉන් අනතුරුව රුසියාවේ මොස්කව් නුවර ව්‍යාපාර පරිපාලන අධ්‍යාපන ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ඒ මහතා ලැබීය.

**වෙනත් සාර්ථකත්වයන්**

රුසියාවේ මොස්කව් නුවර "පීපල්ස් ප්‍රෙන්ඩ්ෂිප්" විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර ශිෂ්‍ය සංගමයේ ලේකම් වශයෙන් පත්වීම හා වඩාත්ම කැපී පෙනෙන ශිෂ්‍යයා (විදේශ ශිෂ්‍ය අංශය 1995) වීම.

සෙනරත් මහතා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පුළුල් ජාත්‍යන්තර විවරණයක් ලබා ඇති අතර විදේශ විනිමය ආයෝජන ව්‍යාපාර කිහිපයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. සමූහ ව්‍යාපාර කිහිපයක් සාර්ථක අයුරින් මෙහෙයවීම හා සමාජ සුභසාධන ව්‍යාපෘති ගණනාවක් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ දක්ෂිණ දේශය තුළ පවත්වා ගෙන යාමට මැදිහත් වීම.

වෛද්‍ය සෙනරත් මහතා 2007 වසරේ අප්‍රේල් මස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත්කරනු ලැබූ අතර පසුව අධිකාරියේ විධායක අධ්‍යක්ෂ ධුරයට පත්වීම් ලැබීය. ඉන් අනතුරුව ඒ මහතා ගාලු වරායේ නිරීක්ෂණ අධ්‍යක්ෂවරයා වශයෙන් හා කොළඹ වරායේ ඉඩම් සංවර්ධන ව්‍යාපෘතියේ සම සභාපති වශයෙන් ක්‍රියාශීලී කාර්යභාරයක නිරතව ඇත.

ශ්‍රී ලංකාවේ භූගෝලීයමය වශයෙන් පවත්නා වාසිදායක පිහිටීම ප්‍රයෝජනයට ගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උන්නතිය සඳහා ලොව නන් දෙස පවත්නා ව්‍යාපාරික අවස්ථා ලංකාව වෙත ග්‍රහණය කර ගැනීමේ ගවේෂණාත්මක කාර්යයෙහි ඒ මහතා උත්සුකව නිරතව සිටී.

## අනුර ජයවික්‍රම මහතා
## අධ්‍යක්ෂ

**අතිරේක ලේකම් - වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය**

1982 වර්ෂයේදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබාගත් අනුර ජයවික්‍රම මහතා 1984 ශ්‍රී ලංකා පරිපාලන සේවයට සම්බන්ධ විය. 2006 වර්ෂයේ අතිරේක ලේකම්වරයෙකු වශයෙන් වරාය හා ගුවන් සේවා අමාත්‍යශයට සම්බන්ධවීමට ප්‍රථම ඔහු වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය යන අමාත්‍යාංශයන්හි පරිපාලන තනතුරු කිහිපයක් දරා ඇත.

ඔහු දකුණු ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් (Flinders) විශ්ව විද්‍යාලයෙන් ප්‍රතිපත්ති සහ පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ගත්තේය.

පරිපාලනය පිළිබඳ අතිමහත් නිපුණතාවයක් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ විශේෂ ශ්‍රේණියේ නිලධාරිවරයෙකු වශයෙන් සුවිශේෂී වැඩ කිරීමේ පලපුරුද්දක් ඔහු සතුව ඇති අතර, දැනට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු වශයෙන් කටයුතු කරනු ලබයි.

අනුර ජයවික්‍රම මහතා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි.

## ඒස්. ආර්. ආටිගල මහතා
## අධ්‍යක්ෂ

**නියෝජ්‍ය ලේකම් මහා භාණ්ඩාගාරය**

ආටිගල මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ගණිත අංශයෙන් විද්‍යාවේදී සහ එක්සත් රාජධානියේ, වර්වික් (Warwick) විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිධාරියෙකු වේ.

වසර ගණනාවක් ඔහු මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥයෙකු ලෙස කටයුතු කළ අතර ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂක සහ වැඩ බලන සභාපතිවරයා වශයෙන් ද, ෂෙල් ගෑස් ලංකා සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද සේවය කර ඇත.

ඒ මහතා වර්තමානයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වශයෙන් කටයුතු කරනු ලබයි.

ඔහු ලංකා බැංකුවේ අධ්‍යක්ෂ ධූරයේ සහ ශ්‍රී ලංකා ආරක්ෂණ සහ විනිමය කොමිසමේ, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ ද කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේද නිරීක්ෂකයෙකු වේ.

**ඩබ්ලිව්. සුදර්මා කරුණාරත්න මහත්මිය**
**අධ්‍යක්ෂ**

**ශාස්ත්‍රපති (රාජ්‍ය පරිපාලන) කාර්ල්ටන් විශ්ව විද්‍යාලය, කැනඩාව**
**භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය (පළමු පන්තිය)**
**රේගු අධ්‍යක්ෂ ජනරාල්**

කරුණාරත්න මහත්මිය 1984 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක් වූ අතර රජයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ ගණනාවක සහකාර අධ්‍යක්ෂ, සහකාර පාලක, නියෝජ්‍ය අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ ජනරාල් වැනි තනතුරු හොබවා ඇත. 2005 වසරේ සිට ඇය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා සහ ජාතික අයවැය අංශවල අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කර ඇත. දැනට ඇය ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරයි. තවද කරුණාරත්න මහත්මිය අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද පරිපාලන, ආයතන, මානව සම්පත් සංවර්ධන, වැටුප් සහ සේවක සංඛ්‍යා, ප්‍රතිව්‍යුහගත කිරීම් සහ ප්‍රතිසංස්කරණ වැනි විවිධ ක්ෂේත්‍රවලට අදාළ නිලධාරී කමිටු බොහෝ ගණනක සාමාජිකාවක ලෙස ද සේවය කර ඇත. ඇය අමාත්‍ය මණ්ඩල ටෙන්ඩර් මණ්ඩල සාමාජිකාවක් ලෙස සිය සේවය ලබාදී ඇති අතර රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය සහ ළමාරක්ෂණ අධිකාරිය වැනි ආයතනවල කළමනාකරණ මණ්ඩල අධ්‍යක්ෂවරියක ලෙස ද සේවය කර ඇත. දැනට ඇය ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ආයෝජන මණ්ඩලය, ජාතික අන්තරායකාරී ඖෂධ පාලක මණ්ඩලය සහ පුරෝගාමී පාලන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලවල අධ්‍යක්ෂිකාවක් ලෙස කටයුතු කරයි.

කරුණාරත්න මහත්මිය ආසියානු සංවර්ධන බැංකුව (ADB), ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව, ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධන පිළිබඳ සංවිධානය (OECD), පොදු රාජ්‍ය මණ්ඩලය, ජයිකා (JICA) , ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) ආදිය මඟින් පවත්වන වෘත්තීයමය සම්මන්ත්‍රණ/පාඨමාලා කිහිපයක් හදාරා ඇත.

**ආචාර්ය දමිතා ද සොයිසා මහත්මිය**
**අධ්‍යක්ෂ**

**ලේකම්**
**ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය**

ආචාර්ය දමිතා ද සොයිසා මහත්මිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව (සංඛ්‍යානය) පිළිබඳ ගෞරව උපාධිය ලබා ඇත. ඇය විසින් ඕස්ට්‍රේලියාවේ කැන්බරා නුවර පිහිටි ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයෙන් කෘෂි කාර්මික සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති පශ්චාත් උපාධිය ලබා ඇත. තවද, ඇමෙරිකාවේ ඔහියෝ කොලොම්බස්හි පිහිටි ඔහියෝ රාජ්‍ය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ද ඇය සතුව ඇත.

2010 අප්‍රේල් 25 දින සිට බලපැවැත්වෙන පරිදි ඇය ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම් ලෙස පත් කරන ලද අතර 2010 නොවැම්බර් 25 දින නැවතත් එම තනතුරටම පත් කරන ලදී. අමාත්‍යාංශ ලේකම් ලෙස කටයුතු කරන අතරතුර දැනට ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජාතික ජල සම්පත් සංවර්ධන (NARA) ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලවල ද අධ්‍යක්ෂිකා තනතුරු හොබවයි. ඇය ජනාධිපති ලේකම් විසින් පත්කරන ලද ඛණිජ සම්පත් සංවර්ධන කමිටුවේ නියෝජිතවරියෙකි.

පොහොර සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කල ස්ථාවර මිළදී ගැනීම් සැළසුම් කමිටුවේ සභාපතිනිය වශයෙන් ඇයව පත්කර ඇත. ආචාර්ය සොයිසා මහත්මිය ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවාවට අයත් වේ. විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් අනතුරුව මුදල් සහ ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවෙන්

මුල්ම වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඇය එහිදී සැලසුම් නිළධාරී, සහකාර අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ අතිරේක අධ්‍යක්ෂ වැනි විවිධ තනතුරු වල සේවය කළාය.

ඇය 1999 වසරේදී එම දෙපාර්තමේන්තුවෙහිම අධ්‍යක්ෂවරිය ලෙස උසස් කරන ලදී. ආචාර්ය සොයිසා මහත්මිය 2005 වර්ෂයේදී එම අමාත්‍යාංශයේම පිස්කල් ප්‍රතිපත්තීන් පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස උසස් කරන ලදී. ඇය දැනට පවත්නා තනතුර දැරීමට පෙර මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ, මූල්‍ය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස ද කටයුතු කළාය.

තවද, ඇය මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිටින අතර, වැව්ලි භාරකාර අරමුදලේ සභාපතිනිය ලෙසද, නැනෝ තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ (SLINTec) සහ නැනෝ තාක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගමේ (NANCO) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස ද සේවය කළාය. ඇය ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, වී අලෙවි මණ්ඩලය, උසස් ඉදිකිරීම් පුහුණු කිරීමේ ඇකඩමිය සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් වූවාය. තවද, ඇය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සහ ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කළාය. ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්වරිය ලෙස වැඩ භාර ගැනීමෙන් පසු ඇය ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්විය.

**ඒෂන ද සිල්වා මහතා**
**අධ්‍යක්ෂ**

ඒෂන ද සිල්වා මහතා කොළඹ රාජකීය විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරීය. ඔහු සහතික ලත් වෘත්තීය කළමණාකරුවන්ගේ ආයතනයේ (MCPM) සාමාජිකයෙකු මෙන්ම එක්සත් රාජධානියේ වෘත්තීයමය ආයතනයේ හවුල්කාර සාමාජිකයෙකු ද (AUKAP) වේ. ඔහු රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේම ජ්‍යෙෂ්ඨ තනතුරු ගණනාවක්ම හොබවනු ලබයි. වර්තමානයේ ඔහු ඒෂන හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගමේ සභාපති ලෙස ද, ෂර්මන්ස් ලොජිස්ටික්ස් (පෞද්ගලික) සමාගමේ සභාපති ලෙස ද, ෂර්මන්ස් ප්‍රවාහන (පෞද්ගලික) සමාගමේ සභාපති ලෙස ද, එස්නා (පෞද්ගලික) සමාගමේ උපසභාපති/කළමණාකාර අධ්‍යක්ෂ ලෙස ද, එස්නා ටෙක්නොලජීස් (පෞද්ගලික) සමාගමේ සභාපති ලෙස ද, එස්නා විලාස් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ලෙස ද, එස්නා පවර් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ලෙස ද, එස්නා වෙන්චර්ස් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ලෙස ද, පැන් ඒෂියා බැංකුවේ අධ්‍යක්ෂ ලෙසද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කමිටු සාමාජික ලෙස ද, මවුන්ට්බැටන් ලැන්ඩ්ස් (පෞද්ගලික) සමාගමේ කමිටු සාමාජික ලෙස ද, මැක් මැරයින් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ලෙසද, ලංකා ෂිපිං ඇන්ඩ් ලොජිස්ටික්ස් සමාගමේ අධ්‍යක්ෂ ලෙස ද, සිමාටෙක් ඒජන්සි ලංකා හි අධ්‍යක්ෂ ලෙස ද, ෂර්මන්ස් පුත්‍ර (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ලෙසද, ෂර්මන් ද සිල්වා සහ සමාගමේ අධ්‍යක්ෂ ලෙසද, ඩෙමිනිෂන් එක්ස් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

ඔහු ශ්‍රී ලංකාවේ මහජන කසකස්ථාන කොන්සියුලර් කාර්යාලයේ ගරු කොන්සාල්වරයා වශයෙන් ද පත්වීම් ලැබ ඇත.

ඒෂන ද සිල්වා මහතා ශ්‍රී ලංකා ඇග්‍රි බිස්නස් කෝපරේෂන් (SLABCO) සමාගමේ හිටපු සභාපතිවරයා වූ අතර, විදේශ කටයුතු අමාත්‍යාංශයේ විශේෂ උපදේශක කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කර ඇත. ඊට අමතරව ඔහු විදේශීය සමාගම් සඳහා උපදේශකවරයෙකු ලෙස ද කටයුතු කරයි.

**කපිල ලියනගමගේ මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

**නීති උපදේශක - ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

**කළමනාකරණ කමිටුව**

ආචාර්ය ප්‍රියත් බී. වික්‍රම මහතා
සභාපති

ඉන්දික කරුණාජීව මහතා
උප සභාපති

කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතා
කළමනාකාර අධ්‍යක්‍ෂ

වෛද්‍ය සංජය සේදර සෙනරත් මහතා
විධායක අධ්‍යක්‍ෂ

නෝමන් වීරරත්න මහතා
අතිරේක කළමනාකාර අධ්‍යක්‍ෂ

ශිරානි වන්නිආරච්චි මහත්මිය
අධ්‍යක්‍ෂ (මුදල්)

ජේ.කේ.පී. කුරුකුලසූරිය මහතා
අධ්‍යක්‍ෂ (දක්ෂිණ වරාය සංවර්ධන)

ජී.ඒ. තලගල මහතා
අධ්‍යක්‍ෂ (වරාය මෙහෙයුම්)

ඒ.ඩී.ටී. ගුණසේකර මහතා
අධ්‍යක්‍ෂ (තාක්ෂණ)

ඩී.ඩබ්ලිව්. අතපත්තු මහතා
අධ්‍යක්‍ෂ (සේවා සැපයුම්)

මේජර් ජනරාල් එස්.ජී. කරුණාරත්න මහතා
අධ්‍යක්‍ෂ (ආරක්ෂක)

එම්.පී.එස්.එස්. පිරිස් මහතා
ප්‍රධාන ඉංජිනේරු (සිවිල්)

කේ.ඒ. අන්සාර් මහතා
ප්‍රධාන අභ්‍යාස කළමණාකරු

ඩී.ජී.අයි.සී. ලොකුහේවගේ මහත්මිය
ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්)

කපිතාන් ආර්.ඒ. ජයවික්‍රම මහතා
හාබර් මාස්ටර්

එල්. ප්‍රේමසිරි ද සිල්වා මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක

වෛද්‍ය ඩී. රාජකාන්තන් මහත්මිය
ප්‍රධාන වෛද්‍ය නිලධාරිණී

එච්.ඩී.එච්. සමරසිංහ මහතා
ප්‍රධාන ඉංජිනේරු (නාවික)

එල්.එච්.ආර්. සේපාල මහතා
ප්‍රධාන මානව සම්පත් කළමනාකරු

පී.ඩබ්ලිව්. වඩුගේ මහතා
ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ වැඩ)

ඩී.යූ.ඩබ්ලිව් ද සොයිසා මහතා
ප්‍රධාන කළමණාකරු (සේවා සැපයුම්)

පී.ඒ.ඒ. හේවාගීගන මහතා
ප්‍රධාන ඉංජිනේරු (දකුණු වරාය සංවර්ධන)

ඊ.ඒ.ටී. එදිරිසූරිය මහතා
ප්‍රධාන ඉංජිනේරු (යන්ත්‍රෝපකරණ)

ඒ. ඒ. එස්. ආර්. අබේසිරිවර්ධන මහතා
ප්‍රධාන ඉංජිනේරු (සැලසුම් හා සංවර්ධන)

ඩබ්ලිව්.එන්. ඇල්සන් මහතා
ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා)

ඩී.ඒ.ජේ.අයි.පෙරේරා මහතා
ප්‍රධාන කළමනාකරු (බහළු මෙහෙයුම්)

උපුල් ජයතිස්ස මහතා
ප්‍රධාන කළමනාකරු (අලෙවි හා ව්‍යාපාර සංවර්ධන)

පී. රණතුංග මහතා
ප්‍රධාන කළමනාකරු (සම්ප්‍රදායික නැව්බඩු)

ආර්.එම්.ඒ.එස්. රත්නායක මහතා
ප්‍රධාන කළමනාකරු (පරිපාලන)

ඩබ්ලිව්.එම්.ඩී.බී. විජේකෝන් මහතා
ප්‍රධාන ඉංජිනේරු (විදුලි)

එච්.ඒ.එන්.එස්. ප්‍රනාන්දු මහතා
වැ.බ.ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ)

එච්.එම්.යූ.බී.ගලගොඩ මහතා
වැ.බ. ප්‍රධාන කළමනාකරු
(තොරතුරු පද්ධති)

**විගණන කමිටුව**

එස්.ආර්. ආටිගල මහතා
සභාපති

ඩබ්.එස්. කරුණාරත්න මහත්මිය
සාමාජික

ශිරාණි වන්නිආරච්චි මහත්මිය
සාමාජික

ජී.ඒ.තලගල මහතා
සාමාජික

ඒ.ඩී.ටී.ගුණසේකර මහතා
සාමාජික

එල්.ප්‍රේමසිරි ද සිල්වා මහතා
ලේකම්

2011 වර්ෂයේ ක්‍රියාකාරකම් සහ ප්‍රධාන සාර්ථකත්වයන් පහත දක්වා ඇත.

2011 වර්ෂය තුළදී පහත සඳහන් නව ප්‍රධාන නෞකා සේවාවන් සහ පෝෂක නෞකා සේවාවන් ආකර්ෂණය කර ගැණින.

**ප්‍රධාන නෞකා සේවාවන් - 5**

* එවර්ග්‍රීන් සහ සීමාටෙක් – CIX – 2 වයිනා ISC
* MSC – දකුණු අප්‍රිකා සේවය
* RCI / CIS – ප්‍රාදේශීය බහළු සේවය සහ හැපෙග් ලොයිඩ්
* PIL – නැගෙනහිර අප්‍රිකා/ ඈත පෙරදිග සේවය – EA2 W/B
* PIL – නැගෙනහිර අප්‍රිකා / ඈත පෙරදිග සේවය – EA2 E

**පෝෂක නැව් සේවා - 1**

* ලංකා නැව් සංස්ථාව (CSC) – Viz/Karikal

**නෞකා සේවාවන් 5 ක් සමඟ පර්යන්ත සේවා ගිවිසුම්වලට එළඹීම**

* CMAS – CGM
* වැන්හයි ලයින්
* එවර්ග්‍රීන්
* APL
* ZIM/GSL ලයින්

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය පර්යන්ත කළමනාකරණයේ ප්‍රතිඵලයක් ලෙස පහත ප්‍රතිඵල වාර්තා කෙරිණ**

* දේශීය බහළු මෙහෙයුම් ධාරිතාවය 14.9% න් වර්ධනය විය.
* ප්‍රති අපනයන බහළු මෙහෙයුම් ධාරිතාවය 3.2% න් වර්ධනය විය.
* ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලැබු පර්යන්ත සමස්ථ මෙහෙයුම් 6.1% න් වර්ධනය විය.
* ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙළඳපොළ කොටස 53.9% න් වර්ධනය විය.
* ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙතෙක් මෙහෙයවන ලද ඉහළම බහළු මෙහෙයුම් ධාරිතාවය විස්සේ සම ඒකක 2,299,446 කි.

**කොළඹ වරාය පහත ප්‍රතිඵල වාර්තා කෙරිණ**

* දේශීය බහළු මෙහෙයුම් ධාරිතාවය 12.3% න් වර්ධනය විය.
* ප්‍රතිඅපනයන බහළු මෙහෙයුම් ධාරිතාවය 0.9% න් වර්ධනය විය.
* කොළඹ වරායේ සමස්ථ වර්ධනය 3%
* කොළඹ වරායේ පර්යන්ත මෙතෙක් මෙහෙයවන ලද ඉහළම බහළු මෙහෙයුම් ධාරිතාවය විස්සේ සම ඒකක මිලියන 4,262,887 කි.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය 1984 අංක 7 සහ 35 පනත්වලින් සංශෝධිත 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතෙහි විධිවිධාන යටතේ 1979.08.01 වන දින ස්ථාපිත කරනු ලැබිය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතේ 6 (1) වගන්තියෙන් එහි අරමුණු සහ කාර්යයන් පහත සඳහන් ලෙස නිර්වචනය කර ඇත.

- ස්ටෙවඩෝරු කටයුතු, නැව්ගත කිරීම් හා ප්‍රතිනැව්ගත කිරීම්, ගොඩබෑම් හා ගුදම්ගත කිරීම, වාප්පු කටයුතු, යාත්‍රාවලට ජලය, ඉන්ධන හා විදුලිබලය සැපයීම, ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදන හා ලිහිසි තෙල් යාත්‍රාවලට සහ යාත්‍රා වලින් බන්කර් හා ගබඩා අතර ගෙනයාම සහ ගෙන ඒම, යාත්‍රා වල නියමු කාර්යය හා නැංගුරම්ලෑම සඳහා ද, කිමිදීම හා ජලය යට නැව් අළුත්වැඩියා කිරීම සහ ඊට අදාළ අනෙකුත් සේවා කාර්යක්ෂම හා අඛණ්ඩ සේවා සැපයීම.

- කාර්යක්ෂම හා නිත්‍ය සැසඳුම් හා ආරක්ෂක සේවා සැපයීම

- වරාය සීමාවන් තුළ හා වරාය වල ප්‍රවේශ මාර්ගයන්හි යාත්‍රාකරණය විධිමත් කිරීම හා පාලනය කිරීම

- වරාය ස්ථාපනයන් නඩත්තු කිරීම හා ඒවායේ පාවිච්චිය ප්‍රවර්ධනය, නිශ්චිත වරායන් තුළ වැඩි දියුණු කිරීම් හා සංවර්ධන කටයුතු

- යම් විශේෂිත වරායන් තුළ රේගු දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් හැර අනෙකුත් සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම් හා ක්‍රමවත් කිරීම

- විශේෂිත වරායන් තුළට හා ඉන් බැහැරව යාත්‍රාකරණය සඳහා යාත්‍රා වලට මග පෙන්වීම හා ආරක්ෂාව සඳහා අවශ්‍ය ප්‍රදීප හා වෙනත් උපයෝගීතා ශ්‍රී ලංකා වෙරළෙහි හා ඉන් ඔබ්බෙහි පිහිටුවීම හා නඩත්තු කිරීම

- වරාය අධිකාරිය පනත මගින් පවරනු ලබන වෙනත් යම් කාර්යයන් ඉටු කිරීම

- වත්කම් ප්‍රතියෝජනය කිරීම පිණිසත්, නව ආයෝජන ඇති කිරීම පිණිසත්, ප්‍රමාණවත් පොදු සංචිතයක් පිහිටුවා පවත්වා ගෙන යාම පිණිසත්, අධිකාරියේ ආදායමට ගෙවනු ලැබීමට සුදුසු ගාස්තු ගෙවනු ලැබීම සඳහා සැහෙන්නාවූ ආදායමකට නොඅඩු ආදායමක් අධිකාරියට ලැබෙන ආකාරයකින් වරාය අධිකාරියේ කටයුතු පවත්වා ගෙන යාම, ඉහත කී ආකාරයේ ගාස්තු අධිකාරිය විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් අදාළ පනතට අනුකූලව අයකර ගැනීම

- පනතෙහි විධිවිධාන ප්‍රකාර විශේෂිත වරායන් හා එක් එක් වරාය මූල්‍ය වශයෙන් ස්වයංපෝෂිත ව්‍යාපාරයක් ලෙස කළමනාකරණය කිරීම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනතෙහි 5 (1) වගන්තිය ප්‍රකාරව වරාය අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය ගරු අමාත්‍යවරයා පත්කළ අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් සමන්විත වේ.

සභාපති, ප්‍රධාන විධායක නිළධාරී වන අතර ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි සමස්ථ පරිපාලනය භාරව කටයුතු කරයි.

**2011 වසරේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ වෙනස්වීම්**

**නෝමන් වීරරත්න මහතා** අතිරේක කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

**ඩී.ඩබ්ලිව්. අතපත්තු මහතා** අධ්‍යක්ෂ (සේවා සැපයුම්) වශයෙන් පත් කරන ලදී.

**මේජර් ජනරාල් එස්.ජී. කරුණාරත්න මහතා** අධ්‍යක්ෂ (ආරක්ෂක) වශයෙන් පත් කරන ලදී.

**ඩී.යූ.ඩබ්ලිව් ද සොයිසා මහතා** ප්‍රධාන කළමණාකරු (සේවා සැපයුම්) වශයෙන් පත් කරන ලදී.

**ඩබ්ලිව්.එන්. ඇල්සන් මහතා** ප්‍රධාන කළමනාකරු (සුභසාධක හා කාර්මික සම්බන්ධතා) වශයෙන් පත් කරන ලදී.

**පී. රණතුංග මහතා** ප්‍රධාන කළමනාකරු (සම්ප්‍රදායික නැව්බඩු) වශයෙන් පත් කරන ලදී.

**ආර්.එම්.ජී.එස්. රත්නායක මහතා** ප්‍රධාන කළමනාකරු (පරිපාලන) වශයෙන් පත් කරන ලදී.

**එච්.එම්.යූ.බී.ගලගොඩ මහතා** වැ.බ. ප්‍රධාන කළමනාකරු (තොරතුරු පද්ධති) වශයෙන් පත් කරන ලදී.

**2011 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ විශ්‍රාම ගැනීම**

**අයි.පත්මපෙරුම මෙනෙවිය -** ප්‍රධාන නීති නිලධාරිනී **-** ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් විශ්‍රාම ගනු ලැබීය.

**ලංකා නැව් නියෝජිතයින්ගේ රැස්වීම්**

වර්ෂය තුළදී ලංකා නැව් නියෝජිතයින්ගේ සංගමය (CASA) විසින් වරාය හා සම්බන්ධ කරුණු හා සිය සාමාජිකයන්ට බලපාන ප්‍රශ්ණ හා ගැටළු පිළිබඳ සාකච්ඡා කරනු පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්ව මණ්ඩලය සමග රැස්වීම් කිහිපයක් පවත්වනු ලැබීය. වරාය සේවාලාභීන්ට බලපාන ගැටළු නිරාකරණය කර ගැනීමටත් අන්‍යෝන්‍ය අවබෝධය හා සුහද සම්බන්ධතා පවත්වා ගැනීමටත් එමඟින් ඵලදායිතාවය වැඩි දියුණු කර ගැනීමටත් එම සාකච්ඡා ඵලදායී විය.

**විනයානුකූල නියෝගයන්ට එරෙහිව අභියාචනා කමිටු**

තමන් වෙත පනවා ඇති විනයානුකූල නියෝගයන්ට එරෙහිව සේවකයන් විසින් සභාපති/අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අභියාචනා හැත්තෑවක් (70) ඉදිරිපත් කොට තිබූ අතර ඒවා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නීතිරීති හා රෙගුලාසි ප්‍රකාර පිහිටුවන ලද අභියාචනා මණ්ඩල පහක් (05) වෙත යොමු කරන ලදී.

මෙම අභියාචනා අතරින් පහක් (05) අනුමත කළ අතර පනස් හතරක් (54) ප්‍රතික්ෂේප විය. එකොළහක් (11) අවසන් කළ යුතුව ඇත.

**විදේශ පුහුණුව සහ ශිෂ්‍යත්ව අවස්ථා**

සමාලෝචනයට බඳුන් වූ වර්ෂය තුළදී අධිකාරියේ ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු දරණ නිළධාරීන් හැත්තෑ එක් (71) දෙනෙකුට ශිෂ්‍යත්ව පිරිනමා පුහුණු පාඨමාලාවන් හැදෑරීමටත්, ශ්‍රී ලංකාවෙන් බැහැරව ජාත්‍යන්තර සංවිධාන මගින් පවත්වනු ලැබූ සම්මේලන වලට හා සම්මන්ත්‍රණ වලට සහභාගීවීම සඳහාත් අවස්ථාව ලබා දෙන ලදී.

මීට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි සේවකයන් දහඅට දෙනෙකු (18) ක්‍රීඩා තරඟවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා විදේශ ගතවිය.

**සන්නිවේදන හා මහජන සම්බන්ධතා**

කළමනාකාරීත්වය හා සේවකයින් මෙන්ම වරාය හා සම්බන්ධ බාහිර පාර්ශවයන් අතර මනා සන්නිවේදන සම්බන්ධතාවයක් වර්ධනය කර ගැනීමට සන්නිවේදන හා මහජන සම්බන්ධතා

කොට්ඨාශය (CPRD) පිහිටුවා ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආයතනයේ සමස්ථ ප්‍රතිරූපය ඉහළ නැංවීමට නවතම උපක්‍රමයක් ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදුකර ඇත. දේශීය හා විදේශීය ප්‍රදර්ශනයන් සඳහා සහභාගී වන අතරම විද්‍යුත් මාධ්‍ය හා පුවත්පත් යන මාධ්‍ය හරහා මහජන සම්බන්ධතා කොට්ඨාශය මෙම කාර්යය සඳහා ප්‍රබල සහයෝගයක් ලබාදී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය වෙත පවරන ලද බහුවිධ කාර්යයන් අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රතිරූපය වර්ධනය කිරීම සඳහා බාහිර දේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ සක්‍රීයව කටයුතු කිරීම මෙම කොට්ඨාශයේ කාර්යභාරයකි. වරාය ව්‍යාපෘතීන්හි සිදුකිරීමට නියමිත සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පුළුල් ප්‍රචාරයක් ගෙන දීමට කළ හැකි සියළුම ක්‍රියාමාර්ගයන් ගෙන ඇත.

කළමනාකාරීත්වය සහ සේවකයින් අතර මනා සන්නිවේදන තත්ත්වයක් වර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණ සඵල කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් අතර "තීර්ථ" මාසික සඟරාව නොමිලයේ බෙදාහැරීම, සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මඟින් සාර්ථකව කර ගෙන යනු ලැබීය. ක්‍රීඩා, සෞන්දර්ය විෂයන් හා දර්ශනය වැනි සමාජ රුචිකත්වයක් ඇති විෂය ක්ෂේත්‍ර ගණනාවක් තුළ වරාය සේවකයින් දක්වන්නා වූ විශේෂිත දක්ෂතාවය හඳුනාගැනීමට එය උපකාරී වන අතර තවදුරටත් කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාලීන ක්‍රියාමාර්ග නීති සහ රෙගුලාසි පිළිබඳ වරාය සේවකයින් දැනුවත් කිරීම මාර්ගයක් විවර කොට ඇත.

ආයතනයේ පරිශීලනය සඳහා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යය යන දෙවර්ගය සඳහා සංරක්ෂණ ලේඛනාගාරය, සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විසින් පවත්වා ගෙන යනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියට අදාළව දේශීය පුවත්පත් වල සහ බොහෝ සඟරාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ප්‍රකාශයට පත් කරන ලද සියළුම කරුණු පරිගණක ගත කළ සහ මුල් පිටපත් වශයෙන් මෙම කොට්ඨාශය තුළ සුරක්ෂිතව පවතින අතර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ වාර්තාමය වීඩියෝ වැඩ සටහන් සඳහා අවශ්‍ය වන මෙන්ම, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ආවරණය කළ අතීත හා වර්තමාන සියලු දෘෂ්‍ය වීඩියෝ වැඩ සටහන් අනාගත පරිහරණය වෙනුවෙන් නවීන විද්‍යුත් තාක්ෂණය උපයෝගී කරගත් චිත්‍රාගාරයක සුරක්ෂිතව තබා ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය ආවරණය කරමින් සකසන ලද සියලුම වාර්තාමය වැඩ සටහන් නැරඹීම සඳහා දෘඩ පිටපත් හා මෘදු පිටපත් (පරිගණක ගත කරන ලද) පුස්තකාලයක් ද මෙම අංශය සතුවේ.

මොණරාගල - බුත්තල "දැයට කිරුළ" සහ වියට්නාම සහ බංගලාදේශය වැනි ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවලදී පැවති ජාතික ප්‍රදර්ශණ ගණනාකවකදී කොළඹ වරාය දකුණු ආසියාවේ ප්‍රමුඛපෙළේ කේන්ද්‍රස්ථානය වශයෙන් සහ ශ්‍රී ලංකාව සමුද්‍රික මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීමට සහ ඒ පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවස්ථාව ලැබිණ. ටෙක්නෝ ප්‍රදර්ශණයේදී හොඳම ප්‍රදර්ශණ කුටියට හිමි රිදී සම්මානය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දිනා ගන්නා ලදී.

ජාත්‍යන්තර මිත්‍ර සහයෝගිතා වරාය ජාල (INAP) සම්මේලනය ඇතුළුව වැනි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උත්සව අවස්ථා සංවිධානය කරමින් මෙම කොට්ඨාශය වැදගත් කාර්ය භාරයක් ඉටු කළේය. විවිධ අවස්ථා වෙනුවෙන් පල කරන ලද පුවත්පත් අතිරේකයන් මෙම කොට්ඨාශය විසින් සකස් කොට සංවිධානය කරන ලදී.

සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය විවිධ මාධ්‍ය සාකච්ඡාවන්හිදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය නියෝජනය කිරීමට හා එය සම්බන්ධ වීඩියෝ දර්ශන, මුද්‍රිත දත්තයන්, පුවත්පත් නිල නිවේදනයන්, බාහිර මාධ්‍ය අංශයට නිකුත් කිරීමට බලය ලත් නිල හස්තය වේ.

තවද ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ ඒකාබද්ධව "ඉසුරු ගෙනෙන නැව් තොට" නම් චිත්‍ර, රචනා,කාව්‍ය, වේදිකා නාට්‍ය අත් පිටපත් රචනය, ඡායාරූප, මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ

වරායේ අනුරුව සැකසීම, මුද්දර සහ කාව්‍ය තරඟ මෙම කොට්ඨාශය මගින් සම්බන්ධීකරණය කරන ලදී.

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සමාරම්භක උත්සවයේ සමරු මුද්දරය නිර්මාණය කිරීමේ කාර්යයේදී සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය, ශ්‍රී ලංකා මුද්දර කාර්යංශය හා සමීප සම්බන්ධතාවයකින් කටයුතු කළ අතර 2011 නොවැම්බර් 18 වෙනි දින සමාරම්භක උත්සවයේදී මුල් දින කවරය නිකුත් කිරීම සිදු කෙරිණ.

මෙම අංශය ජාතික සහ වෙනත් පිළිගත් රූපවාහිනී ගුවන්විදුලි සහ පුවත්පත් ආයතන සම්බන්ධීකරණය සහිතව විවිධ වාර්තා සහ සම්මුඛ සාකච්ඡා රූපවාහිනී සහ ගුවන් විදුලි මඟින් ප්‍රසිද්ධ කර වරාය ව්‍යාපෘතීන් සහ ඒවායේ ප්‍රතිලාභ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා ආයතනය වෙත පැවරි ඇති කාර්යභාරය අනුව ක්‍රියාකරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දියත් කොට ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් සහ සමාන අවස්ථා සංදේශණය කිරීම සහ මහජන සම්බන්ධතා කටයුතු පහසු කිරීම තුළින් රටේ අනාගත සමාජ ආර්ථික සංවර්ධනය සඳහා දායක වී ඇත. මෙම අතිදැවැන්ත ව්‍යාපෘති සම්බන්ධව කළාපීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ අරමුණු ඇතිව සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය වැඩමුළු රාශියක් සම්බන්ධීකරණය කරන ලදී.

බාහිර පාර්ශවයන් විසින් ඡායාරූපකරණය, චිත්‍රපට නිෂ්පාදනය සහ රූපවාහිනී දැන්වීම් නිෂ්පාදනය වැනි තාවකාලික වාණිජ කර්තව්‍යයන් සඳහා වරාය පරිශ්‍රය තුළ ඇති විවිධ ස්ථානවල වැදගත්කම අනුව ඒවා භාවිතා කිරීම වෙනුවෙන් ගෙවීම් ක්‍රම අඩංගු නව ගෙවීම් සංග්‍රහිතයක් හඳුන්වා දී ඇත.

# මෙහෙයුම් සමාලෝචනය

## ක්‍රියාකරවන

ඉතිහාසයේ ප්‍රථමවරට කොළඹ වරාය විසින් ඉහළම වාර්ෂික බහළු මෙහෙයුම් ධාරිතාවය 2011 වර්ෂයේදී වාර්තා කර ඇත. 2011 දෙසැම්බර් 31 දින වන විට මෙහෙයුම් කළ බහළු සංඛ්‍යාව විස්සේ සම ඒකක 4,262,887 ක් වූ අතර මෙය 3% ක වර්ධනයකි.

2010 වසර සමඟ සසඳන විට කොළඹ වරාය විසින් මෙහෙයවන ලද සම්පූර්ණ බහළු සංඛ්‍යාව, පැමිණි නැව් සංඛ්‍යාව සහ මෙහෙයවන ලද සමස්ථ නැව් බඩු සංඛ්‍යාවේ වර්ධනයක් සිදු වී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කළමනාකරණය කරන ලද බහළු පර්යන්ත 2010 වසරේදී SAGT සමාගම විසින් මෙහෙයවන ලද වෙළඳපල කොටස හා සැසඳීමේදී 3% ක වර්ධනයක් පෙන්නුම් කරයි. ජීවමිතික පැමිණීම සටහන් කිරීමේ ක්‍රමය ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමෙන් ක්‍රියාකරවන කාර්යය මණ්ඩලය සේවයට වාර්තා කිරීම පිළිබඳව උනන්දුවක් ඇති කිරීම මඟින් පර්යන්ත කාර්යය සාධනයේද අභිවෘද්ධියක් ඇතිවිය.

පවත්නා සම්පත් උපරිම අන්දමින් අධීක්ෂණය කිරීම උදෙසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. බහළු පර්යන්තවල මෙහෙයුම් නොකරන කාලසීමාව අඩු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. ග්‍රැන්ට් දොඹකර 06 ක්ද, රබර් ටයර් යෙදූ ග්‍රැන්ට් දොඹකර 30 ක් ද (RTG), අංගන ට්‍රැක්ටර් 50 කින් ද සමන්විත නව උපකරණ සැපයීමෙන් පර්යන්තවල අධි ව්‍යුහාත්මක පහසුකම් වැඩි දියුණු කර ඇත. ජයබහළු පර්යන්තයට යාබදව තිබූ පැරණි ගොඩනැගිලි කඩා ඉවත් කිරීමෙන් අංගන ඉඩ කොටස් 8000 ක් එකතු කරන ලද අතර එමඟින් දේශීය බහළු ඇහිරිය හැකි ඉඩ ප්‍රමාණය වැඩිකර ඇත.

මූල්‍යමය සහ යුරෝ මුදල් කලාපයේ උද්ගතවුණු අර්බුද කරණ කොට ගෙන ඇති වූ ගෝලීය ආර්ථික අවපාතයක්, ඇමරිකානු ආර්ථිකයේ පවත්නා පසුබෑමත්, ස්වභාවික ව්‍යවසනයන් සහ අනතුරුවල ප්‍රතිඵලයක් ලෙස ජපාන ආර්ථිකයට සිදු වූ අහිතකර ඵළවිපාක මෙන්ම මැදපෙරදිග කළාපයේ පැවති යුධමය තත්ත්වයන් මධ්‍යයේ කොළඹ වරාය විසින් 2011 වසරේ බහළු මෙහෙයුම් සම්බන්ධ ඉහත සඳහන් ප්‍රගතිය ළඟා කර ගෙන ඇති බව සඳහන් කළ යුතුය.

## සේවා සැපයුම්

සේවා සැපයුම් කොට්ඨාශයේ ප්‍රධාන කර්තව්‍ය වන්නේ වරායට පැමිණෙන පූර්ණ බහළු පැටවුම් (FCL), ඌණ බහළු පැටවුම් (LCL), තොගකඩන, ඇසුරුම් සහ මෝටර් රථ වලින් සමන්විත ගොඩබාන ලද සියලු නැව් භාණ්ඩ භාරදීමත්, ගණුදෙනුකරුවන්ට අදාළ අනෙකුත් නැව් භාණ්ඩ ආශ්‍රිත සේවා ඉටුකිරීමත් වේ.

දවසේ පැය 24 පුරාම සේවා සැපයීම තුළින් පාර්භෝගික සේවා මධ්‍යස්ථානයෙන් 2011 වසර තුළ පූර්ණ බහළු පැටවුම් විස්සේ සම ඒකක 278,956 ඍජුවම බෙදා හැර ඇත. පාරිභෝගිකයන්ට සපයනු ලබන සේවා වැඩි කිරීමටත්, ලිපි ලේඛණ සඳහා ගතවන කාලය අවම කිරීමටත්, වසර තුළ නේවිස් (NAVIS) නැව්බඩු මොඩියුල වැඩ සටහන හඳුන්වාදීමට කටයුතු කෙරේ.

දේශීය ප්‍රති අපනයන, බහු රාජ්‍යවලට යැවෙන නැව්බඩු ඒකරාශි කිරීම (MCC) සහ විශේෂ වර්ගයේ නැව්බඩු සඳහා වරාය තුළ ඇති ගුදම්වල ඉඩකඩ සලසන අතර ඌණ බහළු පැටවුම් වලින් වැඩි ප්‍රමාණයක් (වී.ස.ඒ. 7926) වෙන්කොට ඇසිරීම සඳහා පැලියගොඩ බහළු රඳවා ගැනීමේ මධ්‍යස්ථානය වෙත මාරුකර ඇත. ඌණ බහළු පැටවුම් වෙන්කොට ඇසිරීමෙන් රුපියල් මිලියන 185.3 ක ආදායමක් උත්පාදනය කර ඇත. බහුරාජ්‍ය වලට යැවෙන නැව්බඩු එක්රැස් කිරීමෙන් රුපියල් මිලියන 94.2 උපයාගෙන ඇත. මීට අමතරව හිස් බහළු ගබඩා කිරීමේ කුළිය වශයෙන් රුපියල් මිලියන 5.6 ක ආදායමක් උපයාගෙන ඇත.

වසර තුළදී නිශ්කාෂණ ආයතනවලට නව බලපත්‍ර 82 ක් නිකුත් කර ඇති අතර බලපත්‍ර 817 ක් අළුත් කිරීමෙන් සමස්ථ බලපත්‍ර 899 ක් සඳහා රුපියල් මිලියන 11.8 ක ආදායමක් උපයා ගෙන ඇත. “ඒ” සහ “බී” වර්ගයේ වාප්පු ලිපිකරුවන්ට වාප්පු අනන්‍යතා පත්‍ර නිකුත් කිරීමෙන් සහ

අළුත් කිරීමෙන් රුපියල් මිලියන 5.3 ක මුදලක් එකතු කර ගෙන ඇත. වසර තුළ නිකුත් කරන ලද සහ අළුත්කරන ලද "ඒ" වර්ගයේ බලපත්‍ර සංඛ්‍යාව 1934 ක් ලෙස වාර්තා වී ඇති අතර "බී" වර්ගයේ බලපත්‍ර 287 ක් විය.

බහළු රැඳවුම් මධ්‍යස්ථාන අංක V (CFS V) දරණ ගුදම අළුත්වැඩියා කිරීම මඟින් බන්ධිත සහ අන්තරාළ නැව්බඩු සඳහා ගුදම් පහසුකම් වැඩි කරන ලද අතර බන්ධිත සහ අන්තරාළ වෙළඳාම සඳහා ඉල්ලුම වැඩි වූ අතර එමඟින් රුපියල් මිලියන 33.2 ක සම්පූර්ණ ආදායම ලබා ගෙන ඇත. මෙය 2010 දී උපයාගත් රුපියල් මිලියන 303.1 ක මුදල හා සැසඳීමේදී 2011 වසරේදී සේවා සැපයුම් කොට්ඨාශය විසින් ඉටු කරන ලද සේවාව තුළින් රුපියල් මිලියන 335.6 ක ආදායමක් උපයා ගෙන ඇත.

අතහැර දමන ලද නැව්බඩු ඉවත් කිරීම සඳහා ප්‍රසිද්ධ ටෙන්ඩර් මඟින් විකිණීමෙන් සහ වෙන්දේසි මඟින් රුපියල් මිලියන 101 ක සම්පූර්ණ මුදලක් එකතු කර ගෙන ඇති අතර සී/සී ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සේවා ආයතනය මඟින් අබලි යකඩ, භාවිතා කරන ලද තෙල් සහ පරණ ටයර් විකිණීමෙන් රුපියල් මිලියන 15 ක අතිරේක ආදායමක් උත්පාදනය කර ඇත. මීට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ඉවත් කරන ලද අතිරේක ද්‍රව්‍යන් ප්‍රසිද්ධ ටෙන්ඩර් මඟින් විකිණීමෙන් රුපියල් මිලියන 7.9 ක මුදලක් උපයා ගෙන ඇත. තවද, ඇතැම් පුද්ගලයන් වෙත පැවරූ නිශ්කාෂණය නොකළ භාණ්ඩ රාජසන්තක කිරීමෙන් රු. 845,000/= ක ආදායමක් ලබා ගෙන ඇත.

2011 වසර තුළදී භාණ්ඩ ලබා ගන්නන් විසින් වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අත්හැර දමන ලද කුළී වෙනුවෙන් ඉල්ලුම්පත්‍ර 53 ක් ලැබී තිබිණ. මෙයින් ඉල්ලුම්පත්‍ර 21 ක් නිර්දේශ කරන ලද අතර 3 ක් ප්‍රතික්ෂේප කරන ලදී. ඉතිරි ඉල්ලුම්පත් සම්බන්ධව වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් තීරණය කළ යුතුව ඇත.

සේවා සැපයුම් අංශය විසින් ඉටුකරනු ලබන සේවයේ ගුණාත්මක බව වර්ධනය කිරීමේ අරමුණින් අධිකාරිය ගණුදෙනුකරුවන්ට 2012 වසර තුළදී කාර්යක්ෂම හා ඵළදායී සේවාවක් සහතික කරනු වස් නේවිස් (NAVIS) නැව්බඩු බෙදා හැරීමේ මොඩියුල පද්ධතියක් හඳුන්වා දෙමින් පවතී. ඊට අමතරව අධිකාරියේ පාරිභෝගිකයන්ට ගුණාත්මක බවින් වැඩි සහ විශ්වාසදායී සේවයක් සැපයීම අරමුණු කර ගනිමින් සේවා සැපයුම් කොට්ඨාශයේ ක්‍රියාකරවන සහ ගුදම් කාර්යය මණ්ඩලයේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක දැනුම වර්ධනය කිරීම උදෙසා මහපොළ අභ්‍යාස ආයතනයේ ප්‍රධාන කළමනාකාර (සේවා සැපයුම්) විසින් වරාය සංවර්ධන වැඩ සටහන් මහපොළ අභ්‍යාස ආයතනයේදී පවත්වා ගෙන යන ලදී.

## නාවික

### නියමු සේවා

සමාලෝචිත වසර තුළදී කොළඹ වරායට පැමිණි සියලුම වර්ගවල යාත්‍රා සඳහා නිතිපතා අඛණ්ඩව නියමු සේවා සපයන ලදී.

| නෞකා වර්ගය | නෞකා සංඛ්‍යාව | පැමිණි කාර්යය | නෞකා සංඛ්‍යාව |
|---|---|---|---|
| බහළු | 3,187 | නැව් තෙල් සැපයීම | 65 |
| සාම්ප්‍රදායික | 68 | අළුත්වැඩියා | 30 |
| වියළි තොග | 202 | මගී නෞකා | 72 |
| තෙල් නැව් | 284 | වෙනත් | 22 |
| රෝල් ඔන් රෝල් ඔෆ් | 149 | | |
| වෙනත් | 45 | | |
| | | **එකතුව** | **4,124** |

**ප්‍රධාන ටග් යාත්‍රාපති අංශය**

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන ටග් යාත්‍රා අංශය යාත්‍රා නැංගුරම්ලෑම සහ යාත්‍රාකරණය සඳහා අඛණ්ඩ හා කාර්යක්ෂම ටග් සේවාවන් ලබාදීම මඟින් සාර්ථක මෙහෙවරක් ඉටු කරන ලදී. මෙම මෙහෙවරට අමතරව පහත සඳහන් වෙනත් කටයුතු ද ඉටු කරනු ලැබීය.

- ✱ ටග් යාත්‍රාවල තට්ටු (ඩෙක්) අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු ඉටු කිරීම
- ✱ නැව් බැඳ තැබීමට උපයෝගී කරගනු ලබන ඉවතලූ කඹ ආශ්‍රයෙන් ටග් යාත්‍රා සඳහා අවශ්‍ය ලණු පැදුරු නිෂ්පාදනය කිරීම සහ ටග් යාත්‍රාවන් සහ වෙනත් අංශයන් සඳහා කැන්වස් ආවරණ සෑදීමේ කටයුතු.

නෞකා හැසිරවීම සඳහා ටග් යාත්‍රා හතරක්, පහක් දෛනිකව ක්‍රියාත්මක වූ අතර හදිසි අවශ්‍යතාවයන් සඳහා ටග් යාත්‍රාවන් පොරොත්තු සේවයේ යොදවා ඇත.

**ටග් යාත්‍රා ආධාරයෙන් මෙහෙය වූ මුළු නෞකා ගණන**

නැංගුරම් ලෑමේ ටග් යාත්‍රා මඟින් ඉටුකළ සම්පූර්ණ මෙහෙයුම් ගණන වූ 12,563 හි සවිස්තර වාර්තාව පහත පරිදි වේ.

| ටග් යාත්‍රාවේ නම | එකතුව |
|---|---:|
| රාජා මෝටර් යාත්‍රාව | 672 |
| නන්දිමිත්‍ර මෝටර් යාත්‍රාව | 1,517 |
| සුරනිමල මෝටර් යාත්‍රාව | 3,408 |
| ගෝඨයිම්බර මෝටර් යාත්‍රාව | 2,945 |
| විජයබාහු මෝටර් යාත්‍රාව | 1,942 |
| බරණ -II මෝටර් යාත්‍රාව | 1,966 |
| වේළුසුමන මෝටර් යාත්‍රාව | 113 |

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිය ටග් යාත්‍රා ප්‍රධාන අළුත්වැඩියා කටයුතු සඳහා මුදාහැරීම පිණිස ටොන් 60 ක නව ඇදගෙන යාමේ ටග් යාත්‍රා දෙකක් කුළී පදනම මත ලබා ගන්නා ලදී. 2011 දෙසැම්බර් අග වන විට මෙම ටග් යාත්‍රා දෙක සම්පූර්ණ ගමන්වාර 3460 සඳහා යොදවා ඇත.

**පිටත වරායයන්හි නවතා ඇති ටග් යාත්‍රා**

**ත්‍රිකුණාමලය වරාය**

- ✱ මහසෙන් මෝටර් යාත්‍රාව
- ✱ නීලමහ මෝටර් යාත්‍රාව
- ✱ වසභ මෝටර් යාත්‍රාව (ශ්‍රී ලං නා හ සමඟ)
- ✱ නන්දිමිත්‍ර මෝටර් යාත්‍රාව (20BP)

**ගාල්ල වරාය**

ථෙරපුත්තාභය මෝටර් යාත්‍රාව

**කන්කසන්තුරය**

- ✱ කංචදේව මෝටර් යාත්‍රාව
- ✱ යීර මෝටර් යාත්‍රාව

**මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය**

* අවශ්‍ය අවස්ථාවලදී ගාලු වරායෙන් ලබාගත් ටග් යාත්‍රා යොදවන ලදී.

**පුහුණු කටයුතු**

මහපොළ අභ්‍යාස ආයතනයෙන් මෙහෙයවනු ලැබූ ගිනි නිවීම පිළිබඳ උසස් පාඨමාලාව, මූලික ගිනි නිවීමේ පාඨමාලාව, මූලික ප්‍රථමාධාර, පුද්ගල ආරක්ෂාව හා සමාජ වගකීම සහ පුද්ගල ජීවිතාරක්ෂණ ක්‍රමෝපායන් යන පාඨමාලා සඳහා නිළධාරීන් සහ සේවකයින් සහභාගී කර ඔවුන්ගේ දැනුම කුසලතා වර්ධනය කර ගැනීමට පෙළඹවීම.

**උපයන ලද ආදායම**

| | | |
|---|---|---|
| 2010 සත්‍ය ආදායම | - | රුපියල් මිලියන 308.822 |
| 2011 සංශෝධිත ආදායම | - | රුපියල් මිලියන 345.680 |
| 2012 ප්‍රක්ෂේපිත ආදායම | - | රුපියල් මිලියන 368.437 |

**ප්‍රධාන ඉංජිනේරු නිලධාරී අංශය**

**කාර්ය මණ්ඩලය**

2011 වර්ෂය තුළ සියළුම වර්ගයේ ටග් යාත්‍රා, ප්‍රදීපාගාර යාත්‍රා, නියමු සහ නැංගුරම්ලෑමේ යාත්‍රාවල මෙහෙයුම් හා අළුත්වැඩියා කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පවත්වා ගෙන යාම.

මෙම අංශයේ කාර්යය මණ්ඩලය විසින් සිදුකරනු ලබන සියළුම සාමාන්‍ය නඩත්තු කිරීම් කටයුතු වලට අමතරව දෛනිකව දියත් කිරීමට අවශ්‍ය යාත්‍රාවන් සඳහා නියමු සහ මෙහෙයුම් සේවා සැපයීම.

ඉංජිනේරු නිලධාරී අංශය ඉතාමත් උද්යෝගයෙන් යුතුව ටග් යාත්‍රාවල සියළුම නඩත්තු කිරීම් කටයුතු සිදුකරනු ලබන හෙයින් වැඩපලවල් සඳහා ආම්පන්න රැස් කිරීමට කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කොට ඇත.

**වරාය ගිනි නිවීමේ ඒකකය**

වරාය ගිනි නිවීම් ඒකකය 2011 වර්ෂය තුළ ගිනි සහ වෙනත් හදිසි අවස්ථාවලදී ඇති වන ආපදා තත්ත්වයන් අවම කරමින් හදිසි අවශ්‍යතා ආවරණය කිරීමට අමතරව අභ්‍යන්තරික වශයෙන් ගිනි ආරක්ෂණයන් ප්‍රමිතිගත කිරීමත් ක්‍රියාවේ යෙදවීමත් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගිනි නිවීම් ඒකකය සමුද්‍රතෙල් දූෂණය, අන්තරායකාරී නැව් බඩු ඉහිරීම් වැනි හදිසි අවස්ථාවන් වලදී වගකීමකින් යුතුව ක්‍රියාත්මක වන කණ්ඩායමකි.

වරාය ගිනි නිවීම් ඒකකය පහත සඳහන් අවස්ථා ද ඇතුළුව ලද ඇමතුම් 1800 කට පමණ සහභාගී වි ඇත.

| | |
|---|---|
| ගිනි නිවීම සඳහා ප්‍රතිචාර | 15 |
| නාවික හමුදා පෙරහුරු ඇමතුම් | 02 |
| හදිසි ඇමතුම් | 25 |
| තෙල් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 121 |
| ගෑස් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 23 |
| නැව්වල අධිතාප වැඩ සඳහා පොරොත්තු රාජකාරි | 1,486 |

| | |
|---|---|
| අන්තරාදායක නැව්බඩු මෙහෙයවීමේදී පොරොත්තු රාජකාරි | 03 |
| අන්තරාදායක නැව්බඩු සඳහා පොරොත්තු රාජකාරි | 27 |
| පාලම්/ගුදම් යනාදිය සේදීම | 56 |
| ජලය පිටතට පොම්ප කිරීම | 33 |
| තෙල් දූෂණය පාලනය කිරීමේ කාර්යයන් | 02 |
| තෙල් නැව් පරීක්ෂාවට යාම | 807 |
| ඉතා වැදගත් පුද්ගල පැමිණීම වෙනුවෙන් පොරොත්තු සේවය | 01 |

**ගිනි ආරක්ෂණ ක්‍රියාකාරම්**

ගාල්ල, ත්‍රිකුණාමලය සහ මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම ගොඩනැගිලි/දොඹකර/පාවෙන යාත්‍රාවල ගිනි ආරක්ෂණ පරීක්ෂා කිරීම් සිදු කරන ලදී.

2011 පරීක්ෂා කළ මුළු ගිනි නිවීම් උපකරණ ගණන 3,773

**පුහුණු කටයුතු**

| | |
|---|---|
| කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩමුළු | 26 |
| පිටස්තරයන් දැනුවත් කිරීමේ සංචාරයන් | 04 |
| කොක්සන්වරු පුහුණු කිරීමේ පාඨමාලාව | 04 |
| නැව් තට්ටු ආවේක්ෂණ කටයුතු පුහුණුවන්නන් සඳහා ගිනි නිවීම් පුහුණුව | 03 |
| ගිනි නිවීමේ ඒකකයේ කාර්යාා මණ්ඩලය සඳහා නැවත මතක් කිරීමේ ගිනි පුහුණුව | 06 |

ලංකා ඛණිජ තෙල් ගබඩා පර්යන්තය, කොලඹ නැව් තටාකාංගනය හා කොළඹ විදුලි ජනක යන්ත්‍රයන්හි ගිණි නිවීමේ ඒකකයන් සමඟ (Colombo Power Plant) ඒකාබද්ධව ගිනි නිවීමේ අභ්‍යාසයන් සිදු කිරීම.

**ආදායම**

2011වර්ෂය තුළ වරාය ගිනි නිවීම ඒකකය උපයන ලද ආදායම

| විස්තරය | ඇ.ඩො. | රුපියල් |
|---|---|---|
| ගිනි නිවීම් සඳහා කැඳවීම | 2,550 | |
| තෙල් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 176,762 | |
| ගෑස් නැව් සඳහා පොරොත්තු රාජකාරි | 26,060 | |
| අධිතාප වැඩ සඳහා පොරොත්තු රාජකාරි | 28,938 | |
| අන්තරාදායක නැව් බඩු සඳහා පොරොත්තු රාජකාරි | 8,300 | |
| පුහුණු කටයුතු සඳහා අයකිරීම් | 119 | |
| පරීක්ෂණ චාරිකා සඳහා අයකිරීම් | 8,700 | |
| තෙල් දූෂණ වැලැක්වීම සඳහා අයකිරීම් | | 375,000 |
| **මුළු ආදායම** | **251,429** | **375,000** |

මුළු ආදායම රුපියල් 28,535,048/-

**වරාය නිරාපද අංශය**

වරාය නිරාපද අංශයෙන් වරාය තුළ සියළුම වර්ගයේ අන්තරාදයක නැව් බඩු මෙහෙයවීම සහ එහි ආරක්ෂණ තත්ත්වයන් නිරන්තරව නිරීක්ෂණයට ලක් කිරීම.

රසායන ද්‍රව්‍ය ඉහිරීයාමේ සහ ගිනි ගැනීමේ සිද්ධීන් කිහිපයක් වරාය ගිනි නිවීම් ඒකකයේ සහයෝගයෙන් පාලනය කිරීම. එමෙන්ම අනතුරුදායක නැව් බඩු සහිත ගුදම් ඇතුළුව ගුදම් පරීක්ෂා කිරීම සහ බහළු පරීක්ෂා කිරීමේ කටයුතු ද වරින් වර කර ගෙන යනු ලැබීය.

වරාය තුළ අවසරලත් අධිතාප වැඩ කටයුතුවලට අමතර අනවසර අධිතාප වැඩ කටයුතු අනාවරණය කර ගැනීම හා නවතා දැමීම සම්බන්ධ පරීක්ෂාවන් සිදු කෙරිණ. තවද සමුද්‍ර දූෂණ සම්බන්ධයෙන් ද පරීක්ෂාවන් සිදුකිරීමට අමතරව සේවක මණ්ඩල හා නාවික කටයුතු සම්බන්ධයෙන් ද හදිසි අනතුරු විභාග කොට විශ්ලේෂණය කරන ලදී.

✱ 2011 වසර තුළ කොළඹ වරායේදී මෙ.ටො. 280,256.825 ක අන්තරාදායක නැව් බඩු මෙහෙයවීම් සිදුකර ඇත.

✱ අනතුරුදායක ප්‍රති අපනයන නැව් බඩු ප්‍රවාහනය කරන බහළු 29,053 ක් මෙහෙයවීම.

✱ ක්‍රියාකරවන කොට්ඨාශයේ සේවකයින් සඳහා වරාය තුළ අන්තරාදායක නැව් බඩු මෙහෙයවීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ ඊට අදාළ ආරක්ෂක පිළිවෙත් සම්බන්ධයෙන් දේශන මාලාවක් හඳුන්වාදීම.

✱ අධි පුපුරණ ද්‍රව්‍ය මෙ.ටො. 142,813 (GPIE) හා පුපුරණ ස්වභාවයේ ද්‍රව්‍ය මෙ.ටො. 9,652.693 (GP IAE/IIE) මෙහෙයුම් කර තිබේ.

✱ ජයබහළු පර්යන්තයේ සේවකයින්ගේ පෞද්ගලික ආරක්ෂාව සහ නාවික කොට්ඨාශයට අනුයුක්ත නැව් කම්කරුවන් පුද්ගල ආරක්ෂණ උපකරණ භාවිතා කිරීම සම්බන්ධ කටයුතු සහකාර වරාය ආරක්ෂක පරීක්ෂකයින්ගේ සහාය ඇතිව ඉටු කිරීම.

තෙල් නැව් 215 ක් කොළඹ වරායට පැමිණි අතර පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් ඛණිජ තෙල් වර්ග මුදාහරින ලදී.

| නැව් භාණ්ඩ වර්ගය | ප්‍රමාණය මෙ.ටො. |
|---|---:|
| ද්‍රව පෙට්‍රෝලියම් වායු | 183,038.118 |
| ගෑස් ඔයිල්/ජෙට් AI/ගැසොලින්/භූමිතෙල් | 2,338,191.164 |
| බොර තෙල් | 1,256,861.943 |
| ඉන්ධන | 725,768.280 |
| බේස් තෙල් | 22,628.199 |

**වෙරළ ප්‍රදීපාගාර අංශය**

ජාත්‍යන්තර නෞකා මාර්ගය හරහා බස්නාහිර සහ දකුණු වෙරළ තීරය දිගේ පිහිටුවා ඇති ප්‍රදීපාගාරයන් නිසි පරිදි නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සිදු කරන ලදී.

### ප්‍රවේශ ඇළ මාර්ගයන්හි ස්ථාපිත ආලෝක බෝයාවන්

ආලෝක බෝයාවන් නිරන්තර පරීක්ෂා කොට නඩත්තු කිරීම් සිදු කරන ලදී. කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හා ඒකාබද්ධව කොළඹ වරායේ නිරිත දිගින් පිහිටි ප්‍රධාන ඇළ මාර්ගයේ නිරන්තර වෙනස් කිරීම සඳහා හැරීම් සහ මුහුද යටින් දිවෙන ඉන්ධන නල තැන්පත් කිරීමේ වැඩ කටයුතු සඳහා ද විශේෂ පහසුකම් සලසා දී ඇත. තවද නාවිකයින් නිරන්තරයෙන්ම CASA, SLAVO, LASO සහ එක්සත් රාජධානියේ ජල ශාස්ත්‍රීය කොට්ඨාශය වෙතින් ලැබෙන චක්‍රලේඛ ප්‍රකාරව නිසි පරිදි අවවාද කිරීම ද කරනු ලැබේ.

### උත්පාදිත ආදායම 2010/2011 ප්‍රදීපාගාර ගාස්තු

රු. මිලියන

| | 2009 | 2010 | 2011 ඇස්තමේන්තුගත | 2011 ප්‍රතික්ෂේපිත |
|---|---|---|---|---|
| ඒකාබද්ධ | 299.39 | 534.93 | 511.761 | 545.573 |

### වරාය යාත්‍රා අංශය

වරාය යාත්‍රා අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ කොළඹ වරායට පැමිණෙන යාත්‍රා සඳහා නියමු යාත්‍රා, නැංගුරම්ලෑමේ යාත්‍රා, නැංගුරම්ලෑමේ කණ්ඩායම් සැපයීම සහ සේවා පහසුකම් සැලසීමත්ය. මීට අමතරව විවිධ වැඩ කණ්ඩායම්, දූපත් දියකඩන හා නිරිත දිග දියකඩන වෙත ප්‍රවාහනය කිරීමත්, වරාය තුළ ජලය පිරිසිදුව තබා ගැනීමත්, ජීරාෆ් දියත් දොඹකර ආධාරයෙන් බර වැඩි එසවුම් මෙහෙයවීමත් සිදු කෙරේ.

මහපොළ අභ්‍යාස ආයතනය විසින් පවත්වනු ලබන විවිධ වැඩ සටහන් වලට සහභාගී වී නිපුණතා සහ දැනුම දියුණුකර ගැනීම සඳහා බෝට්ටු කාර්යය මණ්ඩලය උනන්දු කරවන ලදී.

### ජල ගුණවිද්‍යා සමීක්ෂණ අංශය

ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි සමීක්ෂකයින් සියලුම වරායන්හි ඉඩම් සහ ජල ගුණවිද්‍යා සමීක්ෂණ කටයුතුවල නිරත වූහ.

- පිවිසුම් දියත් මගෙහි ගැඹුර මැනුම් කටයුතු
- කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ගැඹුර මැනුම් කටයුතු
- ප්‍රධාන පිවිසුමේ ගැඹුර මැනුම් කටයුතු
- ඇතුළත වරාය ද්‍රෝණියේ සහ නැංගුරම්පළ වල ගැඹුර මැනුම් කටයුතු
- කොළඹ වරාය සිතියම් සංශෝධනය කිරීමේ කටයුතු
- මෙහෙයුම් ස්ථාන පරීක්ෂණය (අඛණ්ඩව)
- බ්ලූමැන්ඩල් සමීක්ෂණ (CPILD)
- වරාය අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සමීක්ෂණය සහ තලමිතිකරණය
- බහළු අංගන (ජයබහළු 4) පුළුල් කිරීම සහ එහි සමීක්ෂණ කටයුතු
- ජයබහළු පර්යන්ත 1-4 දක්වා නැවත පිලී ඇතිරිමේ ව්‍යාපෘතිය
- පැලියගොඩ දත්ත සමීක්ෂණය

### ගාල්ල වරාය

- ඇතුළත වරාය හා පිවිසුම් දියත් මගෙහි ජල ගුණවිද්‍යා සමීක්ෂණය
- සැහැල්ලු රුවල් යාත්‍රා ව්‍යාපෘතියේ මාර්ග තලමිතිකරණය
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ රුමස්සල ප්‍රදේශයේ සීමා මායිම්ගත කිරීම
- ගාලු සැලැස්ම යාවත්කාලීන කිරීම
- පවරා ගැනීම සඳහා ඉඩම් සමීක්ෂණය

**ත්‍රිකුණාමලය වරාය**

- ✱ අනවසරයෙන් අත්කරගත් ඉඩම් මැනීම
- ✱ වරාය ඉඩම්වල පරීක්ෂණ කටයුතු

**මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය**

- ✱ මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ මැනීමේ සහ නැවත පදිංචි කිරීම සඳහා වූ ප්‍රදේශයේ ඉල්ලුම්කරුවන්ගේ කොටස්වල සීමා නියම කිරීම
- ✱ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ අදියර II හි, ටාගට් පාර, ආරා බොක්ක පාර, සූරියවැව පාර, මහවැලි ප්‍රදේශය සහ පෞද්ගලික ඉඩම් පවරා ගැනීමේ මැනුම් කටයුතු
- ✱ රජයේ මිනින්දෝරු අංශයේ අධීක්ෂණය යටතේ සමීක්ෂණයන් 6 ක් නිම කිරීම (ආසන්න වශයෙන් කැබලි 500)
- ✱ පාරිසරික විශ්ලේෂණය සඳහා දියකඩනය හා වෙරළ සීමාව අතර බටහිර දෙසට කි.මී.1.5 හා නැගෙනහිර වෙරළ තීරය දක්වා වෙරළ මිනුම් කටයුතු (මසකට දෙවරක්)
- ✱ යෝජිත පරිපාලන ගොඩනැගිල්ලේ සිරස් හා තිරස් සීමා පරීක්ෂා කිරීම
- ✱ සූරියවැව, මීගහජඳුර යෝජිත ජාත්‍යන්තර ක්‍රීඩාංගනය සඳහා සිරස් හා තිරස් සීමා පරීක්ෂා කිරීම
- ✱ අගෝස්තු සහ නොවැම්බර් මස යෙදුණු විවෘත කිරීමේ නිල උත්සවය වෙනුවෙන් කටයුතු පිළියෙළ කිරීම.
- ✱ ස්මාරකය සඳහා කටයුතු සකස් කිරීම
- ✱ රජයේ ගොඩනැගිලි වැඩ බිම සඳහා කටයුතු සකස් කිරීම.
- ✱ ආයෝජකයන්ගේ ඉඩම් සහ මාර්ග ජාලය සඳහා කටයුතු සකස් කිරීම
- ✱ ගොඩනැගිලි සහ ටැංකි වෙනුවෙන් පිහිටීම සහ ඉඩම් උස් කිරීමේ දත්ත පරීක්ෂා කිරීම
- ✱ බෝයාවන් වල පිහිටීම ලකුණු කිරීම හා ප්‍රධාන නැංගුරම්පල පිවිසුම් ඇල මාර්ගයෙහි ජල ගුණවිද්‍යා සමීක්ෂණය
- ✱ අදියර 1 හි දැනට ඉදිකර ඇති ප්‍රදේශයේ තෙල් ටැංකි අවට පාලන පද්ධතිය යළි ප්‍රතිස්ථාපනය කිරීම, පරිපාලන සංකීර්ණය සහ දියකඩනය

**නාවික අංශය**

මෙම අංශයෙන් නැව් සේවා සපයන්නන්, යාත්‍රා ක්‍රියාකරවන්නන්, නාවික සමීක්ෂකයන්, සුළු හා මහා පරිමාණ අළුත්වැඩියා වැඩබිම්, තෙල්, තෙල් මිශ්‍රිත ජලය සහ අපවිත්‍ර ඉවත් කිරීමේ සේවාවන් සඳහා වාර්ෂික ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

ඉපැයූ ආදායම 2011

| බලපත්‍රයේ නම | නිකුත් කළ ගණන | ආදායම |
|---|---|---|
| නැව් අළුත්වැඩියා බලපත්‍ර | 119 | 3,068,703 |
| නැව් තටාකාංගන බලපත්‍ර | 73 | 1,151,085 |
| සමීක්ෂණ බලපත්‍ර | 39 | 695,130 |
| නැව් සේවා සැපයුම් බලපත්‍ර | 76 | 2,529,817 |
| බෝට්ටු බලපත්‍ර | 33 | 876,784 |
| | එකතුව | 8,321,519 |

## සැලසුම් හා සංවර්ධන

### කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (CPEP)

ජාත්‍යන්තර නාවුක කර්මාන්තයේ වර්ධනය වන සේවා ඉල්ලුම සැපයීම සඳහා කොළඹ වරාය පුළුල් කිරීම ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන ඇත. කොළඹ වරාය සම්බන්ධව වඩාත් විස්තරාත්මක අධ්‍යයනයක් කිරීමෙන් අනතුරුව යෝජිත කොළඹ දකුණු වරාය සංවර්ධනය කිරීමේ අත්‍යවශ්‍යතාවය හඳුනාගන්නා ලදි. මෙම සමස්ථ වරාය ව්‍යාපෘතිය “කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය” (CPEP) වශයෙන් නම් කර ඇති අතර එය පහත සඳහන් අදියර දෙකකින් සමන්විත වේ.

1. දියකඩනය ඉදිකිරීම, නව වරාය ද්‍රෝණිය සහ නාවික ඇළ මාර්ගය හැරීම සහ බොර තෙල් නළ නැවත එළීම යන අංගවලින් සමන්විත වරාය යටිතල පහසුකම් පිළිබඳ කටයුතු.

2. පර්යන්ත සහ අදාල ආශ්‍රිත සේවා ඉදිකිරීම.

### වරාය යටිතල කාර්යයන්

සමස්ථ ඇස්තමේන්තුගත ඉදිකිරීම් පිරිවැය ඇ.ඩො.මි. 330 ක් සහිතව වරාය යටිතල පහසුකම් ඉදිකිරීම් කටයුතු සඳහා මුල පුරන ලදී. යටිතල පහසුකම් පිළිබඳ ව්‍යාපෘතියේ මූල්‍ය දායකත්වය ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඒකාබද්ධව දරනු ලැබේ. මුළු පිරිවැයෙන් 81.7 % ට සමාන ඇ. ඩො. මි. 300 ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් දරනු ලබන අතර ඉතිරි 18.3% සඳහා මූල්‍ය දායකත්වය දරනු ලබන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසිනි.

කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2008 අප්‍රේල් 11 වැනි දින නිල වශයෙන් ආරම්භ කරන ලද අතර මාස 48 ක් තුල නිම කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු වන්නේ සී/ස හුන්ඩායි ඉංජිනේරු ඉදිකිරීම් සමාගමයි. උපදේශක වශයෙන් කටයුතු කරන්නේ සී/ස ස්කොට් විල්සන් ආයතනයයි.

### 2011 දෙසැම්බර් මාසය වන විට කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය

මෙම ව්‍යාපෘතියේ මුළු මහත් භෞතික ප්‍රගතිය 83% ක් ලෙස තක්සේරු කර ඇති අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ මූල්‍ය ප්‍රගතිය 89% ලෙස තක්සේරු කර ඇත.

### දියකඩනයන්

### ප්‍රධාන දියකඩනය (දිග කි.මී. 5.14)

* ප්‍රධාන දියකඩනයන් සහ කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩබිම් ප්‍රදේශය ගොඩකිරීම.

* ගොඩකිරීම් පරිමාව : ඝණ මීටර් 18.42 න් ඝණ මීටර් 17.65 ක්

ප්‍රධාන දියකඩනය ඉදිකිරීම (සාමාන්‍ය බාදිය ප්‍රවාහ මට්ටම (LWOST) මීටර් + 3.5 දක්වා සහ සාමාන්‍ය බාදිය ප්‍රවාහ මට්ටම මීටර් + 5 දක්වා)

* ගල් පිරවුම් මට්ටම - මීටර් 5120
* ද්වීතික ආමර් යෙදීම - මීටර් 5090
* ප්‍රාථමික ආමර් (Core Locs) යෙදීම - මීටර් 4810 (ප්‍රමාණය)
* කොන්ක්‍රීට් ආමර් නිෂ්පාදනය
    - ඒකක 31,655 න් ඒකක 29,318

**පත්ලේ ස්ථරය යෙදීම සහ භූ සළු (Geo Textile) එළීම**

* සාමාන්‍ය බාදිය ප්‍රවාහ මට්ටම මීටර් + 0 දක්වා : මීටර් 4860
* සාමාන්‍ය බාදිය ප්‍රවාහ මට්ටම මීටර් + 0 ඉහළට : මීටර් 4790

**රළ බැම්ම ඉදිකිරීම**

* රළ බැම්මේ පළමු එසවීම (මීටර් 1520 ප්‍රමාණයේ සිට ඉදිරියට) : 4550 (83.7%)
* රළ බැම්මේ දෙවන එසවීම (මීටර් 1520 ප්‍රමාණයේ සිට ඉදිරියට) : 4170 (73.2%)
* අවසාන එසවුම : 4000 (68.51%)

ද්වීතික දියකඩනය (දිග කි.මී. 1,094) - රළ බැම්ම දිග මීටර් 100 ක කොටසක් සම්පූර්ණ කර ඇති අතර දෙවන ජැටිය දිග මීටර් 80 ක් සම්පූර්ණ කර ඇත. සමස්ථ ප්‍රගතිය 58% කි.

**හැරීම් සහ ගොඩකිරීම්**

හැරීමේ කටයුතු දැනට කෙරී ගෙන යන අතර ඇළ ප්‍රවේශ මාර්ගයේ හාරන ද්‍රව්‍ය ඝණ මීටර් මිලියන 9.67 ක් ඉවත් කර ඇත. සම්පූර්ණ ඇළ මාර්ග හැරීමේ කටයුතු අවසන් කිරීම සඳහා සාමාන්‍යයෙන් ඝණ මීටර් 450,000 ඉවත් කළ යුතු වේ.

**කලුගල් සැපයීම**

කළුතර දිස්ත්‍රික්කයේ වාද්දුවේ පිහිටි කුඩා වරායේ සිට මෙම කලුගල් මුහුදු මඟින් ප්‍රවාහනය කිරීම යහපත් කාලගුණික තත්ත්වයක් පවතින අවස්ථාවලදී සාර්ථක ලෙස කරගෙන යනු ලැබූ අතර සම්පූර්ණ අවශ්‍යතාවය වන ඝ.මී.මිලියන 5.2 න් ඝන මී.මිලියන 4.86 ප්‍රමාණයක කළුගල් මෙතෙක් කොළඹට ප්‍රවාහනය කර ඇත.

**මුහුද යටින් දිවෙන බොරතෙල් නළ**

මුහුද යටින් දිවෙන බොරතෙල් නළ වරාය ප්‍රවේශ මාර්ගයේ නොගැඹුරු මුහුද හරහා ඒක ලක්ෂිත බෝයාව දක්වා දිව යයි. අලුත් නළ එළීම මුහුදු මටටමේ සිට මීටර් -26 ක් දක්වා සාර්ථකව සම්පූර්ණ කර ඇත. අතහැර දමන ලද පැරණි නළ ඉවත් කිරීම 100% ක් සම්පූර්ණ කර ඇත. ගොඩබිමට සම්බන්ධ නළ පිළිබඳ ආරක්ෂක කටයුතු සම්පූර්ණ කර ඇත.

**ගොඩනැගිලි**

පාලන කුළුණු ගොඩනැගිල්ල - මීටර් 26 ක උසකට සම්පූර්ණ කර ඇත.
නැව් කාර්යය මණ්ඩල පහසුකම් සැලසීමේ ගොඩනැගිල්ල - බිම් මට්ටමේ කොන්ක්‍රීට් තලාද සහ කොන්ක්‍රීට් තට්ටු සම්පූර්ණ කර ඇත.

**අභ්‍යන්තර මාර්ග**

සාමාන්‍යයෙන් කි.මී. 4.0 ක දිගින් යුත් අභ්‍යන්තර මාර්ග අංක 6, 4 සහ 2 යන පටු මාවත් සංවර්ධනය කිරීමේ කටයුතු වලින් සමන්විත වේ. (පටු මාවත පළල මීටර් 3.7 කි) දැනට පාරවල් සහ පොදු පහසුකම් සම්බන්ධ වැඩ වලින් 53% ක් සපුරා ඇත.

සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය - 2012 අප්‍රේල් 10

**දකුණු බහළු පර්යන්තය (SCT)**

| | | |
|---|---|---|
| නැංගුරම්පල | - | 03 (සමස්ථ දිග මීටර් 1200) |
| ගැඹුර | - | මීටර් 18 |
| ධාරිතාවය | - | වි.ස.ඒ. මිලියන 2.4 |
| ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය | - | ඇ.ඩො.මි. 500 |
| ගිවිසුම අත්සන් කිරීම ( BOT ) | - | 2011 අගෝස්තු 12 |
| ක්‍රියාත්මක වන දිනය | - | 2011 දෙසැම්බර් 01 |
| මෙහෙයුම් කිරීමට බලාපොරොත්තු වන වසර | - | 2014 මැයි |

දකුණු බහළු පර්යන්තය නමින් (SCT) හැඳින්වෙන දකුණු කොළඹ වරායේ පළමු පර්යන්තය, සී/ස චයිනා මර්චන්ට්ස් හෝල්ඩිංග්ස් ජාත්‍යන්තර සමාගම, එයිට්කන් ස්පෙන්ස් (පී එල් සී) සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය හවුල්කරුවන් වන්නා වූ සී/ස කොළඹ ජාත්‍යන්තර බහළු පර්යන්ත ආයතනය විසින් (C I C T) ඉදිකොට මෙහෙයුම් කරනු ලැබේ. පර්යන්තයේ පළමු මීටර් 600, 2014 මැයි මාසය වන විට මෙහෙයුම් සඳහා විවෘත කිරීමට සැළසුම් කර ඇති අතර සම්පූර්ණ පර්යන්තය 2016 දෙසැම්බර් මාසය වන විට නිම කිරීමට අපේක්ෂිතය. ඉදිකොට, මෙහෙයුම්කර, භාරදීමේ (BOT) සහනදායි කාලපරිච්ඡේදය වන වසර 35 අවසානයේදී පර්යන්ත යටිතල පහසුකම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත භාරදෙනු ඇත.

**වත්මන් ප්‍රගතිය**

* ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ CICT සමාගම අතර BOT ගිවසුම 2011.08.12 දින චීනයේදී අත්සන් කරන ලදි.
* ස්ථානීය පරීක්ෂා කිරීමේ කටයුතු නිම කර ඇත.
* චීනයේ සී/ස AECOM ආයතනය ව්‍යාපෘතියේ උපදේශක වශයෙන් පත්කර ඇත.
* ස්ථානීය බදු ගිවිසුම, කොටස්කරුවන්ගේ ගිවිසුම සහ ආධාර දෙන්නන්ගේ ඍජු ගිවිසුම අත්සන් කිරීම ඇතුළුව ගිවිසුමේ සඳහන් කර ඇති සියලු කොන්දේසි 2011 නොවැම්බර් 09 වන විට සපුරා ඇත
* මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සිවිල් කොන්ත්‍රාත්කරු ලෙස සී/ස චයිනා හාබර් ඉංජිනේරු සමාගම පත්කර ඇත.
* අගාද මාන (Bathy metric) සමීක්ෂණ සම්පූර්ණ කර ඇත.
* 2011 දෙසැම්බර් 16 වන දින අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ඉදිකිරීම් කටයුතු උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.
* හෑරීමේ සහ ගොඩකිරීමේ කටයුතු කෙරෙමින් පවතී.

**නැගෙනහිර බහළු පර්යන්තය (ECT)**

ගෝලීය මූල්‍ය අර්බුදය හමුවේ පවා කොළඹ වරාය මුලින් අදහස් කළ ප්‍රක්ෂේපනයන්ට වඩා ඉදිරියට ගොස් ඇත. කොළඹ වරාය සංවර්ධනය පිළිබඳ මෑතදී නිකුත් කරන ලද ක්‍රමෝපාය වාර්තාවේ කොළඹ වරාය දකුණු බහළු පර්යන්තය ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව පවා වරායේ ධාරිතාවය අඩුවීමකට මුහුණ දීමට සිදුවන බව අවධාරණය කර ඇත. තවදුරටත් විශාල බහලු රැගත් යාත්‍රා නැංගුරම්ලෑමේදී කොළඹ වරාය අභියෝග වලට මුහුණ දෙනු ඇත. එබැවින් දකුණු බහළු පර්යන්තයට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එවැනි විශාල යාත්‍රා සඳහා නැංගුරම්පලක් හැකි ඉක්මණින් ඉදිකිරීමේ හදිසි අවශ්‍යතාවයක ඉල්ලුමක් පවතී.

මේ අතර දැනට කොළඹ වරායට පැමිණිය නොහැකි වැඩි ගැඹුරක් අවශ්‍ය විශාල යාත්‍රා පැමිණිය හැකි පහසුකම් මෙන්ම වර්ධනය පවත්වාගෙන යාමට අවශ්‍ය පෝෂක සේවා තුලින් ලෝකයේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ආර්ථික මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීමත් ඉන්දියානු සාගරයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමත් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඉතා වැදගත්වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ණය බැදීම් ගෙවීම වෙනුවෙන් ආදායම් මාර්ග පවත්වාගෙන යාමට මෙයින් පහසුකම් සැලසේ.

ඉහත සඳහන් කරුණු සලකා බලා රජය සතු වරාය මෙහෙයවන්නෙකු ලෙස ජාතික උන්නතිය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට පැවරී ඇති වගකීම ඉටුකිරීමෙහිලා විශාලත්වයෙන් යුත් බහළු ප්‍රවාහන යාත්රා සහ ඒ වෙනුවෙන් සීමිත අංගන පහසුකම් සැළසෙන පරිදි මීටර් 400 ක දිගින් යුත් ජැටි බැම්මක් නැගෙනහිර බහළු පර්යන්තය සඳහා ඉදිකිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සැළසුම්කර ගෙන යනු ලැබේ.

2013 ප්‍රථම භාගය වන විට නැගෙනහිර බහළු පර්යන්තයේ මෙම සීමිත සංවර්ධන කටයුතු නිම කිරීමට සැළසුම් කර ඇත. මෑතදී කරන ලද ඉල්ලුම් පුරෝකථනයට අනුව නැගෙනහිර බහලු පර්යන්තය 2020 වන විට සම්පූර්ණ කළ යුතුය.

බටහිර බහලු පර්යන්තය (WCT) 2024 වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. කෙසේ වෙතත් ඉල්ලුම් පුරෝකථනය පදනම් කොට ගෙන මෙම තීරණය ඇගයීමට භාජනය කළ යුතුය.

**ත්‍රිකුණාමලය වරාය සංවර්ධන ව්‍යාපෘතිය**

**හැඳින්වීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ත්‍රිකුණාමලය වරාය නැවත සංවර්ධනය සහ පුළුල් කිරීම එහි වරාය සංවර්ධන ප්‍රතිපත්තියේ එළිදක්වා ඇත. ආර්ථික මධ්‍යස්ථානයක් සහ සම්පත් මධ්‍යස්ථානයක් ලෙස ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාතේ නාගරික වර්ධන මධ්‍යස්ථානයක් වශයෙන් එය නැවත සංවර්ධනය කිරීමට නියමිතය. මෙම මධ්‍යස්ථානය කොළඹ නගරයට ප්‍රති චුම්බක ප්‍රවේශයක් ලෙස කටයුතු කරනු ඇත.

"කාර්මික කලාපය" යන තේමාව යටතේ වරාය භූමි සංවර්ධනය සිදුවනු ඇත. කාර්මික කලාපය සඳහා හඳුනාගත් සමස්ථ ඉඩම් ප්‍රදේශය අක්කර 3000 කි. මෙම ප්‍රදේශය මාර්ග සහ දුම්රිය මාර්ග වලින් සම්බන්ධ වන අතර වරාය ආශ්‍රිත කර්මාන්ත, ආනයන අපනයන කටයුතු, කර්මාන්ත සංවර්ධන කටයුතු සහ නැව් තැනීම, නැව් අලුත්වැඩියා කිරීමේ කටයුතු ආදිය මෙන්ම සංචාරක සහ කෘෂිකර්මය ද ඇතුළුව විවිධ කර්මාන්ත සංවර්ධනය කිරීමට හැකියාවක් පවතී.

**වර්තමාන ප්‍රගතිය**

මේ වන විට කර්මාන්ත කලාපය සඳහා යෝජනා කැඳවීම් පිළියෙල කර, හැකියාවක් සහිත ආයෝජකයින් වෙත නිකුත් කිරීමට නියමිතව ඇත. යටිතල පහසුකම් සංවර්ධනය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වියදමින් සිදු කිරීමට නියමිත අතර 2011 අයවැය අනුව වෙන් කල මුදල රුපියල් මිලියන 60 කි.

**යෝජිත කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය**

**හැඳින්වීම**

කොළඹ වරායට යාබදව යෝජිත වරාය නගරය ඉදිකිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සැළකිල්ලට භාජනය කර ඇත. යෝජිත වරාය නගරය සුඛෝපභෝගි හෝටල්, නිවාස සංකීර්ණ, වෙළඳ සංකීර්ණ, පෞද්ගලික අංශ සඳහා නවීන කාර්යාල ඉඩ පහසුකම්, සැහැල්ලු රුවල් යාත්‍රාංගන මෝටර් රථ ධාවන පථ වැනි නිදහසේ සහ විනෝදයෙන් ගත කිරීමට හැකි ස්ථානයන් ගෙන් සමන්විත වනු ඇත.

**ව්‍යාපෘති සාරාංශය**

**අදියර I**

- ✱ දියකඩනය ඉදිකිරීම
- ✱ හෙක්ටයාර 200 ක් ගොඩ කිරීම.
- ✱ මාර්ග ජාලය,ජල සැපයුම, අපද්‍රව්‍ය පද්ධතිය, විදුලිය, සංනිවේදනය සහ දත්ත සම්බන්ධතා වැනි යටිතල පහසුකම් සැපයීම
- ✱ ව්‍යාපෘති කාලය : වසර 3 කි
- ✱ ව්‍යාපෘති පිරිවැය : ඇමරිකානු ඩොලර් මිලියන 700 (සාමාන්‍යයෙන්)

**අදියර II**

මහල් ගණනාවකින් යුත් නවීන කාර්යාල ඉඩකඩ, පදිංචිය සඳහා ගොඩනැගිලි, හෝටල්, සාප්පු සංකීර්ණ, ආපන ශාලා සහ විනෝදවීමේ සැහැල්ලු රුවල් යාත්‍රා සඳහා පහසුකම්, මෝටර් රථ ධාවන පථ වැණි විවේකී/ විනෝදාත්මක පහසුකම් ඇතුළුව ගොඩකරන ලද ඉඩම් සංවර්ධනය කිරීම.

**වර්තමාන කටයුතු**

ව්‍යාපෘතිය කරගෙන යාම සඳහා මුලික තාක්ෂණික ශක්‍යතා අධ්‍යයනය මොරටුව විශ්ව විද්‍යාලය විසින් ආරම්භ කර ඇති අතර ගොඩ කරන ලද ඉඩම් සඳහා නිර්දේශ කරන ලද සැලැස්මක් ඉදිරිපත් කරන ලදී. තවද පාරිසරික බලපෑම් තක්සේරු (EIA) අධ්‍යයනය මොරටුව විශ්ව විද්‍යාලය විසින් සම්පුර්ණ කර ඇත. මෙම පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර කොන්දේසිවලට යටත්ව ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලැබිණ.

තමන්ගේම අරමුදල් යොදා ගොඩකරන ලද ඉඩම් වල ඉදිකිරීම් කටයුතු කිරීම සඳහා ආයෝජකයකු විසින් මෙම ව්‍යාපෘතිය උදෙසා ස්වකැමැත්තෙන්ම යෝජනාවක් ඉදිරිපත් කරන ලදි. බැදීම් වලින් තොර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර සමාලෝචන කමිටුවක් ( SCARC ) විසින් එම යෝජනාව සමාලෝචනය කරන ලද අතර මේ සඳහා විස්තරාත්මක යෝජනාවක් කැඳවීමට තීරණය කරන ලදී.

සාමාන්‍යයෙන් අක්කර 500 ක් පමණ වු භූමියක් නිර්මාණය කිරීම උදෙසා ඝණමීටර් මිලියන 30 ක් පමණ වැලි තොගයක් අවශ්‍ය වන අතර, මෙම වැලි තොගය ගැඹුරු මුහුදේ මුහුදු පත්ලෙන් හාරාගත යුතුවේ. භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය විසින් මෙම කර්තව්‍යය අරභයා මුහුදේ කොටසක් වෙන්කර දී ඇති අතර වැලි ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස අවශ්‍ය අධ්‍යයන කටයුතු කරගෙන යනු ලැබේ.

මීට අමතරව යෝජිත ස්ථානය සඳහා නිශ්කාශණ වාර්තාවක් ලබා දීම පිණිස පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යාත්මක බලපෑම් පිළිබඳ තක්සේරු කිරීමේ අධ්‍යයනයක් පවත්වාගෙන යනු ලැබේ.

## දකුණු වරාය සංවර්ධනය

හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සහ නැව් තෙල් සැපයීමේ හා තෙල් ටැංකි සංකීර්ණය වැනි ව්‍යාපෘති ඇතුළුව ව්‍යාපෘති කිහිපයක වැඩ කටයුතු දකුණු වරාය සංවර්ධන කොට්ඨාශය විසින් ආරම්භයේ සිටම තවදුරටත් කර ගෙන යනු ලැබේ. 2011 වර්ෂය තුළ මෙම ව්‍යාපෘති සතුටුදායක ප්‍රගතියක් ලබා ඇත.

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ව්‍යාපෘතියේ පළමු අදියරේ ඉදිකිරීම් මෙම වසර තුළ සැහෙන අන්දමින් සම්පූර්ණ කර ඇති අතර දැනට සුළු පරිමාණයේ වරාය කටයුතු කර ගෙන යනු ලැබේ. වරාය පරිශ්‍රය තුළ වරාය ආශ්‍රිත ව්‍යාපාර ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එළඹෙන ලද තීරණයට අනුව මෙම වසර තුළ යෝජනා කැඳවීමක් දකුණු වරාය සංවර්ධන කොට්ඨාශය විසින් සාර්ථක ලෙස දියත් කර ඇත. මේ අනුව ආයෝජකයින් 14 දෙනෙකුගේ කෙටි ලේඛන සකස් කරන ලද අතර සීනි, පෙට්‍රෝලියම් රසායන ද්‍රව්‍ය, පොහොර සහ සිමෙන්ති ඇඹරීමේ සහ ඇසිරීමේ යන්ත්‍රාගාර පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. කෙසේ වෙතත් ආයෝජකයින්ගේ ඉල්ලුම වැඩිවීම නිසා නැවත වරක් තවත් යෝජනා කැඳවීමක් ඉතා ඉක්මනින්ම ක්‍රියාත්මක කිරීමට දකුණු වරාය සංවර්ධන කොට්ඨාශය සැලසුම් කර ඇත.

ව්‍යාපෘතියේ පළමු සහ දෙවන අදියර සඳහා අවශ්‍ය සෑම ඉඩමක්ම පාහේ ඉඩම් අත්පත්කර ගැනීමේ පළමු අදියර යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් මිළදී ගෙන/පවරා ගෙන ඇත. අනාගත සංවර්ධන වැඩ කටයුතු සඳහා දෙවන අදියර යටතේ ඉඩම් මැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර එම ඉඩම් මිළදී ගැනීමේ/පවරා ගැනීමේ කාර්යයන් දකුණු වරාය සංවර්ධන කොට්ඨාශය විසින් කර ගෙන යනු ලැබේ. මෙම ප්‍රමාණය හෙක්ටයාර් 500 ක් පමණ වන අතර පවුල් 600 ක් පමණ නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කිරීමට ඇත.

නැව් තෙල් සැපයීමේ පහසුකම් සහ තෙල් ටැංකි සංකීර්ණය ව්‍යාපෘතිය යටතේ සමුද්‍රික ඉන්ධන, ගුවන්යානා ඉන්ධන සහ ද්‍රව පෙට්‍රෝලියම් වායු ගබඩා කිරීම/මිශ්‍ර කිරීම සඳහා ඝණ මීටර් 80,000 ධාරිතාවයකින් යුත් ටැංකි 14 ක් ඉදිකිරීම අවසාන වෙමින් පවතින අතර නුදුරු අනාගතයේදී එහි වැඩ කටයුතු ආරම්භ කිරීමට නියමිතය. නැව් තෙල් සැපයීමේ කටයුතු නිසි අන්දමින් ක්‍රියාත්මක කිරීම උදෙසා තෙල් ටැංකි සහ පර්යන්ත ආශ්‍රිත ප්‍රදේශවල ඇතැම් යටිතල පහසුකම් ඉදිකිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතී.

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය ව්‍යාපෘතියේ දෙවන අදියරට අදාළ කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර ඇත. දෙවන අදියරට අදාළ ඉදිකිරීමේ මූලික කටයුතු කොන්ත්‍රාත්කරු විසින් එම ස්ථානයේ ආරම්භකර ඇත. දෙවන අදියරට අදාළ ප්‍රධාන කර්තව්‍යයන් වන්නේ මීටර් 2000 ක් දිගැති ජැටි බැම්ම ඉදිකිරීම, කෘතිම දිවයිනක් නිර්මාණය කිරීම, ජලාපවහන පද්ධතියක් ස්ථාපිත කිරීම, ද්‍රෝණිය කැණීම, ප්‍රවේශ මාර්ගය ගැඹුරු කිරීම, මෙහෙයුම් උපකරණ සවි කිරීම ආදියයි.

ඉහත සඳහන් කටයුතු වලට අමතරව බිම් ඇතුරුම් ගල් (ILB) නිෂ්පාදනය සහ අනෙක් ප්‍රධාන කටයුතුවලට පහසුකම් සැලසීම ඇතුළුව 2011 වර්ෂය තුළදී දකුණු වරාය සංවර්ධන කොට්ඨාශය වෙනත් විවිධ කටයුතු ද පවත්වා ගෙන යනු ලැබීය.

## සිවිල්

සිවිල් ඉංජිනේරු කොට්ඨාශයට අයත් වන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයිති කොළඹ වරායේ ගොඩනැගිලි, ගුදම්, පාලම්, ජැටි, බහළු රැඳවුම් මධ්‍යස්ථාන දියත්මං, ප්‍රදීපාගාර, සංචාරක බංගලා, මාවත්, දුම්රිය මාවත්, බහළු අංගන සහ අනෙකුත් සිවිල් ඉංජිනේරු ව්‍යුහයන් එළදායී අන්දමින්

නඩත්තු කිරීමයි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිල නිවාස නඩත්තු කිරීමට අමතරව තීන්ත ගෑම සහ පින්තාරු කිරීම ද ක්‍රමානුකූල පදනමක් මත පවත්වා ගෙන යනු ලැබේ.

වරාය ද්‍රෝණීන්, ප්‍රවේශ මාර්ග සහ හැරවුම් ද්‍රෝණියේ හැරීමේ කටයුතු හංසකාවා හාරන යාත්‍රාව මඟින් වසර පුරාම සිදුවේ. අද්දර නැංගුරම් පලවල හැරීම් කටයුතු “දිය කොවුල්ලා” යාත්‍රාව මඟින් සිදු කර ගෙන යනු ලැබේ. බේරේ වැවේ හැරීමේ කටයුතු “බූවල්ලා” හාරන යාත්‍රාව මඟින් සිදු කෙරේ. තවද, අනෙකුත් වරායවල හැරීමේ කටයුතු ද අවශ්‍ය පරිදි සිදු කෙරේ.

වරාය පරිශ්‍රය තුළ පිරිසිදු බව, අපද්‍රව්‍ය (කුණු) ඉවත් කිරීමෙන් නඩත්තු කර ගෙන යනු ලබන අතර තද සුළඟින් එකතුවන ජලය සහ මලාපවහන පද්ධතිය නඩත්තු කිරීම සිවිල් ඉංජිනේරු කොට්ඨාශය විසින් සිදු කරනු ලැබේ.

වරාය ප්‍රදේශයට ද අඛණ්ඩ ජල සැපයුමක් සැපයීම සඳහා ද සිවිල් ඉංජිනේරු කොට්ඨාශය වගකිව යුතු වේ.

මෙම කාලපරිච්ඡේදය ඇතුළතදී පහත සඳහන් ප්‍රධාන කර්තව්‍යයන් ඉටු කරන ලදී.

- හාබර් මාස්ටර් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම
- ජයබහළු පර්යන්ත අංගන IV ප්‍රදේශය දීර්ඝ කිරීම
- ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම
- බ්ලූමැන්ඩල් තෙල් ගබඩා සංකීර්ණය අළුත්වැඩියා කිරීම
- අමාත්‍යාංශ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම
- ජපන් ගුදම අළුත්වැඩියා කිරීම
- මඟී පර්යන්ත ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම
- ඔලුවිල් සංචාරක බංගලාව සහ ඔලුවිල් අභ්‍යාස ආයතනය අළුත්වැඩියා කිරීම
- වරාය මාවත් පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගොඩනැගිලි කඩා ඉවත් කිරීම
- බණ්ඩාරනායක තටාකයේ අංක 3 ගුදම අළුත්වැඩියාව

මීට අමතරව ඉන්දියානු රජයෙන් පිරිනමන ලද ආධාර යටතේ ජලගුණ විද්‍යා සමීක්ෂණය, කන්කසන්තුරය වරාය ද්‍රෝණියේ සහ ප්‍රවේශ මාර්ගයේ ගිලා බැස ඇති නෞකා කොටස් ටොන් 10 ක ප්‍රමාණයක් ඉවත් කිරීම සම්පූර්ණ කර ඇත. කන්කසන්තුර වරායේ සංවර්ධන අධ්‍යයනයන් සිදු කිරීම සඳහා ඉන්දියානු රජය විසින් තවදුරටත් ආධාරයන් ප්‍රදානය කරන ලදී.

එසේම කන්කසන්තුර වරායේ කාර්යාලයීය ගොඩනැගිල්ල ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය දායකත්වයෙන් සම්පූර්ණ කර ඇත.

## විදුලි හා විද්‍යුත්

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විෂය පථයට අදාළ සියලුම වරායවල සියලුම ඉංජිනේරු ව්‍යාපෘති සහ විදුලිබලය සහ සන්දේශණ ඉංජිනේරු ක්ෂේත්‍රවල පහසුකම් සැළසුම් කිරීම, කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සහ පහසුකම් නඩත්තුව පිළිබඳව විදුලි සහ විද්‍යුත් කොට්ඨාශය වගකියනු ලැබේ.

විදුලිබල සහ සංදේශණ ක්ෂේත්‍රවල සියලුම අත්‍යාවශ්‍ය සේවා අඛණ්ඩව සිදු කිරීම සඳහා 24 පැය පුරාම ප්‍රධාන ඉංජිනේරු සහ නියෝජ්‍ය ඉංජිනේරුවරුන් දෙදෙනෙකුගේ පාලනය යටතේ ඉහළ සුදුසුකම්ලත් වෘත්තීමය විදුලි/සංදේශණ ඉංජිනේරුවරුන්ගේ කණ්ඩායමක් යොදවා ඇත. මෙය ලෝකයේ අනෙකුත් ජාත්‍යන්තර කේන්ද්‍ර වරායවල පවත්නා තත්ත්වයට සරිලන පරිදි වරාය කටයුතු වලට අදාළ සියලුම සේවාවන් ගෙන් 95% ට වඩා සාර්ථක කර ගැනීම උදෙසා ඉවහල් වී ඇත.

**විදුලිබල ඉංජිනේරු ක්ෂේත්‍රය යටතේ ආවරණය කරන ලද කටයුතු**

- ✱ විදුලිබල මණ්ඩලයෙන් ලබා ගන්නා විදුලිය බෙදාහැරීම; සමස්ථ ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 18
- ✱ සියලුම ඌණ බලැති විදුලි ස්ථාපිතයන් සහ විදුලි උපාංග ආරක්ෂා කිරීම සහ නඩත්තු කිරීම
- ✱ භාරන යාත්‍රාවල, ටග් යාත්‍රාවල සහ අනෙකුත් පාවෙන යාත්‍රාවල විදුලි උපකරණ ආදිය නඩත්තු කිරීම
- ✱ බහළු මෙහෙයුම් දොඹකරවල (Ship to shore yard crane) විදුලි උපකරණ නඩත්තු කිරීම
- ✱ නෞකා තොග නැව් බඩු මෙහෙයවීමේ දොඹකර නඩත්තු කිරීම
- ✱ විදුලි මෝටර් (AC/DC) සහ බහළු දොඹකරවල අනෙකුත් උපකරණ අළුත්වැඩියා කිරීම
- ✱ සමස්ථ ධාරිතාවය මෙ.වො. 15.5 සහිත පොරොත්තු සේවාවේ ඇති විදුලි උත්පාදක යන්ත්‍ර නඩත්තු කිරීම
- ✱ කි.වො.11 ක භූගත විදුලි රැහැන් ජාලය ස්ථාපිත කිරීම, නඩත්තුව සහ ගැටළු සහගත තත්ත්වයන් නිරවුල් කිරීම
- ✱ වායු සමීකරණ පද්ධති සැලසුම් කිරීම, ස්ථාපිත කිරිම සහ නඩත්තු කිරීම
- ✱ නව රබර් ටයර් යෙදූ ග්‍රැන්ට් දොඹකර සඳහා ඉඩකඩ සැලසීම පිණිස ජයබහළු පර්යන්තයේ පහන් කණුවල උස වැඩිකිරීම

**විද්‍යුත් සහ සංදේශණ ඉංජිනේරු ක්ෂේත්‍රය යටතේ ආවරණය කරන ලද කටයුතු**

- ✱ VHF ගුවන් විදුලි තරංග ජාලය සැලසුම් කිරීම සහ නඩත්තු කිරීම (නාවික තරංග)
- ✱ බහළු පර්යන්තයේ ගෙගාහර්ට්ස් 2.4 Wi-Fi දත්ත සංදේශණ ජාලය සැලසුම් කිරීම හා නඩත්තු කිරීම
- ✱ බහළු පර්යන්තයේ චන්ද්‍රිකා තාක්ෂණය පදනම් කරගත් බහළු ස්ථානීය පද්ධතියේ මිහිමත මං සෙවීමේ පද්ධතිය (GPS) නඩත්තු කිරීම
- ✱ බහළු පර්යන්තයේ ගුවන් විදුලි තරංග හඳුනා ගැනීමේ (RFID) පද්ධතිය නඩත්තු කිරීම
- ✱ ඔප්ටිකල් ෆයිබර් ජාලය සහ දත්ත ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය සැලසුම් කිරීම සහ නඩත්තු කිරීම
- ✱ දුරකථන මාර්ග 2000 ක ධාරිතාවයක් සහිත වරාය දුරකථන PABX පද්ධතිය සැලසුම් කිරීම හා නඩත්තු කිරිම
- ✱ රේඩාර්, ප්‍රතිරාව ශබ්ද මානය (ECHO SOUNDER), චන්ද්‍රිකා සංදේශණ උපකරණ, දිශාන්තර මිහිමත මං සෙවීමේ පද්ධතිය (GDPS) පදනම් කරගත් සමීක්ෂණ පද්ධති ඇතුළුව නාවික පද්ධතීන් නඩත්තු කිරීම
- ✱ CCTV පද්ධතීන් සැලසුම් කිරීම හා නඩත්තු කිරීම
- ✱ VHF ඩුප්ලෙක්ස් චැනලය සඳහා ඉඩකඩ සලසනු වස් ශබ්ද සංනිවේදන (Voice Communication) පහසුකම් වැඩි කිරීම

## කොන්ත්‍රාත් හා සැලසුම්

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොන්ත්‍රාත් හා සැලසුම් කොට්ඨාශයේ ප්‍රධාන වගකීම වන්නේ සිවිල් ඉංජිනේරු ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක සැළසුම් සකස් කිරීම හා එම ව්‍යාපෘති කළමනාකරණය කිරීමයි. වරාය අධිකාරියේ මෙවන් ව්‍යාපෘතීන් ලෙස, ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වලට පහසුකම් සපයනු ලබන නැංගුරම්පලවල්, පාලම්, ගොඩනැගිලි ව්‍යුහයන්, ගොඩනැගිලි හා මාර්ග වැනි වරාය යටිතල පහසුකම් සැපයීම දැක්විය හැකිය. තවද, සියලුම ප්‍රාදේශීය වරායන්ද ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියලුම කොට්ඨාශවල නඩත්තුව සහ සංවර්ධනය සඳහා

අවශ්‍ය වන සියලුම සැළසුම් සහ ඇදීමේ කටයුතු කොන්ත්‍රාත් සහ සැලසුම් කොට්ඨාශය මඟින් ඉටු කෙරේ. ව්‍යාපෘති කළමනාකරණයට ඇතුළත් වන්නේ ටෙන්ඩර් ක්‍රියාවලිය, ඉදිකිරීම් කටයුතු සහ එවැනි ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සහ ගිවිසුම් කළමනාකරණයි.

ඉහත සඳහන් දැට අමතරව පෙරසවි අංගනයට අනුයුක්ත කර සිටි සේවකයින්ගේ කම්කරු ශ්‍රමය සෘජුව භාවිතා කරමින් කළහැකි සුළු ඉදිකිරීමේ ව්‍යාපෘතීන් ද භාර ගෙන තිබේ. තවද, මෙම කොට්ඨාශය විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් ඔලුවිල් සංවර්ධන ව්‍යාපෘතියේ ද නියැලී සිටී.

**2011 වර්ෂයේ මෙම කොට්ඨාශය විසින් ඉටුකරන ලද ප්‍රධාන කර්තව්‍යයන් පහත පරිදි වේ.**

**ඔළුවිල් වරාය ව්‍යාපෘතිය** - පළමු අදියර සඳහා හෙක්ටයාර 16 ක ප්‍රමාණයේ ජල ප්‍රදේශයක් ආවරණය වන මීටර් 550 ක දිග ප්‍රමාණයකින් යුතු උතුරු දියකඩනය සහ මීටර් 773 ක දිග ප්‍රමාණයකින් යුත් දකුණු දියකඩනය ලෙස සක්කගල් යෙදූ දියකඩන 02 ක් ඉදිකිරිම මෙම ව්‍යාපෘතියට අන්තර්ගත වේ. ධීවර කටයුතු සඳහා හෙක්ටයාර 06 ක පමණ ජල ප්‍රදේශයක් වෙන් කෙරේ. දළ බර ටොන් 5000 ක නෞකාවලට අවශ්‍ය ගැඹුර සැපයීම සඳහා වාණිජ වරාය ද්‍රෝණිය පළමු අදියර මීටර් 08 ක් දක්වා හැරීමට සිදුවනු ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයන්නේ ඩැනීඩා (DANIDA) ආයතනයෙන් වන අතර ඇස්තමේන්තු ගත මුළු පිරිවැය ආසන්න වශයෙන් යුරෝ මිලියන 46.1 කි. සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය යුරෝ 46,095,369.49 ක අඩුම සාර්ථක ඉල්ලුම්කරුවෙකු වෙත ඉදිකිරිම් කටයුතු භාර දෙන ලදී. බලාපොරොත්තු නොවූ කාලගුණික තත්ත්වයන් සහ ඇතැම් සැලසුම්/තාක්ෂණික කරුණු හේතු කොට ගෙන මෙම ව්‍යාපෘතිය 2012 මැද භාගයේදී නිම කිරීමට සැලසුම්කර ඇත.

ඉදිකිරිම් සඳහා අවශ්‍ය කරන සියළු උපදේශක සේවාවන්, සවිස්තරාත්මක සැළසුම් හා ඉදිකිරීම් අධීක්ෂණ අවශ්‍යතාවයන් මෙම කොට්ඨාශය මඟින් සපයනු ලැබේ.

**ව්‍යාපෘති ප්‍රගතිය**

- 2008 මැයි 23 දින වන නෝර්ඩියා බැංකුව හා ශ්‍රී ලංකාවේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය අතර ණය ගිවිසුම් අත්සන් තබා ඇත.
- 2008 ජූනි 20 වන දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා එම් ටී හෝජාර්ඩ් ආයතනය අතර කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් තබා ඇත.
- 2008 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ නියෝගය කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කර ඇත.
- කොන්ත්‍රාත් වැඩ කෙරීගෙන යන අතර 93% ක් පමණ මේ වන විට (ගොඩනැගිලි හා මංමාවත් ඉදිකිරීම්, ඉඩම් සංවර්ධනය, දිය කඩන හා පාලම් ඉදිකිරීම් සහ හැරීම් වැඩ) සම්පූර්ණ කර ඇත.

**ඔළුවිල් හි වෙරළ සංරක්ෂණ කටයුතු**

ඔළුවිල් ප්‍රදේශයේ වෙරළ ඛාදනය සඳහා පිළියම් ලෙස ගත හැකි විසඳුම් හඳුනා ගැනීමේ අධ්‍යනයක් ලංකා හයිඩ්‍රොලික් ආයතනය මඟින් ආරම්භ කරන ලදී.

අරමුදල් පාවිච්චි කිරීම සඳහා ඩැනීඩා (DANIDA) ආයතනයේ අනුමැතිය සහිතව වැඩ කටයුතු පවරා දී ඇති අතර 2012 මැද භාගය වන විට නිම කිරීමට අපේක්ෂිතය. එකක් මීටර් 100 ක දිගින් යුක්ත වූ මීටර් 4.0 ක් ගැඹුරැති වෙරළින් ඔබ්බට දියකඩන 3 ක් ඉදිකිරීම සඳහා සැළසුම් කර ඇති අතර මෙයින් වෙරළ තීරුව දිගේ කි.මී. 2.5 ක් ආවරණය වේ.

**ගාල්ල වරාය සංවර්ධනය**

- ✱ සැහැල්ලු රුවල් යාත්‍රා අළුත්වැඩියා කිරීමේ ගොඩනැගිල්ල ඉදි කෙරෙමින් පවතින අතර එහි සමස්ථ පිරිවැය රුපියල් මිලියන 21 කි.
- ✱ යෝජිත සැහැල්ලු රුවල් යාත්‍රාංගනය සඳහා ටෙන්ඩර් ලේඛණ සැළසුම් කිරීම සහ සූදානම් කිරීම. ඉඩම් පවරා ගැනීම මේ වන විට සිදුවෙමින් පවතී.
- ✱ සැහැල්ලු රුවල් යාත්‍රාංගනය සඳහා අවශ්‍ය වන්නාවූ උපකාරක පහසුකම් සැපයීම සඳහා යෝජිත පහසුකම් සැපයීමේ ගොඩනැගිල්ල සැළසුම් කිරීම.
- ✱ ගාල්ලේ රුමස්සල සංචාරක බංගලාව නැවත සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව භාරදීම සඳහා ටෙන්ඩර් ලියකියවිලි සැළසුම් කිරීම සහ පිළියෙළ කිරීම.
- ✱ ගාලු වරායේ යෝජිත ගේබියන් (Gabion) ආවරණ ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස ටෙන්ඩර් ලියකියවිලි සැළසුම් කිරීම සහ පිළියෙල කිරීම.

**වෙනත් කටයුතු**

- ✱ කොළඹ වරායේ අභ්‍යන්තර මාවත් පුළුල් කිරීමේ කටයුතු සැළසුම් කිරීම හා ඉදිකිරීම් සිදු කෙරෙමින් පවතී.
- ✱ හර්තාල් පාලම පුළුල් කිරීම සඳහා වූ ඉදිකිරීම් - කොළඹ වරායේ උපව්‍යුහයන් ඉදිකිරීම් කටයුතු දැනට කෙරීගෙන යන අතර එහි මුළු පිරිවැය රුපියල් මිලියන 90 වේ.
- ✱ සමගි බහළු පර්යන්තයේ හදිසි අළුත්වැඩියා කටයුතු සඳහා වූ ගිවිසුම ප්‍රදානය කිරීම පිණිස මිළ ගණන් කැඳවීමේ ලේඛණ සකස් කිරීම. මෙහි මුළු පිරිවැය රුපියල් මිලියන 420 කි.
- ✱ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ත්‍රිකුණාමල වරායේ ඉඩම් මැනීම් කටයුතු කර ගෙන යනු ලැබේ.
- ✱ යෝජිත හර්තාල් පාලම පුළුල් කිරීම සඳහා මිළ ගණන් කැඳවීමේ ලේඛණ සකස් කිරීම සහ සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිළ ගණන් කැඳවීම - කොළඹ වරායේ ඉහළ ව්‍යුහය.
- ✱ දුම්රිය හා භාණ්ඩ අංශය සඳහා වානේ ව්‍යුහයන් සැලසුම් කිරීම.
- ✱ අභ්‍යන්තර වරාය මාවත් පුළුල් කිරීම නිසා ඇතිවන වෙනස්කම්වලට අවශ්‍ය පරිදි ව්‍යුහයන් සැළසුම් කිරීම.

**සමගි බහළු පර්යන්තයේ කඩිනම් අළුත්වැඩියා කටයුතු**

**පසුබිම සහ අවශ්‍යතා**

නව උතුරු පියරයේ ඉදිකිරීම් කටයුතු ණය අංක SL- P 41යටතේ JBIC ආයතනය විසින් සපයන ලද අරමුදලින් 2003 වර්ෂයේදී නිමකර ඇත. මෙම පර්යන්තය දැනට හඳුන්වනු ලබන්නේ සමගි බහළු පර්යන්තය යනුවෙනි. (UCT)

දකුණු හා උතුරු නැංගුරම්පොළ වල සාමාන්‍ය නැව් බඩු නෞකාවන් සඳහා ඉඩ සැළසීම වෙනුවෙන් මීටර් 387ක් දිගැති මීටර්127ක් පළලැතිව සමගි බහළු පර්යන්තය ඉදිකරන ලදි. මෙම ඉදිකිරීම් කටයුතු වලින් වසර කිහිපයකට පසු බටහිර ජැටියේ වේදිකාව සහ උතුරු ජැටියේ මීටර් 20ක ප්‍රමාණයක් පුපුරා ගිලාබැස ඇති බැවින් සමගි පර්යන්තයේ බටහිර අන්තයේ කොටසක් සම්පූර්ණ ව්‍යුහාත්මක වෙනස්කම් වලට භාජනය වී ඇති බව පැහැදිලිව දැකගත හැකිවේ.

සමගි බහළු පර්යන්තයේ ව්‍යුහය අඛණ්ඩව පිරිහීම හේතුවෙන් අංක 02 දරන පර්යන්තයේ කටයුතු දැනට මෙම තත්ත්වය යටතේ සීමා වී ඇති බැවින් එමගින් ඉටුවූ මෙහෙයුම් කටයුතු වලට දැඩි බලපෑමක් එල්ල වී ඇත. බටහිර ජැටි බැම්ම තව දුරටත් බිඳ වැටුණහොත් අංගනයේ පිරවීම් ද්‍රව්‍ය සේදීයාමට ඉඩ තිබේ. මේ නිසා වරාය ද්‍රෝණියේ මෙහෙයුම් වලට බාධා ඇති විය හැකි අතර අවසානයේදී කොළඹ වරායට විශාල ව්‍යවසනයක් සිදුවීමට ඉඩ ඇත.

**හඳුනාගත් අළුත්වැඩියා කටයුතු**

පර්යන්තයේ සම්පූර්ණ මෙහෙයුම් කටයුතු සිදුකිරීම සඳහා මීටර් 127ක් දිග බටහිර ජැටි බැම්ම, උතුරු ජැටි බැම්ම (මීටර් 20ක කොටසක්) මෙන්ම සමගි බහළු පර්යන්තයේ බටහිර අන්තයේ සිට අවම වශයෙන් මීටර් 50ක අංගන පුනරුත්ථාපන කටයුතු (මීටර් 127 xමීටර් 50) යථා තත්ත්වයට පත්කිරීම පිණිස හදිසි අවශ්‍ය අළුත්වැඩියාවන් සිදුකිරීමට සැළසුම් කර ඇත.

**අඩංගු කාර්යයන්**

- ✱ හැරීම සහ බටහිර ජැටි බැම්මේ මීටර් 127කුත්, පවත්නා ජැටි බැම්ම ටයි රොඩ් යොදා ශක්තිමත් කිරීමත්/නැංගුරම් බ්ලොක් යොදා සකස් කිරීමත්, ජැටි බැම්ම ආරක්ෂා කිරීම සඳහා ගල්වැටියක් සකස් කිරීම.
- ✱ උතුරු ජැටියේ උතුරු අන්තය සඳහා ටයිරොඩ් සැපයීම, මීටර් 20ක් සඳහා ඇන්කර් බ්ලොක් සැපයීම
- ✱ පවත්නා ජැටි බැම්මේ අංගනය පැත්තේ දැනට ඇති ගල් කුට්ටි (Rock Mound) ඉවත්කොට භූ සළු (Geo Textile) ස්ථරයක් යොදා නැවත ඉදිකිරීම.
- ✱ අංගන ජැටිය යථා තත්ත්වයට පත්කිරීම සහ භූමිය යළි සකස්කිරීම (127m x 50m)

**අරමුදල් මූලාශ්‍ර**

මේ සඳහා ව්‍යාපෘතිමය නොවන දේශීය හවුල්කරුවන්ගේ ආධාර මුදල් යටතේ ජපන් රජය විසින් රුපියල් මිලියන 400ක් අනුමත කෙරිණ.

**කාර්යයන්හි ප්‍රගතිය**

කොන්ත්‍රාත්කරු වන ඇක්සස් ඉංජිනියරින් පුද්ගලික සමාගම වෙත 2011 දෙසැම්බර් මසදී වැඩ කටයුතු භාරදී ඇත.

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල**

කොළඹ 01 කැනල් අංගන ප්‍රදේශයේ සිය ප්‍රධාන කාර්යාලය ඉදිකිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදහස් කරයි. මෙහෙයුම් හා නඩත්තු කටයුතු සම්බන්ධව සෘජුවම සම්බන්ධ නොවන සියළුම කාර්ය මණ්ඩල මෙම ගොඩනැගිල්ලේ ඒකරාශී කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය සම්පූර්ණ ඉඩ ප්‍රමාණය දළ වශයෙන් ගණන් බලා ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යෝජිත ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සම්බන්ධව සැලසුම් සකස් කිරීම සහ මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍යතා සම්බන්ධයෙන් සියාරා ඉදිකිරීම් පුද්ගලික සමාගම විසින් සිය කැමැත්තෙන්ම භාර දෙන ලද ව්‍යාපෘති යෝජනාවක් ලැබී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙම යෝජනාව පිළිබඳ ඇගයීම් වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ කමිටුව (SCARC) වෙත යැවීම සඳහා වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. SCARC ආයතනය විසින් අවසර ලබා ගැනීමෙන් පසු සියාරා ආයතනය සමඟ 2011 ජනවාරි 14 වන දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

මහල් 25කින් යුත් ගොඩනැගිල්ල සඳහා ප්‍රාථමික සැලසුම් නිෂ්කාශණ වාර්තාවක් කොළඹ මහ නගර සභාවෙන් ලබා ගෙන ඇත. සියාරා ආයතනය විසින් විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව SCARC ආයතනයට භාරදී ඇත. මේ අනුව රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව විසින් SCARC ආයතනයට සහායවීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් (TEC), සැපයීම් පිළිබඳ සලකා බැලීමට පත්කර ඇත. තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් දැනට පවත්වාගෙන යනු ලැබේ. යෝජිත ගොඩනැගිල්ල සමන්විත වන්නේ පහත දැක්වෙන අංගයන් වලිනි.

| | | |
|---|---|---|
| ✱ | මහල් සංඛ්‍යාව - | 25 |
| ✱ | ගොඩනැගිල්ලේ සම්පූර්ණ ඉඩකඩ ප්‍රමාණය - | වර්ග මීටර් 31000 |
| ✱ | ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය - | රු බිලියන 4.5 |
| ✱ | ආරම්භ කිරීමට යෝජිත දිනය - | 2012 ජනවාරි |
| ✱ | ඇස්තමේන්තුගත ඉදිකිරීම් වකවානුව - | මාස 30 |

**පරිශ්‍ර සහ භූගෝලීය තොරතුරු පද්ධති අංශය**

කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය සහ ඔළුවිල් හි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සියලුම නිශ්චල දේපළ/ඉඩම් සහ ගොඩනැගිලි පරිශ්‍ර අංශය විසින් කළමනාකරණය කරන අතර වත්කම් පරිසංණකගත කිරීම සහ විස්තර සැකසීම භූගෝලීය පද්ධති අංශය විසින් සිදු කරනු ලැබේ.

දිවයින වටා පිහිටි අක්කර 8000 ක් පමණ වූ බිම් ප්‍රමාණයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් වන අතර මෙයින් පරිශ්‍ර 75 ක් පමණ පිටස්තර පුද්ගලයින්ට සහ ආයතනවලට බදු දී ඇත. මෙම අංශය විසින් අනුගමනය කරන ලද විශේෂ අයකර ගැනීම් ක්‍රමයක් මඟින් පරිශ්‍ර අංශය විසින් රුපියල් මිලියන 143.54 ක ශුද්ධ මුදලක් උපයා ගෙන ඇත. තවද, වසර තුළ ගන්නා ලද නොයෙකුත් ක්‍රියාමාර්ග තුළින් රුපියල් මිලියන 9.899 ක මුදලක් හිඟ කුළී මුදල් වශයෙන් අයකර ගෙන ඇත.

මසකට රුපියල් 5000 ක මුදලක් කුළී වශයෙන් අයකර ගැනීමේ පදනම මත මගී පර්යන්තයේ වෙළඳ කුටි 26 ක් බදු දී ඇත.

බේරේ වැව වටා සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත කටයුතු දියුණු කිරීම සම්බන්ධව අනුගමනය කරනු ලබන රජයේ පිළිවෙත අනුව බේරේ වැවේ "ද පැන්ටූන්" නමින් හැඳින්වෙන දියමත පාවෙන අවන්හලක් විවෘත කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සිනමන් ලේක් සයිඩ් හෝටලය සමඟ බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කර ඇත.

විවිධ ශ්‍රේණිවලට අයත් සේවක කොටස්වල සුභසාධනය සඳහා නිවාස 606 කට ආසන්න ප්‍රමාණයක් සහ ඇඳන් 354කින් හෙබි තනිකඩ නිවාස පරිශ්‍ර අංශය විසින් පරිපාලනය කරනු ලැබේ.

නගර සභාවට අධිකාරිය විසින් ගෙවනු ලබන බදු සහ වරිපනම් කටයුතු පරිශ්‍ර අංශය විසින් කර ගෙන යනු ලැබේ. භූගෝලීය තොරතුරු පද්ධතිය හඳුන්වාදීම තුළින් පරිශ්‍රයන් පහසුවෙන් හඳුනාගත හැකි වූ අතර බදු සහ වරිපනම් ගෙවීමේදී ඇතිවන වෙනස්කම් අවමකර ගැනීමට ද හැකිවිය. 2011 වසර තුළදී බදු සහ වරිපනම් වශයෙන් රු. 29,166,761/= ක මුදලක් ගෙවා ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් දේපළවලට බලයෙන් ඇතුළුවීම වැලැක්වීම උදෙසා පරිශ්‍ර අංශය විසින් හැකි සෑම පියවරක්ම ගනු ලබන අතර මෙම තත්ත්වයන් අධීක්ෂණය කිරීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධතියේ සහය ඉවහල් කර ගනු ලැබේ.

## යන්ත්‍රෝපකරණ

යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රධාන වගකීම වනුයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැව් භාණ්ඩ මෙහෙයවන උපකරණ සංචිතය වඩාත් යහපත් අන්දමින් නඩත්තු කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා සැලසුම් සකස් කිරීමෙන් මෙම උපකරණ බහළුගත සහ සාම්ප්‍රදායික නැව්බඩු මෙහෙයවීම සඳහා අඛණ්ඩව සැපයීමත්ය.

උපකරණවල ක්ෂණික හෝ හදිසි අළුත්වැඩියාවන් සිදු කිරීමට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමේ උපක්‍රමය හා අනුගතවෙමින් සැලසුම්සහගත නිවාරණ නඩත්තු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම තුළින් 2011 වර්ෂය තුළදී මෙම කොට්ඨාශය විසින් පහත සඳහන් දේ ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැව් භාණ්ඩ මෙහෙයුම් උපකරණ සමූහයක් සාර්ථක ලෙස නඩත්තු කරන ලදී.

* නෞකාවේ සිට වෙරළ දක්වා වූ බහළු දොඹකර (STS) 23
* රබර් ටයර් යෙදූ ග්‍රැන්ට් දොඹකර 67
* පීලි මත ක්‍රියාකරවන ග්‍රැන්ට් දොඹකර 04
* බහළු මෙහෙයුම් එසවුම් යන්ත්‍ර 19
* අඩු එසවුම් ට්‍රක් රථ (ටොන් 2.5 සිට 15 දක්වා) 112
* ප්‍රයිමූවර් රථ/පර්යන්ත ට්‍රැක්ටර් 144
* ටේලර් (බොම්බ් කාට් සහ වෙනත්) 193
* ඩ්‍රෝබාර් ට්‍රැක්ටර් 04
* ජංගම දොඹකර, වෝෆ් ඉලෙක්ට්‍රික්, ෆ්ලෝටින් සහ ඕවර් හෙඩ් දොඹකර සහ එලිවේටර්ස් 67
* නැව් බඩු මෙහෙයුම් කටයුතු සඳහා අඛණ්ඩ සේවයක් සැපයීම වෙනුවෙන් අවශ්‍ය පොරොත්තු විදුලි ජනක යන්ත්‍ර 07
* ෂංටින් ලොකොමෝටිව් එන්ජින් 03
* මෝටර් වාහන 591 (බස් රථ, ලොරි, වෑන් රථ, ඩබල් කැබ්, මෝටර් රථ, ත්‍රිරෝද රථ සහ යතුරු පැදි)

වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට විස්සේ සම ඒකක 2.3 ක සමස්ථ ප්‍රමාණයක් මෙහෙයවීමට හැකි වූ අතර කාර්යය සාධනය මෙම තත්ත්වයට ළඟා කර ගැනීමට හැකි වූයේ උපකරණ 90% ට වැඩි ප්‍රමාණයක් පැවති හෙයිනි. එය සැළසුම් සහගත උපකරණ නඩත්තු කිරීමේ ඍජු ප්‍රතිඵලයකි. යන්ත්‍රෝපකරණ ඉංජිනේරු කොට්ඨාශයේ විවිධ අංශ මඟින් 2011 වසර තුළදී පහත සඳහන් කටයුතු නිමකර ඇත.

**ග්‍රැන්ට් දොඹකර නඩත්තු කිරීමේ ඒකකය - ජයබහළු පර්යන්ත අදියර I සහ II**

නෞකාවේ සිට වෙරළ දක්වා දොඹකර, පීලි මත ක්‍රියාකරන ග්‍රැන්ට් දොඹකර සහ හුවමාරු දොඹකර සඳහා ප්‍රධාන අළුත්වැඩියා කටයුතු සිදුකර ඇත. වයර් කඹ නැවත යෙදීම සහ ට්‍රොලි සඳහා පීලි හා රෝද නැවත යෙදීම වැනි නිවාරණ නඩත්තු කටයුතු සම්පූර්ණ කරන ලදී. අනතුරු හානි ද අළුත්වැඩියා කර ඇත. පින්තාරු කිරීම සහ සුළු අළුත්වැඩියා කාර්යයන් සම්පූර්ණ කෙරිණ. මීට අමතරව මෙම කාලය අතරතුර සේවක කුටි 2 ක් නැවත යොදන ලදී.

**නැව්බඩු මෙහෙයුම් යන්ත්‍රාගාරය - ජයබහළු පර්යන්ත අදියර III සහ IV**

ඩීසල් එන්ජින් අළුත්වැඩියා කිරීමේ අංශයේ සහාය ඇතිව ප්‍රයිමූවර් රථ සහ ඉහළ එසවුම් (Top Lifter) යන්ත්‍රවල එංජින් සහ සම්ප්‍රේෂණ යන්ත්‍ර 44 ක් නැවත යොදා සම්පූර්ණ කර ඇත. ඊට අමතරව ප්‍රයිමූවර් රථ සහ ඉහළ එසවුම් යන්ත්‍ර 10 ක නිවාරණ නඩත්තු කටයුතු නිමකර ඇත. මෙම කාලය තුළ ටේලර් 38 සඳහා නිවාරණ නඩත්තු කටයුතු සිදුකර ඇත. ප්‍රයිමූවර් රථ සහ ටේලර් රථ වලට සිදු වූ අනතුරු හානි 17 ක් අළුත්වැඩියා කර ඇත.

**දොඹකර වැඩපල**

ටොන් 7 සිට 90 දක්වා ධාරිතාවයෙන් යුත් ජංගම දොඹකර, IHI රුවල් කුළුණ, මහපොළ අභ්‍යාස ආයතනයේ නෞකා අනුකාරකය යන අංශවලට අදාළ සියළුම දොඹකරවල ප්‍රධාන සහ සම්පූර්ණ අළුත්වැඩියා කටයුතු 27 ක් සිදුකර ඇත. එමෙන්ම නිවාරණ නඩත්තු කටයුතු ද සපුරා ඇත. ඕවර් හෙඩ් දොඹකර 20 ක අළුත්වැඩියා හා නඩත්තු කටයුතු අවසන්කර ඇත.

**ඉදිකිරීමේ උපකරණ නඩත්තු කිරීමේ අංශය**

පැටවුම් යන්ත්‍ර, ටග් ට්‍රැක්ටර් සහ ෆාම් ට්‍රැක්ටර් 16 ක ප්‍රධාන සහ සම්පූර්ණ අළුත්වැඩියා කටයුතු සිදුකර ඇත. මෙම ප්‍රධාන අළුත්වැඩියාවන්ට අමතරව ෆාම් ට්‍රැක්ටර්, ටග් ට්‍රැක්ටර්, මාර්ග තලන යන්ත්‍ර, වායු පීඩන යන්ත්‍ර සහ වෙනත් උපකරණවල නිවාරණ නඩත්තු කටයුතු 35 ක් සම්පූර්ණයෙන්ම නිමවා ඇත.

**ඩීසල් එන්ජින් අළුත්වැඩියා අංශය**

හුවමාරු දොඹකරවල කමින්ස් (Cummins) එන්ජින් 21 ක සම්පූර්ණ අළුත්වැඩියා කටයුතු නිමකර ඇත. නඩත්තු කිරීමේ උපලේඛණ අනුව ප්‍රයිමුවර් රථ එන්ජින් 5 ද, පර්යන්ත ට්‍රැක්ටර් 14 ද සම්පූර්ණ අළුත්වැඩියා කටයුතු සපුරා ඇත. මීට අමතරව වර්ෂය තුළදී ඉහළ එසවුම් යන්ත්‍ර 04 ද, අඩු එසවුම් යන්ත්‍ර 02 ද සම්පූර්ණ අළුත්වැඩියා කටයුතු නිමකර ඇත. ඩබල් කැබ් රථ, බස් රථ සහ ලොරි රථ 05 ක එන්ජින් මුළුමනින්ම අළුත්වැඩියා කිරීමෙන් මෝටර් ගරාජයේ කටයුතු වලට දායක වී ඇත. ප්‍රයිමුවර් රථ සහ ඉහළ එසවුම් යන්ත්‍ර රථ 25 ක සම්ප්‍රේෂණ යන්ත්‍ර මුළුමනින්ම අළුත්වැඩියා කර ඇත.

**මෝටර් ගරාජය**

සියලුම සැහැල්ලු වාහන සහ බර වාහනවල අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සිදුකරන ලදී. වසර තුළදී ටිංකරින් සහ පින්තාරු කිරීමේ කාර්යයන් ද අවසන් කර ඇත.

**නැව්බඩු මෙහෙයුම් යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා අංශය**

ඉහළ එසවුම් යන්ත්‍ර සහ අඩු එසවුම් යන්ත්‍ර 10 ක සම්පූර්ණ අළුත්වැඩියා සහ නිවාරණ නඩත්තු කටයුතු සිදුකර ඇත.

බදු ක්‍රමය මත මෙහෙයුම්කරුවන් දෙදෙනෙකු විසින් මෙහෙයුම් කර නඩත්තු කරනු ලබන "සමර්හිල්" හි ඇති තෙල් තොග ගබඩා සංකීර්ණය මෙම අංශයේ අධීක්ෂණය යටතේ වසර තුළදී සතුටුදායක අන්දමින් ක්‍රියාත්මක කරන ලදී.

## යන්ත්‍රෝපකරණ වැඩ

වානේ නිෂ්පාදිත වැඩ සහ පවත්නා වානේ වලින් නිර්මිත උපකරණ සමුද්‍රික යාත්‍රා සහ වරාය උපකරණ අළුත්වැඩියා කිරිම සහ නඩත්තු කිරීම ඇතුළුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම වානේ නිමවුම් කාර්යයන් උදෙසා යාන්ත්‍රික ඉංජිනේරු කොට්ඨාශය වගකීම් දරයි.

ජයබහළු පර්යන්තයේ නෞකාවල සිට වෙරළ දක්වා වූ සියළුම දොඹකර වෙනුවෙන් රේල් පීලි නැවත යෙදීම, දොඹකර පිලී අළුතින් යෙදීම, සමුද්‍රික යාත්‍රා සහ නැංගුරම් ලැමේ ටග් යාත්‍රා ආදියේ සියළුම වානේ නිර්මිතයන් නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම, තොග නැව්බඩු මෙහෙයවීමේදී අවශ්‍ය ග්‍රැබ්ස් නඩත්තු කිරීම, සාමාන්‍ය නැව්බඩු ගුදම්වල ගුදම් දොරවල් අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම, ජයබහළු පර්යන්තයේ බහළු දොඹකර වල සියළුම වානේ නිර්මිතයන් අළුත්වැඩියා කිරීම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනෙකුත් කොට්ඨාශවලට අවශ්‍ය වන්නා වූ විශේෂයෙන් ඇන්කර් දම්වැල් සහ අළුත් ෂකල් කොකු නිර්මාණය කිරීමේ යාන්ත්‍රික වැඩ සහ පරික්ෂා කිරීම් වැනි අත්‍යාවශ්‍ය කටයුතු නඩත්තු කරමින් සියළුම මෙහෙයුම් කටයුතු මනා ලෙස පවත්වා ගෙන යාම සඳහා යාන්ත්‍රික වැඩ ඉංජිනේරු කොට්ඨාශය තීරණාත්මක කාර්යයභාරයක් ඉටුකරයි. තවද බහළු පර්යන්තවල සහ සම්ප්‍රදායික නැව්බඩු නැංගුරම්පලවල පවත්නා ගරාදි නඩත්තු කිරීම සහ නව නිර්මිතයන් ද, ජයබහළු පර්යන්ත සමාගම යටතේ කොළඹ තෙල් සංකීර්ණයේ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, උපලේඛණගත කිරීම සහ ක්‍රියාවට නැංවීම ද මීට අයත් ක්‍රියාමාර්ග වේ.

සාමාන්‍ය නඩත්තු කටයුතුවල නිරත වන අතරම ජයබහළු පර්යන්ත ටේලර් යන්ත්‍ර 12 ක ද, ප්‍රයිමුවර් රථ මුහුණු 20 ද, පහළ තට්ටුවකින් සමන්විත ටේලර් 02 ද, සෙල් ෆෙන්ඩර්ස් 10 ද, ප්‍රධාන ව්‍යුහාත්මක අළුත්වැඩියාවන් සම්පූර්ණ කර ඇත. එමෙන්ම ජයබහළු පර්යන්ත III සහ IV හි පුළුල්කිරීමේ ව්‍යාපෘති සඳහා ගරාදි 200 ක් නිර්මාණය කිරීම ද, බණ්ඩාරනායක පාලමේ ගරාදි 165 ක් නිර්මාණය කිරීම ද අංක III සහ IV දරණ ජයබහළු පර්යන්තයේ පහන් කණු 28 ක උස වැඩිකිරීම ද, ජල ටැංකි කුළුණක් ඉදිකිරීම ද, ව්‍යුහාත්මක අංක J1 සිට J 14 දක්වා ඇති හානි වූ ටොලි පීලි නැවත එලීමද, වායු සම්ප්‍රේෂණ යන්ත්‍ර 3 ක් සහ ගුදම් දොරවල් 12 ද, ලියවන පට්ටල් 3 ද, CNC යන්ත්‍ර 1 ක් සහ ෂෙයාරිංග් යන්ත්‍ර එකක් අළුතින් සකස් කිරීම ද ඉටු කරන ලදී. එමෙන්ම අංක 10 සහ 13 දරණ නියමු දියත් යාත්‍රාවල සහ එම් වී සිංහබාහු ටග් යාත්‍රාව සහ බඳෙහි සියලුම අළුත්වැඩියාවන් ද, සිමෙන්ති සහ ගල් අඟුරු තොග මෙහෙයුම් සඳහා ත්‍රිකුණාමලය වරායේ ඝණ මීටර් 4.5 ධාරිතාවයෙන් යුත් ග්‍රැබ් උපකරණය අළුත්වැඩියා කිරීමද, බිම් ඇතුරුම් ගල් යන්ත්‍රාගාරයේ ප්‍රධාන අළුත්වැඩියාවන්ද, මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ නව ගුදමෙහි නිර්මාණ කටයුතු ද සිදුකර ඇත.

කොළඹ තෙල් සංකීර්ණයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඝණ මීටර් 5780 ක ධාරිතාවයකින් යුත් නව ඛණිජ තෙල් ගබඩා කිරීමේ ටැංකියක් සහ සමුද්‍රික බැර තෙල් ගබඩා කිරීම සඳහා මෙ.ටො. 3 ක බොයිලේරු ස්ථාපනය කිරීමත් මෙම කොට්ඨාශය විසින් සම්පූර්ණ කර ඇත. මෙසේ කොළඹ තෙල් සංකීර්ණයේ නැව් තෙල් සැපයීමේ ව්‍යාපාරය තුළින් ආදායම වර්ධනය කිරීමට ඉවහල් වේ.

## නාවික ඉංජිනේරු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියලුම පාවෙන යාත්‍රා නඩත්තු කිරීමේ සහ අළුත්වැඩියා කිරීමේ ප්‍රධාන වගකීම නාවික ඉංජිනේරු කොට්ඨාශයට පැවරී ඇත. නාවික කටයුතු, මෙහෙයුම් කටයුතු, සිවිල් ඉංජිනේරු නඩත්තු කටයුතු සහ සිය මෙහෙයුම් කාර්යයන් සඳහා ආරක්ෂක අංශය වෙත අවශ්‍ය ප්‍රමාණවත් තරම් පාවෙන යාත්‍රා සපයාදීම මෙම අංශය මඟින් සහතික කෙරේ. නාවික කටයුතු, සිවිල් ඉංජිනේරු කටයුතු සහ ආරක්ෂක අංශ විසින් භාවිතා කරනු ලබන පිටතින් ඇන්ජින් සවිකරන ලද බෝට්ටු නඩත්තු කිරීමට ද නාවික ඉංජිනේරු අංශයේ වගකීම වී ඇත.

එමෙන්ම තොග නැව්බඩු මෙහෙයවීම සඳහා මෙහෙයුම් අංශයට අවශ්‍ය උපකරණ සැපයීම ද මෙම අංශයේ වගකීමයි. එසේම ගෑස් උඳුන්, බත් පිසින උඳුන්, ඇළුමිනියම් භාජන සහ අනෙකුත් උපකරණ වැනි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූළුතැන්ගෙයි උපකරණ නඩත්තු කිරීම ද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යාත්‍රා දියත් කරන මාර්ග නඩත්තු කිරීම සහ මෙහෙයවීම ද මෙම අංශය මඟින් සිදුවේ.

නාවික ඉංජිනේරු කොට්ඨාශය අංශ දෙකකින් සමන්විත වන අතර වසර තුළ එම අංශයන් ලබාගත් සාර්ථක ප්‍රතිඵල පහත දැක්වේ.

**නාවික අංශය 1**

**නැවත සැකසීමේ ඉංජිනේරු අංශය**

වරායේ සියලුම නැංගුම් ලැමේ ටග් යාත්රා, "මේස" ගිනි නිවීමේ යාත්‍රාව, "ප්‍රදීප - II" ප්‍රදීපාගාර සේවා යාත්‍රාව, "සේරුවිල" මගී යාත්‍රාව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හාරන යාත්‍රා සහ පිටතින් එංජින් සවිකල සියලුම යාත්‍රා නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ කටයුතු සම්බන්ධීකරණය පිළිබඳව, සමුද්‍රික I අංශය යටතේ පවත්නා නැවත සැකසීමේ ඉංජිනේරු අංශය වගකියනු ලැබේ. කොළඹ වරායේ නැංගුරම්ලැමේ ටග් යාත්‍රා 05 ක්, ත්‍රිකුණාමල වරායේ නැංගුරම්ලැමේ ටග්යාත්‍රා 01 ක්, ගාලු වරායේ නැංගුරම්ලැමේ ටග් යාත්‍රා 01 ක්, කන්කසන්තුර වරායේ නැංගුරම් ලැමේ ටග්යාත්‍රා 01 ක් සඳහා මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට මෙම අංශය කටයුතු කර ඇත. මෙම කටයුතු ක්‍රියාත්මක කරන අතරතුර මෙම පාවෙන යාත්‍රා සඳහා වූ ලොයිඩ් ලේඛණ වර්ගීකරණ සමීක්ෂණ අවශ්‍යතා අනුව යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාවන් ද ඉටුකර ඇත.

තවද මෙම වසර තුළදී ප්‍රධාන භාරන යාත්‍රා දෙක වන "හංසකාවා" ට්‍රේලින් සක්ෂන් භාරන යාත්‍රාව සහ "දිය කොවුල්ලා" ග්‍රැබ් හොපර් භාරන යාත්‍රාව මනා මෙහෙයුම් තත්ත්වයකින් පවත්වා ගෙන යාම සඳහා නඩත්තු කටයුතු කර ගෙන යනු ලැබීය. තවද, "බුවල්ලා" කටර් සක්ෂන් භාරන යාත්‍රාවේ සියලුම ව්‍යුහාත්මක සහ පින්තාරු කිරීම ද ඇතුළුව යාත්‍රා බඳෙහි අලුත්වැඩියා කටයුතු ද මෙම කොට්ඨාශය විසින් සම්පූර්ණ කර ඇත. තවද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක, නාවික සහ සිවිල් ඉංජිනේරු කොට්ඨාශවල භාවිතා කරනු ලබන පිටතින් එන්ජින් සවිකල යාත්‍රාවල සාමාන්‍ය අළුත්වැඩියා නඩත්තු කටයුතු ද මෙම කොට්ඨාශය මඟින් සිදු කර ඇත.

තවද, මෙම වර්ෂය තුළ "ගෝඨයිම්බර" සහ "නන්දිමිත්‍ර" ටග් යාත්‍රා වියළි තටාකාංගන ගත කිරීම ද ඇතුළුව ඇක්වමාස්ටර් ප්‍රචාලන පද්ධතිවල ප්‍රධාන අලුත්වැඩියා කටයුතු ද මෙම අංශය විසින් සතුටුදායක අන්දමින් නිම කරන ලදී. තවද "රාජා" "වේළුසුමන" "තේරපුථාභය" ටග් යාත්‍රාවල සහ "දියකොවුල්ලා" සහ "හංසකාවා" යන භාරන යාත්‍රාවල තටාකාංගන අළුත්වැඩියා සහ අනෙකුත් ප්‍රධාන අළුත්වැඩියා කටයුතු ද මෙම අංශය මඟින් සිදුකර ඇත. "විජයබාහු" ටග් යාත්‍රාවේ ප්‍රධාන එංජින් දෙක සහ විදුලි උත්පාදන යන්ත්‍ර දෙක සම්පූර්ණයෙන්ම ගලවා අලුත්වැඩියා කටයුතු සිදුකරන ලද අතර ප්‍රචාලන පද්ධතියේ අලුත්වැඩියා කටයුතු ද සිදුකරන ලදී. "නීලමහ" ටග් යාත්‍රාවේ සම්පූර්ණ එංජිම, ප්‍රචාලන සහ යාන්ත්‍රික අලුත්වැඩියාවන් මෙන්ම අධිපීඩනය යොදා මලකඩ ඉවත්කිරීම සහ සම්පූර්ණයෙන්ම තීන්ත ආලේප කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක මණ්ඩලය මඟින් වියළි තටාකාංගන භාවිතා නොකර ආරක්ෂිත බලපත්‍ර සහිත දියත් මහ උපයෝගී කර ගනිමින් සාර්ථකව නිමකර ඇත.

2011 වසර නැවත සැකසීමේ අංශය ඉතිහාස ගතවන වසරකි. ප්‍රධාන කාර්යයන් සහ තටාකාංගන අලුත්වැඩියා කිරීම් පිළිබඳව වසරක් තුළ උපරිම දියුණුවක් මෙම වසරේදී ලබා ඇත. එමඟින් මෙම කර්තව්‍යන් ඉතා සාර්ථකව ඉටු කරන ලද අතර මෙහෙයුම් සඳහා නැංගුරම් ලෑමේ ටග් යාත්‍රා උපරිම වශයෙන් සපයා දී ඇත.

**වරාය යාත්‍රා අංශය**

නියමු දියත් යාත්‍රා සහ මුරින්ග් යාත්‍රා ආදිය අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම ප්‍රධාන වශයෙන් වරාය යාත්‍රා අංශයට පැවරී ඇත. මේ අනුව නාවුක කොට්ඨාශයේ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට සමත්ව ඇත.

වසර තුළදී "අංක 01", "රේනජර්", "බලයා", "රුහුණු" මුරින්ග් යාත්‍රා සහ "එකෝ 3" සමීක්ෂණ යාත්‍රාව සහ "අංක 09" දරණ නියමු යාත්‍රාව නෞකා දියත් මහට ගෙන ගොස් සියලුම දිය යට අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. "අංක 10" නියමු යාත්‍රාවේ එන්ජින් දෙකෙහි සහ යාන්ත්‍රික මෙන්ම සවිකල කොටස් සම්පූර්ණයෙන් අලුත්වැඩියා කිරීම් සිදු කරන ලදී. 11, 12, 13, 14 සහ 15 දරණ නියමු යාත්‍රා මෙන්ම 2, 3 මුරින් යාත්‍රා සහ එකෝ 3 යාත්‍රාවෙහි ලොයිඩ් වර්ගීකරණ සමීක්ෂණ සතුටුදායක අන්දමින් නිම කරන ලදී. ඉහත සඳහන් කරුණුවලට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියලුම නියමු යාත්‍රා, මුරින් යාත්‍රා සහ අනෙක් යාත්‍රාවන් වල සාමාන්‍ය නඩත්තු කටයුතු සහ අලුත්වැඩියා කටයුතු ද සිදු කරන ලදී.

**නාවික අංශය II**

**නැව් තැනීමේ අංශය**

නැව් තැනීමේ අංශය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාවෙන යාත්‍රාවන්හි සියලුම දැවමය අළුත්වැඩියා කටයුතු සහ ෆයිබර් ග්ලාස් අළුත්වැඩියාවන්ට ප්‍රධාන වශයෙන් වගකිව යුතු වේ. තවද එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දියත් යාත්‍රාවල සහ කිම්දුම් බෝට්ටුවල ෆෙන්ඩර් අළුත්වැඩියාවන්, ලී වැඩ සහ යාත්‍රාවන්හි ලී බඳ වල අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු සිදු කරන ලදී. සියලුම ජීආර්පී බෝට්ටුවල සහ දැවමය බඳ සහිත දියත් යාත්‍රාවල ෆයිබර් ආවරණ අළුත්වැඩියා කිරීමට ද හැකි විය. නාවික කොට්ඨාශය විසින් භාවිතා කරනු ලබන නැංගුරම්ලෑමේ ටග් යාත්‍රාවල දැවමය

ගෘහභාණ්ඩ අළුත්වැඩියාව, පනේල වැඩ (Paneling) සහ ෆෙන්ඩර්ස් අළුත්වැඩියා කටයුතු නැව් තැනීමේ අංශය විසින් සිදු කරන ලදී. වර්ෂය තුළ ටොන් 600 ක් බරති ආරක්ෂිත දියත් මගෙහි හතර වතාවක් දියත් මෙහෙයුම් සිදුකර ඇති අතර දියත් මහ 1 සිට 3 දක්වා දියත් මෙහෙයුම් හයක් සිදු කරන ලදී. මෙම අංශය විසින් දියත් යාත්‍රා 07 ක ප්‍රධාන පෙලේ අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදී. නියමු දියත් යාත්‍රා 04 ක, නැව් බැඳ තැබීමේ යාත්‍රා 04, විවිධ කුඩා යාත්‍රා කිහිපයක නැංගුරම්ලෑමේ ටග් යාත්‍රා 06 ක සහ අනෙකුත් යාත්‍රා 10 ක නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු මෙම වර්ෂය තුළදී කටයුතු සිදු කරගෙන යන ලදී.

**නැව්බඩු යාත්‍රා අළුත්වැඩියා අංගනය**

ක්‍රියාකරවන කොට්ඨාශය විසින් භාවිතා කරනු ලබන ඇදගෙන යාමේ ටග් යාත්‍රා, මෝටර් දියත් යාත්‍රා, වතුර බත්තල්, තට්ටු බත්තල්වල නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු කෙරෙහි මෙම අංගනය වගකිව යුතු අතර මෙම යාත්‍රාවල මලකඩ ගැටිති ඉවත් කර සුද්ද කිරීම (Grit Blasting) හා පින්තාරු වැඩ කර ගෙන යනු ලැබේ. ක්‍රියාකරවන කොට්ඨාශය විසින් ඉහත සඳහන් කරන ලද යාත්‍රාවල මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට මෙම අංගනයට හැකි විය.

වර්ෂය තුළ ක්‍රියාකරවන, නාවික, ආරක්ෂක හා ඉංජිනේරු කොට්ඨාශ, ගාල්ල වරාය, ත්‍රිකුණාමලය වරාය සහ අනෙකුත් බාහිර ආයතන විසින් ඉල්ලා සිටින ලද විවිධ ප්‍රමාණයේ කම්බි හා මැනිලා කඹ සිලිංග 697 ද, විවිධ ප්‍රමාණයේ තිර රෙදි 220 ක් ද, විවිධ ප්‍රමාණයේ කැන්වස් ආවරණ 44 ක් සහ කුෂන් කවර 35 මෙම අංශය විසින් නිශ්පාදනය කර සපයන ලදී.

අත් කරත්ත, අපද්‍රව්‍ය ගෙන යන කරත්ත, විල්බැරෝ වැනි විවිධ වර්ගයේ කරත්තවල අළුත්වැඩියා කටයුතු සිදු කරන අතරතුර විල්බැරෝ සහ අත්කරත්ත 17 ක් නිශ්පාදනය කෙරිණ. එමෙන්ම විවිධ වර්ගයේ පයිප්ප නිශ්පාදනය සහ අළුත්වැඩියා කටයුතු මෙම අංගනය විසින් කර ගෙන යනු ලැබිණ. ඊට අතරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාශ විසින් ඉල්ලා සිටින ලද, 1500 ට වැඩි විවිධ උපකරණ නිෂ්පාදනය කිරීම සහ මුළුතැන්ගෙයි උපකරණ, ඇළුමිනියම් නිශ්පාදන හා අත් මෙවලම් අළුත්වැඩියා කිරීම ද සිදු කෙරිණ.

සම්පූර්ණ වානේ අළුත්වැඩියාවන් සහ නැව් බඳ ගැටීම් වලක්වනයන් වැඩ සහිතව "වැලිගොව්වා" ටනැක් ටග් යාත්‍රාවේ සහ WB 12 වතුර බත්තලෙහි සම්පූර්ණ අළුත්වැඩියාවක් සිදු කරනු ලැබිණ. කොළඹ වරායේ දියත් මාර්ග 6 ක් නඩත්තු කර ක්‍රියාත්මක කරන මෙම අංශය වර්ෂය තුළ දියත් මෙහෙයුම් 13 ක් සිදු කරන ලද අතර, යාත්‍රාවල අළුත්වැඩියා කටයුතුද නිරත විය. (ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යාත්‍රා 10 ක් සහ පෞද්ගලික අංශයට අයත් යාත්‍රා 03 කි)

**බේරේ අංගනය**

මෙම අංගනය ප්‍රධාන වශයෙන්ම ක්‍රියාකරවන කොට්ඨාශය විසින් භාවිතා කරනු ලබන වානේ නැව් බඩු බත්තල් නඩත්තුව සහ අළුත්වැඩියාව සම්බන්ධයෙන් වගකියනු ලැබේ. ලොරි බොඩි 03 ක වානේ රාමු සැකසීම් සිදු කල අතර WB 07 වතුර බත්තලෙහි ප්‍රධාන අළුත්වැඩියා කටයුතු වර්ෂය තුළදී සිදු කර ඇත.

නාවික ඉංජිනේරු කොට්ඨාශයේ සිය සේවය සියලුම කොට්ඨාශ වෙත සාර්ථකව ලබාදී ඇති අතර, වසර තුළදී පෞද්ගලික අංශය වෙත දියත් මහ සේවය ලබාදීමෙන් හා දියත් මහ කුළී පදනම මත ලබාදීමෙන් සහ වයර් සිලිංග යනාදිය නිශ්පාදනය කිරීම මගින් රු. 8,967,263.26 ක ආදායමක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට උපයාදීමට හැකිවිය.

කාර්යා මණ්ඩලයේ සහ සේවකයින්ගේ ඇපකැපවීම සමඟින් පවත්නා සම්පත් උපයෝගී කර ගැනීම හේතුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාවෙන යාත්‍රා සම්බන්ධයෙන් වූ සියලුම මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට මෙම කොට්ඨාශයට හැකිවිය.

## සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ

### කාර්යයන්

ශ්‍රී ලංකාවේ සියළු වාණිජ වරායයන්හි මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය කරනු ලබන ඉන්ධන, යන්ත්‍ර සහ උපකරණ අමතර කොටස් සහ අනෙකුත් අයිතමයන් මිලදී ගැනීම (දේශීය සහ විදේශීය), ගබඩා කිරීම සහ නිකුත් කිරීම, මෙම කොට්ඨාශයේ ක්‍රියාකාරකම්වලට ඇතුළත් වේ.

සමාලෝචිත වර්ෂය තුළ අනුමත කළ ටෙන්ඩර් සංඛ්‍යාව

| විස්තරය | ටෙන්ඩර් මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව | ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය |
|---|---|---|
| කැබිනට් මණ්ඩලය පත් කළ ටෙන්ඩර් මණ්ඩලය (අනුමත සීමාව රුපියල් මිලියන 100ට වැඩි) | නැත | නැත |
| අධ්‍යක්ෂ මණ්ඩලය (දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලය අංක 1) (රුපියල් මිලියන 20 සිට මිලියන 100 දක්වා) | 12 | 07 |
| මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය (දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩල අංක 2) (රු. 250,000/- සිට රුපියල් මිලියන 20 දක්වා) | 48 | 1,412 |
| "බී" ටෙන්ඩර් මණ්ඩලය (දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩල අංක 03) (අනුමත සීමාව රු. 250,000/- ට අඩු) | 51 | 3,401 |

**දේශීය මිළදී ගැනීම් සඳහා 2011 වර්ෂය තුළ සමස්ථ වියදම**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන නොවන භාණ්ඩ | රු. | 694,476,269/= |
| ප්‍රාග්ධන අයිතම | රු. | 79,868,330/= |

**විදේශීය මිළදී ගැනීම් වෙනුවෙන් 2011 වර්ෂය තුළ සමස්ථ වියදම (පිරිවැය සහ නැව් ගාස්තු වටිනාකම)**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන නොවන අයිතම | රු. | 416,809,725/= |
| ප්‍රාග්ධන භාණ්ඩ | රු. | 235,055,961/= |

| | |
|---|---|
| විවෘත කළ ණයවර ලිපි | 146 |
| විවෘත කළ ටෙලිග්‍රැෆික් හුවමාරු සංඛ්‍යාව | 13 |

**2011 වර්ෂය තුළ වාප්පු අංශය මගින් නිශ්කාෂණය කර ගන්නා ලද භාණ්ඩවල විස්තරය**

නැව් භාණ්ඩ - 89

ගුවන් භාණ්ඩ - 105

තැපැල් පාර්සල් - 09

**2011.12.31 දිනට තොග වටිනාකම රු. 1,669,620,237**

**ප්‍රධාන ගබඩාව සහ තොග පාලන**

| | |
|---|---|
| 2011 වර්ෂය තුළ ගබඩා වලට ලැබුණු භාණ්ඩ වටිනාකම (ප්‍රාග්ධන සහ ප්‍රාග්ධන නොවන) | රු. 1,854,217,263/= |
| භාවිතා කරනු ලබන අංශයන් වෙත නිකුත් කළ භාණ්ඩ වටිනාකම (ප්‍රාග්ධන සහ ප්‍රාග්ධන නොවන) | රු. 2,409,676,069/= |

## තොරතුරු පද්ධති

තොරතුරු පද්ධති කොට්ඨාශය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සංවර්ධන අභිප්‍රායන් මනා ලෙස හඳුනාගෙන ඇති අතර ඒ පිළිබඳව ඉතා උනන්දුවෙන් කටයුතු කරයි. තවද මෙම පද්ධතිය ඉතා සාර්ථක අන්දමින් ඉදිරියට ගෙනයාමෙහිලා වඩාත් නවීනතම තොරතුරු තාක්‍ෂණික ක්‍රමවේද භාවිතා කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම වඩාත් කාර්යක්‍ෂම අන්දමින් කාර්යාල ක්‍රම, නවීනතම ක්‍රම හඳුන්වාදීමෙන් පද්ධතිය ඉදිරියට ගෙනයාමට කටයුතු කර ඇත. තොරතුරු තාක්‍ෂණයේ භාවිතා කළ හැකි සම්පත් උපයෝගී කරගෙන වඩාත් වේගවත් ලෙස වරාය සංවර්ධන කටයුතු ඉටුකිරීමෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය කළාපයේ අනෙකුත් වරායන් සමඟ තරඟකාරිත්වයෙන් වඩාත් ඉදිරියට ගෙනයාමට හැකි වේ. තොරතුරු තාක්‍ෂණය පදනම් කරගත් ව්‍යාපෘති සළකා බලන විට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාර්ථකත්වය උදෙසා තොරතුරු පද්ධතිය වැදගත් බලවේගයක් වේ. තොරතුරු තාක්‍ෂණ පද්ධතිය මගින් මෙතෙක් කල් මෙහෙය වන ලද ව්‍යාපෘති සහ දැනට මෙහෙය වනු ලබන ව්‍යාපෘති දෙස බැලීමේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ව්‍යාපාරික අරමුණ ළඟාකර ගැනීමෙහිලා තොරතුරු පද්ධති කොට්ඨාශය විසින් දෙනු ලබන දායකත්වය පෘථුල ලෙස සනාථ කරයි.

**බහළු පර්යන්ත කළමනාකරණ පද්ධතිය (සීටීඑම්එස්) - ජයබහළු පර්යන්තය/සමගි බහළු පර්යන්තය**

නේවිස් (NAVIS) පර්යන්ත කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු නව/වෙනස් වන ව්‍යාපාරික අවශ්‍යතා හේතුකොට ගෙන මුහුණපෑමට සිදුවූ ප්‍රශ්න රැසක් මෙම නව ක්‍රමවේද අනුබද්ධතාවය තුළින් සාර්ථක කිරීම සහතික කර ඇත. භාවිතා කරන්නන් විශාල සංඛ්‍යාවකට අන්තර්ජාල ප්‍රවේශ මොඩියුල පහසුකම් වඩාත් ප්‍රචලිත කිරීමට පියවර ගෙන ඇත. මෙම කාර්යය සම්පූර්ණ කිරීමෙන් පසුව නියෝජිතයින් වරායට පැමිණීමේ අවශ්‍යතාවය අවම කර ඇති අතර ලිපි කටයුතු අවම කිරීමෙන් තොරතුරු හුවමාරුව වඩාත් වේගවත් කර ඇත. මෙම පද්ධතියට බාධාවක් වනුයේ “එක්ස්ප්‍රස්” දත්ත සමුදායට අදාළ තොරතුරු ගබඩා කිරීමේ පහසුකමින් වැඩි ප්‍රමාණයක් ඉතා සීඝ්‍රයෙන් වැඩිවන දත්ත පරිමාවට ඇතුළත් කර ගැනිමට සිදුවීමයි. මෙම තත්ත්වය මඟහරවා ගැනීමට අනවශ්‍ය දත්ත ඉවත් කිරීම සඳහා මොඩියුලයක් (Purging Module) මිළදී ගෙන ඇති අතර මෙය පරීක්‍ෂණ පද්ධතිය සමඟ සාර්ථක ලෙස ක්‍රියාත්මක කර ඇත. දැනට මෙය නිෂ්පාදන පද්ධතියේ ක්‍රියාත්මක කිරීම අරඹා ඇත.

**නැව් බඩු කළමනාකරණ පද්ධතිය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාරිභෝගිකයින්ට කාර්යක්‍ෂම සේවයක් සැපයීම සඳහා 2011 වසර තුළදි නේවිස් පද්ධතියේ නැව් බඩු මොඩියුලයක් මිළදි ගන්නා ලදි. මෙම මොඩියුලය භාවිතා කරන දෙපාර්තමේන්තු සමඟ පරීක්‍ෂාවට භාජනය කර ඇති අතර මෙම මොඩියුලය ක්‍රියාත්මක කිරීමත් සමඟ සේවා සැපයුම් කොට්ඨාශයේ ඵලදායිතාවය නඟා සිටුවීමට බලාපොරොත්තු වේ. නැව් බඩු නිශ්කාෂණ කර්මාන්තයට මෙමඟින් බොහෝ වාසිදායක තත්ත්වයන් ඇති වේ. එනම්, ගණුදෙනුකරුවන්ගේ කාර්යාල වලින් සේවා ඉල්ලීමේ අයදුම්පත් ලබාදීම ඇරඹීම, ශ්‍රී ලංකා වරාය

අධිකාරියෙන් ඉන්වොයිස් කෙටුම්පත් ඉදිරිපත් කිරීම, ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් මුදල් මගින් ගෙවීම් කිරීමේ පහසුකම, ලංකා බැංකුවේ ගිණුම් අයිතිකරුවන්ගේ මුදල් අන්තර්ජාලය මගින් හුවමාරු කිරීම හෝ ඕනෑම බැංකුවක ඩෙබිට්/ක්‍රෙඩිට් කාඩ් පාවිච්චි කිරීමෙන් අන්තර්ජාල ගෙවීම් ප්‍රවේශයන් භාවිතා කිරීම වේ. මෙය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව දොරටු සහ ගුදම් විද්‍යුත් මාර්ගයෙන් සම්බන්ධ කරන අතර නිශ්කාෂණ කර්තව්‍යයන් සරල කිරීම හා පුළුල් කිරීම සිදුවේ. මෙමඟින් විවිධ සේවා ස්ථාන වල රැඳී සිටීමට සිදුවන කාල වේලාවන් අඩු කිරීම ද සිදුවේ.

මෙම මොඩියුලය ක්‍රියාත්මක කිරීම අදියර දෙකකින් සිදුකිරීමට සැළසුම් කර ඇත. පළමු අදියරේදී නිර්යාත ක්‍රියාදාමය ක්‍රියාත්මක කරනු ලබන අතර දෙවන අදියරේදී ආයාත ක්‍රියාදාමය ක්‍රියාත්මක කරනු ලැබේ.

**ඔරකල් මූල්‍ය පද්ධතිය**

දැනට පවත්නා පද්ධතිය මූලික වශයෙන් දියුණු කිරීම සඳහා පොදු ලෙජරය, ලැබිය යුතු ගිණුම් සහ මුදල් කළමනාකරණ මොඩියුලය සමඟ මූල්‍ය පද්ධතිය නව ඔරකල් බිස් සර්වරයක් (ORACLE BIZ SERVER) වෙත මාරුකර ඇත. පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු දැනට අතින් කරනු ලබන කටයුතු බොහොමයක් එමඟින් සිදුකරනු ලැබේ. එනම් චෙක්පත් ලිවීම ස්වයංක්‍රීයව සිදුකිරීම, මුදල් කොට්ඨාශයේ ක්‍රියාදාමයන් සරල කිරීම තුළින් වැඩ කටයුතු කාර්යක්ෂමතාවයකින් සහ නිරවද්‍යතාවයකින් සිදුකරනු ලැබිය හැකිවේ. කලින් පැවති සර්වරය පරීක්ෂණ තත්ත්වයකට පරිවර්තනය කරන ලදි. දත්ත එක්රැස් කිරීම සහ ගෙවිය යුතු ගිණුම් මෙන්ම ස්ථිර වත්කම් මොඩියුලයන් පරීක්ෂා කිරීම DMS කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය ඇතිව ආරම්භ කර ඇත.

**සේවක සෞඛ්‍යාරක්ෂණ කළමනාකරණ පද්ධතිය (EHMS) - වෛද්‍ය පද්ධතිය**

වෛද්‍ය කොට්ඨාශයේ කටයුතු පරිගණක පද්ධතියක් යටතේ දියුණු කිරීම පසුගිය වසරේදී නිමකරන ලදි. ගෙගා බයිට් 146ක් සහිත දෘඩ තැටි 4ක් සමඟ X – 3850 M2 IBM සර්වර් යන්ත්‍රයක් ලබාගන්නා ලද අතර Linux Red Hat මෙහෙයුම් පද්ධතියක් සවිකරන ලදි. මෙම පද්ධතිය ක්‍රියාකරනු ලබන්නේ ඔරකල් 10g දත්ත සමුදාය මගිනි. විවිධ ස්ථාන වලට ජාල ගතකිරීම් දැනටමත් සම්පූර්ණ කර ඇති අතර විද්‍යුත් රැහැන් සැපයීම සහ ක්ලයන්ට් (Client) යන්ත්‍ර ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා දැනට කටයුතු කරනු ලැබේ. VB. NET භාවිතා කිරීමෙන් මෘදුකාංග සංවර්ධනය සිදුකරන ලද අතර මෘදුකාංග අවසාන පරීක්ෂණයට ලක්කිරීම දැනට සිදුකෙරෙමින් පවතී.

**වට්ටෝරුගත භාණ්ඩ පාලනය සහ ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය**

සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ අංශයක අවශ්‍යතා සපුරාලීමට අවස්ථාවක් සළසාදීම දීර්ඝ කාලයක් සිට පැවති අවශ්‍යතාවයකි. මේ බව අනාවරණය වුයේ කොට්ඨාශයේ සියලුම කර්තව්‍යයන් පවත්නා පද්ධතිය යටතේ සපුරාලීමට නොහැකි වීමෙනි. විද්‍යුත් ව්‍යාපාරික ක්‍රමයේ වට්ටෝරුගත භාණ්ඩ සහ ප්‍රසම්පාදන මොඩියුලයක් අපගේ සියලුම අවශ්‍යතාවයන් ඉටුකිරීම සඳහා වූ විසඳුමක් ලෙස සළකා බලන ලදි. ඒ අනුව මොඩියුල දෙකක් මිළට ගත් අතර අපගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි මෘදුකාංග සකස්කිරීම අරමුණු කරගෙන පද්ධති පිළිබඳ අධ්‍යයනයක් අරඹන ලදි. මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසු සියලු වට්ටෝරුගත භාණ්ඩ කළමනාකරණය, දේශීය විදේශිය මිළදී ගැනීම් සහ භාණ්ඩ ඉල්ලීම් කර්තව්‍යයන් ස්වයංක්‍රීයව සිදු කෙරේ.

**ජීවමිතික පැමිණීමේ /පිටවීමේ වේලා සටහන් හා භෞතික පිවිසුම් පාලන පද්ධතිය (TAPAC)**

මෙම ව්‍යාපෘතිය අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීමට නියමිතය. පළමු අදියරේ ප්‍රධාන කර්තව්‍ය වන්නේ සියලුම සේවකයින්ගේ පැමිණීමේ/පිටවීමේ විස්තර වාර්තා ලබාගැනීමයි. මෙම මොඩියුලය සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලද අතර කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ ඔලුවිල් යන ස්ථාන වල මනා අන්දමින් පවත්වා ගෙන යනු ලැබේ. සියලුම පරිපාලන

කළමනාකරුවන්ට සේවක පැමිණීමේ/පිටවීමේ වාර්තා නඩත්තු කිරීමට සහ වාර්තා ලබාගැනීමට පහසුකම් සළසා ඇත. මෙම මොඩියුලය නව වැටුප් පත්‍රිකා පද්ධතිය සහ මානව සම්පත් පද්ධතිය අතර 2012 වසර මැද භාගයේදී සම්බන්ධ කිරීමට සැළසුම් කර ඇත. මෙම අනුබද්ධ කිරීම සම්පූර්ණ කිරීමෙන් පසු නිවාඩු සහ අතිකාල විස්තර නඩත්තු කිරීම ස්වයංක්‍රීයව සිදුකිරීමට පහසු වේ.

දෙවන අදියරේදී සේවකයන් එහාමෙහා යාම දොරටු මගින් පරීක්ෂාවට ලක් කිරීමට හැකිවේ. නියමු ව්‍යාපෘතියක් වශයෙන් දැනටමත් දොරටු දෙකක මෙම යන්ත්‍ර සවිකර ඇත. ඒවා දැනට පරීක්ෂාවට ලක් කෙරෙමින් පවතී.

**නව වැටුප් පත්‍රිකා පද්ධතිය**

අවශ්‍යතා එකතුකිරීම, පද්ධතිය පිළිබඳ අධ්‍යයනය, විශ්ලේෂණය සහ සංවර්ධන අවධීන් දැනටමත් සපුරා ඇති අතර 2011 වසර අග භාගයේදී පද්ධතිය ක්‍රියාත්මක කිරීම අරඹන ලදි. මෙම පද්ධතිය ප්‍රධාන වශයෙන් මුදල් කොට්ඨාශයේ අවශ්‍යතා සපුරනු ලබන අතර අවසන් අවධීන් වලදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියලුම පරිපාලන අංශ වලට සම්බන්ධ කරනු ලැබේ. නව වැටුප් පත්‍රිකා පද්ධතිය මානව සම්පත් පද්ධතිය සමඟ අනුබද්ධ කිරීමට කටයුතු කරන අතර පද්ධතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වූ විට නිවාඩු/අතිකාල නඩත්තු කිරීම් සහ පරිගණක මගින් ණය අයදුම් කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීයව ඉටුකිරීම පහසුවේ.

**ආනයන බිල්පත් සම්බන්ධ හදිසි අවස්ථා පද්ධතිය**

පූර්ණ බහළු පැටවුම්(FCL)/ඌණ බහළු පැටවුම් (LCL)/CSC වැනි ප්‍රධාන නැව්බඩු නිශ්කාෂණ පද්ධති වල බිඳ වැටීමක් සිදු වුවහොත් එවන් අවස්ථා වලදී භාවිතා කිරීම සඳහා කාර්යය පද්ධතියක් සංවර්ධනය කර ඇත. මෙය පරීක්ෂාවට ලක්කොට ඇති අතර අවශ්‍ය වූ විටෙක ක්‍රියාත්මක කිරීමට සුදානම්ව ඇත. ආයතනය ඇතුළත සංවර්ධනය කළ මෙම පද්ධතිය ඔරකල් දත්ත සමුදාය සමඟ සහ දත්ත හුවමාරු කිරීමේදී සමස්ථ වරාය ජාලය තුළ භාවිතා කෙරේ.

**දෘඩාංග කළමනාකරණ පද්ධතිය**

පරිගණක යන්ත්‍ර සහ ප්‍රින්ටර්ස් වැනි දෘඩාංග අයිතමයන් අළුත්වැඩියා කිරීම් කටයුතු තොරතුරු පද්ධති කොට්ඨාශය මගින් පරීක්ෂා කළ හැකි වන පරිදි දෘඩාංග චලනයන් ක්‍රමවත් කිරීම සඳහා මෙම පද්ධතිය සංවර්ධනය කර ඇත. භාණ්ඩ වට්ටෝරුගත කිරීම සහ ඒවා ස්ථානගත කිරීම සරල විමසුම් පහසුකමක් බවට දැනට පත්වී ඇත. මෙමගින් දෘඩාංග අයිතමයන් පරීක්ෂා කිරිමේ ක්‍රියාවලිය ඉතා සරල කර්තව්‍යයක් බවට පත්කර ඇත.

**බිල්පත් සංසන්දනාත්මක පද්ධතිය**

නව භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවය අනුව මෙම පද්ධතිය වැඩිදියුණු කර ඇති අතර ඔරකල් දත්ත සමුදාය කටයුතු වලට සුදුසු පරිදි VB. NET භාවිතා කරමින් සංවර්ධනය කර ඇත.

**තොරතුරු පද්ධතිය නඩත්තු කිරීම**

**පූර්ණ බහළු පැටවුම්/ඌණ බහළු පැටවුම්/ගොඩබෑම් හා භාරදීම් පද්ධතිය**

ඉහත සඳහන් පද්ධතීන් IBM ප්‍රධාන රාමු යන්ත්‍රණය තුළින් ක්‍රියාත්මක වන අතර ගණුදෙනුකරුවන්ට අඛණ්ඩ සේවයක් සැපයීම සඳහා අවශ්‍ය පූර්ව ආරක්ෂණ ක්‍රමයක් මගින් පද්ධති මනා අන්දමින් ක්‍රියාත්මක වන සේවයක් සහතික කරනු වස් අවශ්‍ය පියවර ගෙන ඇත. ආයෝජන මණ්ඩලය, කටුනායක, පිටකොටුව ලේඛන මධ්‍යස්ථාන තවමත් ප්‍රධාන රාමු යාන්ත්‍රණයක් මත යැපෙමින් පවතී.

**බහළු පැටවුම් මධ්‍යස්ථානය (CFS) - පෑලියගොඩ**

භාවිතා කරන්නන් සඳහා පද්ධති සහය, පුහුණුව සහ තත්කාර්යය වාර්තා සපයා ඇත. සර්වර් (Server) නඩත්තුව සහ දත්ත ආධාරක ක්‍රියාවලින් පරීක්ෂා කරන ලද අතර සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.

**ආරක්ෂක පාලනය සහ බලපත්‍ර නිකුත්කිරීමේ පද්ධතිය**

භාවිතා කරන්නන් සඳහා පද්ධති සහය පුහුණුව සහ තත් කාර්යය වාර්තා සපයා ඇත. සර්වර් (Server) නඩත්තුව සහ දත්ත ආධාරක ක්‍රියාවලින් පරීක්ෂා කර සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. අතිරේකව මෙහෙයුම් පද්ධතියේ අධි පියවරක් සහිතව සර්වර් යන්ත්‍රණය පී පද්ධතියේ නව භාණ්ඩයක් ලෙස යාවත්කාලීන කර ඇත. තවද දත්ත සමුදාය ඔරකල් 8 i සිට 10 g දක්වා අධි පියවරක් ලෙස සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.

මෙම පද්ධතීන් ක්‍රියාත්මක කිරීමේ තලයට ලඟා වූ පසු දෘඩාංග හා මෘදුකාංග නඩත්තු කිරීම පද්ධතියේ ඉතා වැදගත් අංශයන් බවට පත්වී ඇත. පද්ධතියේ ජීවන කාලය තුළ දීර්ඝ කාලීන මෙහෙයුම් කටයුතු නඩත්තු කිරිම තොරතුරු පද්ධතියට නොසළකා හැරිය නොහැකි කාර්යයක් වේ. තොරතුරු පද්ධතිය මත පැවරී ඇති නඩත්තු කාර්යය පරිමාවට විශේෂ අවධානයක් යොමු කළ යුතු වන්නේ එය මෙහෙයුම් පද්ධතිය ක්‍රියාත්මක කරගෙන යාම සඳහාත් මෙම කාර්යය අනාගතයේදී තවදුරටත් කරගෙන යාම සඳහාත් ඉවහල් වන බැවිනි. දෘඩාංග හා මෘදුකාංග නියමිත කාලානුරූපව නඩත්තු කිරීමෙන් තොරතුරු පද්ධති කොට්ඨාශය මගින් ගන්නා ලද ක්ෂණික ක්‍රියාමාර්ග, පද්ධතීන් අඛණ්ඩව මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහතික වී ඇත.

## මානව සම්පත් සංවර්ධන

සුදුසුකම්ලත් නිපුණතා සහිත ක්‍රියාශීලි ශ්‍රම බලකායක් ආකර්ශණය කර ගනුවස් ඵලදායක සහ කාර්යක්ෂම ලෙස සංවිධානයේ දැක්ම, මෙහෙවර සහ අභිලාෂයන් ඉෂ්ඨ කර ගැනීමෙහිලා ඔවුන්ගේ සේවය රඳවා ගැනීමත් සම්බන්ධව මානව සම්පත් සංවර්ධන කොට්ඨාශය වගකිවයුතුවේ. සේවකයන් බඳවා ගැනීමේ සිට විශ්‍රාමයාම දක්වා සියලුම කාර්තව්‍යන් මානව සම්පත් කොට්ඨාශය මඟින් සාධනය කරනු ලබන අතර, වැටුප් සහ වේතන කළමනාකරණය, ප්‍රතිලාභ සහ දිරිදීමනා සැපයීම, කාර්යය සාධන ඇගයීම, දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම මානව ප්‍රාග්ධන කළමනාකරණය සහ මානව සම්පත් සැලසුම් කිරීම මීට අයත් වේ.

12,987 ක් වන සේවක සංඛ්‍යාව කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය සහ ඔලුවිල් යන වරායවල ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කර්තව්‍යන් මනා අන්දමින් ක්‍රියාත්මක කිරීමෙහිලා අනුමත කරන ලද මානව සම්පත් සැලැස්ම ඉවහල් වී ඇත. අනුමත කරන ලද නව බඳවා ගැනීමේ පටිපාටිය සහ නව ලකුණුදීමේ ක්‍රමය අනුව මානව සම්පත් සැලැස්ම අනුගමනය කරමින් තනතුරු වලින් වැඩි ප්‍රමාණයක් ආයතනය තුළ සේවකයන් අතුරින් යෝග්‍ය සහ සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසුව පුරවන ලදී. කෙසේ වෙතත් සුදුසු අයදුම්කරුවන් නොමැති අවස්ථාවන්හිදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව බාහිර බඳවා ගැනීම සඳහා කටයුතු කර ඇත.

2011 වසර ආරම්භයේදී විධායක, විධායක නොවන, තාක්ෂණික සහ තාක්ෂණික නොවන කොටස්වලට අයත් සම්පූර්ණ ශ්‍රම බලකාය 12,824 ක් විය. කොළඹ වරායේ සමස්ථ සේවක සංඛ්‍යාව 11,726 ක් වූ අතර ගාල්ල සහ ත්‍රිකුණාමලය යන වරායවල සේවක සංඛ්‍යාව පිළිවෙලින් 500 සහ 598 ක් විය.

සාම්ප්‍රදායික ක්‍රමෝපායන් වෙනුවට බහළු මෙහෙයුම් ක්‍රියාවලිය සහ ආශ්‍රිත සේවා පවත්වා ගෙන යාම සඳහා නව පරිඝණක පද්ධතීන් ක්‍රියාත්මක කිරීම සහ නව යන්ත්‍රසූත්‍ර හඳුන්වා දීමට මෑත භාගයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට හැකි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙහෙයුම් සහ

අනෙකුත් සේවාවල අතිරික්ත සේවක සංඛ්‍යාවක් නිර්මාණය විය. එබැවින් ඌණ ඵලදායිතාවයක් සහිත සේවකයින් සේවය අතහැරයාම උනන්දු කරනු වස් 2011.04.04 දින සිට ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කර ලදී. මේ අනුව ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රමය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් 1439 ක් විශ්‍රාම ගන්වා ඇත.

2011 වර්ෂයේදී ස්ථිර පදනම මත අනුමත සේවක සංඛ්‍යාව තුළ සේවකයින් 12 දෙනෙකු බාහිරව බඳවා ගෙන ඇත. වසර තුළ සේවක සංඛ්‍යාවෙන් 331 ක් විශ්‍රාම යාමෙන්ද, 1439 ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමෙන් ද, 29 දෙනෙකු සේවයෙන් පහ කිරීමෙන්, 56 දෙනෙකු මරණයට පත්වීම සහ වෙනත් හේතුන් නිසාද සේවකයින් 1855 දෙනෙකු අඩු වී ඇත.

ඉහත විස්තර මත පදනම් වී ඇති අන්දමට 2011.12.31 වැනි දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කලමනාකරණය කරනු ලබන සියලුම වරායවල සම්පූර්ණ ශ්‍රම බලකාය 10982 ක් විය. මෙයින් 10083 ක් කොළඹ වරායේද, 433 ගාලු වරායේද, 466 ක් ත්‍රිකුණාමලය වරායේද සේවයේ යෙදී සිටියහ. සේවා බාණ්ඩ අනුව විධායක නිලධාරීන් 667 ක්ද, විධායක නොවන 5989 ක් ද, තාක්ෂණික 2192 ක්ද, තාක්ෂණික නොවන ශ්‍රේණිවල 2134 ක් ද වූහ.

2011 වසර තුළ සිදු වූ හදිසි අනතුරු සංඛ්‍යාව 79 ක් වූ අතර මාරක අනතුරු වෙනුවෙන් රු. 550,000/= ක් ගෙවීමට කටයුතු කර ඇත

2011 වසර තුළ විශ්‍රාම ගිය/සේවයෙන් ඉල්ලා අස්වූ සේවකයින්ට රු. 9,782,000/= ක මුදල් පරිත්‍යාගයන් සිදුකර ඇත.

වසර තුළ ස්වභාවික හේතුන් මත මියගිය සේවකයින්ගේ යැපෙන්නන් සඳහා රු. 608,000/= ක කරුණාසහගත දීමනාවක් ප්‍රදානය කර ඇත.

2006 දී ක්‍රියාත්මක කරන ලද වැටුප් ව්‍යුහය පදනම් කර ගෙන සියලුම විධායක නොවන කොටස්වල වැටුප් පොදු ආකෘතියක් මත සංශෝධනය කරන ලද අතර සුදුසුකම්ලත් ශ්‍රම බලකායක් ආකර්ශණය කර ගැනීමෙහිලා නව බඳවා ගැනීමේ පටිපාටිය සලකා බලමින් නව ලකුණු දීමේ ක්‍රමයක් සකස් කරන ලදී. නව බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව සේවකයින්ගේ වැඩ, පැමිණීම සහ හැසිරීම පදනම් කර ගනිමින් 2011.11.01 දින සිට ඉහළ වැටුප් තලයක පිහිටුවීම කටයුතු කර ඇත.

ආයතනයේ නියමිත අරමුණු ඉටුකර ගැනීම සඳහා එක් එක් සේවකයින්ට ඵලදායක ලෙස පවරන ලද කාර්යයන් සාධනය කිරීම සම්බන්ධව ඇගයීමක් සෑම සය මසකට වරක් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. කාර්යය සාධන ඇගයීමේ ප්‍රතිඵල පදනම් කර ගනිමින් වර්තමාන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි සේවකයින්ගේ නිපුණතා, දැනුම සහ ආකල්ප දියුණු කිරීමට කටයුතු කරන ලදී.

මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) සියළුම කොට්ඨාශ සඳහා හඳුන්වා දෙන ලද අතර මානව සම්පත් කර්තව්‍යයන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහ භාවිතා කරන්නන්ට වඩාත් පහසු පද්ධතියක් නඩත්තු කිරීම සඳහා ලේඛණ කළමනාකරණ පද්ධතිය සහ සමස්ථ වැටුප් පත්‍රිකා පද්ධතිය මානව සම්පත් තොරතුරු පද්ධතිය සමඟ අනුබද්ධ කිරීම පිණිස කටයුතු කර ගෙන යනු ලැබේ.

## ආරක්ෂක

ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පාලනය වන සියළුම වාණිජ වරායන්ගේ ආරක්ෂාව පිළිබඳ වූ වගකීම ආරක්ෂක කොට්ඨාශය වෙත පැවරී ඇති අතර, එය ඉටු කරලනු වස් පුරා පැය 24 ක අඛණ්ඩ වූ කාර්යක්ෂම ආරක්ෂක සේවාවක් පවත්වා ගෙන යනු ලැබේ. කොළඹ වරාය අධි ආරක්ෂිත කලාපයක පිහිටා ඇති බැවින් එයට අයත් දේපළ සහ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා නව දැනුම, නව තාක්ෂණික මෙවලම් හා ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් මෙම කොට්ඨාශය ඉහත අරමුණු කරා යාමට විශිෂ්ඨ සේවාවක් සැපයීමට කැපවී සිටී.

පූර්ණ කාලීනව එදිනෙදා ආරක්ෂක රාජකාරී කටයුතු හොඳින් පවත්වා ගනිමින් වරායේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අප කොට්ඨාශය මඟින් උපයාගත් ආදායම පහත සඳහන් පරිදි වේ.

**වරාය පාවිච්චි කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම්**

| විස්තරය | රුපියල් |
|---|---|
| පුද්ගල සහ වාහන බලපත්‍ර නිකුත් කිරීමෙන්උපයාගත් ආදායම | 78,348,362 |
| වරාය බලපත්‍ර අස්ථාන ගතකර ගැනීමෙන් පසු නැවත නිකුත් කිරීමෙන් දඩ මුදල් වශයෙන් උපයාගත් ආදායම | 31,455 |
| S.A.G.T.ආයතනය වෙත සහ සී/ස කොළඹ නැව් තටාකාංගනය වෙත බලපත් නිකුත් කිරීමෙන් ලද ආදායම | 4,469,591 |
| බලපත්‍ර සඳහා කවර, උරපටි නිකුත් කිරීමෙන් ලද ආදායම | 142,100 |
| විනෝදාත්මක බිලීබෑම (Angling) සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම | 102,928 |
| **එකතුව** | **83,034,436** |

මෙයට අමතර වශයෙන් පහත සඳහන් ආදායම් ද උපයාගෙන ඇත.

| විස්තරය | රුපියල් |
|---|---|
| 2011 වර්ෂයේ රථවාහන නීති රීති උල්ලංඝණය කිරීම වෙනුවෙන් අධිකාරියේ පවරන ලද නඩුවලින් උපයාගෙන ඇති දඩ මුදල් | 137,500 |
| 2011 වර්ෂය තුළ හදිසි අනතුරු වලින් වරාය අධිකාරියට සිදු වූ අලාභ උදෙසා අයකර ගත් මුදල | 2,064,419 |
| **එකතුව** | **2,201,919** |

මෙම උපයාගත් මුදල්වලට අමතරව සේවා සැපයුමක් ලෙස බලපත්‍ර කාර්යාලය මඟින් මෙම වසර තුළ නිකුත් කළ බලපත්‍ර වර්ග සහ ප්‍රමාණ පහත දැක්වේ.

**වරාය සේවක ඡායාරූප බලපත්‍ර කාර්යාලය**

**2011 වසර තුළදී වරාය සේවකයින් සඳහා ඡායාරූප හැඳුනුම්පත් සංඛ්‍යාව**

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| නව පත්වීම් සඳහා | 30 |
| දත්තයන් වෙනස් වීම අනුව නැවත නිකුත් කිරීම | 1,028 |

| | |
|---|---|
| 2011 වසර තුළදී වරාය අධිකාරියේ සංචිත වාහන සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව | 517 |
| වරාය සේවකයින්ගේ පෞද්ගලික වාහන සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව | 3,710 |
| වර්ෂය තුළදී මුද්‍රණය කර ඇති R.P.U. බලපත්‍ර සංඛ්‍යාව | 1,948 |

තවද, මහත් මෙහෙවරක යෙදෙනෙ මෙම කොට්ඨාශයේ ආරක්ෂක පුහුණු අංශය නියාමකවරයාගේ සිට අධිකාරී තනතුර දක්වා නිළයන්ට ද විශේෂ විමර්ෂණ ඒකකයට ද අභ්‍යාස ලබා දෙමින් සහ වැඩමුළු පැවැත්වීමෙන් උසස් ප්‍රමිතියෙන් යුත් සේවයක යෙදවීමට මහත් කැපවීමකින් කටයුතු කර ඇත. ඒ අනුව වාර්ෂිකව පහත සඳහන් පුහුණු පාඨමාලාවන් ආරක්ෂක නිළයන් සඳහා පවත්වනු ලැබේ.

**ආරක්ෂක කොට්ඨාශයේ සියළුම තනතුරුවල ආරක්ෂක නිළයන් සඳහා සිදු කරන ලද පුහුණු පාඨමාලා**

2011 වර්ෂය තුළ ආරක්ෂක කොට්ඨාශයේ නිළ ඇඳුම්ලාභී සියලුම තනතුරවල ආරක්ෂක නිළයින්ට පහත සඳහන් වැඩමුළු සහ ප්‍රායෝගික පාඨමාලා පවත්වන ලදී.

✱ **ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක කොට්ඨාශයේ සහ අනුබද්ධ ආයතනවල රාජකාරි කටයුතු පිළිබඳ අවබෝධයක් ලබාදීම සඳහා පැවැත්වූ වැඩමුළු**

ඉහත විෂයට අදාළව පුහුණු සැසි 02 ක් පවත්වා තිබු අතර, තුන්වන සැසිය 2011.01.12 වන දින ආරම්භ වී වැඩමුළු 19 ක් පැවැත්වීමෙන් පසු 2011.07.20 වන දින අවසන් වන ලදී. එම වැඩමුළු 19 සඳහා ආරක්ෂක කොට්ඨාශයේ සියලුම තරාතිරම්වල ආරක්ෂක නිලයන් 1037 දෙනෙකු සහභාගී විය. මෙම වැඩමුළුවේ උපදේශකවරුන් වශයෙන් වෙනත් කොට්ඨාශවල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිළධාරීන් ද සහභාගී කර ගන්නා ලදී.

✱ **ගිනි අවි ප්‍රායෝගික පුහුණු කටයුතු සහ වෙඩි අභ්‍යාස පුහුණු**

ආරක්ෂක කොට්ඨාශයේ වයස අවුරුදු 45 ට අඩු ආරක්ෂක නිළයින් සඳහා බහුවාර ගිනි අවි වෙඩි තැබීම් පුහුණුව ද රාජකාරි අවශ්‍යතාවයන් මත තෝරාගත් ආරක්ෂක නිළයන්හට මි.මි 9 පිස්තෝල වෙඩි අභ්‍යාස පුහුණුව ද සිදු කරන ලද අතර, රාජකාරි අවශ්‍යතාවයන් මත අදාළ විධායක නිළධාරීන්ට මි.මි. 9 පිස්තෝල වෙඩි අභ්‍යාස පුහුණුව සහ බහුවාර වෙඩි අභ්‍යාස පුහුණුව ලබා දෙන ලදී. ඒ අනුව වාර්ෂික වෙඩි අභ්‍යාස පුහුණුවලදී මි.මි. 9 පිස්තෝල වෙඩි පුහුණු සඳහා ආරක්ෂක නිළයින් 88 ක් පුහුණු කටයුතු සිදු කළ අතර, ඒ සඳහා මි.මි. 9 ජීව පතරොම් 981 ක් භාවිතා කරන ලදී.

ඉහත සඳහන් සියලුම නිළයන් විසින් HK 512 සහ M3 සුපර් 90 යන ගිනි අවිවලින් ආරක්ෂක නිළයන් 571 දෙනෙක් වෙඩි අභ්‍යාස පුහුණු කටයුතු සිදු කළ අතර, ඒ සඳහා SG වර්ගයේ ජීව පතරොම් 5705 උපයෝගී කර ගන්නා ලදී. (සෑම වර්ෂයක් පාසාම ආරක්ෂක කොට්ඨාශයේ තෝරාගත් ආරක්ෂක නිළයන් සඳහා වෙඩි අභ්‍යාස පුහුණු කටයුතු සිදු කරනු ලැබේ.)

සියළුම වරායයන් නියෝජනය වන පරිදි සියලුම ආරක්ෂක නිළයින් පුහුණු අභ්‍යාස කටයුතුවල යොදවා පුහුණුවීම් ප්‍රශස්ත මට්ටමකින් ලබාදීමට මෙම කොට්ඨාශය සමත්ව ඇති අතර, වාර්ෂිකව අදාළ නිළයින් සඳහා ද්‍රව්‍ය හා භාණ්ඩයන් ද නියමිත පරිදි ඔවුන් වෙත ලබාදීමට කටයුතු කර ඔවුන්ගේ සේවය උසස් මට්ටමකින් පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත.

## සුභසාධක හා කාර්මික සම්බන්ධතා

සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය මඟින් අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත සපයනු ලබන මූල්‍ය හා මූල්‍ය නොවන සුභසාධක පහසුකම් රැසක් ඇත. එම පහසුකම් දිගින් දිගටම සේවක හිතසුව පිණිස වරින් වර සංශෝධනය කරමින් සහ වර්ධනය කරමින් 2011 වර්ෂය වන විට ප්‍රශස්ථ මට්ටමේ සුභසාධක පහසුකම් රැසක් සපයනු ලැබීය. එම පහසුකම් විස්තර සහිතව පහත දැක්වේ.

### කාර්ය මණ්ඩලය වෙත නොමිලේ ආහාරපාන සැපයීම

වරාය අධිකාරියේ සේවා මුර පදනම මත සේවයේ යොදවා ඇති සේවකයින් හට දිවා/රාත්‍රී ආහාරපාන මෙන්ම තේ සහ කෙටි කෑම වැනි ආහාර සැපයීම සිදු කරනු ලබන අතර කාර්යාලය ගණයේ සේවකයින්ට දිවා ආහාර නොමිලේ සැපයීම සිදු කරයි. මෙම කාර්ය සඳහා 2011 වර්ෂයේදී රු. 405,824,992/= මුදලක් වැය කොට ඇත.

එමෙන්ම 2011 වර්ෂයේදී අධිකාරිය විසින් නොමිලයේ දෙනු ලබන දිවා ආහාරය ලබා නොගන්නා සේවකයින් වෙනුවෙන් දිවා ආහාර වේලක් සඳහා ගෙවනු ලැබූ රු. 40/= ක මුදල 2011 ඔක්තෝම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රු. 80/= දක්වා වැඩි කරන ලදී.

### සේවකයින් සඳහා වන හදිසි අනතුරු හා රක්ෂණ යෝජනා ක්‍රමය

වර්ෂය ආරම්භයේ ක්‍රියාත්මක වූ වෛද්‍යාධාර යෝජනා ක්‍රමය 2011 අගෝස්තු මස 31 වන දින සිට අත්හිටුවනු ලැබීය. මේ අනුව කලින් පැවති වෛද්‍යාධාර ක්‍රමයට වඩා වැඩි වාසිදායක ප්‍රතිලාභ ඇතුළත් වන පරිදි නව රක්ෂණ යෝජනා ක්‍රමයක් ජාතික රක්ෂණ භාර අරමුදල සමඟ එක්ව 2011 සැප්තැම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ කලින් ලැබූ ප්‍රතිලාභයන්ට වඩා වැඩි පහසුකම් ලැබෙන අතර හදිසි අනතුරකදී රුපියල් දශලක්ෂය දක්වා වූ රක්ෂණාවරණයක් හිමිවන අතර ස්වභාවික මරණයක දී රුපියල් ලක්ෂයක රක්ෂණාවරණයක් හිමි වනු ඇත. එයට අමතරව බාහිර වෛද්‍ය ප්‍රතිකාර සඳහා වාර්ෂිකව රු. 7500/= මුදලක් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. තවද, ආරෝග්‍යශාලා ගතව ප්‍රතිකාර ගැනීමේදී වියදම් සඳහා රුපියල් ලක්ෂය (රු. 100,000/=) දක්වා වූ රක්ෂණාවරණයක් හිමි වනු ඇත. මෙහි විශේෂ ලක්ෂණය වන්නේ සේවකයෙකුට ස්වේච්ඡාවෙන් සිය පවුලේ සාමාජිකයින් මෙම රක්ෂණයට දායක කරගත හැකි වීමයි.

ඒ අනුව කාලත්‍රයා වෙනුවෙන් වාර්ෂිකව රු. 1,500/= ක මුදලක් ද දරුවෙකු වෙනුවෙන් රු. 720/= ක මුදලක් ද වාර්ෂිකව ගෙවිය යුතු වේ. මෙම රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමත් සමඟ එතෙක් ක්‍රියාත්මක වූ වෛද්‍යාධාර යෝජනා ක්‍රමය, ඇස් කණ්ණාඩි සඳහා මුදල් ගෙවීම, මරණ සඳහා ගෙවනු ලබන කරුණාසහගත දීමනාව මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යටතට ගෙන එන ලදී.

2011 සැප්තැම්බර් මස 01 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා වරාය අධිකාරියේ සේවකයින් හා ඔවුන්ගෙන් යැපෙන්නන් වෙත ගෙවා ඇති රක්ෂණ ප්‍රතිලාභ මුදල රු.18,998,770/= ක් වේ.

### නියමුවන් සඳහා වූ රක්ෂණ යෝජනා ක්‍රමය

ඉහත රක්ෂණ යෝජනා ක්‍රමයට අමතරව අධිකාරියේ නාවික කොට්ඨාශය යටතේ සේවය කරන නියමුවන් සඳහා විශේෂ රක්ෂණයක් පවත්වා ගෙන යනු ලබන අතර මේ සඳහා නාවික කොට්ඨාශය යටතේ සේවයේ යෙදෙන සියළුම නියමුවන්ට මෙම රක්ෂණ ආවරණය ලබා ගත හැක. මේ යටතේ නියමුවන්ට රු. 3,000,000/= රක්ෂණාවරණයක් හිමි වන අතර රක්ෂණ වාරික මුදලින් 50% ක් අධිකාරිය මඟින් දරනු ලබන අතර ඉතිරිය නියමුවන් විසින් දරනු ලබයි.

**නිවාස ණය යෝජනා ක්‍රමය**

වරාය අධිකාරියේ සේවකයින්ට නිවසක් මිලදී ගැනීම, නිවසක් තනා ගැනීම, අළුතින් කොටසක් එකතු කිරීම හෝ නිවසක් තැනීම සඳහා ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් ලක්ෂ පහක උපරිමය දක්වා නිවාස ණය ලබාදීමේ වැඩසටහනක් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සහය ඇතිව ක්‍රියාත්මක වේ. සහන පොලී අනුපාතිකයක් අය කරනු ලබන අතර වාර්ෂිකව දශලක්ෂ පනහක මුදලක් මේ සඳහා වෙන් කොට ඇත. මෙම නිවාස ණය වැඩ සටහන සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙත 2011 වර්ෂය තුළදී රු. 20,127,000/= මුදලක් මුදා හරින ලදී.

**ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය**

අධිකාරියේ සේවකයින්ගේ දූ දරුවන් හට විශ්ව විද්‍යාල අධ්‍යාපනය සහ අ.පො.ස. (උ/පෙ) හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව වර්ග දෙකක් පිරිනැමේ. මේ අනුව අ.පො.ස. (උ/පෙ) හැදෑරීම සඳහා මසකට රු. 750/= බැගින් මාස 24 ක් සඳහා ශිෂ්‍යත්ව දීමනා ප්‍රදානය කෙරේ. මෙම ශිෂ්‍යත්වය සඳහා සමාලෝචිත 2011 වර්ෂයේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් 474 දෙනෙකු සඳහා රු. 2,277,500/= ක මුදලක් ප්‍රදානය කරනු ලැබීය. විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා තෝරා ගන්නා අධිකාරියේ සේවකයින්ගේ දරු දැරියන්ට වර්ෂයකට රු. 25,000/= බැගින් වන සේ අධ්‍යයන කාලය අනුව උපරිමය වර්ෂ 05 ක් දක්වා ශිෂ්‍යත්ව ප්‍රදානයක් සිදු කරනු ලැබේ. මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ 2011 වර්ෂයේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් 236 දෙනෙකු සඳහා රු. 5,927,500/= ක මුදලක් ප්‍රදානය කරන ලදී.

**සුභසාධක බස් රථ**

අධිකාරියේ සේවකයින්ට හා ඔවුන්ගේ පවුල්වල අයට වන්දනා සහ විනෝද චාරිකාවල යෙදීම සඳහා අනුග්‍රාහාත්මක ගාස්තු ප්‍රමාණ මත බස් රථ සේවකයින්ට ලබා දෙනු ලබන අතර සේවක අවමඟුල් සඳහා නිශ්චිත කාලසීමාවන් තුළ නොමිලේ බස් රථයක් ලබාදීම සිදු කෙරේ. එවැනි අවස්ථාවක බස් රථයක් ලබාදිය නොහැකි නම් රු. 6,500/= ක උපරිමයකට යටත්ව වියදම ප්‍රතිපූර්ණය කරනු ලැබේ. තවද, අධිකාරියේ සේවකයින්ට සිය සේවා ස්ථානයන්ට පහසුවෙන් ගමන් කිරීම සඳහා අධිකාරියේ බස් රථ මඟින් වරාය පරිශ්‍රය තුළ නොමිලේ ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවය සමාලෝචිත වර්ෂය තුළදී ද අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. 2011 වර්ෂයේදී සුභසාධන කටයුතු සඳහා බස්රථ ධාවනය කිරීමෙන් අධිකාරිය රුපියල් 4,601,279/= ක ආදායමක් උපයා ගෙන ඇත.

**විශේෂ නිවාඩු හිමිකම් දීමනා ගෙවීම**

රෝගී තත්ත්වයකදී හෝ හදිසි අනතුරකදී, තමන් හට හිමි සියළුම නිවාඩු අවසන් වී ඇති අවස්ථාවකදී නැවත සේවයට සුදුසු තත්ත්වයකට පත් වන තෙක් වෛද්‍ය උපදෙස් මත උපරිම වශයෙන් මාස 06 ක් දක්වා සුභසාධක ක්‍රමය යටතේ අනුමත වැටුප් සහිත නිවාඩු ලබා දෙනු ලැබේ. 2011 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් ලැබුණු අයදුම්පත් 141 ක් සලකා බලන ලද අතර ඒ අනුව දින 1910 ක් වැටුප් සහිත නිවාඩු සහ දින 465 ක් වැටුප් රහිත නිවාඩු ලෙස ප්‍රදානය කිරිමට අනුමැතිය දෙන ලදී.

**සුභසාධක ආපනශාලා**

අධිකාරියේ පරිශ්‍රය තුළ අධිකාරියේ සේවකයින්ට මෙන්ම විවිධ කටයුතු සඳහා වරාය පරිශ්‍රයට පැමිණෙන්නන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම වෙනුවෙන් ආපනශාලා 16 ක් පවත්වා ගෙන යනු ලබන අතර සහන මිල ගණන් යටතේ ආපනශාලා මඟින් ආහාර පාන සැපයීම සිදුකරනු ලබයි. වාර්ෂිකව ටෙන්ඩර් කැඳවා බදුකරුවන් තෝරා ගෙන මෙම ආපනශාලා බදු දෙනු ලබන අතර 2011 වර්ෂය තුළදී එමගින් ලද මුළු ආදායම රු. 1,152,761/= ක් වේ.

**නිවාඩු නිකේතන පහසුකම් ලබාදීම**

කතරගම පිහිටුවා ඇති අංක 02 විශ්‍රාම ශාලාවේ කාමර සහ ශාලා පහසුකම් මේ යටතේ සේවකයින්ට ලබා දෙන අතර සේවකයෙකුට එක් දිනක් සඳහා කාමරයකට අය කරනු ලබන්නේ රු. 150/= ක සහන ගාස්තුවකි. සේවකයෙකුට වරකට කාමර දෙකක් වෙන් කර ගත හැකි අතර ඊට වැඩි වන අවස්ථාවක එම කාමර සඳහා අතිරේක ගාස්තුවක් ගෙවීමට සිදුවේ. මෙම විශ්‍රාම ශාලාවේ කාමර 19 ක සහ ශාලා දෙකක පහසුකම් සපයා ඇත. මෙම සංචාරක නිකේතනයෙන් 2011 වර්ෂය තුළ උපයන ලද ආදායම රු. 92,282,060/= වේ.

**සේවකයින්ට තිළිණ ප්‍රදානය**

අධිකාරියේ සියළුම සේවකයින්ට සිය සේවා කාලය වසර 30 ක් සම්පූර්ණ කළ පසු වටිනා තිළිණයක් ප්‍රදානය කරනු ලබන අතර වසර 40 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින්ට වරාය චෛත්‍යයේ අනුරුවක් සහ සමරු සිහිවටනයක් තිළිණ කරනු ලැබේ. 2011 වර්ෂයේදී වසර 30 සපුරන ලද සේවකයින් 207 කට හා වසර 40 ක සේවා කාලයක් සපුරන ලද සේවකයින් 26 දෙනෙකු හට මෙම ක්‍රමය යටතේ තිළිණ ප්‍රදානය කොට ඇත.

**සමුද්‍රික කෞතුකාගාරය**

වරාය හා නාවික ක්ෂේත්‍රයේ ඓතිහාසික විකාශනය දැක්වෙන අනුරූ සහ ප්‍රදර්ශන පුවරු මෙන්ම පැරණි වරාය පරිශ්‍රය තුළ භාවිත කළ භාණ්ඩ මෙහි ප්‍රදර්ශනයට තබා ඇත. පාසැල් සිසුන් අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත් ව ඇති මෙය වරාය හා නාවික කටයුතු පිළිබඳව උනන්දුවක් දක්වන සියළු දෙනාට ප්‍රයෝජනවත් වන මධ්‍යස්ථානයකි. 2011 වර්ෂය තුළදී කෞතුගාර දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව විශේෂ ප්‍රදර්ශන පුවරු සවිකරන ලදී. ගාස්තු අය කිරීමකින් තොරව මෙය පෙ:ව: 10.00 සිට ප:ව: 07.00 දක්වා විවෘත කොට ඇත. මෙම මධ්‍යස්ථානය ප්‍රකාශන, පොත් පත් සහ පින්තූර පත්‍රිකා විකිණීම මඟින් වර්ෂය තුළදී රු. 358,370/= ක ආදායමක් උපයා ගෙන ඇත.

**සුභසාධක හා ක්‍රීඩාගාර පහසුකම්**

අධිකාරිය මඟින් සුභසාධක මධ්‍යස්ථානවලට ක්‍රීඩාගාරයක් බැගින් ලබාදී ඇත. මීට අමතරව වරාය අධිකාරියේ ක්‍රීඩා සංගමය සඳහා වර්ෂයකට රු. 712,000/= ක උපරිමයකට යටත්ව මුදලක් එම සංගමයේ ක්‍රීඩා සංවර්ධන කාර්යයන් සඳහා ලබාදීම සිදු කරයි.

**පුස්තකාල පහසුකම්**

අධිකාරියේ සේවකයින්ගේ කියවීමේ රුචිය වර්ධනය සඳහා සේවකයින් විසින් පවත්වා ගෙන යනු ලබන සෑම පුස්තකාලයක් සඳහාම වාර්ෂිකව රු. 45,000/= ක උපරිමයකට යටත්ව ප්‍රදානයන් ලබා දෙනු ලැබේ. මෙවැනි පුස්තකාල 16 ක් වරාය පරිශ්‍රය තුළ ක්‍රියාත්මක වේ. 2011 වර්ෂය තුළදී පුස්තකාල 16 ක් වෙනුවෙන් රු. 300,000/= ක මුදලක් පොත් පත් මිලදී ගැනීම සඳහා ප්‍රදානය කරන ලදී.

**වෙනත් සුභසාධක පහසුකම්**

✱ **සේවා වනිතා ඒකකය**

සේවා වනිතා ඒකකය මඟින් පවත්වා ගෙන යනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ දරු දැරියන් සඳහා නොමිලේ දිවා ආහාරය සපයනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී ඉල්ලා ඇති පහසුකම් සැපයීම සිදු කරන ලදී.

✱ **ක්‍රීඩාගාර පහසුකම්**

සුභසාධක මධ්‍යස්ථාන වල පිහිටුවා ඇති ක්‍රීඩාගාරයන් හි ස්ථාපිත කර ඇති උපකරණ නඩත්තු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී පියවර ගන්නා ලදී.

✱ **සේවක සුභසාධක ප්‍රවර්ධන වැඩ සටහන**

අධිකාරියේ සේවක සුභසාධනය නැංවීම සඳහා සේවක ප්‍රතිචාරයන් සලකා බලමින් වසර අවසාන කාර්තුවේදී සුභසාධනයට අදාළ භාණ්ඩ හා ද්‍රව්‍ය සැපයීමට කඩිනම් පියවර ගනු ලැබීය.

✱ **උපකරණ සැපයීම**

සේවක මහත්ම මහත්මීන්ගේ සුභසාධක තත්ත්වයන් වැඩිදියුණු කිරීම වෙනුවෙන් සුභසාධක මධ්‍යස්ථානවල විවේකය ඵලදායී ලෙස ගත කිරීම සඳහා සේවක ඉල්ලීම පරිදි රූපවාහිනී හා වෙනත් උපකරණ නොකඩවා සැපයීමට ක්‍රියා කරන ලදී.

## නීති

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නීති නිළධාරීන් කොළඹ, ගාල්ල සහ ත්‍රිකුණාමලය වරායන්හි නීති උපදේශකයන් වන අතර ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට, කොට්ඨාශ ප්‍රධානීන්ට හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙනත් කොට්ඨාශවලට උපදෙස් ලබා දෙති.

**උපදේශනයන්**

2011 වර්ෂය තුළ 144 ට අධික උපදේශනයන් ප්‍රමාණයක් කළමනාකාරීත්වයට ලබාදී ඇත.

ඊට අමතරව කෙටුම්පත් සම්පාදනය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශවකරුවෙකු වන කොන්ත්‍රාත්, ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු, බදු ගිවිසුම් යනාදිය සම්බන්ධ වෙනත් ගිවිසුම්වලට එළඹීමත් නීති කොට්ඨාශයට අයත් වන රාජකාරීන් වේ.

**ඔප්පු, ගිවිසුම් සහ කොන්ත්‍රාත්**

බදුදීමේ ගිවිසුම් 05 ක්, බදු ගැනීමේ ගිවිසුම් 01 ක් සහ ගිවිසුම්/කොන්ත්‍රාත්/ගිවිසුම්වලට පරිපූරකයන් 02 ක් 2011 වර්ෂය තුළදී නීති කොට්ඨාශය විසින් ක්‍රියාවට නංවනු ලැබීය. මෙම නීතිමය ලේඛණවලට අමතරව පහත සඳහන් ගිවිසුම් සහ බැඳුම්කරයන් ක්‍රියාවට නංවන ලදී.

වැටුප් රහිත නිවාඩු මත විදේශ රැකියා සඳහා පිටවයන්නන් සම්බන්ධයෙන් ගිවිසුම් සහ බැඳුම්කරයන් 4 කි.

✱ ශ්‍රී ලංකාව තුළ සහ විදේශගත පුහුණු සහ අධ්‍යාපනික කටයුතු සම්බන්ධයෙන් ගිවිසුම් සහ බැඳුම්කර 4.

✱ කළමනාකාර පුහුණුවන්නන් සම්බන්ධයෙන් ගිවිසුම්/බැඳුම්කර දෙකක් අත්සන් කිරීම.

✱ මානව සම්පත් ඩිප්ලෝමාව/ඉංග්‍රීසි ඩිප්ලෝමාව හදාරනු ලබන සේවකයින් වෙනුවෙන් ගිවිසුම්/බැඳුම්කර 36 ක් අත්සන් කරන ලදී.

✱ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ගිය සේවකයින් වෙනුවෙන් ගිවිසුම්/බැඳුම්කර 1454 ක් අත්සන් කිරීම.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාර්ශවකරුවෙකු වන සියලුම අධිකරණ කටයුතු නීතිපතිගේ සහ පෞද්ගලික නීතිඥ මණ්ඩලවල සහයෝගය ඇතිව නීති කොට්ඨාශය විසින් මෙහෙයවනු ලැබේ.

2010 දෙසැම්බර් අග වන විට නඩු කටයුතු/පැමිණිලි සහ ඉල්ලුම්පත්‍ර 250 ක් අධිකරණ කටයුතු සඳහා ඉදිරිපත් වී තිබිණ. (ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණ, මහාධිකරණ, දිසා අධිකරණ, කම්කරු විනිශ්චය සභා, මහේස්ත්‍රාත් අධිකරණ, මානව හිමිකම් කොමිසම, බේරුම්කාර මධ්‍යස්ථාන, කම්කරු උසාවි, කම්කරු දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්)

2011 වසර තුළ අළුත් නඩු කටයුතු, පැමිණිලි සහ ඉල්ලුම්පත්‍ර 59 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව ගොණුකර තිබේ. (ඉහත සඳහන් ඡේදයේ අඩංගු සියලුම අධිකරණ සහ ආයතන) මෙයින් නඩු කටයුතු 03 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගොණු ගත කර ඇත. 2011 වසර තුළදී සමස්ථ නඩු කටයුතු සංඛ්‍යාව වූ 309 න් 52 ක කටයුතු අවසාන කර ඇත. මෙයින් නඩු කටයුතු 21 ක් වරාය අධිකාරියට වාසි සහගත ලෙස තීරණය වී ඇති අතර නඩු කටයුතු 12 ක් පාර්ශවකරුවන් විසින් ඉල්ලා අස්කර ගෙන ඇත. නඩු කටයුතු 12 ක් සමථයකට පත්කර ඇති අතර නඩු 07 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවාසි සහගත ලෙස තීරණය කර ඇත.

2011 දෙසැම්බර් 31 දින වන විට නඩු කටයුතු/පැමිණිලි සහ ඉල්ලුම්පත්‍ර 257 ක් ඉහත සඳහන් ආයතනයන්හි අවසන් නොවී පවතී.

**ශ්‍රේෂ්ඨාධිකරණ නඩු**

2010.12.31 දින වන විට නඩු කටයුතු 05 ක් අවසන් නොවී පැවතිණ. 2011 වසර තුළ අළුත් නඩු කටයුතු 06 ක් ගොණු ගතකර ඇති අතර එයින් 05 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව ද එක් නඩුවක් වරාය අධිකාරිය විසින් ද ගොණු ගතකර ඇත. නඩු කටයුතු 11 න් 04 ක කටයුතු අවසන් කර ඇත. නඩු කටයුතු 03 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසි සහගත ලෙස ඉල්ලා අස් කිරීමෙන් සහ ඉවත දැමීමෙන් අවසන් කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගොණු ගත කරන ලද එක් නඩුවකදී තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා ඉල්ලා සිටි අවසරය ප්‍රතික්ෂේප කරන ලදී. 2011.12.31 දිනට නඩු කටයුතු 07 ක් තීරණය නොවී පැවැතුණි.

**අභියාචනාධිකරණ නඩු**

2010.12.31 දිනට නඩු කටයුතු 20 ක් තීරණය නොවී පැවතුණි. 2011 වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව අළුතින් නඩු 04 ක් ගොණු ගතකර ඇත. 2011 වසර තුළ නඩු කටයුතු 07 ක් නිමකර ඇති අතර ඉන් එකක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසි සහගත ලෙස තීරණය විය. නඩු කටයුතු 06 ක් පෙත්සම්කරුවන් විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී. 2011.12.31 දින වන විට නඩු කටයුතු 17 ක් තීරණය නොවී පැවතුණි.

**මහාධිකරණ නඩු**

2010.12.31 දින වන විට මහාධිකරණය ඉදිරියේ නඩු කටයුතු 11 තීරණය නොවී පැවතුණි. 2011 වසර තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අළුත් නඩු 02 ක් ගොණු ගතකර ඇත. නඩු කටයුතු 13 න් 3 ක් 2011 වර්ෂය තුළදී අවසන් කර ඇත. මෙයින් එකක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසි සහගත ලෙසද, දෙකක් වරාය අධිකාරියට අවාසි සහගත ලෙස ද තීරණය කරන ලදී. 2011.12.31 දිනට නඩු කටයුතු 11 ක් අවසන් නොවී පැවතුණි.

**දිස්ත්‍රික් අධිකරණ නඩු**

2010 දෙසැම්බර් 31 දිනට නඩු කටයුතු 13 ක් අවසන් නොවී පැවතුණි. 2011 වසර තුළදි ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව අළුත් නඩු කටයුතු 02 ක් ගොණුගත කර ඇත. නඩු කටයුතු 15 න් 03 ක් අවසන් කර ඇති අතර මෙයින් 02 ක් සමථයකට පත් වී ඇති අතර 01 ක් ශ්‍රී ලංකා වරාය

අධිකාරියට වාසි සහගත ලෙස තීරණය කර ඇත. 2011.12.31 දිනට නඩු කටයුතු 12 ක් අවසන් නොවී පැවතුණි.

**මහේස්ත්‍රාත් අධිකරණ නඩු**

2010.12.31 දිනට මහේස්ත්‍රාත් උසාවියේ නඩු කටයුතු 02 ක් අවසන් නොවී පැවතුණි. 2011 වසර තුළදී රජයේ නිල නිවාස (සන්තකය ආපසු පවරා ගැනීමේ) පනත යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් නිල නිවාසවලින් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සහ රජයේ ඉඩම් (සන්තකය ආපසු පවරා ගැනීම) සඳහා අයදුම්පත්‍ර ද ඇතුළුව අළුතින් නඩු කටයුතු 12 ක් මහේස්ත්‍රාත් උසාවියේ ගොණුකර ඇත. 2011 වසර තුළ නඩු කටයුතු 06 ක් අවසන් කර ඇත. ඉහත දක්වන ලද මහේස්ත්‍රාත් නඩු කටයුතුවලට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් පාර්ශවකරුවන් වන්නා වූ අවස්ථාවල දිවයිනේ විවිධ පළාත්වල පිහිටි මහේස්ත්‍රාත් අධිකරණවලින් ලැබෙන සිතාසි සම්බන්ධව ද නීති කොට්ඨාශය කටයුතු කරනු ලබයි. දැනට මහේස්ත්‍රාත් උසාවිවල නඩු කටයුතු 08 ක් අවසන් නොවී පවතී.

**කම්කරු විනිශ්චය සභා නඩු**

2010.12.31 දින වන විට කම්කරු විනිශ්චය සභාවේ එතෙක් තීරණය නොකළ නඩු සංඛ්‍යාව 16 ක් විය. 2011 වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව අලුතින් නඩු 08 ක් ගොණු ගත කෙරිණ. මෙම නඩු 24 න් 06 ක් අවසන් කරන ලදී. මෙයින් එක් නඩුවක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසි සහගත අයුරින් නිම කරන ලද අතර නඩු 03 ක් සමථයකට පත් කෙරිණ. නඩු 02 ක් ඉල්ලා අස් කර ගන්නා ලදී. 2011.12.31 දිනට කම්කරු විනිශ්චය සභාවල තිරණය නොවී පැවතුණු නඩු සංඛ්‍යාව 18 ක් විය.

**මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ අයදුම්පත්, කම්කරු ආරවුල් (සමථයකට පත්කිරීම සඳහා නඩු) පිළිබඳව කම්කරු දෙපර්තමේන්තුවට යොමු කරන ලද පැමිණිලි සහ පාර්ලිමේන්තු කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි**

2010 දෙසැම්බර් 31 දිනට කම්කරු ආරවුල් (සමථයකට පත්කිරීම සඳහා නඩු) පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ තීරණ නොවුණු පැමිණිලි සංඛ්‍යාව 30 විය. මානව හිමිකම් සම්බන්ධ අයදුම්පත් 133 සහ පාර්ලිමේන්තු කොමසාරිස්ට කරන ලද පැමිණිලි 16 ක් අවසාන තීරණයකට පැමිණ නොතිබිණ.

2011 වසර තුළ කම්කරු ආරවුල් (සමථයකට පත්කිරීම සඳහා වූ කරුණු) පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවට කරන ලද පැමිණිලි සංඛ්‍යාව 21 ක් විය. ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව මානව හිමිකම් සම්බන්ධ අයදුම්පත් 03 ක් ගොණු ගත කර තිබිණ. ශ්‍රී ලංකා වරාය අධිකාරියට විරුද්ධව පාර්ලිමේන්තු කොමසාරිස් වෙත එක් පැමිණිල්ලක් යොමු කර තිබුණි.

සමථයකට පත් කිරීම සඳහා වූ කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ කරුණු 19 ද, මානව හිමිකම් පිළිබඳ අයදුම්පත් 04 ද 2011 වසර තුළ අවසන් කර තිබිණ.

මේ අනුව කම්කරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද පැමිණිලි 32 ද, මානව හිමිකම් සම්බන්ධ ඉල්ලුම්පත් 132 ද, පාර්ලිමේන්තු කොමසාරිස් වෙත ඉදිරිපත් කළ පැමිණි 17 ද, 2011 දෙසැම්බර් 31 දිනට අවසන් නොවී පැවතුණි.

**බේරුම්කාර නඩු**

2010.12.31 දිනට වාණිජමය බේරුම්කරණය සඳහා ඉදිරිපත් කරන ලද කරුණු 03 ද, කාර්මික බේරුම්කරණය සඳහා ඉදිරිපත් කරන ලද එක් පැමිණිල්ලක් ද තීරණය නොවී පැවතුණි. 2011 වසර තුළදී වාණිජමය (විදේශීය) බේරුම්කරණය සඳහා වූ නඩු සම්බන්ධ කරුණු සමථයකට

පත්කර අවසන් කර තිබේ. මේ අනුව 2011.12.31 දිනට කාර්මික බේරුම්කරණය සඳහා වූ එක් කරුණක්ද වාණිජ බේරුම්කරණය සඳහා වූ කරුණු 02ක් ද තීරණය නොවී පැවතුණි.

**වෛද්‍ය**

රාජකාරි කටයුතු කර ගෙන යන අතරතුර හොඳ මානසික මට්ටමක් සහ ශාරීරික සුවතාවයක් පවත්වා ගෙන යාමට සහ ඵළදායීතාවය වර්ධනය කරමින් දුම්පානය, මත්ද්‍රව්‍ය සහ මත් ද්‍රව්‍යයන්ට ඇබ්බැහිවූවන් ඒවායින් වලක්වා ගැනීමට දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම මගින් රැකියා කරන ස්ථානය තුළ මනා සෞඛ්‍යාරක්ෂිත පරිසරයක් පවත්වා ගෙන යනු ලැබීය.

- ✱ හදිසි අනතුරු, හදිසි තත්ත්වයන් සහ හදිසි ප්‍රතිකාර අවශ්‍යතාවයන් සඳහා ක්ෂණිකව ප්‍රතිකාර සිදු කෙරේ.

- ✱ ජීවන රටාව හේතු කොට ගෙන ඇතිවන රෝගී තත්ත්වයන් පිළිබඳව නිතිපතා පරීක්ෂාවෙන් සිටිනු පිණිස එවැනි පුද්ගලයින් තනි තනිවම වෛද්‍යවරුන් සමඟ ඒ පිළිබඳව සාකච්ඡා කිරීම වැදගත් වේ. මේ සඳහා ඒ වෙනුවෙන් කැපවූ පලපුරුදු වෛද්‍ය කාර්යය මණ්ඩලයක් සහ ඔවුන්ගේ වෛද්‍ය සේවා කණ්ඩායම් විසින් පැය 24 පුරාම සේවයක් සලසන ලදී.

- ✱ එක්ස් කිරණ සහ ඊ.සී.ජී. පහසුකම්, පරීක්ෂණාගාර පහසුකම් සහ දන්ත වෛද්‍ය පහසුකම් වැඩි දියුණු කර ඇත.

- ✱ පැය 24 පුරාම ක්‍රියාත්මක වන ගිලන් රථ සේවයක් ද පවතී.

- ✱ ප්‍රධාන රෝහල් වලින් සාමාන්‍ය වෛද්‍ය පරීක්ෂණයන් සිදු කර ගැනීම වෙනුවෙන් රෝගීන් විසින් කරනු ලැබූ ඉල්ලීම්, නියමිත පැකේජයන් විශේෂ වට්ටම් සහිතව ලබා ගැනීමට හැකි විය.

- ✱ වෛද්‍ය අංශය විසින් නිතිපතා කරනු ලබන පරීක්ෂාවන්ට අමතරව වෛද්‍ය පර්යේෂණායතනයේ සහාය ඇතිව වරාය පරිශ්‍රය තුළ ඩෙංගු මර්ධන කටයුතු සිදුකර ඇත. මෙමඟින් වරාය පරිශ්‍රය තුළ ඩෙංගු වාහක මදුරුවන් බෝවන ස්ථාන අවමකර ගත හැකි විය.

- ✱ මත්පැන් සහ දුම්බීම පිළිබඳව නිතිපතා උපදේශක වැඩ සටහන් සහ ප්‍රාශ්වාස වාතයේ මත්පැන් තිබේදැයි කරනු ලබන පරීක්ෂාවන් මඟින් ඔවුන්ගේ යහපැවැත්වමට දායකත්වයක් සපයන ලද අතර රාජකාරියේ යෙදී සිටින අතර සිදුවීමට ඉඩ ඇති අනතුරු අවම කර ගැනීමට ද ඉවහල් වී ඇත.

- ✱ තොරතුරු පද්ධති අංශයේ සහභාගීත්වය ඇතිව මෙම අංශයේ කටයුතු පරිගණක ගත කිරීම ද සිදු කරගෙන යනු ලැබේ.

## මහපොළ අභ්‍යාස ආයතනය

**පොදු**

වරාය සේවකයින්, වරාය භාවිතා කරන්නන් සහ සමුද්‍රික අංශයේ වෙනත් අය සඳහා පුහුණු පහසුකම් සැලසීම මුඛ්‍ය පරමාර්ථය කොට ගත් මහපොළ පුහුණු ආයතනය (MPTI) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉතා වැදගත් අංශයක් වන බව කිවමනාය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ සමුද්‍රික අංශයේ සේවක දැනුම, නිපුණතා හා ආකල්ප වර්ධනය අරභයා සැකසුනු දේශන මාලා, වැඩ මුළු ප්‍රායෝගික පුහුණු වැඩ සටහන් කෙරෙහි අවධානය යොමු කරමින්, මෙම ආයතනය

විසින් 2011 වාර්ෂික පුහුණු දින දර්ශන අනුව වැඩ සටහන් පවත්වාගෙන යන ලදී. 2011 වසර තුල වරාය සේවකයින් වෙනුවෙන් ඵලදායිතාව, කණ්ඩායම් හැඟීම් වර්ධනය, තාක්ෂණික නිපුණතා දියුණු කිරීම, ගනුදෙනුකාර සේවා සහ තත්ත්ව අභිවෘද්ධිය අරමුණු කරගත් වැඩ මුළු කීපයක් පවත්වන ලදී. පිළිගත හැකි සහතික ලබාගැනීම දක්වා වරාය සේවකයින්ට සිය නිපුණතා වර්ධනය කර ගැනීම සඳහාත් වරාය මෙහෙයුම් වලට අදාල තෝරාගත් සේවා වල විශේෂඥ දැනුමක් ලබාගැනීම උදෙසාත් මහපොල අභ්‍යාස ආයතනය ව්‍යුහාත්මක මාවතක් සපයා දෙනු ලබයි.

2011 වසර තුළ මිනිස් පැය 432,912 ක් ආවරණය කරමින් මහපොල පුහුණු ආයතනය විසින් අපේක්ෂකයින් (සේවයේ යෙදී නොසිටින) 3621 දෙනෙකු පුහුණු කර ඇත. ඉකුත් වසර සමග සසඳන විට මෙය 30% පමණ වර්ධනයක් පෙන්නුම් කරයි. මීට අමතරව සේවයේ යෙදී සිටින විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින්, කාර්මික විදුහල් ශිෂ්‍යයින් සහ වෙනත් සමාන වෘත්තීය අධ්‍යයන ආයතන සේවකයින් 244 දෙනෙකු සඳහා මහපොල පුහුණු ආයතනය විසින් රැකියාවේ නිරතව සිටිමින් පුහුණු පහසුකම් සපයා ඇත.

**2011 වසර තුල සමස්ථ පුහුණු කිරීම් කාර්ය සාධනය.**

| ප්‍රවාහය | පුහුණු කරන ලද අපේක්ෂක සංඛ්‍යාව | සමස්ථ මිනිස් පැය |
|---|---|---|
| උපකරණ ක්‍රියාකරවීම | 260 | 18,225 |
| නැව්බඩු මෙහෙයවීම | 61 | 22,880 |
| කළමනාකරණය | 1,319 | 212,452 |
| තොරතුරු පද්ධති | 325 | 31,041 |
| තාක්ෂණික | 331 | 106,020 |
| ගිනි නිවීම්, නිරාපද සහ වෘත්තීය සෞඛ්‍ය | 760 | 9,057 |
| සමුද්‍රීය සහ නාවිකත්ව | 565 | 33,237 |
| ජාතික ආධුනිකත්ව හා පුහුණු අධිකාරියේ (NAITA) ආධුනිකයන් සහ වෘත්තීය පුහුණු (VTA) සහ කාර්මික විද්‍යාල | 203 | 140,300 |
| විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින් | 41 | 21,280 |
| **එකතුව -සේවයේ යෙදී සිටියදී ( with OJT)** | **3,865** | **594,492** |
| **එකතුව-සේවයේ යෙදී නොසිටියදී (without OJT )** | **3,621** | **432,912** |

**නව පුහුණු වැඩ සටහන්**

අප මහපොළ අභ්‍යාස ආයතනයේ දැක්ම දෙස බලන විට වර්තමානය සහ ආයතනයේ සමස්ථ දැක්ම සාර්ථක කර ගැනීම අතර පරතරයක් පවතී. මෙම පරතරය පියවීම පිණිස මහපොළ අභ්‍යාස ආයතනය තුළ නව මහා පරිමාණ පුහුණු වැඩ සටහන් කිහිපයක් සංවර්ධනය කර පවත්වනු ලැබ ඇත.

**වරාය ආශ්‍රිත කුසලතා සංවර්ධන වැඩ සටහන්**

සමස්ථ වරාය සැපයුම් ක්‍රියාදාමයේ අන්තර් සම්බන්ධතාවයකින් යුත් වරාය බොහෝ විෂයයන් මෙහෙයවනු ලබන විවිධ කොට්ඨාශයන්ගෙන් සමන්විත සංවිධානයකි. නමුත් මෙය සාමාන්‍ය වරාය සේවකයා විසින් අවබෝධ කර ගෙන නොමැත. මේ හේතුවෙන් දිගුකල් පවතින විසඳුමක් සොයා ගැනීමට මහපොළ අභ්‍යාස ආයතනය මෙම ගැටළුව අවධානයට ලක් කිරීම කාලෝචිතය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් අනෙකුත් කොට්ඨාශයන්හි කාර්යයන් පිළිබඳ

අවබෝධයෙන් සිටීම හා අනෙකුත් කොට්ඨාශයන්ට අනුයුක්ත සේවකයින් තමන්ගේ අභ්‍යන්තර ගණුදෙනුකරුවන් බව තේරුම් ගැනීම මූලික සාධකයක්ව පවතී. මෙම පදනම මත පිහිටා පහත සඳහන් වරාය ආශ්‍රිත විෂයයන් වලින් සැදුම්ලත් වරාය කුසලතා සංවර්ධන පාඨමාලා පවත්වනු ලැබීය.

- ✱ වරාය කළමනාකරණ
- ✱ වරාය මෙහෙයුම්
- ✱ වරාය සේවා සැපයුම්
- ✱ වරාය ඉංජිනේරු
- ✱ වරාය ආරක්ෂක
- ✱ වරාය අලෙවිකරණ
- ✱ වරාය ආර්ථිකය
- ✱ වරාය කටයුතුවලට සම්බන්ධ විද්‍යුත් දත්ත සැකසුම් සහයෝගය
- ✱ සමුද්‍ර පරිපාලනය
- ✱ විද්‍යුත් ව්‍යාපාර
- ✱ වරාය ප්‍රවාහන

2011 වර්ෂයේදී අයදුම්කරුවන් 28 දෙනෙකු වෙනුවෙන් පදනම් මට්ටමේ පාඨමාලාව පවත්වනු ලැබීය. මෙම වැඩ සටහනේ විශේෂ ලක්ෂණය වන්නේ සමස්ථ ආචාර්ය මණ්ඩලය විවිධ විෂයයන්හි විශේෂඥතාවයකින් යුත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේම නිළධාරීන් වීමත් එමඟින් එම නිළධාරීන්ට පුහුණුව සඳහා වරාය තුළ කළ ආයෝජන වල ප්‍රතිඵල නෙළා ගැනීමට හැකිවීමත්ය.

**වරාය සංවර්ධන ක්‍රමෝපාය**

වර්තමාන ගෝලීය ආර්ථිකය තුළ වරාය කර්මාන්තය ප්‍රධාන කාර්යභාරයක නිරතව සිටී. මුහුද සහ ගොඩබිම පදනම් කරගත් ප්‍රවාහන මාධ්‍ය අතර ප්‍රධාන සම්බන්ධීකාරකය වශයෙන් වෙළඳාමට සහ ඒ ආශ්‍රිත ක්‍රියාවන්ට එය පහසුකම් සලසනු ලබයි. එය ජාත්‍යන්තර සැපයුම් ජාලයේ කොටසකි. මෙම අංශය ඉතාමත් තරඟකාරීව හා සීඝ්‍ර ලෙස පියවරන් අනුව වෙනස් වේ. වරාය කර්මාන්තයට බලපාන මෙම සීඝ්‍ර වෙනස්වීම් ඉදිරියේ, විවිධ ආයතනයන්හි කළමනාකාරීත්වයන් කලින් මුහුණ නොදුන් අභියෝගයන්ට මුහුණ දෙමින් සිටින අතර නව විසඳුම් සහිත ක්‍රමෝපාය වෙනස්කම් අවශ්‍ය කෙරේ. මෙම පදනම යටතේ, 2011 වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධායක නිළධාරීන් සඳහා ක්‍රමෝපායන වරාය කළමනාකරණ වැඩ සටහන සංවර්ධනය කර පවත්වනු ලැබීය.

**ඉංජිනේරු ශිෂ්‍යභට පුහුණු (නාවික ඉංජිනේරු ඩිප්ලෝමා) වැඩසටහන**

උගත් රැකියා විරහිත තරුණයින් නාවික ක්ෂේත්‍රයේ පුහුණු කිරීමෙන් හා ඔවුන්ට ජාත්‍යන්තර නැව් සමාගම් විසින් මෙහෙය වනු ලබන නෞකාවන්හි රැකියා අවස්ථා ලබාදීමෙන් ඔවුන් ජාත්‍යන්තර නාවික ශ්‍රම සංචිතයට යොමු කිරීමේ ප්‍රබල හැකියාවක් ශ්‍රී ලංකාව සතුව ඇත.

වෘත්තිකයන්ගේ ඌණතාවය සැලකිල්ලට ගෙන නාවිකයින් සඳහා පුහුණුව සලසන පවත්නා දේශීය සමුද්‍රීය පුහුණු ආයතනවල පුහුණුව ලත් පිරිස වැඩි කිරීමට මෙය ඉතාම උචිත අවස්ථාව වේ.

නාවික ක්ෂේත්‍රයේ පුරෝකථන වලට අනුව වර්තමානයේ නාවික ක්ෂේත්‍රය තුළ විශේෂයෙන්ම නිලධාරී තරාතිරමේ විශාල හිඟයක් පවතී. වර්ෂ 2015 පමණ වන විට මෙම නිළධාරී තරාතිරමේ හිඟය 28,000 ක් පමණ වනු ඇතැයි මෑත කාලීන අධ්‍යයනයක් මඟින් අනාවැකි පළකර ඇත.

මේ අනුව ජාත්‍යන්තර සමුද්‍රික ආයතනයේ (IMO) අනුමත පාඨමාලාව වන අභ්‍යාස සහතිකකරණය, නැව් තට්ටුවේ ආවේක්ෂණ කටයුතු පිළිබඳ තත්ත්වකරණ පාඨමාලාව සහ වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ වෙළඳ නැව් අධ්‍යක්ෂ ජෙනරාල් විසින් අනුමත කළ විෂය මාලාවට

අනුව ලංකා නැව් සංස්ථාවේ සහයෝගීත්වයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනයේදී ශිෂ්‍යභට පුහුණු වැඩ සටහන් 2009 ජනවාරි මස සිට ආරම්භ කෙරිණ. පළමු කණ්ඩායම පාඨමාලාව සම්පූර්ණ කර නෞකාවල පුහුණුව ලබන අතර දෙවන කණ්ඩායම (අපේක්ෂකයින් 20 දෙනෙකු) එහි අධ්‍යයන පාඨමාලාව හදාරනු ලබති.

**ග්‍රැන්ට් දොඹකර අනුකාරක පුහුණු වැඩ සටහන**

වරාය තුළ මෙහෙයුම්කරණ ග්‍රැන්ට් දොඹකර සහ අංගන දොඹකර පුහුණු කරවීමට වැඩි දියුණු කළ බහළු දොඹකර අනුකාරකයක් පිහිටවූ දකුණු ආසියාතික කලාපයේ පුරෝගාමී වරාය හා සමුද්‍රික ආයතනය වන්නේ මහපොළ අභ්‍යාස ආයතනයයි. 2011 වර්ෂය තුළදී වරාය සේවකයින් 139 දෙනෙකු පුහුණු කරවීමට අපට හැකි වූ අතර අනාගතයේදී මෙම පුහුණු පහසුකම් පිටස්තර පුද්ගලයින් සඳහා මුදල් අයකර ලබාදීමේ පදනම මත පැවැත්වීමට සැලසුම් කරමින් සිටී.

**සමුද්‍රික කටයුතු සම්බන්ධ ඉංග්‍රීසි පාඨමාලාව**

අභ්‍යාස, සහතිකකරණය, නැව් තට්ටුවේ ආවේක්ෂණ කටයුතු පිළිබඳ තත්ත්වකරණ පාඨමාලාව (STCW) ජාත්‍යන්තර සමුද්‍රික ආයතනයේ අවශ්‍යතාවයන්ට අනුව නාවිකයින් සඳහා අනුමත බලයලත් ආයතන වෙතින්, අඛණ්ඩ මුදාහැරීම් සහතිකය (CDC) ලබා ගැනීමට සමුද්‍රික ඉංග්‍රීසි භාෂාව පිළිබඳව පාඨමාලාවක් පැවැත්වීම අත්‍යවශ්‍ය වේ. දිවයිනේ පළමුවෙන්ම මෙම පාඨමාලාව ආරම්භ කළ පුරෝගාමී ආයතනය වන්නේ මහපොළ අභ්‍යාස ආයතනයයි. 2011 වර්ෂයේදී 127 දෙනෙකු සඳහා සහාය මට්ටමේ සමාන පාඨමාලාවන් 5 ක් පවත්වනු ලැබීය. වෙළඳ නෞකා අධ්‍යක්ෂ ජනරාල්වරයා අනුමැතිය ලබාදුන් මෙහෙයුම් මට්ටම සඳහා විෂය ධාරාව සංවර්ධනය කෙරිණ. 20 දෙනෙකු සඳහා එක් පාඨමාලාවක් පවත්වනු ලැබිණ.

**මානව සම්පත්, උසස් ඉංග්‍රීසි, වරාය ආරක්ෂාව සහ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් අනුමත කළ නව බඳවා ගැනීමේ පරිපාටියට අනුව නිශ්චිත ක්ෂේත්‍රයක උපාධියක්/ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා නොමැති අයදුම්කරුවන් හට නුදුරු අනාගතයේදී ඔවුන්ගේ උසස්වීම්වලදී දැඩි දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදුවනු ඇත. එබැවින් තුන් අවුරුදු සංවර්ධන වැඩ සටහනට අනුව, සුදුසුකම් සපිරි සම්පත් දායකයින් යොදවා ගැනීම මඟින් මහපොළ අභ්‍යාස ආයතනයේදී මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවක් සහ උසස් ඉංග්‍රීසි පාඨමාලාවක් පැවැත්වීමට යෝජනා කෙරිණ. එය ජාතික ව්‍යාපාරික කළමනාකාරීත්ව ආයතනය (NIBM), IPM ආයතනය, කොළඹ සහ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය වැනි වෙනත් අනුමැතිය ලත් ආයතන මඟින් ප්‍රදානය කරනු ලබන ඩිප්ලෝමාවන්ට සමාන වනු ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සහ කොළඹ විශ්ව විද්‍යාලයේ සම්පත් දායකයින් සමඟ අප සාකච්ඡා වාරයන් කිහිපයක් පැවැත්වූ අතර මානව සම්පත් කළමනාකරණ සහ උසස් ඉංග්‍රීසි ඩිප්ලෝමාව සඳහා විස්තරාත්මක විෂය මාලාව පිළියෙළ කරන ලදී. ශ්‍රී ලංකා වරාය අධිකාරියට ආදායම් උපදවා දෙනු ලබන ගාස්තු අයකර ගැනීමේ පදනම මත 70 දෙනෙකුගෙන් සමන්විත මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව 2010 ඔක්තෝම්බර් මසදී ආරම්භ කෙරිණ. සහභාගීවන්නන් 35 ක් බැගින් සමන්විත කණ්ඩායම් දෙකක් සඳහා උසස් ඉංග්‍රීසි ඩිප්ලෝමාව ද 2011 වර්ෂයේදී ආරම්භ කෙරිණ.

කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය හා සහයෝගීත්වයෙන් වරාය ආරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමාව සහ කොළඹ විශ්ව විද්‍යාලය හා සහයෝගීත්වයෙන් තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව සඳහා විස්තරාත්මක විෂය මාලාවක් 2012 පළමු කාර්තුව තුළ ආරම්භ කිරීමට යෝජිතය.

**නඩත්තු කිරීමේ නිපුණතා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම**

සේවකයින්ගේ නඩත්තු කිරීමේ නිපුණතාවය වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ශ්‍රමිකයින් සඳහා පහත සඳහන් තාක්ෂණික වැඩ සටහන් 2011 වර්ෂය තුළ සංවර්ධනය කර පවත්වා ගෙන යනු ලැබීය.

* රථවාහන පාලන පරිපථ
* ඉංජිනේරුමය ඇඳීම් පාඨමාලාව
* පරිපාලකවරුන් සඳහා හැඩගැසීමේ පාඨමාලාව
* ගුවන් විදුලි සහ රූපවාහිනී නඩත්තුව සහ අළුත්වැඩියාව
* මෙකාට්‍රොනික් (Mechatronics) පුහුණු පාඨමාලව

මෙකාට්‍රොනික් විද්‍යාගාරයේ පළමු අදියර ස්ථාපනය කරනු ලැබූ අතර අධීක්ෂණ ශ්‍රේණීන්ට අයත් තාක්ෂණික නිලධාරී මණ්ඩලයේ 45 දෙනෙකු පමණ පුහුණු කරවනු ලැබීය.

**මුදල් අයකරනු ලබන පාඨමාලා**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ මහපොළ අභ්‍යාස ආයතනයේ ඇති සම්පත්වලින් පුහුණුකරුවන්ගේ ශක්තීන්ගෙන් හා කුසලතාවයන්ගෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමේ අරමුණින් 2010 වර්ෂය තුළ දී බාහිර පාර්ශවයන් සහ බාහිර ආයතන සඳහා මුදල් අයකර පවත්වනු ලබන විවිධ වූ පාඨමාලා පවත්වනු ලැබීය. සමුද්‍රික හා නාවිකත්ව, තාක්ෂණික, උපකරණ මෙහෙයුම්, වරාය සේවා සැපයුම්, වරාය මූල්‍ය හා තොරතුරු පද්ධති යන විෂය පථයන් මෙම පාඨමාලාව මඟින් ආවරණය කෙරිණ.

**වරාය මෙහෙයුම් සහ සේවා සැපයුම්**

* ප්‍රයිමුවර් රථ ක්‍රියාකරු පුහුණුව
* අඩු එසවුම් යන්ත්‍ර ක්‍රියාකරු පුහුණුව
* ජංගම දොඹකර පුහුණුව
* ටොප්ලිෆ්ට් ක්‍රියාකරු
* වාප්පු ලිපිකරු පුහුණු වැඩ සටහන
* ක්‍රියාකරු සහායකයින් සඳහා වන වැඩ සටහන

මහපොළ අභ්‍යාස ආයතනයේ ඇති ෆෝක් ලෝඩර්ස්, දොඹකර, ප්‍රයිමුවර් රථ, ගිනි අනුකාරක සහ නැව් අනුකාරක වැනි උපකරණ සහ පහසුකම් ප්‍රයෝජනයට ගනිමින් බාහිර පාර්ශවයන් වෙනුවෙන් මේ වර්ගයේ පුහුණු පාඨමාලා සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම හමුවේ පුහුණු වැඩ සටහන් ව්‍යාප්ත කිරීමට අභ්‍යාස ආයතනය බලාපොරොත්තුවෙන් සිටී.

**සමුද්‍රීය හා නිරාපද**

* සුක්කානම්කරු පුහුණුව
* නැව් තට්ටු සේවක පුහුණු පාඨමාලාව
* එන්ජින් කාමර සේවක පුහුණු පාඨමාලාව
* පුද්ගලයින් ගලවා ගැනීමේ ක්‍රමෝපායන්
* පුද්ගල ආරක්ෂාව සහ සමාජ වගකීම්
* වින්විකරු පුහුණු පාඨමාලාව
* ශ්‍රී ලංකා නාවික හමුදා භටයින් සඳහා වන රිගිං (නැව් ගැට ගැසීම) පාඨමාලාව
* මූලික ප්‍රථමාධාර
* උසස් ගිනි නිවීමේ පාඨමාලාව

**පියපුතු පදනම යටතේ වරාය සේවකයින්ගේ දරුවන් පුහුණු කිරීම**

දැනටමත් විශ්‍රාම ගෙන ඇති සහ ඉදිරි වර්ෂ 03 ක් ඇතුළත විශ්‍රාම ගැනීමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සේවිකාවන්ගේ දරුවන් සඳහා රැකියා අවස්ථා අරමුණු කර ගෙන 2011 වර්ෂය තුළ මහපොළ අභ්‍යාස ආයතනය පුහුණු වැඩ සටහනේ දෙවන කණ්ඩායමේ පුහුණුව පවත්වා ගෙන ගොස් ඇත. මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන වෘත්තීය සමිති විසින් දීර්ඝ කාලයක සිට කරන ලද ඉල්ලීමකි. මෙම වැඩ සටහන යටතේ පහත සඳහන්

බාණ්ඩයන්ගෙන් විවිධ විෂයයන් පුහුණු කිරීම සඳහා අපේක්ෂකයින් 98 දෙනෙකු පුහුණු කටයුතුවල යෙදෙමින් සිට ඇත.

| බාණ්ඩය | ප්‍රමාණය |
|---|---|
| ගිණුම් ලිපිකරුවන් | 39 |
| යතුරුලියන්නන් | 21 |
| යන්ත්‍ර ක්‍රියාකරුවන් | 08 |
| සමුද්‍රික වඩුකාර්මිකයන් | 03 |
| පැස්සුම්කරුවන් | 10 |
| පෙදරේරුවන් | 05 |
| වැද්දුම්කරුවන් | 12 |

**මහපොළ අභ්‍යාස ආයතනයේදී සහ බාහිර ආයතනවලදී සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩ සටහන්වලට සහභාගීවීම**

2011 වර්ෂය තුළ කළමනාකරණය, මූල්‍ය, ඉංජිනේරු, ආරක්ෂක, නීති, සෞඛ්‍ය හා ආරක්ෂාව, වරාය කළමනාකරණ, තොරතුරු පද්ධති, මානව සම්පත් කළමනාකරණ ආදී ක්ෂේත්‍රයන්හි වරාය සේවකයින්ගේ දැනුම හා කුසලතාවයන් යාවත්කාලීන කිරීමේ හා වැඩි දියුණු කිරීමේ අරමුණින් බාහිර ආයතනයන්හිදී පුහුණු කිරීම් සිදුකිරීමට කටයුතු කරන ලදී. 2011 වර්ෂය තුළ පහත සඳහන් ආයතන විසින් පවත්වන ලද පුහුණු වැඩ සටහන් සඳහා ආයතනයේ සේවක සේවිකාවන් 75 දෙනෙකු සහභාගී විය.

* ශ්‍රී ලංකා නීති විද්‍යාලය
* ශ්‍රී ලංකා නීතිඥ සංගමය
* බේරුම්කාර මණ්ඩලය
* ආයෝජන මණ්ඩලය
* මහ බැංකුව
* වාණිජ මණ්ඩලය
* ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනය
* ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය
* වරලත් ගණකාධිකාරී ආයතනය
* IPM ආයතනය
* මොරටුව විශ්ව විද්‍යාලය
* ඉන්දියානු නැව් ලියාපදිංචි කාර්යාලය
* ශ්‍රී ලංකා පරිගණක සංගමය
* ශ්‍රී ලංකා තෘතියික වෘත්තිය අධ්‍යාපන මධ්‍යස්ථානය
* ශ්‍රම අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය
* ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
* ශ්‍රී ලංකා AAT ආයතනය
* CIMA ශ්‍රී ලංකා ශාඛාව
* ශ්‍රී ලංකා පදනම් ආයතනය
* ශ්‍රී ලංකා සේවාදායක සංගමය
* විනය කළමනාකරණය අධ්‍යයනය සඳහා වූ මධ්‍යස්ථානය
* වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්
* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
* ඉදිකිරීම් පුහුණු කිරීම් හා සංවර්ධනය සඳහා වූ ආයතනය

ඉහත ආයතනයන්හි වරාය සේවකයින් පුහුණු කරවීම සඳහා රු. 894,330/- ක මුදලක් වැය කර ඇති අතර සේවාස්ථ පුහුණු කටයුතු වෙනුවෙන් රු. 3,001,150/- ක මුදලක් වැය කෙරිණ.

### ISO 9001: 2008 තත්ත්ව සහතිකය

නාවිකයන් සඳහා IMO/STCW පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා ඉන්දියන් රෙජිස්ටර් ඔෆ් කොලිටි සිස්ටම් ආයතනයේ ISO 9001:2000 සහතිකකරණය මහපොළ අභ්‍යාස ආයතනය විසින් 2004 ජුලි මාසයේදී ලබා ගෙන ඇත. ඉන්දියන් රෙජිස්ටර් ඔෆ් කොලිටි සිස්ටම් ආයතනය විසින් නිරීක්ෂණ විගණනයට ලක් කිරීමේ ක්‍රමානුකූල පරීක්ෂණයන් 2005 සිට 2009 දක්වා කර ගෙන යනු ලැබූ අතර ISO සහතිකකරණය තහවුරු කෙරිණ. මෙම සහතිකය 2004 වසරේදී ලබා දුන් අතර 2010 වසර දක්වා පමණක් වලංගු වේ. 2010 නොවැම්බර් මාසය වන විට ISO 9001:2008 තත්ත්වකළමනාකරණ පද්ධතියක් කරා ප්‍රවිශ්ඨවීම අනිවාර්යය වේ. මෙම පදනම මත ISO 9001:2008 තත්ත්ව කළමනාකරණ පද්ධතිය සමඟ අනුකූලවීමට තත්ත්ව මාර්ගෝපදේශනය, ක්‍රියා පිළිවෙත් මාර්ගෝපදේශනය, කාර්යය උපදේශන සහ ප්‍රමිත ආකෘතීන් යනාදී ලේඛනයන් පිළියෙළ කිරීම අවශ්‍ය විය. මෙහිදී වැදගත්ම කරුණ වනුයේ බාහිර පාර්ශව උපදේශකවරුන්ගේ කිසිම සහයක් නොමැතිව මහපොළ අභ්‍යාස ආයතනයේම නිළධාරීන් විසින් මෙම ලේඛණ පිළියෙළ කිරීමයි. 2010 ජුලි මාසය වන විට මෙය සාර්ථක කර ගැනීමට අපට හැකි වූ අතර නාවිකයින් සඳහා IMO/STCW පුහුණු පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් ISO 9001:2008 තත්ත්ව සහතිකකය පිරිනමනු ලැබූ ශ්‍රී ලංකාවේ පුරෝගාමී අධ්‍යාපනික ආයතනය වන්නේ මහපොළ අභ්‍යාස ආයතනයයි.

### පුහුණුකරුවන් පුහුණු කිරීම

ආයතනයේ පුහුණු නිමවුම් තත්ත්වයන් වැඩි දියුණු කිරීමට 2011 වර්ෂය තුළ පුහුණුකරවන්නන්ගේ කාර්යය මණ්ඩලයේ 15 දෙනෙකු පමණ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහනට සහභාගී කරවීමට හැකි විය.

### ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන වල කාර්යය සාධනය

පහත සඳහන් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයන්හිදී පුහුණු පාඨමාලාවන් පවත්වනු ලැබීය.

### ඔලුවිල් පුහුණු මධ්‍යස්ථානය

| පාඨමාලාවේ නම | කාලය | වැඩ සටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| අඩු එසවුම් යන්ත්‍ර මෙහෙයුම් | සති 02 | 01 | 05 |

වෘත්තීය පුහුණු අධිකාරිය (VTA), තාක්ෂණික විද්‍යාල, ජාතික ආධුනිකත්ව හා පුහුණු අධිකාරිය (NAITA) සහ රාජ්‍ය නොවන සංවිධාන වැනි ආයතනවලින් නොමිලේ මෙහෙයවනු ලබන පාඨමාලා සඳහා පුහුණුවන්නන්ට දීමනාවක් ද ගෙවන බැවින් මුදල් අයකරනු ලබන පාඨමාලාවන් සඳහා මහජනයාගේ ප්‍රතිචාරය අඩුවී ඇත.

### උපයන ලද ආදායම

2011 වසර තුළ බාහිර පාර්ශවයන් සඳහා ගාස්තු අයකරනු ලබන පාඨමාලා පැවැත්වීම මඟින් මහපොළ අභ්‍යාස ආයතනය රු. 14,445,263/= ක ආදායමක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් උපයා දී ඇත. වරාය මෙහෙයුම් පිළිබඳ සමස්ථ හැකියාවන් වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් විවිධ බාණ්ඩයන් යටතේ දැනුම, නිපුණතා හා ආකල්ප වැඩි දියුණු කිරීමේ විවිධ පුහුණු පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම මඟින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ කොට්ඨාශයන්ගෙන් ලැබූ ආදායම රු. 9,509,294/= කි.

ඒ අනුව මහපොළ අභ්‍යාස ආයතනය මඟින් 2011 වර්ෂය තුළ උපයන ලද සමස්ථ ආදායම රු. 23,954,557/=

ඊට අමතරව අනෙකුත් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන වරාය අධිකාරිය වෙත උපයා දෙන ලද ආදායම පහතින් දැක්වේ.

| | | |
|---|---|---|
| සමුද්‍රික පුහුණු ආයතනය | (ඔලුවිල්) | රු. 169,506/= |
| පුහුණු මධ්‍යස්ථානය | (බදුල්ල) | රු. 98,750/= |

2011 වර්ෂය තුළ මහපොළ අභ්‍යාස ආයතනය සහ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි පවත්වන ලද පාඨමාලා වෙනුවෙන් දරන ලද සමස්ථ වියදම රු. 4,820,106/= කි.

## අභ්‍යන්තර විගණන

අභ්‍යන්තර විගණන කොට්ඨාසයේ ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික විගණන වැඩ සටහන මඟින් මඟ පෙන්වනු ලැබූ අතර විගණන මඟින් එය නිර්දේශ කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම් හා වියදම් විෂයපථය තුළ අභ්‍යන්තර පිරික්සීම් සහ සාමාන්‍ය අභ්‍යන්තර විගණක කටයුතු කර ගෙන යනු ලැබිණ.

### අභ්‍යන්තර පරීක්ෂා කිරීම්

#### පැමිණීම

කම්කරු හා කම්කරු නොවන සේවකයින් සේවා ස්ථානයේ රැඳී සිටීම සම්බන්ධයෙන් හදිසි පරීක්ෂාකර බැලීමේ කටයුතු හදිසි වැටලීමේ කණ්ඩායම විසින් දිවා රාත්‍රී මුර සේවා තුළදී අඛණ්ඩව කර ගෙන යනු ලැබීය. අනවසරයෙන් සේවා ස්ථානයෙන් බැහැරව සිටි සේවකයින් සඳහා විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම පිණිස වාර්තා කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සේවකයින් ඔවුන්ගේ සේවා ස්ථානයේ පැමිණීම යහපත් අතට පත්විය.

### මුදල්

මුදල් හා සුළු මුදල් අග්‍රිමය වරින් වර හදිසියේ පරීක්ෂා කිරීමේ කටයුතු කර ගෙන යනු ලැබූ අතර ඌණතාවයන් පිළිබඳව වාර්තා කරන ලදී.

#### ආදායම් විගණනය

වසර සඳහා ආදායම් එකතුව සම්බන්ධයෙන් විගණන කටයුතු විගණන වැඩ සටහන ප්‍රකාරව කර ගෙන යනු ලැබීය. වරාය ගාස්තු අඩුවෙන් අයකර ගැනීම් අනාවරණය කර ගැනීමට විශේෂ පැවරුම් කාර්යයන් තුළින් හැකිවිය.

ණයගැති ගිණුම්, විවාදිත බිල්පත් සහ අගරු වූ චෙක්පත් පරීක්ෂණයට භාජනය කළ අතර ඒවායේ වෙනස්කම් වාර්තා කරනු ලැබීය. කටුනායක සහ බියගම ගොඩබෑම් සහ භාරදීම් ඒකක වල නිතිපතා පරීක්ෂණයන් සිදු කරන ලදී.

#### වියදම් විගණනය

ප්‍රාග්ධන සහ පුනරාවර්ථන වියදම් සහ ගබඩා ගෙවීම් වවුචර් සම්බන්ධයෙන් පිරික්සුම් කර ගෙන යනු ලැබීය. වාහන ධාවන සටහන් පත් සහ වාහන අනුමත ආකෘති පත්‍ර පරීක්ෂා කෙරුණු අතර ඌණතාවයන් පෙන්වා දෙනු ලැබිණ.

වැටුප් හා වේතන සම්බන්ධ සකස් කිරීම් නිතිපතා පරික්ෂා කර ගෙන යනු ලැබූ අතර සොයාගනු ලැබූ අසමානතාවයන් පිළිබඳව වාර්තා කෙරිණ.

**ගබඩා පිළිබඳ භෞතික නිවරදාතාවයන් පරීක්ෂා කිරීම**

කොළඹ වරායේ ගබඩා පිළිබඳ භෞතික නිරවද්‍යාතාවයන් පරීක්ෂා කර බැලීම් අඛණ්ඩව කර ගෙන යනු ලැබූ අතර ගාල්ල සහ ත්‍රිකුණාමලය යන වරායයන්හි වාර්ෂික තොග පරීක්ෂා කර බැලීම්වලදී ද සෑම විටම සහාය දක්වනු ලැබිණ.

ප්‍රධාන ගබඩාවේ අඛණ්ඩ නිරවද්‍යාතාවයන් සලකා බැලීමේදී ගබඩාවේ පවතින නිරන්තරයෙන් අවශ්‍ය නොවන තොග අයිතමයන් හඳුනාගත් අතර සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීම සඳහා සැපයුම් කොට්ඨාශය වෙත යොමු කෙරිණ.

**පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර, වාහන සහ ජංගම උපකරණ**

සභාපතිතුමාගේ උපදෙස් අනුව ක්‍රියාකාරීත්වයේ පවතින අළුත්වැඩියා කළ හැකි උපකරණ නිසැකව හඳුනාගැනීම පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, වාහන සහ ජංගම උපකරණ පිළිබඳව භෞතික සමීක්ෂණයක් අභ්‍යාන්තර විගණන, තොරතුරු පද්ධති සහ යන්ත්‍රෝපකරණ කොට්ඨාශයන්හි කාර්යා මණ්ඩල විසින් කර ගෙන යනු ලැබිණ.

**පරීක්ෂාවන්**

වසර තුළ සභාපති, කළමනාකාර අධ්‍යක්ෂගේ ඉල්ලීම පරිදි විශේෂ පරීක්ෂණ සිදු කරන ලදී.

**අවසාන ගිණුම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වෙමින් මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙළ කිරීම සහතික කිරීමේ අදහස ඇතිව අධිකාරියේ අවසාන ගිණුම් පරීක්ෂා කිරීම ද මෙම කොට්ඨාශයේ වගකීම වේ.

**පූර්ව විගණන**

සමාලෝචිත වර්ෂය තුළ තැන්පතු, ආපසු ගෙවීම් සහ වරාය ගාස්තු අතහැර දැමීම පිළිබඳව පූර්ව විගණනයන් කරනු ලැබීය.

**ගාල්ල හා ත්‍රිකුණාමලය වරායයන්**

ගාල්ල හා ත්‍රිකුණාමලය වරායයන් වෙනුවෙන් ආදායම් සහ වියදම් දෙඅංශයේම ගිණුම් විගණනය කර වාර්තා සකස් කෙරිණ.

## ත්‍රිකුණාමලය වරාය

2011 වසර තුළ ත්‍රිකුණාමල වරායේ කටයුතු සම්බන්ධ පාලන වාර්තාව

**නාවික**
**ත්‍රිකුණාමලය වරායට පැමිණි නෞකා සංඛ්‍යාව**

| විස්තරය | 2010 | 2011 |
|---|---|---|
| සාමාන්‍ය නැව් බඩු සහ තොග කඩන | 136 | 150 |

| | | |
|---|---|---|
| මගී නෞකා | 11 | 13 |
| එකතුව | 147 | 163 |

**නැව් භාණ්ඩ මෙහෙයුම්**

**සාමාන්‍ය නැව් බඩු සහ වියළි තොගකඩන නැව් බඩු මෙහෙයවීම**

| විස්තරය | පැටවුම් (මෙ.ටො.) | ගොඩබෑම් (මෙ.ටො.) |
|---|---|---|
| සාමාන්‍ය නැව් බඩු සහ වියළි තොග කඩන නැව් බඩු | 36,078 | 241,787 |
| දියර තොග | 1,620 | 113,034 |

**නාවික**

ත්‍රිකුණාමලය වරායේ ටග් යාත්‍රා 3 ද, දියත් යාත්‍රා 4 ද, ටනැක් යාත්‍රාවක් ද තිබෙන අතර මෙයින් බොහොමයක් ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයේ ඇති බව සොයා ගන්නා ලදී. මෙම යාත්‍රා අතුරින් "සිංහබාහු" ටග් යාත්‍රාව අළුත්වැඩියාව සඳහා කොළඹට එවා ඇති අතර ඒ වෙනුවෙන් "නීලමහ" ටග් යාත්‍රාව එවා ඇත.

**යටිතල පහසුකම් සංවර්ධනය**

2011 වර්ෂයේදී මුණ්ඩම් (Bollard) පරීක්ෂාව සඳහා කොළඹ ඩොක්යාඩ් ආයතනය විසින් ක්ලැපන්බර්ග් හි ටොන් 250 ක මුණ්ඩමක් ඉදිකරන ලදී.

**සේරුවිල II යාන්ත්‍රික බෝට්ටුව - මගී ප්‍රවාහන සේවය**

මෙය ශ්‍රී ලංකා නිදහස් වරාය පෞද්ගලික සමාගමේ කළමනාකරණය යටතේ පැවතිණ. ප්‍රධාන අළුත්වැඩියා කටයුතු හේතු කොට ගෙන කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ගේ සේවය 2011 ජුනි මස 30 දින අවසන් කරන ලදී. මෙහි ප්‍රධාන එංජිමේ අළුත්වැඩියා කටයුතු දැනට සිදු කෙරේ.

**ආරක්ෂක අංශය**
**ජාත්‍යන්තර නැව් හා වරාය ආරක්ෂාව (ISPS)**

මේ පිළිබඳ රීති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අඩුපාඩු රැසක් පෙන්වා දෙන ලද අතර මේවායින් බොහොමයක් සම්පූර්ණ කර ඇත. ඉතිරි කොටස් අදාළ අංශයන් මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

**ගිනි නිවීමේ වැඩසටහන්**

2011 දෙසැම්බර් 05 දින සිට 2011 දෙසැම්බර් 09 වන දින දක්වා කාලය ඇතුළත කලින් කරන ලද පරිදි එක් එක් ඒකකයේදී කොළඹ වරායෙන් පැමිණි නිලධාරීන් විසින් ගිනි නිවීමේ පිළිබඳ පැහැදිලි කිරීම උදෙසා පංති පවත්වන ලදී.

**ඉංජිනේරු කොට්ඨාශය විසින් සිදු කරන ලද කාර්යයන්**

**සිවිල්**

* බර්මා කඳවුරේ ආරක්ෂක කුටිය ප්‍රතිසංස්කරණය කිරීම, බර්මා කඳවුරේ "ඩී" ශාලාවේ පැති තාප්පය ඉදිකිරීම, අංක 6 දරණ ගුදමේ අළුත්වැඩියා කටයුතු, ඕර්ස් හිල් (Orr's Hill) හි අංක I සංචාරක බංගලාවේ ජල ටැංකිය සඳහා අතිරේක ජල නල සැපයීම නිමකර ඇත.

* ඕර්ස් හිල් හි සංචාරක බංගලාවන්, අංක II දරණ සංචාරක බංගලාව සහ ඒකක 3 ක පිහිටි බෞද්ධ මන්දිර ප්‍රතිසංස්කරණය සහ පින්තාරු කිරීම, සැපයුම් කාර්යාලයේ කොන්ක්‍රීට් වහල කොටසේ සිමෙන්ති වැඩ, නැංගුරම්ලෑමේ යාත්‍රාවේ සේවක කාමර (Cabin) වෙන්කිරීම සිදු කරන ලදී.

* අංක 8 සහ 16 දරණ රයිෆල් ග්‍රීන් (Rifle Green) නිළ නිවාසයන්හි අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු, නව පරිපාලන ගොඩනැගිල්ල සහ දියත් යාත්‍රාවල සහ වාහනවල සියලුම වඩුවැඩ අවශ්‍යතාවයන් අනුව සිදු කරගෙන යනු ලැබීය.

**යාන්ත්‍රික ඉංජිනේරු**

* රෝසා බස් රථයේ ටින්කර් වැඩ සහ පින්තාරු වැඩ, තට්ටුව, ආසන සහ වෙනත් අළුත්වැඩියාවන් සිදු කිරීම, මිට්සුබිෂි වෑන් රථයේ ඇන්ජිම සම්පූර්ණයෙන් අළුත්වැඩියා කිරීම, ටින්කර් වැඩ සහ පින්තාරු කිරීම, ලේලන්ඩ් බස් රථයේ මල බැදී කොටස් ඉවත් කර අළුතින් ඇළුමිනියම් තහඩු යොදා සවිකිරීම සහ පින්තාරු කිරීම, ඉසුසු පික්-අප් රථයේ ගියර් පෙට්ටිය අළුත්වැඩියා කිරීම, එහි පසුපස කොටසේ ටින්කර් වැඩ සහ පින්තාරු කිරිමත් රථයේ විදුලි කාර්මික කටයුතු සිදු කරන ලදී.

* අංක III දරණ නියමු දියත් යාත්‍රාවේ වීල් කාමරයේ (Wheel Room) සහ යාත්‍රා බඳෙහි ප්‍රතිසංස්කරණ කටයුතු මෙන්ම නියමු යාත්‍රාවේ වලක්කන කොකු (Fender Hook) නිපදවීම, වතුර බත්තල්වල තට්ටුවෙහි දිරාගිය කොටස් නැවත සැකසීම, නැංගුරම්ලෑමේ යාත්‍රාවල නල පද්ධතිය (Pipe Line) නැවත සැකසීම, සලකුණු බෝයා 6 ක් පිළිසකර කර නැවත සවිකිරිම.

* “මායා” දියත් යාත්‍රාවේ ෂාෆ්ට් කොටස අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ වරායේ කණ්ඩායමට සහාය වීම, සේරුවිල II යාන්ත්‍රික දියත් යාත්‍රාවේ ප්‍රධාන එන්ජිම අළුත්වැඩියා කිරීම, ග්‍රැබ් සහ අදාළ කොටස් අළුත්වැඩියා කිරීමෙන් ගල් අඟුරු / ජිප්සම් ගොඩබෑම් සඳහා ක්‍රියාකරවන අංශයට සහායවීම.

## ගාල්ල වරාය

| වර්ගය | නෞකා සංඛ්‍යාව | ගොඩබෑම් (මෙ.ටො.) | පැටවීම් (මෙ.ටො.) |
|---|---|---|---|
| ක්ලින්කර් | 45 | 392,179 | - |
| සිමෙන්ති තොග | 09 | 62,801 | - |
| ජිප්සම් | 01 | 8,500 | - |
| ප්‍රති අපනයන නැව් බඩු | - | 29 | 253 |
| **මුළු ගණන** | **55** | **463,509** | **253** |

| | |
|---|---|
| මෙහෙය වූ සමස්ථ ටොන් ප්‍රමාණය | මෙ.ටො. 463,762 |
| සමස්ථ භාණ්ඩ නෞකා | 55 |
| අනෙකුත් යාත්‍රා (මගී,නාවික,නැව්තෙල්,අළුත්වැඩියා යනාදිය) | 104 |
| 2011 වර්ෂයේදී නැංගුරම් ලද සමස්ථ නැව් | 159 |
| නැංගුරම්ලෑම් | 53 |
| වරාය සීමාවෙන් පිටත නෞකා | 5,788 |
| රුවල් යාත්‍රා | 119 |

# මූල්‍ය සමාලෝචනය

## ආදායම (වරායයන් තුනෙහිම)

ආදායම (රු: මිලි:)
(වරාය කටයුතු සැකසුම)

| විස්තරය | 2010 | 2011 | විස්තරය | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| **වරාය කටයුතු වලින් ආදායම** | 25,046 | 27,542 | ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන | 617 | 587 |
| **වෙනත් ආදායම්** | 3,233 | 3,708 | සාම්ප්‍රදායික ප්‍රති අපනයන නැව් බඩු | 29 | 41 |
| | | | තටාකායන සහ නැංගුරම්ලෑම් | 657 | 689 |
| | | | යාත්‍රා ගමන්,වරාය,නියමු හා ටග් ගාස්තු | 3,141 | 3,407 |
| | | | ගබඩා කිරීම | 1,837 | 2,160 |
| | | | සාම්ප්‍රදායික අභ්‍යන්තරික නැව් බඩු | 2,505 | 3,085 |
| | | | බහළුගත ප්‍රතිඅපනයන නැව් බඩු | 5,708 | 5,655 |
| | | | බහළුගත දේශීය නැව් බඩු | 9,908 | 11,149 |
| | | | වෙනත් සේවා (මෙයහයුම්) | 643 | 770 |
| **සමස්ථ ආදායම** | **28,279** | **31,250** | **මුළු ආදායම (වරාය කටයුතු පමණි)** | **25,046** | **27,542** |

## මෙහෙයුම් හා වෙනත් වියදම් (වරායයන් තුනෙහිම) (රුපියල් මිලියන)

| විස්තරය | 2010 වියදම | 2011 විදයම | වැඩිවීම/අඩුවීම | % |
|---|---|---|---|---|
| සම්භාර ප්‍රතිපාදනය සඳහා ගෙවීම | 918 | 1,123 | (205) | (22) |
| වත්කම් නඩත්තුව | 1,137 | 1,373 | (236) | (21) |
| ඉන්ධන, විදුලිබලය සහ ජලය | 1,828 | 2,201 | (373) | (20) |
| විදේශ ණය මත පොලිය | 1,225 | 1,372 | (147) | (12) |
| අතිකාල | 3,323 | 3,177 | 146 | 4 |
| ක්ෂයවීම් | 4,682 | 4,118 | 564 | 12 |
| වේතන, වැටුප් හා දීමනා | 10,011 | 9,307 | 704 | 7 |
| වෙනත් | 1,997 | 1,659 | 338 | 17 |
| **මුළු වියදම** | **25,120** | **24,330** | **790** | **3** |
| විදේශ විනිමය පාඩු/ලැබීම් | (4,410) | (3,543) | 867 | 20 |
| ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ වියදම් | - | 2,595 | (2,595) | (100) |
| **මුළු වියදම විදේශ විනිමය පාඩුව ඇතුළුව** | **29,530** | **30,468** | **(938)** | **(3)** |

## වරායයන් අනුව ක්‍රියාකාරීත්වය

### කොළඹ වරාය

2011 වර්ෂයේදී කොළඹ වරාය රුපියල් මිලියන 8,757 ක මෙහෙයුම් ලාභයක් ඉපැයීය. 2010 වර්ෂයේ ආදායම වූ රුපියල් මිලියන 27,724 හා සසඳා බලන විට 2011 වර්ෂයේ ආදායම රුපියල් මිලියන 30,525 ක් වූ අතර එය එය රුපියල් මිලියන 2,801 ක වැඩිවීමකි. බදු අයකිරීමට පෙර මුළු වියදම (ස්.වි.ගැ.ඇතුළුව) රුපියල් මිලියන 28,977 ක් වූ අතර 2010 වර්ෂයේ වියදම රුපියල් මිලියන 28,244 කි. එය 3% ක වැඩිවීමකි.




### ගාල්ල වරාය

2011 වර්ෂයේදී රුපියල් මිලියන 147 ක බදු අයකිරිමකට පෙර පාඩුවක් ගාල්ල වරායෙන් වාර්තා විය. 2010 වර්ෂයේදී ලැබූ දළ ආදායම රුපියල් මිලියන 277 හා සසඳා බලන විට 2011 වර්ෂයේදී දළ ආදායම රුපියල් මිලියන 441 ක් ඉපැයූ අතර එය රුපියල් මිලියන 164 ක වැඩිවීමකි. බදු අයකිරීමකට පෙර වියදම (ස්.වි.ගැ.ඇතුළුව) රුපියල් මිලියන 673 ක් වූ අතර 2010 වර්ෂයේ වියදම රුපියල් මිලියන 623 කි. එය 8% ක වැඩිවීමකි.



## ත්‍රිකුණාමලය වරාය

2011 වර්ෂයේදී රුපියල් මිලියන 318 බදු අයකිරීමට පෙර පාඩුවක් ත්‍රිකුණාමලය වරායෙන් වාර්තා විය. 2010 වර්ෂයේ ලැබු දළ ආදායම රුපියල් මිලියන 279 හා සසඳා බලන විට 2011 වර්ෂයේදී රුපියල් මිලියන 285ක ආදායමක් ඉපැයු අතර එය රුපියල් මිලියන 6 ක වැඩිවීමකි. බදු අයකිරීමට පෙර වියදම (ස්.වි.ගැ.ඇතුළුව)රුපියල් මිලියන 817 ක් වු අතර 2010 වර්ෂයේ වියදම රුපියල් මිලියන 662 කි. එය 23% ක වැඩිවීමකි.



සමාලෝචනයට භාජිත වර්ෂය තුළ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය සංස්ථාපිත සමාජ වගකීම් අඛණ්ඩව සිදු කරනු ලැබීය.

- ✱ මොණරාගල - බුත්තල පැවති “දැයට කිරුළ” ප්‍රදර්ශනයට සමගාමීව කතරගම පිහිටි දිස්ත්‍රික් රෝහල අළුත්වැඩියා කිරීම

- ✱ අ.පො.ස (සා/පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) විශිෂ්ඨ ලෙස සමත් වූ වරාය සේවකයින්ගේ දූ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනැමීම.

- ✱ වරාය සේවකයින්ගේ කුඩා දරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් අංග සම්පූර්ණ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබයි.

- ✱ පවතින වරාය පහසුකම් සහ ක්‍රියාකාරකම් මෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සිදු කර ගෙන යනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳව පාසල් සිසුන් සහ මහජනතාව හොඳින් දැනුවත් කිරීමට අවස්ථාවක් සලසනු වස් “දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය” ඇතුළුව ප්‍රදර්ශණ ගණනාවකට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහභාගී විය.

- ✱ අංග සම්පූර්ණ වරාය ගිනි නිවීමේ ඒකකය, ගිණි නිවීම් කටයුතු මෙන්ම කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්හි වෙනත් හදිසි අවස්ථාවන්වලදී ද කොළඹ මහ නගර සභාවට සහායවීම.

මානව ප්‍රාග්ධනය යනු සේවායා විසින් සේවා දායකයාට සපයනු ලබන ආර්ථික වටිනාකමයි. මෙම වටිනාකම තක්සේරු කරනු ලබන්නේ සේවායා සතු නිපුණත්වය, දැනුම සහ පලපුරුද්ද සම්බන්ධ කොට ගෙනය. සේවායා නියෝජනය කරනු ලබන මානව ප්‍රාග්ධනය වර්ධනය කිරීමෙහිලා ඔහුගේ විධිමත් අධ්‍යාපනය සහ සේවය කරන ස්ථානයට අදාළ පුහුණුවීම් කටයුතු වැනි සාධකයන් ඉවහල් වේ.

මානව ප්‍රාග්ධනය ඕනෑම සංවිධානයක මූලික හරය ලෙස සැලකිය හැක. තමන්ට පවරන ලද කාර්යභාරයන් සඳහා අවශ්‍ය නිපුණතා, දැනුම සහ කාර්යයන්හි නියැලීමේ දක්ෂතාවයන් සතු සේවකයන් සේවයේ යෙදවීමෙන් සංවිධානයකට සිය උපරිම කාර්යක්ෂමතාවයකින් ක්‍රියාකිරීම උදෙසා ශක්තිය ලැබේ. ලාභ ඉපයීම වර්ධනය කිරීමටත්, වසර ගණනාවක් සාර්ථක ලෙස පවත්වා ගෙන යාමටත් සංවිධානයට මෙයින් ලැබෙන උපකාරය අතිමහත්ය.

මානව ප්‍රාග්ධනයේ වැදගත්කම හඳුනා ගෙන සංවිධානයන් මානව ප්‍රාග්ධනය උදෙසා ආයෝජනය කරනු ලබයි. අතිරේක සේවකයින් සේවයේ යොදවා ගැනීමේ අවශ්‍යතාවයෙන් තොරව වඩාත් පුළුල් වූ නිපුණතාවයන් කෙරෙහි ප්‍රවේශයක් ඇති කර ගැනීමට සංවිධානයට මෙයින් හැකිවේ. මේ නිසා පාර්ශව දෙකටම ඵලදායක වන සාධකයක් ලෙස සංවිධානයක මානව ප්‍රාග්ධනය සැලකිය හැකි වේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානව ප්‍රාග්ධනය වර්ධනය කිරීමෙහිලා සෘජු වශයෙන් අදාළ වන ප්‍රධාන කොට්ඨාශ වන්නේ මානව සම්පත් කොට්ඨාශය, වෛද්‍ය කොට්ඨාශය, සුභසාධක හා කාර්මික සම්බන්ධතා කොට්ඨාශය සහ මහපොළ අභ්‍යාස ආයතනයයි.

ඵලදායක ශ්‍රම බලකායක් ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීමෙහිලා මානව සම්පත් කොට්ඨාශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මෙම අදහසින් යුක්තව වඩාත් සුදුසුකම් ලත් ශ්‍රමබලකායක් ආකර්ශණය කර ගැනීමටත්, ඔවුන් රඳවා ගැනීමටත්, අදාළ වෘත්තීමය සහ අධ්‍යාපන සුදුසුකම් අන්තර්ගත කරමින් සියලුම සේවක කොට්ඨාශවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කර ඇත.

විධායක, විධායක නොවන, තාක්ෂණික සහ තාක්ෂණික නොවන ප්‍රභේදයන්ට අයත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ථ ශ්‍රම බලකාය 2011 වසර අවසානයේදී 10982 ක් විය. මේ අය අතුරින් 43 දෙනෙකු පශ්චාත් උපාධිධාරීන් ද, 39 දෙනෙකු පශ්චාත් ඩිප්ලෝමාධාරීන් ද 457 දෙනෙකු උපාධිධාරීන් ද 299 දෙනෙකු ඩිප්ලෝමාධාරින් ද වේ.

සංවිධානයේ වැඩි ඵලදායක කාර්යයක් සඳහා සේවක කාර්යා සාධනය ප්‍රතිඵලදායක ලෙස යොදවා ගනු වස් සේවක කාර්ය සාධනය ඇගයීම උදෙසා මානව සම්පත් කොට්ඨාශය වැඩි අවධානයක් යොමු කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සෑම සේවකයෙකුටම හය මාසයක් තුළ නිම කිරීම සඳහා නිශ්චිත කාර්යයක් පවරා ඇති අතර මෙම පූර්ව නිගමන කාලසීමාව අවසන් කළ පසු ඇගයීමකට ලක් කෙරේ. මෙම ඇගයීමේ ප්‍රතිඵලය පදනම් කර ගෙන සේවකයින්ගේ හැකියාවන් සහ දුර්වලතාවයන් හඳුනා ගැනීමට මානව සම්පත් කොට්ඨාශයට හැකියාවන් ලැබිණ. මෙය වර්තමාන අවශ්‍යතාවලට සරිලන අන්දමින් අදාළ පුහුණු වැඩ සටහන් හඳුන්වාදීමට ඉවහල් වේ.

අදාළ විෂය ධාරාව තුළ විශේෂ සුදුසුකම් ලබා ගනිමින් කාර්යා සාධනයේ යෙදෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධායක නිලධාරීන්ට ඔවුනගේ සේවය සඳහා වටිනාකම එක් කිරීමක් ලෙස මාසිකව වෘත්තිමය දීමනාවක් ගෙවනු ලැබේ. මෙයින් අනෙකුත් සේවකයන්ට සිය ක්ෂේත්‍රයන්හි කාර්යයන් වඩාත් වෘත්තීමය අන්දමින් ඉටු කිරීමෙහිලා විශේෂ සුදුසුකම් ලබා ගැනීමට අභිප්‍රේරණයක් ඇති කෙරේ. තම වෘත්තියට අදාළ වන්නේ නම් විධායක නිලධාරීන් විසින් ගෙවන ලද සාමාජික දායක මුදල නැවත ඔවුන්ට ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරනු ලැබේ.

ඕනෑම සංවිධානයකට තම සංවිධානයේ අභිප්‍රායයන් ඵලදායක ලෙස සහ කාර්යක්ෂම ලෙස සාක්ෂාත් කර ගැනීමෙහිලා මානව සම්පත් සැලැස්ම ඉතා වැදගත් ලේඛණයක් වේ. 2011 දී ක්‍රියාත්මක කරන ලද ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය පදනම් කොට ගෙන අනාගත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මානව ප්‍රාග්ධනය උපරිම ලෙස යොදා ගැනීමට හැකිවන පරිදි මානව සම්පත් සැලැස්ම සංශෝධනය කරන ලදී.

මානව සම්පත් කර්තව්‍යයන් මනා ලෙස පවත්වා ගෙන යාම සඳහා මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) 2009 වසරේ සිට ක්‍රියාත්මක කරන ලදී. භාවිතා කරන්නන්ට පහසුවන පරිදි අදාළ සේවක කොටස් අතර මානව සම්පත් තොරතුරු පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී. දැනට වැටුප් පත්‍රිකා පද්ධතිය සහ පැමිණීමේ වේලා සටහන් පද්ධතිය මානව සම්පත් තොරතුරු පද්ධතිය සමඟ අනුගත කිරීම සඳහා මූලික අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇත. ලේඛණ කටයුතු අවම කිරීම සඳහාත්, නිතිපතා සිදුවන මානව සම්පත් කර්තව්‍යයන් පහසුකිරීම සඳහාත් තවදුරටත් ලේඛණගත කළමනාකරණ පද්ධතියක් ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

විවිධ ක්ෂේත්‍රවල නව දේශණමාලා හඳුන්වාදීමෙන් 2011 වසරතුළ පෙර වසරවල මෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන අංශයක් වන මහපොළ අභ්‍යාස ආයතනය විසින් සිය වාර්ෂික වැඩ සටහන් පවත්වා ගෙන යන ලදී. විධායක ශ්‍රේණීන් සඳහා බඳවා ගැනීමේ නව පටිපාටිවලට සරිලන පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ උසස්වීම් කටයුතු සඳහා වෘත්තිමය දැනුම ශක්තිමත් කිරීමේ අභිලාෂයෙන් මහපොළ අභ්‍යාස ආයතනය විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අනුග්‍රහයෙන් මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව සහ කොළඹ විශ්ව විද්‍යාලයේ අනුග්‍රහයෙන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව ද ආරම්භ කරන ලදී. තවදුරටත් කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ අනුග්‍රහයෙන් වරාය ආරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමාවත්, කොළඹ විශ්ව විද්‍යාලයේ අනුග්‍රහයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවත් ආරම්භ කිරීමට කටයුතු කර ගෙන යනු ලැබේ.

විධායක නොවන ශ්‍රේණීන්ගේ නව බඳවා ගැනීමේ පටිපාටිය මත පදනම් වූ ඉහළ තනතුරු සඳහා අයදුම් කිරීම වෙනුවෙන් අවම අධ්‍යාපන මට්ටමක් නොමැති වරාය සේවකයින් සඳහා වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ සංවර්ධනය පිළිබඳ පුහුණු පාඨමාලාවන් මහපොළ අභ්‍යාස ආයතනය විසින් පවත්වනු ලැබිණ.

මීට අමතරව, තම දැනුම හා නිපුණතාවයන් වර්ධනය කර ගැනීමට අපේක්ෂාවෙන් පසුවන්නන් හට පහසුකම් සලසනු වස් සහනදායී ගාස්තු මත විවිධ විෂය ධාරා යටතේ ගාස්තු අයකර පවත්වනු ලබන පාඨමාලා මහපොළ අභ්‍යාස ආයතනය මඟින් මෙහෙයවනු ලැබීය. ගෝලීය තත්ත්වයන්ට සරිලන පරිදි තම දැනුම සහ නිපුණතා යාවත්කාලීන කර ගැනීම උදෙසා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධායක නිළධාරීන් විදේශයන්හි පවත්වනු ලැබූ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගීවීම පිණිස යවන ලදී.

2011 වර්ෂය තුළ මහපොළ අභ්‍යාස ආයතනයේදී සහ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි පවත්වනු ලැබූ පාඨමාලා සඳහා වැය වූ සමස්ථ වියදම රු: 4,820,106/- ක් විය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ සුභසාධනය වර්ධනය කරනු වස් සුභසාධක හා කාර්මික සබඳතා කොට්ඨාශය විසින් සුභසාධක පහසුකම් පෙර පරිදිම අඛණ්ඩව කර ගෙන යනු ලැබිණි. සුභසාධක හා කාර්මික සබඳතා කොට්ඨාශය විසින් සිදු කරනු ලබන ඇතැම් සුභසාධක පහසුකම් වන්නේ නොමිලයේ ආහාර සැපයීම, නිවාස ණය යෝජනා ක්‍රම, ප්‍රවාහන පහසුකම්, රක්ෂණ යෝජනා ක්‍රමය, ක්‍රීඩා පහසුකම්, සුබසාධක ආපනශාලා සහ නිවාඩු නිකේතන ආදියයි. සේවකයින්ට සිය දැනුම, නිපුණතාවයන් සහ ආකල්ප යාවත්කාලීන කර ගැනීමේ හැකියාව ලබා දෙමින් කොට්ඨාශ විසින් පවත්වා ගෙන යනු ලබන පුස්ථකාල වෙත පොත්පත් මිලදී ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන සපයන ලදී. වරාය සේවකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට සුභසාධන පහසුකම් ඇති කිරීම පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම සේවකයින් අතර 2011.09.01 දින සිට බලපැවැත්වෙන පරිදි වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය මනා අන්දමින් පවත්වා ගෙන යාම සඳහා වෛද්‍ය කොට්ඨාශය මඟින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කෙරේ. මෙම අරමුණු සාර්ථක කර ගැනීමෙහිලා රෝගී වූ සහ තුවාල ලත් සේවකයින් රැක බලාගන්නා අතර සේවකයින්ගේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා කායික සෞඛ්‍ය පමණක් නොව මානසික සහ සමාජමය යහපත මනා ලෙස පවත්වා ගෙන යාම වෙනුවෙන් වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගැනීම පිණිස ද වෛද්‍යවරු අවධානය යොමු කරන ලදී.

සේවකයින්ට සිය සේවා ස්ථානවල හිතකර ආකාරයෙන් රාජකාරී ඉටුකර ගැනීම පිණිස සුවපහසු සහ සෞඛ්‍යයට හිතකර පරිසරයක් නිර්මාණය කරන ලදී.

මෙම සියළු පහසුකම් ධනාත්මක වශයෙන් ක්‍රියාකාරී වූ ඵලදායක සේවා බලකායක් ඇති කිරීමට ඉවහල් වී ඇත.

සංයුක්ත පාලනය යන්නෙන් අදහස් කෙරෙනුයේ ව්‍යාපාරයට සම්බන්ධ සියළුම පාර්ශවවල යහපත උදෙසා සම්පත් සාර්ථක ලෙස උපයෝගී කර ගනිමින් අදාළ ආයතනය සම්බන්ධ නිසි මාර්ගෝපදේශකත්වයකින් යුතුව පාලනය පවත්වා ගෙන යාම සඳහා එම ආයතනය විසින් පිහිටුවනු ලබන සමස්ථ යාන්ත්‍රණයයි. යහ පාලනයක් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් මූලික වගකීම අධිකාරියේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. සංවිධානයේ මූලික අරමුණු ළඟා කරගනු වස් එහි ක්‍රියාවලියන් හා පාලන ක්‍රම නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වන බවට ඔවුන් සහතික විය යුතු අතර මේ සඳහා වෘත්තිමය නිළධාරීන් ඔවුන්ට අදාළ ක්‍රියාකාරී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වගකීම දැරීම තුළින් පහසුකම් සැලසිය යුතුය. මෙම කර්තව්‍ය තුළ අභ්‍යන්තර විගණක නිලධාරීන්ට ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පරීක්ෂා කිරීමට හා අනුමත පිළිවෙත් තුළින් බැහැරවීමේ අවස්ථා ඇත්නම් ඒ පිළිබඳ වාර්තා කිරීම තුළින් වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට පැවරී ඇත. යම් බැහැරවීමක් වේ නම් විශේෂයෙන් මෙහෙයුම් හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් අපේක්ෂිත කාර්ය්‍යා සාධනය ළඟාකර ගැනීම පිණිස ඒවා ප්‍රතිශෝධනය කළයුතු වන්නේ කෙසේ දැයි නිර්දේශ කෙරෙන අතර එමඟින් යහ පාලනය කෙරෙහි දායකත්වයයක් සපයයි.

මූල්‍යමය හා අනෙකුත් මෙහෙයුම් ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ උසස් මට්ටම හා නිරතුරුබව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තමන්ට භාරවූ කටයුතු කොතෙක් දුරට ඉටු කරයි ද යන්න වග, කළමනාකාරීත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ හුවමාරු කරගනු ලබන තොරතුරු වල උසස් මට්ටම, විනිවිදභාවයකින් යුත් සංවිධානයක් කළමනාකරණය කිරීමෙහිලා ඔවුන්ගේ කැපවීම වටිනාකම උපරිමකර ගැනීම සඳහා වැදගත් අවශ්‍යතාවයක්ව ඇත. එහිලා උසස්ම මට්ටමේ සංයුක්ත පාලනයක් අඛණ්ඩව පවත්වා ගෙන යාමට අධිකාරිය කැප වී ඇත.

අධිකාරියේ පාලනය සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මනා පරිචයක් ක්‍රියාත්මක වන බවට සහතික වීම සඳහා නීතිරීති හා රෙගුලාසි, ව්‍යුහයන් හා ක්‍රියාදාමයන් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු අවධානයක් යොමු කිරීම අධිකාරිය විසින් අඛණ්ඩව සිදු කර ගෙන යනු ලැබේ. අධිකාරිය විසින් එහි පාලන කාර්යයන් පිළිබඳ ව්‍යුහයන් මනා අන්දමින් ප්‍රතිශෝධනයට ලක් කොට ඇත.

මුදල් වර්ෂය තුළ අධිකාරිය විසින් අනුගමනය කර ඇති මනා සංයුක්ත පාලන මූලධර්ම පහත සඳහන් ශීර්ෂ යටතේ දක්වා ඇත.

- අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු
- අභ්‍යන්තර පාලන
- අභ්‍යන්තර විගණන
- විනය නීති
- මහා භාණ්ඩාගාරය සහ වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය සමඟ සම්බන්ධතාවය
- ව්‍යවස්ථාපිත හා නෛතික අවශ්‍යතාවයන්ට අනුකූල වීම
- යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්

මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසායකත්ව දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ මාලාවේ නිශ්චිතව හඳුනාගත් වගන්ති වලින් බැහැරව කටයුතු කිරීම සඳහා වරාය සහ මහාමාර්ග අමාත්‍යවරයා හා මුදල් හා සැළසුම් අමාත්‍යවරයා විසින් ඒකාබද්ධව සිදු කරන ලද නිර්දේශයන් සඳහා අනුමැතිය ලබාදීමට අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය අනුගමනය කරමින් කර්මාන්තය තුළ උසස් මට්ටමකින් තරඟකාරී සහ ප්‍රායෝගික රාජ්‍ය ආයතනයක් බවට පත්වීම සහ අවශ්‍ය කරන නම්‍යශීලීත්වය සහ ස්වාධීනත්වය තහවුරු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පාලන ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරනු ලැබ ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු**

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති, උපසභාපති හා අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මන්ඩලයේ සාමාජිකයින්, ඉහළම වෘත්තියමය සහ පෞද්ගලිකමය ආචාර විද්‍යාත්මක වටිනාකම් සහිතව අධිකාරිය ක්‍රියාත්මක වන කර්මාන්තයෙහි පළපුරුද්දක් ඇති අයවලුන් විය යුතුවේ.

වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ පහත ආකාරයටය;

* වරාය සංවර්ධනයෙහි හෝ වරාය මෙහෙයුම් කාර්යයන්හි හෝ නෛතික හෝ මූල්‍ය කටයුතු හෝ නාවික කටයුතු, වාණිජ හෝ ඉංජිනේරු කටයුතුවල හෝ පරිපාලනයෙහි හෝ කම්කරු සම්බන්ධතා කටයුතු සම්බන්ධ පළපුරුද්දක් සහිත සහ එම කටයුතුවල හැකියාව ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන්නේ නම් ඔවුන් අතරින් සභාපතිවරයා සහ තවත් අධ්‍යක්ෂවරුන් 04 දෙනෙකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ.

* කළමනාකාර අධ්‍යක්ෂවරයා පනතේ 13.1 වගන්තිය ප්‍රකාරව ඇමතිවරයා විසින් පත්කරනු ලැබේ.

* මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක්.

* රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ ධීවර කටයුතු විෂය පවරනු ලැබ ඇති ඇමතිවරයා භාරයේ පවතින අමාත්‍යාංශයේ එම ඇමතිවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්.

වරාය අධිකාරියේ සභාපතිවරයා හැරෙන්නට, (1) (අ) උපවගන්තිය හෝ (1) (ඇ) උප වගන්තිය යටතේ පත්කරන ලද අධ්‍යක්ෂවරුන්ගෙන් කෙනෙකු වරාය අධිකාරියේ උප සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැක.

සභාපතිවරයා, උප සභාපතිවරයා සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා සතු කාර්යභාරය පැහැදිලි ලෙස වෙන් කොට, අර්ථ නිරූපනය කර ඇත. විධායක නොවන සියළු අධ්‍යක්ෂවරු ඔවුන් සතු ගැඹුරු හසළ දැනුම් හා පළපුරුද්ද මත අධිකාරියට සේවය සළසයි. මෙම ප්‍රකාශයේ දිනට ධූරයන් දරමින් සිටි අධිකාරියේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ඔවුන් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පිටු අංක 13 – 18 වල දැක්වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය සතු මූලික කටයුතු සහ වගකීම් පහත දැක්වේ**

* ක්‍රමෝපායගත පරමාර්ථ, ප්‍රතිපත්ති, අභිලාෂයන් හා ඉලක්ක ස්ථාපනය තුළින් විධානයන් නියම කිරීම

* අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම උදෙසා වූ කාර්යසාධනය අධීක්ෂණය කිරීම

* ප්‍රමාණවත් අභ්‍යන්තරික පාලනයක් සහ ඉහළම ආචාරධර්ම පද්ධතියක් පවත්වා ගන්නා බවට සහතික වීම.

* මාර්ගෝපදේශයන් සම්පාදනය කිරීම සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා ඒවායේ සාර්ථකත්වය පිළිබඳව සහතික වීම.

* සියළු ව්‍යාපාරික අවදානම් හඳුනාගෙන යෝග්‍ය හා ප්‍රමාණවත් පාලනයක් ඇති කිරීම, අවදානම් තත්ත්වයන් සම්බන්ධයෙන් කාලීනව අවශ්‍ය පියවර ගැනීම සඳහා එම තත්ත්වය වාර්තා කිරීමේ අධීක්ෂණ යාන්ත්‍රණය යථා පරිදි ක්‍රියාත්මක වන බවට සහතික වීම.

අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපතා රැස්වන අතර සමාලෝචිත වර්ෂය තුළ 14 වතාවක් රැස්විය. අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කටයුතු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමට කාලීනව කටයුතු කළහ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් සභාපති විමසා අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කරනු ලබන අතර එක් එක් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමට පෙර තොරතුරු පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සියළුම අධ්‍යක්ෂවරුන් වෙත යවනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කළ විෂයවලට අනෙකුත් කරුණු අතර මෙහෙයුම් හා මූල්‍ය ක්‍රියාකාරීත්ව දර්ශකයන් සමාලෝචනය කිරීම ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති හා යෝජනා සිය සීමාවන් තුළ අනුමත කිරීමත් ඇතුළත් විය.

ඉදිරිපත් වූ සියළුම නිර්දේශයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසන් අනුමැතියට යටත් වනසේ සමහර නිර්දේශයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම ප්‍රධාන වශයෙන් විගණන කමිටුව සහ කළමනාකරණ කමිටුව වැනි අනුකමිටු ගණනාවක් වෙත පවරා ඇත.

**කළමනාකරණ කමිටුව**

සභාපති, උප සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ සහ විධායක අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් හතර දෙනෙකු (04) සහ අනෙකුත් පූර්ණ කාලීන අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකු (07) මෙන්ම හාබර් මාස්ටර්වරයා ද මෙම කමිටුවේ සාමාජිකයින් වශයෙන් සේවය කළහ.

සාර්ථක වාණිජමය සංවිධානයක් වශයෙන් මෙන්ම සමාජමය වගකීමක් සහිත සංයුක්ත රාජ්‍ය ආයතනයක් ලෙස වරාය භාවිතා කරන්නන්ට වඩාත් දියුණු සේවයක් සලසමින් ඵලදායකත්වය නංවාලීමට මෙන්ම අනෙකුත් හවුල්කරුවන්ගේ යහපත සඳහා සම්පත් උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගෙන එදිනෙදා පරිපාලනය, කළමනාකරණය සහ මෙහෙයවීමේ කටයුතු පිළිබඳ තීරණවලට එළඹීමේදී කළමනාකරණ කමිටුව ඉහත විස්තර කරන ලද විවිධ පැතිකඩ සම්බන්ධව කටයුතු සලසා දෙන ලදී.

කළමනාකරණ කමිටුව එහි රැස්වීමවලදී සියළුම ප්‍රතිපත්තිමය කරුණු මෙන්ම තීරණ ක්‍රියාත්මක කිරීමට පූර්වයෙන් ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ එකඟත්වය සඳහා ඉදිරිපත් කිරීමට පෙරාතුව ද මනා ලෙස පරීක්ෂාවට භාජනය කරන ලදී. මෙම ක්‍රියාවලිය පවත්වා ගෙන යාමේදී ප්‍රමාදයන් වලකාලීම සඳහා කළමනාකරණ කමිටුව මසකට දෙවරක් රැස්වී තීරණවලට එළඹේ.

මෙම වර්ෂය තුළ කළමනාකරණ කමිටු රැස්වීම් දහයක් (10) ක් පවත්වා ඇත.

**විගණන කමිටුව**

විගණන කමිටුව සමන්විත වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයා සහ තවත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙනි. විගණන කමිටුව 2011.01.25 දින නැවත පත් කරන ලදී.

විගණන කමිටුව විසින් ප්‍රතිපත්ති හා අභ්‍යන්තර පාලන පිළිවෙත් විමර්ශණය කිරීමත්, අභ්‍යන්තර විගණකගේ වාර්තා හා රජයේ විගණන ලිපි පරීක්ෂා කිරීමෙන් ඒවා සම්බන්ධව නිර්දේශයන් කොට්ඨාශ ප්‍රධානීන් විසින් පිළිපදිනු ලබන බවට අධ්‍යක්ෂ මණ්ඩලය හරහා පසු විපරම් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ මහ පෙන්වීම යටතේ මූල්‍යමය සහ මෙහෙයුම් සම්බන්ධ අවදානම් හඳුනා ගැනීමටත් මනා ලෙස නිර්වචනය කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් තුළින් එවැනි අවදානම් කළමනාකරණය කර ගැනීම සහතිකවනු වස් ක්‍රියාවලින් සහ යාන්ත්‍රණයන් අධිකාරිය සතුවේ.

සේවකයන්ගේ සහ වරාය කටයුතු හා සම්බන්ධ අයගේ යහපත වෙනුවෙන් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට සහ සම්පත්වල ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස මූල්‍යමය සහ මෙහෙයුම් සම්බන්ධ පවත්නා ක්‍රමවේදයන් සහ පිළිවෙත් සවිමත් කිරීම උදෙසා නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම කමිටුවේ වගකීමයි.

**අභ්‍යන්තර පාලනය**

ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සංවිධානයක කාර්යක්ෂම කළමනාකරණයන් සඳහා අත්‍යාවශ්‍ය අංගයකි. අධිකාරියේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා මෙම පාලන ක්‍රියාදාමයේ ක්‍රියාශීලීත්වය සමාලෝචනය කිරීම සම්බන්ධව සමස්ථ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති සහ පිළිවෙත් සම්බන්ධයෙන් විස්තරාත්මක රීති මාලාවක් අධිකාරිය විසින් සකස් කරනු ලැබ ඇත. ඒවා නිරන්තරයෙන් සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබීය. ව්‍යාපාරික පරමාර්ථ ළඟා කර ගැනීමේදී ඇතිවන බාධක මඟින් උද්ගතවන අවදානම් තත්ත්වයන්ට මුහුණදීම සඳහා ක්‍රමවේදයක් සැලසුම්කර ඇත. වත්කම්වලට අනවසරයෙන් හිමිකම් කීම හෝ ඒවා බැහැරවීම වැලැක්වීම සඳහා මෙන්ම විධිමත් වාර්තා පවත්වා ගෙන යාමට උත්පාදනය වන්නා වූ තොරතුරු වල විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකවීමක් මෙම කමිටුව සලසයි. අධිකාරියේ ස්ථාපිත ප්‍රතිපත්ති සහ මඟ පෙන්වීම තුළින් දක්ෂතාවය, අවංකභාවය, ආචාර්ය විද්‍යාත්මක සාරධර්ම සහ මනා පාරිසරික සන්නිවේදන වටපිටාවක් පවත්වා ගෙන යාම කෙරෙහි අධිකාරියේ ඇපකැපවීම තුළින් අභ්‍යන්තර පාලන පද්ධතිය සඳහා සහාය දක්වයි.

**අභ්‍යන්තර විගණකයින්**

සුදුසුකම් සහිත වරලත් ගණකාධිකාරිවරයෙකු අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ ප්‍රධානියා වේ. දැනට මෙම කොට්ඨාශය සේවකයන් 80 කින් සමන්විත වන අතර සංවිධානයේ අභිමතාර්ථයන් අනුව ඔවුන් තම කාර්යයන් හා වගකීම් පිළිබඳ මනා පුහුණුවක් ලබා ඇත. විධායක ශ්‍රේණියට අයත් ව්‍යාපෘති සංවර්ධන/සමීක්ෂණ නිලධාරීන් 33 දෙනෙකු විගණන කොට්ඨාශයට අනුයුක්ත කොට ඇත. මෙම කොට්ඨාශය ස්වාධීනව කටයුතු කරන අතර සෘජුවම සභාපතිතුමන්ට හා විගණන කමිටුවට වාර්තා කරයි.

මෙම කොට්ඨාශයට අදාළ විෂය පථය සකස් කරනුයේ සභාපති සහ විගණන කමිටුවේ උපදෙස් ප්‍රකාරවය. විෂය පථය අවශ්‍ය අවස්ථාවලදී අදාළ සංශෝධන සඳහා අඛණ්ඩව සමාලෝචනය කෙරේ. මූලික වශයෙන් සමස්ථ අභ්‍යන්තර පාලන පද්ධතිය අධීක්ෂණය කරනුයේ අභ්‍යන්තර විගණන කොට්ඨාසය මඟින් වන අතර විගණන කමිටුව අවශ්‍ය සහාය සලසයි. අභ්‍යන්තර විගණනය අභ්‍යන්තර පාලන පිළිවෙත්හි කාර්යක්ෂමතාවය හා ක්‍රියාශීලීභාවය පිළිබඳ පරමාර්ථගත දර්ශනයක් සපයන අතර අභ්‍යන්තර පාලන ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරිමෙහිලා වූ කාර්ය සැලසුම් තක්සේරු කරයි.

**විනය නීති**

පිළිගත හැකි මට්ටමේ හැසිරීම් රටාවක් පවත්වා ගෙනයාම සඳහා මග පෙන්වනු පිණිස විනය නීති පනවා ඇත. සියළුම අධ්‍යක්ෂවරුන්, කොට්ඨාස ප්‍රධානීන් හා සේවකයින් විසින් සිය එදිනෙදා රාජකාරි කටයුතු ඉටු කිරීමේදීත්, තමන්ගේ ක්‍රියාකාරකම් අධිකාරියේ කීර්තිනාමයට හා ප්‍රතිරූපයට හානිකරවිය හැකි වන්නා වූ අවස්ථාවලදීත්, ඉහළම මට්ටමේ සදාචාරාත්මක හා අවංකභාවයකින් යුතුව කටයුතු කරනු ලැබීම අධිකාරිය අපේක්ෂා කරයි.

**විනය නීතිවල මූලිකාංග**

- සියළුම කටයුතු වලදී සාධාරණත්වය අවංකමකම හා අපක්ෂපාතීත්වය
- නිතිය පිළිබඳව දැන සිටීම හා එයට කීකරු වීම
- ඉටු කරනු ලබන සියළු කටයුතු වල රහස්‍යභාවය
- අධිකාරියට අහිතකර ලෙස බලපෑ හැකි හැසිරීමෙන් වැළකීම

**රාමු පද්ධතිය අනුකූලවීම සහ ව්‍යවස්ථාපිත සහ නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලවීම**

සියළුම නීතිමය සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවයන් අධිකාරිය පිළිගෙන ඇත. මෙම අරමුණු පෙරදැරි කොට ගෙන අධිකාරියේ සියළුම ව්‍යවස්ථාපිත

සහ නෛතික අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික වීම සඳහා මුදල් කොට්ඨාශය හා අභ්‍යන්තර විගණන කොට්ඨාශය සෑම පරිශ්‍රමයක්ම දරමින් සමගාමීව ක්‍රියාකරති.

එයට අමතරව අධිකාරියේ ව්‍යාපාරික කටයුතු සහ වෙනත් කාර්යයන් නීති සහ රෙගුලාසිවල අනුගමනය කරමින් සිදුවන බවට නීති කොට්ඨාසය සහතික වේ.

**වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධතාවය**

පැහැදිලි විධානයන් මගින් ක්‍රමෝපායගත පරමාර්ථයන් සාක්ෂාත් කර ගනුවස් සැලසුම් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට මග පෙන්වන ගරු වරාය හා මහා මාර්ග අමාත්‍යවරයා සහ එහි ලේකම්වරයා සහ උපාය මාර්ග ව්‍යවසායකත්ව කළමනාකරණ ආයතනය (SEMA) සමඟ අධිකාරිය අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වා ගෙන යයි. එයට අමතරව මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයට අවශ්‍ය වන පරිදි වසර 03 ක් සඳහා වන ව්‍යාපාරික සැලසුමක් සහ මූල්‍යාමය වාර්තා සහ අනෙකුත් මෙහෙයුම් ක්‍රියාකාරීත්වයන් පිළිබඳ සම්පූර්ණ වාර්තා අධිකාරිය විසින් ත්‍රෛමාසික පදනමක් මත ඉදිරිපත් කරන ලදී.

**අදාළ පාර්ශව සම්බන්ධ අනාවරණය කිරීම්**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ ගණුදෙනු පවත්වා ගෙන යනු ලබන කුමන හෝ පාර්ශවයන් සමඟ පෞද්ගලික හිතවත්කමක් හෝ සම්බන්ධතාවයක් නොමැති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කර සනාථ කර සිටී.

**වගවීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අධිකාරියට අදාළ කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ ස්වරූපයක් පිළිබිඹු කරන බවත් එම වාර්තා පිළිගත් අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙළ කර ඇති බවත් මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

**අනාගතය**

සංයුක්ත පාලනයක සැබෑ වටිනාකම රැඳී පවතින්නේ හොඳම ක්‍රම පද්ධති, ප්‍රතිපත්ති සහ මූලධර්ම මාලාවක් අන්ධානුකරණයෙන් අනුගමනය කිරීම තුළ නොවන බවත්, සියළුම හවුල්කරුවන්ගේ විශ්වාසය දිනා ගනිමින් බවත් අධිකාරිය විශ්වාස කරයි. මෙමඟින් සිය ව්‍යාපාරික කටයුතු විනිවිදභාවයෙන් යුක්තව ඉහළම විශ්වාසය හා සාධාරණත්වයෙන් ඉටු කිරීමෙන් ඔවුන් ද අපගේ ක්‍රමෝපායන්ට සහාය වනු ඇත.

# වරාය සංඛ්‍යාලේඛන

## කොළඹ වරාය

### වරාය පරිමාණය

### වරාය ප්‍රදේශය

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර් 184.6 |
| නිරිත දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 1,570 |
| වයඹ දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 810 |
| ඊශාන දිග දියකඩනයේ දිග ප්‍රමාණය | මීටර් 330 |
| බටහිර පිවිසුම | මීටර් 230 X 16 |
| උතුර පිවිසුම | මීටර් 190 X 13 |

**වැඩ කරන වේලාවන්**

වසරේ සෑම දිනකම පැය 24 සේවා පදනම මත කොළඹ වරාය සේවයේ යෙදෙයි.

| 2011 වර්ෂයේදී මෙහෙයුම් කළ වර්ග අනුව නැව්බඩු මෙහෙයුම් ධාරිතාවය | |
|---|---|
| බහළුගත | 87.3% |
| තොග කඩන | 1.2% |
| වියළි තොග | 4.2% |
| දියර තොග | 7.3% |

**අපගමන වේලාව**

නැගෙනහිර බටහිර ප්‍රධාන මුහුදු මාර්ගයේ සිට පැය 1.5 කි

## ගාල්ල වරාය

### වරාය පරිමාණය

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර් 15.3593 |
| පිවිසුම් දියත් මාර්ගය | මීටර් 140 |
| ගොඩබිම් ප්‍රදේශය | හෙක්ටයාර් 16.2264 |
| අනුමැතිය ලත් ප්‍රවේශ මාර්ගයේ දිග | මීටර් 130 |
| අනුමත ගැඹුර | මීටර් 7.3 |

**වැඩ කරන වේලාවන්**

මැයි දින දිවා කාලයේ පමණක් නාවුක කටයුතු නොකරනු ලබන අතර පැය 24 පදනම මත වසරේ සෑම දිනකම තම සේවාවන් පවත්වා ගෙන යයි.

**අපගමන වේලාව**

නැගෙනහිර - බටහිර ප්‍රධාන මාර්ගයේ සිට අපගමන කාලයක් නැත.

### නැංගුරම්ලැමේ පහසුකම්

අද්දර නැංගුරම්පල සංඛ්‍යාව 05

| නැංගුරම්පළ | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| ක්ලොසන්බර්ග් පාලම | 420 | 8.9 |
| නව පාලම | 162 | 8.9 |
| නව පාලම/හරස් | 84 | 8.9 |

### ගුදම් පහසුකම්

| නම | සාමාන්‍ය උස (අඩි) | ප්‍රදේශය (වර්ග අඩි) | ධාරිතාවය (ඝන අඩි) | බහළු තැන්පත් කිරීමේ උස (අඩි) |
|---|---|---|---|---|
| අංක 01 | 23 | 13,333 | 306,667 | 10 |
| අංක 02 | 23 | 40,000 | 920,000 | 10 |

## ත්‍රිකුණාමලය වරාය

### වරාය පරිමාණය

| | |
|---|---|
| ජල ප්‍රදේශය | හෙක්ටයාර් 1,630 |
| පිවිසුම් දියත් මාර්ගය | මීටර් 500 |

### වැඩ කරන වේලාවන්

මැයි දින දිවා කාලයේ නාවුක කටයුතු නොකිරීම හැරුණු කොට ත්‍රිකුණාමලය වරාය වසරේ සැම දිනකම පැය 24 පදනම මත තම සේවා පවත්වා ගෙන යයි.

### නැංගුරම්ලැමේ පහසුකම්

| නැංගුරම්පල | මුළු දිග (මීටර්) | අද්දර ගැඹුර (මීටර්) |
|---|---|---|
| ප්‍රීමා ජැටිය (අභ්‍යන්තර) | 122 | 5.9 |
| ප්‍රීමා ජැටිය (බාහිර) | 240 | 14.2 |
| ප්‍රීමා ජැටිය (බහුකාර්ය) | 179 | 10.3 |
| අෂ්රෆ් ජැටිය | 250 | 12.5 |
| පැති නැංගුරම්පළවල් | 90 x 2 | 8.5 |
| ටෝකියෝ සිමෙන්ති ජැටිය | 155 | 9.3 |
| තෙල් ගොඩබෑමේ ජැටිය (ඛණිජ තෙල්) | 200 | 9.75 |

| | | |
|---|---|---|
| මඩකොච් ප්‍රදේශයේ පිහිටි ජැටිය | 45 | 3.5 |
| ටීටීඒ හි පිහිටි ජැටිය | 190 | 2.0-4.0 |
| සිලෝන් ජැටිය | 50 | 2.5 |
| නගර ජැටිය | 50 | 2.5 |
| මුතූර් ජැටිය | 60 | 3.0 |
| වීඑස්ඕ ජැටිය | 25 | 1.5 |
| පරණ නගර ජැටිය | 50 | 2.0 |

ගුදම් පිළිබඳ විස්තර ටීටීඒ

| ගුදම | පරිමාණය (අඩි) | සාමාන්‍ය උස (අඩි) | ප්‍රදේශය (ව.අ.) | බහළු තැන්පත් කිරීමේ උස (අඩි) | ධාරිතාවය (ඝණ අඩි) |
|---|---|---|---|---|---|
| අංක 03 | 90 X 70 | 15 | 6,300 | 12 | 75,600 |
| අංක 04 | 190 X 95 | 19 | 18,050 | 14 | 252,700 |
| අංක 05 ඒ | 150 X 110 | 25 | 16,500 | 15 | 247,500 |
| අංක 05 බී | 150 X 80 | 15 | 12,000 | 12 | 144,000 |
| අංක 06 | 300 X 110 | 20 | 33,000 | 15 | 495,000 |

## මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය - අදියර 1

වරාය පරිමාණය (වරාය ප්‍රදේශය)

| | |
|---|---|
| ද්‍රෝණි ප්‍රදේශය | හෙක්ටයාර් 55.5 |
| බටහිර දිකඩනයේ දිග | මීටර් 988 |
| නැගෙනහිර දියකඩනයේ දිග | මීටර් 310 |
| ප්‍රවේශ ඇළ මාර්ගය | මීටර් 210 x16 |
| හැරවුම් චක්‍රය | මීටර් 600 |

| | |
|---|---|
| ද්‍රෝණියේ ගැඹුර | මීටර් 17 |
| නෞකා නිර්මාණය | ද.බ.ටො. 100,000 |

## පාලම් දිග

| | |
|---|---|
| සාමාන්‍ය නැව් බඩු පාලම | මීටර් 600 |
| සේවා පාලම | මීටර් 105 |
| තෙල් පාලම | මීටර් 610 |

1505 පෘතුගීසීන් විසින් නාවික කඳවුරක්/වරායක් වශයෙන් භාවිතයට ගැනීම ආරම්භ කිරීමෙන් පසුව කොළඹ අපරදිග රටවල දැන ගැනීමට ලක්විය.

1875 VII එඩ්වඩ් රජු විසින් දෙසැම්බර් 09 වන දින නිරිත දිග දියකඩනයට මුල් ගල තබනු ලැබීය.

1882 කොළඹ වරාය පරිපාලනය කිරීම සඳහා වරාය මණ්ඩලය පිහිටුවන ලදී.

1885 මීටර් 1285 ක් දිග නිරිත දිග දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1898 මීටර් 335 ක් දිග ඊසාන දිග දියකඩනයේ ඉදිකිරීම නිමකිරීම.

1899 වියළි තටාකයේ ඉදිකිරීම ආරම්භ කිරීම.

1906 මීටර් 814 ක් දිග අයිලන්ඩ් දියකඩනයේ ඉදිකිරීම් නිමකිරීම.

1906 වියළි තටාකයේ ඉදිකිරීම නිම කිරීම.

1909 වියළි තටාකය සඳහා මීටර් 250 ක් දිග ගයිඩ් පියරය (නියමු පාලම) ඉදිකර නිමකිරීම (පළමු වැනි ගැඹුරු දිය අද්දර නැංගුරම් පොළ).

1912 වත්මන් ජයබහළු පර්යන්තය පිහිටි ස්ථානයේ අඟුරු ජැටි 18 ක් ඉදිකර නිමකිරීම.

1912 නිරිත දිග දිය කඩනයේ මීටර් 550 ක් දිග දිගුව ඉදිකර නිමකිරීම.

1913 වරාය සංවර්ධන හා නඩත්තු කටයුතු ඉටු කිරීම සඳහා කොළඹ වරාය කොමිෂන් සභාව පිහිටුවන ලදී.

1922 ඛනිජ තෙල් මෙහෙයුම් පහසුකම් සැලසීමේ කාර්යය නිම කිරීම.

1950 මීටර් 9-11 දිය ගැඹුරක් සහිත අද්දර නැංගුරම්පළවල් පහළොවක් සහ මීටර් 7.5 ක දිය ගැඹුරක් සහිත වෙරළාසන්න යාත්‍රා නැංගුරම් පොළවල් දෙකක්ද, වර්ග මීටර 55,800 ක යාබද මාර්ගස්ථ බඩු ගබඩා සහ ගුදම් ඉඩකඩ ඉදි කිරීම ආරම්භ කිරීම.

1954 නිරිතදිග දිය කඩනයෙහි ඉදිකර නිමකළ අද්දර නැංගුරම්පළවල් II වැනි එළිසබෙත් මහ රැජිණ විසින් විවෘත කරනු ලැබීම සහ එය "එළිසබෙත් රැජින ජැටිය" යනුවෙන් නම් කිරීම. "ගොතික්" රාජකීය රුවල් යාත්‍රාව එළිසබෙත් රැජිණ ජැටියෙහි නැංගුරම් ලද පළමු යාත්‍රාව විය.

1956 අද්දර නැංගුම්පළවල් 17 ක්, මාර්ගස්ථ බඩු ගබඩා හා ගුදම් තනා නිම කිරීම.

1958 කොළඹ වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කරන ලදුව වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය පිහිටුවන ලදී.

1964 ගාලු වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කරන ලදී.

1967 වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව පිහිටුවන ලදී.

1967 ත්‍රිකුණාමලය වරායේ නැව්බඩු මෙහෙයුම් කටයුතු ජනසතු කරන ලදී.

**1980** කොළඹ වරාය කොමිෂන් සභාව, වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කොට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවන ලදී.

**1980** කොළඹ වරාය සඳහා ප්‍රධාන සැලැස්ම ජපන් රජයේ සහයෝගය ඇතිව පිළියෙළ කරන ලදී.

**1980** එළිසබෙත් රැජිණ ජැටියේ නව පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.

**1982** පළමු වැනි ග්‍රැන්ට් දොඹකරය - ටැන්ගෝ 80 සේවය සඳහා යොදා ගැනීම.

**1982** නව බහළු පර්යන්ත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ජපානයේ පෙන්ටා ඕෂන් වකචිකු ඒකාබද්ධ සමාගම සමඟ අත්සන් කිරීම.

**1983** සම්පූර්ණ උපකරණ සහිත බහළු පර්යන්තයේ I වැනි අදියර ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

**1984** සම්පූර්ණ උපකරණ සහිත බහළු පර්යන්තයේ II වැනි අදියර ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.

**1984** එළිසබෙත් රැජිණ ජැටියේ බහළු නැංගුරම්පොළෙහි "හිටාචි" ට්‍රාන්සර් දොඹකර හතරක් (04) සේවය සඳහා යොදා ගැනීම.

**1985** ජයබහළු පර්යන්තයේ 1 වැනි අදියර විවෘත කිරීම.

**1987** ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය ආරම්භ කිරීම.

**1987** ජයබහළු පර්යන්තයේ II වැනි අදියර විවෘත කිරීම.

**1988** වෙරළෙන් ඔබ්බෙහි ඒක ලක්ෂිත බෝයා නැංගුරම්පළ පිහිටුවා සේවය සඳහා යොදා ගැනීම.

**1994** නව වරාය ප්‍රවේශ මාර්ගය තනා නිම කිරීම.

**1995** ජයබහළු පර්යන්තයේ III වැනි අදියර විවෘත කිරිම.

**1996** ජයබහළු පර්යන්තයේ IV වැනි අදියර විවෘත කිරිම.

**1998** සමඟි බහළු පර්යන්තය ආරම්භ කිරිම.

**1998** අනුබද්ධිත වරාය සමුළුව.

**1999** නැගෙනහිර වෙරළෙහි ඔලුවිල් ප්‍රදීපාගාරය සේවය සඳහා යොදා ගැනීම සහ ඔලුවිල් නාවික පුහුණු ආයතනය විවෘත කිරිම.

**1999** රැජිණ බහළු පර්යන්තයේ දකුණු ආසියාතික පිවිසුම් පර්යන්ත සංවර්ධන කටයුතු ආරම්භ කිරිම.

**1999** ත්‍රිකුණාමලයේ අද්දර නැංගුරම්පළ ව්‍යාපෘතියක් ඉදිකිරීම ආරම්භ කිරීම.

| | |
|---|---|
| 2000 | දකුණු කොළඹ වරාය ශක්‍යතා අධ්‍යයනය ආරම්භ කිරීම. |
| 2000 | ගාලු වරායේ නව නැංගුරම්පොළක් ආරම්භ කිරීම. |
| 2000 | පෑලියගොඩ බහළු නැව්බඩු මධ්‍යස්ථානය ආරම්භ කිරීම. |
| 2000 | කළාපීය වරායක් වශයෙන් ගාලු වරාය සංවර්ධනය කිරීම සඳහා අවසාන වාර්තාව ඉදිරිපත් කිරීම. |
| 2000 | උතුරු පියරය සංවර්ධනයෙහි II වැනි අදියර ආරම්භ කිරීම. |
| 2000 | තනි-නැවතුම් ලේඛණ කටයුතු මධ්‍යස්ථානය ආරම්භ කිරීම. |
| 2001 | ගාලු වරායේ නව ජැටිය ආරම්භ කිරීම. |
| 2003 | ඔලුවිල් වරාය ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම ආරම්භ කිරීම. |
| 2003 | ඌන පැටවුම් බහළු (LCL), තොග-කඩන නැව්බඩු සඳහා ගණුදෙනුකාර සේවා මධ්‍යස්ථානය ආරම්භ කිරීම. |
| 2003 | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමුද්‍රික කෞතුකාගාරය විවෘත කිරීම. |
| 2003 | සිවිල් වැඩ කටයුතු සම්පූර්ණ වීමත් සමඟම සමඟි බහළු පර්යන්තය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම. |
| 2004 | සමඟි බහළු පර්යන්තයේ බහළු මෙහෙයුම් කටයුතු උත්සවාකාරයෙන් ආරම්භ කිරීම. |
| 2004 | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 25 වන සංවත්සරික උත්සවය පැවැත්වීම. |
| 2004 | මහා පරිමාණ සේවා අංශයේ ජාතික ඵලදායීතා සම්මානය ජයබහළු පර්යන්තය විසින් දිනා ගන්නා ලදී. |
| 2004 | කොළඹ වරායේ බහළු දසලක්ෂ 2 ක් (මිලියන 02 ක්) මෙහෙයවීම. |
| 2005 | ඔලුවිල්හි වරාය හා නිවාස යෝජනා ක්‍රමයෙහි ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම. |
| 2005 | මධ්‍යම පරිමාන සේවා අංශය යටතේ කුසලතා සහතිකයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ අභ්‍යාස ආයතනය වෙත ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය විසින් ප්‍රදානය කරනු ලැබීම. |
| 2006 | කොළඹ වරාය සඳහා බහළු ආරක්ෂක උපනයනයන් සහ මෙගා පෝර්ට් උපනයනයන් හඳුන්වාදීම. |
| 2006 | කොළඹ දකුණු වරාය ඉදිකිරීම සඳහා උපස්ථම්භක වන යෝජිත කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම. |
| 2006 | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අදියර I සඳහා විස්තරාත්මක සැලසුම් කටයුතු පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම. |
| 2007 | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම හා මුදල් ගිවිසුම අත්සන් කිරීම. |

**2008** ඔලුවිල් වරාය ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ ආරම්භ වීම.

**2008** කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ වීම.

**2008** හම්බන්තොට වරායෙහි නැව් තෙල් සැපයීමේ පහසුකම් සැලසීම සඳහාත් තෙල් ටැංකි සංකීර්ණය ඉදිකිරිම සඳහාත් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරිම.

**2009** හම්බන්තොට වරායේ නැව්තෙල් සැපයීමේ පහසුකම හා තෙල් ටැංකි ව්‍යාපෘතිය සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම.

**2009** ජයබහළු පර්යන්තයේ පර්යන්ත කළමනාකරණ පද්ධතිය "NAVIS" දක්වා වර්ධනය කිරිම.

**2010** 2010.08.15 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ ජල ද්‍රෝණියට මුහුදු ජලය පිරවීමේ උත්සවය.

**2010** 2010.11.18 හම්බන්තොට මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය උත්සවාකාරයෙන් විවෘත කිරිම.

**2010** ජයබහළු පර්යන්තයේ බහළු මිලියන 02 ක් මෙහෙයුම් කිරීම.

**2010** කොළඹ වරායේ බහළු මිලියන 04 ක් මෙහෙයවීම.

**2011** නව ග්‍රැන්ට් දොඹකර 06 ක් සහ හුවමාරු දොඹකර 30 ක් වරායට ළඟාවීම.

**2011** ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොළඹ පිහිටි තෙල් පර්යන්තයේ ධාරිතාවය වැඩිකිරීම.

**2011** පර්යන්ත ට්‍රැක්ටර් 50 ක් වරායට ළඟාවීම.

**2011** කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ දකුණු බහළු පර්යන්තය සඳහා ගිවිසුම අත්සන් කිරීම.

**2011** නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ පස් පිඩැලි කැපීමේ උත්සවය.

**2011** දකුණු බහළු පර්යන්තයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම සඳහා පස් පිඩැලි කැපීමේ උත්සවය.

# මූල්‍ය ප්‍රකාශ සටහන්

2011.12.31 දින ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

**අචාර්ය ප්‍රියත් බී.වික්‍රම මහතා**
**සභාපති**

**ඉන්දික කරුණාජීව මහතා**
**උප සභාපති**

**කපිතාන් නිහාල් කැප්පෙටිපොළ මහතා**
**කළමනාකාර අධ්‍යක්ෂ**

**වෛද්‍ය සංජය සේදර සෙනරත් මහතා**
**විධායක අධ්‍යක්ෂ**

**අනුර ජයවික්‍රම මහතා**
**අධ්‍යක්ෂ**

**එස්.ආර්.ආටිගල මහතා**
**අධ්‍යක්ෂ**

**ඩබ්.එස්.කරුණාරත්න මිය**
**අධ්‍යක්ෂ**

**ආචාර්ය දමිතා ද සොයිසා මහත්මිය**
**අධ්‍යක්ෂ**

**ඒෂන ද සිල්වා මහතා**
**අධ්‍යක්ෂ**

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් 14 ක් පවත්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන කළමනාකරණ කමිටුවේ රැස්වීම් දහයක් (10) 2011 වර්ෂය තුළ දී පැවැත්විණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙක් අනු කමිටුව වන විගණන කමිටුව 2011 වර්ෂය තුළදී රැස්වීම් හතරක් (04) පැවැත්වීය. අධ්‍යක්ෂ මණ්ඩලයේ පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන කමිටුවේ සාමාජිකයින් ලෙස ක්‍රියා කළහ.

**එස්.ආර්.ආටිගල මහතා**

**ඩබ්.එස්.කරුණාරත්න මහත්මිය**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2011 වර්ෂය තුළදී බහළු විස්සේ සම ඒකක 4,262,887 ක් මෙහෙයුම් කිරීම තුළින් නව වාර්තාවක් පිහිටුවීය. බහළු විස්සේ සම ඒකක මිලියන 4.26 ක් මෙහෙයුම් කිරීමත් සමඟ, පසුගිය 2010 වසරේ අදාළ කාලසීමාව හා සැසඳීමේදී කොළඹ වරාය 3.0% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

බහළු විස්සේ සම ඒකක මිලියන 4.26 ක් වන සමස්ථ ධාරිතාවයෙන් බහළු විස්සේ සම ඒකක මිලියන 2.29 ක් මෙහෙයුම් කර විශාල කොටසකට දායකත්වය ලබාදී ජය බහළු පර්යන්තය වාර්තාවකට ළඟා විය. SAGT ආයතනයෙන් -0.3% ඍණ වර්ධනය හා සැසඳීමේදී 6.1% ජයබහළු පර්යන්තයේ මෙහෙයුම් ධාරිතාවය වැඩිවිය.

✱ 2010 වර්ෂයේදී විස්සේ සම ඒකක මිලියන 4.13 ක් වූ කොළඹ වරායේ බහළු මෙහෙයුම්

ධාරිතාවය 2011 වර්ෂයේදී විස්සේ සම ඒකක මිලියන 4.26 දක්වා වැඩි විය. (වර්ධනය විස්සේ සම ඒකක 125,446 හෝ 3.0%)

✱ 2010 වර්ෂය සමඟ සංසන්දනය කරන විට 2011 වර්ෂයේදී කොළඹ වරායේ අභ්‍යන්තර බහළු මෙහෙයුම් ධාරිතාවය 12.3% කින් (විස්සේ සම ඒකක 114,642) ඉහළ ගොස් ඇත.

✱ 2010 වර්ෂය සමඟ සංසන්දනය කරන විට කොළඹ වරායේ ප්‍රතිනැව්ගත කිරීම් බහළු මෙහෙයුම් ධාරිතාවය 0.9% (විස්සේ සම ඒකක 28,239) ඉහළ ගොස් ඇත.

✱ 2010 වර්ෂයේ ටොන් මිලියන 58.7 සමඟ සංසන්දනය කරන විට කොළඹ වරායේ මෙහෙය වන ලද සමස්ථ ටොන් ප්‍රමාණය ටොන් මිලියන 62.0 (5.5%) දක්වා වර්ධනය වී ඇත.

✱ 2010 වර්ෂයේ ඒකක 48,234 සමඟ සංසන්දනය කරන විට අභ්‍යන්තර මෝටර් රථ මෙහෙයුම් ධාරිතාවය ද ඒකක 90,824 ක් මෙහෙයවමින් 98.4% ක දැවැන්ත වර්ධනයක් වාර්තා කර ඇත.

2010 වර්ෂය හා සැසඳීමේදී 2011 වර්ෂයේදී කොළඹ වරාය වෙත පැමිණි නැව් සංඛ්‍යාව 3,910 සිට 4,124 දක්වා 5.5% න් වර්ධනය වීමක් පිළිබිඹු කෙරේ. බහළු රැගත් නෞකා ප්‍රමාණයක් ද 2010 වසරේදී 3,076 සිට 3,187 දක්වා 3.6% ක වර්ධනය වාර්තා කොට ඇත.

ඵලදායීතාවය සහ ධාරිතාවය ඉහළ දමනු වස් නැවේ සිට ගොඩට බහළු ගෙන යන නව ග්‍රැන්ට් දොඹකර හයක්, හුවමාරු දොඹකර තිහක් සහ පර්යන්ත ට්‍රැක්ටර් පනහක් භාවිතය සඳහා ගෙන එන ලදි.

ජයබහළු පර්යන්තය වෙත අමතර බහළු ධාරිතාවයක් ගෙන්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ වෙළඳ ක්‍රමෝපායන් අනුමත කළ අතර ප්‍රමුඛ පෙළේ නැව් සමාගම් සමඟ පර්යන්ත සේවා ගිවිසුම් කිහිපයකය ද අත්සන් තබන ලදී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ පර්යන්ත සේවා ගිවිසුම්වලට එළඹී ඇති නැව් සමාගම් විශේෂයෙන්ම ජය බහළු පර්යන්තයේ මෙහෙයුම් ධාරිතාවය ඉහළ නැංවීමට අතිශයින්ම දායකත්වය ලබා දෙන ලදී. 2011 වර්ෂය තුළදී අලුතෙන් ප්‍රධාන නැව් මාර්ග සේවාවන් 05 ක් පෝෂක සේවාවන් 01 ක් ජයබහළු පර්යන්තය වෙත ගෙන්වා ගැනීමට කටයුතු සලස්වා ගන්නා ලදී.

කළමණාකාරීත්වයේ ආක්‍රමණශීලී වෙළඳ ක්‍රමෝපායන්, මෙහෙයුම්, මානව සම්පත් හා පර්යන්ත කළමනාකරණ පද්ධතියේ අධිශ්‍රේණිකරණය ඉහත සඳහන් කරන ලද ජයග්‍රහණයන් සඳහා විශාල දායකත්වයක් ලබාදී ඇත. ජයබහළු පර්යන්තයේ/සමඟි බහළු පර්යන්තයේ මෙහෙයුම් පද්ධතිය වෙනුවට NAVIS SPARCS/EXPRESS ප්‍රතිස්ථාපනය කරන ලද අතර එය සමස්ථ පර්යන්ත මෙහෙයුම් ඒකාබද්ධ කිරීමටත්, සැළසුම් කිරීම් හා ප්‍රවේශ දොරටුව හා පැලම අතර බහළු සීඝ්‍රයෙන් එහා මෙහා ගෙන යාමටත්, මෙමඟින් බහළු සඳහා ගතවන කාලය සහ නෞකා හරවා යැවීමේ කාලය දෙගුණයකින් අඩුකර ගැනීමටත් උපකාර වී ඇත.

වත්මන් ආර්ථික වර්ධන වේගය අඩුවීම, නෞකාවන්ට සේවා සැපයීම නතරවීම, අඩු ඉල්ලුම් හේතුවත් සමඟ බහළු වෙළඳාමට ඉමහත් බලපෑමක් ඇති වේ. අඩු නැව්බඩු ප්‍රවාහන ගාස්තු සහ නැව් තෙල් මිළ වැඩිවීමත් නිසා බහළු ප්‍රවාහන නෞකා සේවා බොහොමයක ලාභය අඩුවීමක් දක්නට ලැබේ. නෞකා සමාගම් තවදුරටත් ලබන පාඩුව මඟහරවා ගනු පිණිස 2013 වසර දක්වා හවුල්කරුවන් සමඟ නෞකා සේවාවන් මෙහෙයවීම ඇතුළුව විවිධ ක්‍රමෝපායන් අනුගමනය කරමින් සිටී.

2011 වර්ෂය අගභාගයේදී අත්විදි ආර්ථික අවපාතය හේතුවෙන් ලෝකයේ ඉහළ පෙළේ වරායන් බොහොමයක් 2011 වර්ෂයේදී එක් අංකයක වර්ධන ධාරිතාවයක් වාර්තා කොට ඇත.

2011 වර්ෂය තුළදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම රුපියල් මිලියන 31,250.5 ක් විය. එය 2010 වර්ෂය හා සංසන්දනය කිරීමේදී 10.5% ක වර්ධනයකි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් ලාභය 2010 වසරේදී 4,386.9 සිට 2011 වර්ෂය වන විට 8,291.8 දක්වා වර්ධනය විය. එය 89% ක වර්ධනයකි.

# මූල්‍ය කටයුතු වාර්තා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සියළු ගණුදෙනු පිළිබඳ ගිණුම් පොත් නිසියාකාරව පවත්වා ගෙන යනු ලබන බවටත්, පවතින තත්ත්වය හා වර්ෂයේ ලාභය/පාඩුව පිළිබඳ සත්‍ය හා සාධාරණ දසුනක් පෙන්නුම් කෙරෙන අයුරින් එහි මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන බවටත්, සහතික කිරීමේ වගකීම 1971 අංක 38 දරණ මුදල් පනතේ (12) හා (13.6) වගන්ති යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ගිණුම් පොත් නිසියාකාරව පවත්වා ගෙන යාමට අධිකාරිය මෙහෙයවීමත්, නිතිපතා වූ සිය රැස්වීම් වලදිත් විගණන කමිටුව හරහාත් මූල්‍ය වාර්තාකරණ පිළිවෙත පුණරීක්ෂණය කිරිමත් කරනු ලැබ ඇත.

මෙම වාර්තාවෙහි දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී ස්ථාවර පදනමක් මත නිසි ගිණුම්කරන ප්‍රතිපත්ති අනුගමනය කිරිමටත්, සාධාරණ හා විචක්ෂණ තක්සේරු වලින් තහවුරු කිරීමටත්, අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිල්ල යොමු කොට ඇත.

අධිකාරියේ වත්කම් ආරක්ෂා කර ගැනීමටත්, වංචා හා වෙනත් අක්‍රමිකතා වලක්වා ගැනීම හා අනාවරණය කර ගැනීමත් උදෙසා තමන්ට සාධාරණව විවෘතව පවත්නා වූ පියවරයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබ ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ව්‍යාපාර කටයුතු ක්‍රමවත් අයුරින් පවත්වා ගෙනයාමටත්, එහි වත්කම් ආරක්ෂා කර ගැනීමටත්, වාර්තාවල නිවරද්‍යතාවය හා විශ්වාසනීයත්වය හැකිතාක් දුරට තහවුරු කිරිමටත් අවශ්‍ය වන්නාවූ අභ්‍යන්තර පිරික්සුම්, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා වෙනත් පාලනවලින් සමන්විත සාර්ථක හා පූර්ණ අභ්‍යන්තර පාලන ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

**කපිල ලියනගමගේ**
**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

සිය සුපරීක්ෂාකාරී වගකීම ඉටුකිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම විගණන කමිටුවේ වගකීම වේ. මෙය සපුරාලීම සඳහා වූ කමිටුවේ ප්‍රධාන වගකීම පහත දැක්වේ.

- ✱ ඵලදායී අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා සහතික වීම.
- ✱ මූල්‍ය ප්‍රකාශණ, මූල්‍ය වාර්තා සහ විගණන ක්‍රියාවලීන් හි නිරවද්‍යතාවය සමාලෝචනය සහ අධීක්ෂණය.
- ✱ ව්‍යවස්ථානුකූල සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වන බවට සහතිකවීම.
- ✱ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ පිරිවැය පාලනය සහතික කරනු වස් පද්ධති සමාලෝචනය.

මහා භාණ්ඩාගාර නියෝජිත/ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ විසින් විගණන කමිටුවේ ප්‍රධානත්වය දරනු ලබන අතර අධිකාරියට සිය පාලන අභිවෘද්ධිය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වැදගත් ක්‍රියාකාරකම් කිහිපයක් කර ගෙන යනු ලැබීය.

වැදගත් ආරම්භක අභ්‍යන්තර පාලන ක්‍රියාමාර්ගයක් 2011 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම සහ විගණන වැඩ සටහන කමිටුව විසින් පිළිගනු ලැබූ අතර මාසික ප්‍රගතිවාර්තා ලබා ගැනීම තුළින් එහි ක්‍රියාකාරීත්වයේ ඵලදායීතාවය නිතිපතා සමාලෝචනයට ලක් කෙරිණ. විගණකාධිපතිවරයා විසින් 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වරාය අධිකාරියේ ගිණුම් පිළිබඳ කෙටුම්පත් වාර්තාව කළමනාකරණයෙන් ඒ සඳහා ලැබුණු ප්‍රතිචාර සමඟ සමාලෝචනය කරන ලදී. අභ්‍යන්තර පාලන පද්ධතීන් විගණන සමාලෝචනය සමඟ අඛණ්ඩව සමාලෝචනයට ලක් කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි පසු විපරම් ක්‍රියාකාරකම් සිදු කරන ලදී. කමිටු රැස්වීම්වලදී මතු කරන ලද ඇතැම් විශේෂ කරුණු විගණන කමිටුවේ නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන ලදී.

අවශ්‍ය පරීක්ෂාවන් සහ සමබරතාවයන් පවත්නා බව විගණන කමිටුවේ අදහස වන අතර අධිකාරියේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා එමඟින් සාධාරණ සහතිකයක් සැපයෙන බව සහ විගණනය කරන ලද ගිණුම් සාවද්‍ය තොරතුරු වලින් තොර බව හෙළි කිරීම තුළින් මූල්‍ය තත්ත්වය පවත්වා ගෙන යන ලදී. වර්ෂය තුළදී පාලනයේ අභිවෘර්ධිය උදෙසා කමිටුව වැදගත් දායකත්වයක් සපයන ලද අතර අධිකාරියේ කටයුතු විනිවිදභාවයෙන් පවත්වා ගෙන යාමට උපකාරී විය.

**එස්.ආර්.ආටිගල**
**සභාපති - විගණන කමිටුව**

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් අනුකූලතාවය දැක්වීමේ තත්ත්වය සවිස්තරාත්මකව පහත දැක්වේ.

**සේවක අර්ථ සාධක අරමුදල - අධිකාරිය සහ සේවක දායකත්වය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියළුම ස්ථිර සේවකයින් වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දායකත්වය වශයෙන් 15% මුදලක් ද සේවක දායකත්වය වෙනුවෙන් 10% ක මුදලක් ද අදාළ මාසයට පසුව එළඹෙන මාසයෙහි අවසාන දිනට ප්‍රථමයෙන් කම්කරු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වේ.

සේවකයින්ගෙන් අඩු කරනු ලැබූ සියළුම මුදල් සහ සේවකයින් සඳහා වූ අදාළ අධිකාරියේ දායක මුදල නියමිත දින හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ ඇත.

**සේවා නියුක්තියන්ගේ භාර අරමුදල**

අධිකාරියේ 3% දායක මුදල සෑම මසකම නියමිත දින හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ තිබේ.

**උපයන විට ගෙවීම**

උපයන විට ගෙවීමේ බද්ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නියමිත දිනට ප්‍රථමයෙන් ප්‍රේෂණය කරනු ලැබ තිබේ.

**ආදායම් බදු**

2006 අංක 10 දරණ දේශීය ආදායම් 13 වගන්තිය අනුව උපයනු ලබන ආදායමට අදාළ වූ ආදායම් බදු ගෙවීම බදු ගෙවිය යුතු ආදායමක් උපයා ඇති සෑම අවස්ථාවකදීම නියමිත දිනවලදී ත්‍රෛමාසිකව ගෙවනු ලැබ ඇත.

**වාර්ෂික දත්ත වාර්තා**

අධිකාරියේ ආදායම බදු සම්බන්ධයෙන් වාර්ෂික දත්ත වාර්තා 2011 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙත වාර්ෂිකව ගොණු කරවනු ලැබ ඇත. මෙම වාර්තා සෑම වර්ෂයකදීම නියමිත දිනය වූ නොවැම්බර් 30 දිනට ප්‍රථම සම්පූර්ණ කොට භාර දෙනු ලැබ තිබේ.

**වාර්ෂික වාර්තාකරණය**

එක් එක් වසර සඳහා වූ වාර්ෂික අයවැය, ගිණුම් සහ වාර්ෂික වාර්තා සෑම වසරකදීම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

| විස්තරය | 2011<br>කොළඹ වරාය | ත්‍රිකුණාමලය වරාය | ගාල්ල වරාය | ශ්‍රී ලං.ව.අ.<br>2011 | 2010 |
|---|---|---|---|---|---|
| **සංඛ්‍යාලේඛණ** | | | | | |
| **පැමිණි නැව් සංඛ්‍යාව** | | | | | |
| නැව්බඩු නෞකා | 3,935 | 114 | 52 | 4,101 | 3,879 |
| වෙනත් නෞකා | 189 | 12 | 21 | 222 | 188 |
| වෙනත් යාත්‍රා | 648 | 35 | 147 | 830 | 590 |
| | **4,772** | **161** | **220** | **5,153** | **4,657** |
| **මෙහෙයුම් ධාරතාවය** | | | | | |
| **බහළු ටී ඊ යු ඒකක ප්‍රමාණය** | | | | | |
| **බහළු ටී ඊ යු ඒකක ප්‍රමාණය (ශ්‍රී ල.ව.අ.)** | | | | | |
| ප්‍රති නැව්ගත කිරීම් | 1,583,195 | | | 1,583,195 | 1,533,845 |
| අභ්‍යන්තරික | 647,482 | | | 647,482 | 563,349 |
| නැවත ගබඩා කිරීම | 68,769 | | | 68,769 | 69,979 |
| **මුළු ටී ඊ යු ඒකක ප්‍රමාණය** | **2,299,446** | | | **2,299,446** | **2,167,173** |
| **බහළු ටී ඊ යු ඒකක ප්‍රමාණය (එස් ඒ ජී ටී)** | | | | | |
| ප්‍රති නැව්ගත කිරීම් | 1,540,633 | | | 1,540,633 | 1,561,744 |
| අභ්‍යන්තරික | 399,404 | | | 399,404 | 368,895 |
| නැවත ගබඩා කිරීම | 23,404 | | | 23,404 | 39,629 |
| **මුළු ටී ඊ යු ඒකක ප්‍රමාණය** | **1,963,441** | | | **1,963,441** | **1,970,268** |
| **බහළු ටී ඊ යු ඒකක ප්‍රමාණය (කොළඹ වරාය)** | | | | | |
| ප්‍රති නැව්ගත කිරීම් | 3,123,828 | | | 3,123,828 | 3,095,589 |
| අභ්‍යන්තරික | 1,046,886 | | | 1,046,886 | 932,244 |
| නැවත ගබඩා කිරීම | 92,173 | | | 92,173 | 109,608 |
| **මුළු ටී ඊ යු ඒකක ප්‍රමාණය** | **4,262,887** | | | **4,262,887** | **4,137,441** |
| සාම්ප්‍රදායික මෙ.ටො. | 3,341,819 | 2,459,797 | 463,772 | 6,265,388 | 5,463,238 |
| ද්‍රව මෙ.ටො. | 4,564,550 | 113,854 | - | 4,678,404 | 4,349,830 |
| | **7,906,369** | **2,573,651** | **463,772** | **10,943,792** | **9,813,068** |
| **සමාන (මෙ.ටො.) ශ්‍රී ලං.ව.අ.** | | | | | |
| බහළුගත නැව් බඩු | 28,112,186 | - | - | 28,112,186 | 26,433,676 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 3,341,819 | 2,459,797 | 463,772 | 6,265,388 | 5,463,238 |
| ද්‍රව | 4,564,550 | 113,854 | - | 4,678,404 | 4,349,830 |
| **මුළු සමාන මෙ.ටො.** | **36,018,555** | **2,573,651** | **463,772** | **39,055,978** | **36,246,744** |
| **සමාන (මෙ.ටො.) එස්ඒජීටී** | | | | | |
| බහළුගත නැව් බඩු | 25,996,790 | - | - | 25,996,790 | 24,992,648 |
| සාම්ප්‍රදායික නැව්බඩු | - | | | - | - |
| ද්‍රව | - | | | - | - |
| **මුළු සමාන මෙ.ටො.** | **25,996,790** | **-** | **-** | **25,996,790** | **24,992,648** |
| **සමාන (මෙ.ටො.) - කොළඹ වරාය** | | | | | |
| බහළුගත නැව් බඩු | 54,108,976 | - | - | 54,108,976 | 51,426,324 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 3,341,819 | 2,459,797 | 463,772 | 6,265,388 | 5,463,238 |
| ද්‍රව | 4,564,550 | 113,854 | | 4,678,404 | 4,349,830 |
| **මුළු සමාන මෙ.ටො.** | **62,015,345** | **2,573,651** | **463,772** | **65,052,768** | **61,239,392** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (ශ්‍රී ලං.ව.අ.)** | | | | | |
| බහළුගත නැව් බඩු | 71,488,979 | - | - | 71,488,979 | 70,054,498 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 12,799,645 | 1,848,270 | 303,227 | 14,951,142 | 13,112,399 |
| වෙනත් | 2,434,403 | 160,153 | 80,812 | 2,675,368 | 2,281,121 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **86,723,027** | **2,008,423** | **384,039** | **89,115,489** | **85,448,018** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (එස් ඒ ජී ටී)** | | | | | |
| බහළුගත නැව් බඩු | 40,805,183 | - | - | 40,805,183 | 35,487,925 |
| සාම්ප්‍රදායික නැව්බඩු | | | | - | - |
| වෙනත් | | | | | |
| **මුළු ටොන් ප්‍රමාණය** | **40,805,183** | **-** | **-** | **40,805,183** | **35,487,925** |
| **මෙහෙයුම් කළ දළ ටොන් ප්‍රමාණය (කොළඹ වරාය)** | | | | | |
| බහළුගත නැව් බඩු | 112,294,162 | - | | 112,294,162 | 105,542,423 |
| සාම්ප්‍රදායික නැව්බඩු | 12,799,645 | 1,848,270 | 303,227 | 14,951,142 | 13,112,399 |
| වෙනත් | 2,434,403 | 160,153 | 80,812 | 2,675,368 | 2,281,121 |
| **මුළු ටොන් ප්‍රමාණය** | **127,528,210** | **2,008,423** | **384,039** | **129,920,672** | **120,935,943** |
| **පිරිස්** | | | | | |
| **සේවක මණ්ඩලය** | **10,083** | **466** | **433** | **10,982** | **12,824** |

| විස්තරය | | 2011 කොළඹ වරාය රු: | 2011 ත්‍රිකුණාමලය වරාය රු: | 2011 ගාල්ල වරාය රු: | ශ්‍රීලවඅ 2011 රු: | ශ්‍රීලවඅ 2010 රු: |
|---|---|---|---|---|---|---|
| **මුදල් (රුපියල් මිලියන)** | | | | | | |
| මෙහෙයුම් ආදායම | | 26,877 | 266 | 399 | 27,542 | 25,046 |
| වෙනත් ආදායම් | | 3,648 | 19 | 42 | 3,708 | 3,233 |
| **මුළු ආදායම** | | **30,525** | **285** | **441** | **31,250** | **28,279** |
| මෙහෙයුම් හා අනෙකුත් වියදම් | | (23,140) | (603) | (588) | (24,330) | (25,118) |
| **ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම, බදු හා විදේශ විනිමය ලැබීම්/විදේශ විනිමය පාඩුවලට පෙර ශුද්ධ ලාභ/(පාඩු)** | | 7,385 | (318) | (147) | 6,920 | 3,162 |
| **බද්දට පෙර ශුද්ධ ලාභ/(පාඩු)** | | 1,548 | (532) | (233) | 782 | (1,248) |
| බද්දට පසු ශුද්ධ ලාභ/(පාඩු) | | 1,348 | (532) | (233) | 583 | (1,065) |
| පෙර වර්ෂයේ ගැළපීම් | | (1,163) | (1.09) | (9) | (1,173) | 982 |
| ඇස්තමේන්තු කළ විදේශ විනිමය ඉපැයීම් | | 22,195 | 217 | 337 | 22,749 | 20,858 |
| | **ඒකක** | | **අනුපාතය** | | | |
| **නැව් ටොන් එකකට** | | | | | | |
| මෙහෙයුම් හා වෙනත් ආදායම් | රු. | 847 | 111 | 950 | 800 | 780 |
| මෙහෙයුම් හා වෙනත් වියදම් | රු. | (642) | (234) | (1,268) | (623) | (693) |
| ටොන් එකකට ශුද්ධ ලාභය | රු. | 205 | (124) | (317) | 177 | 87 |
| වැටුප් ලේඛණය වෙනුවෙන් වියදම් | රු. | 11,999 | 500 | 408 | 12,907 | 14,088 |
| **වැටුප් ලේඛණයට අනුව** | | | | | | |
| මුළු වියදම | % | (52) | (83) | (69) | (53) | (56) |
| මුව ආදායම | % | 39 | 175 | 93 | 41 | 50 |


ආදායම් (වරාය කටයුතු අනුව)
20,000
ආදායම් රුපියල් මිලියනවලින්
2011
2010
වර්ෂය
නාවික
ස්ටෙවඩෝරින්
වාප්පු මෙහෙයුම්
වරාය පහසුකම්
වෙනත්


මෙහෙයුම් හා අනෙකුත් වියදම්
35,000
30,000
25,000
20,000
15,000
10,000
5,000
0
-5,000
රු. මිලියන
2011 වියදම් රු: මිලියන
2011 වියදම් රු: මිලියන
වැඩිවීම/ (අඩුවීම)
වේතන,වැටුප් හා දීමනා
අතිකාල
ඉන්ධන,විදුලිය හා ජලය
වත්කම් නඩත්තු කිරීම
වෙනත්
විදේශ ණය මත පොලිය
විදේශ විනිමය උච්චාවචනය
ක්ෂයවීම
බද්දට පෙර මුළු වියදම්
බද්දට පෙර මුළු වියදම්
වියදම්


2011 වර්ෂය සඳහා ආදායම
(සේවා අනුව) වරායයන් තුනම
වෙනත්
14%
නාවික
13%
වරාය පහසුකම්
9%
වාප්පු මෙහෙයුම්
11%
ස්ටෙවඩෝරින්
53%
නාවික
ස්ටෙවඩෝරින්
වාප්පු මෙහෙයුම්
වරාය පහසුකම්


මෙහෙයුම් නැව් බඩු පමාණය විශ්ලේෂණය (මෙ.ටො.)
කොළඹ වරාය (ශ්‍රී ලං ව අ + එස් ඒ ජී ටී)
තොග කඩන තොග
හා ද්‍රව
16%
අභ්‍යන්තරික බහළු
17%
ප්‍රති නැව්ගත බහළු
67%
ප්‍රති නැව්ගත බහළු
අභ්‍යන්තරික බහළු
තොග කඩන තොග හා ද්‍රව


මෙහෙයුම් ආදායම පිළිබඳ විශ්ලේෂණය
(වරායයන් තුනෙහිම)
ප්‍රති නැව්ගත
බහළු
18%
වෙනත්
36%
තොග කඩන
තොග හා ද්‍රව
10%
අභ්‍යන්තරික
බහළු
36%
ප්‍රති නැව්ගත බහළු
අභ්‍යන්තරික බහළු
තොග කඩන තොග හා ද්‍රව
වෙනත්

| | පිටු අංකය | සටහන් | ශ්‍රීලවඅ 2011 රු: | 2010 රු: | ඒකාබද්ධ කරන ලද 2011 රු: | 2010 රු: |
|---|---|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | | | |
| දේපළ, යන්ත්‍රෝපකරන හා උපකරණ | 130 | 3.1.1 | 106,919,647,386 | 110,192,856,624 | 106,932,109,911 | 110,207,307,140 |
| කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ | 132 | 3.1.2 | 95,887,852,555 | 69,900,930,976 | 95,887,852,555 | 69,900,930,976 |
| **ආයෝජන** | 132 | 3.1.3 | | | - | |
| සමාගම් කොටස්වල ආයෝජන | 132 | 3.1.3.1 | 21,386,650 | 21,385,150 | 21,386,650 | 21,385,150 |
| පාලිත සමාගම්වල ආයෝජන | 132 | 3.1.3.2 | 1,000,000 | 1,000,000 | - | - |
| ආශ්‍රිත ආයතනවල ආයෝජන | 132 | 3.1.3.3 | 40,030 | 40,030 | 41,671,220 | 33,901,831 |
| ඒස් ඒ ජී ටී ආයතනයේ ආයෝජන | 132 | 3.1.3.4 | 577,372,113 | 577,372,113 | 577,372,113 | 577,372,113 |
| වෙනත් මුල්‍ය වත්කම්වල ආයෝජන | 133 | 3.1.4 | 5,555,215,255 | 5,140,432,577 | 5,555,215,255 | 5,140,432,577 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | | **208,962,513,989** | **185,834,017,470** | **209,015,607,704** | **185,881,329,787** |
| | | | | | | |
| **ජංගම වත්කම්** | | | | | | |
| වට්ටෝරු භාණ්ඩ | 133 | 3.2.1 | 1,694,585,948 | 2,543,913,808 | 1,694,585,948 | 2,543,913,808 |
| මාර්ගස්ථ භාණ්ඩ | 133 | 3.2.2 | 330,744,796 | 148,575,016 | 330,744,796 | 148,575,016 |
| වෙළඳ ණයගැතියන් හා උපචිත ආදායම | 134 | 3.2.3 | 1,828,681,531 | 1,797,815,747 | 1,761,749,871 | 1,765,284,140 |
| වෙළඳ නොවන ණයගැතියන් හා අත්තිකාරම් | 134 | 3.2.4 | 726,303,538 | 4,327,694,893 | 726,303,538 | 4,327,694,893 |
| පෙර ගෙවුම් | 134 | 3.2.5 | 108,403,249 | 64,479,492 | 108,403,249 | 64,479,492 |
| ණය සහ සේවක අත්තිකාරම් | 135 | 3.2.6 | 3,990,643,148 | 4,902,598,162 | 4,021,538,773 | 4,944,099,135 |
| ණය ගිණුම් | 135 | 3.2.7 | 573,081 | 1,412,449 | 573,081 | 1,412,449 |
| කෙටි කාලීන ආයෝජන | 135 | 3.2.8 | 3,800,646,450 | 3,114,458,315 | 3,800,646,450 | 3,114,458,315 |
| තැන්පතු හා වෙනත් ලැබිය යුතු මුදල් | 136 | 3.2.9 | 393,625,584 | 385,907,578 | 393,811,987 | 386,521,178 |
| මුදල් හා මුදල් සමාන දෑ | 136 | 3.2.10 | 689,123,726 | 497,324,681 | 855,129,877 | 581,351,691 |
| | | | | | - | - |
| | | | **13,563,331,051** | **17,784,180,143** | **13,693,487,570** | **17,877,790,119** |
| | | | | | | |
| **මුළු වත්කම්** | | | **222,525,845,041** | **203,618,197,613** | **222,709,095,275** | **203,759,119,906** |
| | | | | | | |
| **ස්කන්ධ හා වගකීම්** | | | | | | |
| **යෙද වූ ප්‍රාග්ධන** | | | | | | |
| ස්කන්ධ ප්‍රාග්ධන | 136 | 4.1.1 | 470,551,932 | 470,551,932 | 470,551,932 | 470,551,932 |
| වෙනත් ප්‍රාග්ධන | 136 | 4.1.2 | 7,120,827,853 | 7,120,827,853 | 7,120,827,853 | 7,120,827,853 |
| | | | **7,591,379,785** | **7,591,379,785** | **7,591,379,785** | **7,591,379,785** |
| **සංචිත හා ප්‍රතිපාදන** | | | | | | |
| සංචිත | 136 | 4.2.1 | 2,583,814,576 | 1,468,079,717 | 2,583,814,576 | 1,468,079,717 |
| ප්‍රතිදාන සහ දඩ අරමුදල් | 136 | 4.2.2 | 75,430,976 | 70,047,575 | 75,430,976 | 70,047,575 |
| ණය බේරුම් කිරීමේ සංචිතය | 137 | 4.2.3 | 3,828,973,373 | 3,828,973,373 | 3,828,973,373 | 3,828,973,373 |
| නැවත අගය කිරීමේ සංචිත | 137 | 4.2.4 | 76,429,013,944 | 76,480,827,873 | 76,429,013,944 | 76,480,827,873 |
| විලම්භිත බදු | 137 | 4.2.5 | 12,114,566,119 | 12,114,566,119 | 12,114,566,119 | 12,114,566,119 |
| රඳවාගත් ලාභ | 137 | 4.2.6 | (15,706,122,495) | (15,167,380,909) | (15,510,244,469) | (15,034,926,191) |
| | | | **79,325,676,493** | **78,795,113,748** | **79,521,554,519** | **78,927,568,466** |
| **ජංගම නොවන වගකීම්** | | | | | | |
| වරාය සංවර්ධන ණය (ජපන් ණය) | 137 | 4.3.1 | 40,802,618,894 | 42,143,127,127 | 40,802,618,894 | 42,143,127,127 |
| කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (ආ.සං.බැ.ණය | 137 | 4.3.2 | 26,858,872,434 | 17,128,178,587 | 26,858,872,434 | 17,128,178,587 |
| හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 137 | 4.3.3 | 33,624,094,097 | 30,552,495,737 | 33,624,094,097 | 30,552,495,737 |
| වෙනත් වරායයන් සංවර්ධනය සඳහා ණය | 137 | 4.3.4 | 15,466,185,786 | 10,378,949,563 | 15,466,185,786 | 10,378,949,563 |
| දීර්ඝ කාලීන පාරිතෝෂික සැපයීම | 137 | 4.3.5 | 4,136,276,103 | 3,700,367,289 | 4,136,276,103 | 3,700,367,289 |
| | | | **120,888,047,315** | **103,903,118,302** | **120,888,047,315** | **103,903,118,302** |
| | | | | | | |
| **ජංගම වගකීම්** | | | | | | |
| ණයහිමි සහ උපචිත ගාස්තු | 137 | 5.1 | 1,319,219,830 | 1,120,865,306 | 1,292,653,206 | 1,112,698,427 |
| දීර්ඝ කාලීන ණය ගැනීම් වල ජංගම කොටස් | 138 | 5.2 | 6,011,404,338 | 4,596,138,975 | 6,011,404,338 | 4,596,138,975 |
| තැන්පතු හා අත්තිකාරම් ගෙවීම් | 138 | 5.3 | 5,073,320,460 | 4,622,349,707 | 5,075,870,532 | 4,625,165,202 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 138 | 5.4 | 1,816,067,577 | 2,541,260,367 | 1,824,326,964 | 2,548,153,755 |
| ජංගම බදු ප්‍රතිපාදන | 139 | 5.5 | 255,454,157 | 159,286,861 | 258,583,529 | 166,212,434 |
| හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදන | 139 | 5.6 | 245,275,087 | 288,684,561 | 245,275,087 | 288,684,561 |
| | | | | - | - | - |
| | | | **14,720,741,449** | **13,328,585,778** | **14,708,113,656** | **13,337,053,354** |
| | | | | | | |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | | | **222,525,845,041** | **203,618,197,613** | **222,709,095,275** | **203,759,119,906** |

"පිටු අංක 113 සිට 120 සහ පිටු අංක 121 සිට 145 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනුකලනය වු කොටසකි.
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලදී.





**ආචාර්ය ප්‍රියත් බී.වික්‍රම**
**සභාපති**

**කපිතාන් නිහාල් කැප්පෙටිපොළ**
**කළමනාකාර අධ්‍යක්ෂ**

**ශිරාණි වන්නිආරච්චි**
**අධ්‍යක්ෂ (මුදල්)**

| විස්තරය | සටහන් | ශ්‍රී ලං ව.අ. 2011 රු: | ශ්‍රී ලං ව.අ. 2010 රු: | ඒකාබද්ධ 2011 රු: | ඒකාබද්ධ 2010 රු: |
|---|---|---|---|---|---|
| වරාය කටයුතු වලින් මෙහෙයුම් ආදායම | 121 1.1 සහ 1 | 27,542,063,756 | 25,045,913,526 | 27,804,686,742 | 25,303,761,920 |
| මෙහෙයුම් වියදම් | 126 2.1 | (11,430,116,072) | (12,059,622,067) | (11,439,269,784) | (12,061,775,668) |
| අළුත්වැඩියා සහ නඩත්තු වියදම් | 127 2.2 | (4,457,881,213) | (4,481,907,431) | (4,457,881,213) | (4,481,907,431) |
| **මෙහෙයුම් වලින් ආදායම** | | **11,654,066,471** | **8,504,384,028** | **11,907,535,745** | **8,760,078,821** |
| වරාය කටයුතු වලින් වෙනත් ආදායම | 124 1.3 | 3,708,409,988 | 3,233,386,323 | 3,675,026,853 | 3,202,799,567 |
| පරිපාලන වියදම් | 128 2.3 | (7,070,643,125) | (7,350,921,213) | (7,226,815,626) | (7,523,750,004) |
| **මෙහෙයුම් ලාභ** | | **8,291,833,334** | **4,386,849,138** | **8,355,746,972** | **4,439,128,384** |
| විදේශ ණය මත පොලී | | (1,371,750,365) | (1,225,174,176) | (1,371,750,365) | (1,225,174,176) |
| විදේශ විනිමය ලැබීම්/(පාඩු) | 128 2.5 | (3,543,239,055) | (4,409,809,021) | (3,543,239,055) | (4,409,809,021) |
| **ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම් සහ බදුවලට පෙර ලාභ** | | **3,376,843,914** | **(1,248,134,059)** | **3,440,757,552** | **(1,195,854,813)** |
| ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම් වියදම් | | (2,594,613,057) | - | (2,594,613,057) | - |
| **බදුවලට පෙර සහ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම් වියදම්වලට පසු ලාභ** | | **782,230,857** | **(1,248,134,059)** | **846,144,495** | **(1,195,854,813)** |
| ආදායම් බදු, සැලකී ලාභාංශ බදු හා සමාජ වගකීම බදු | 128 2.6 | (199,634,813) | (159,286,861) | (206,894,530) | (185,056,463) |
| විලම්භිත බදු | 128 2.7 | - | 342,904,325 | - | 342,904,325 |
| | | | | - | |
| **ආශ්‍රිත සමාගම්වල බදුවලට පෙර ලාභ/(පාඩු) කොටස** | | | | 7,769,388 | 5,666,526 |
| **වර්ෂය සඳහා ලාභ/(පාඩු)** | | **582,596,044** | **(1,064,516,595)** | **647,019,353** | **(1,032,340,424)** |
| ඉදිරියට ගෙන ආ සමුච්ත ලාභ/(පාඩු) | | (15,167,380,909) | (15,412,487,623) | (15,034,926,191) | (15,312,209,077) |
| වත්කම් විකිණීම මත මුදල් කර ගන්නා ලද සංචිත ප්‍රත්‍යාගණනය | | 51,813,929 | 327,998,925 | 51,813,929 | 327,998,925 |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | 128 2.8 | (1,173,151,560) | 981,624,385 | (1,173,151,560) | 981,624,385 |
| ප්‍රකාශිත ලාභාංශ | | | | (1,000,000) | - |
| **ඉදිරියට ගෙන ගිය සමුච්චිත ලාභ/(පාඩු)** | | **(15,706,122,495)** | **(15,167,380,909)** | **(15,510,244,469)** | **(15,034,926,191)** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 113 සිට 145 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සටහන් සංලක්ෂයන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම කොටසක් වේ.

ඒකාබද්ධ කරන ලද අතුළත් කිරීම

| <u>**පාලිත/ආශ්‍රිත සමාගම නාම ලේඛනය**</u> | <u>**මූල්‍ය වර්ෂය අවසානය**</u> | <u>**ගිණුම් තත්ත්වයන්**</u> |
|---|---|---|
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | දෙසැම්බර් 31 | විගණනය නොකළ |
| ජයබහළු පර්යන්ත සමාගම | දෙසැම්බර් 31 | විගණනය කළ |
| ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා සමාගම | දෙසැම්බර් 31 | විගණනය කළ |

<u>**ඒකාබද්ධ කිරීම් සඳහා පිළිවෙල**</u>

ජයබහළු පර්යන්ත සමාගම රේඛීය පදනම මත

ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා සමාගම — ස්කන්ධ ක්‍රමවේදය

| විස්තරය | යෙදවූ ප්‍රාග්ධනය ස්කන්ධ ප්‍රාග්ධනය රු: | අනෙකුත් ප්‍රාග්ධනය රු: | සංචිත හා විලම්භිත බදු රු: | වෙන්කිරීම් හා ප්‍රතිපාදන ණය මුදාහැරීම් සංචිත රු: | ප්‍රත්‍යාගණන සංචිත රු: | රඳවාගත් ලාභය රු: | එකතුව රු: |
|---|---|---|---|---|---|---|---|
| <u>**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**</u> | | | | | | | |
| **2011 ජනවාරි 01 දිනට ශේෂය** | **470,551,932** | **7,120,827,853** | **13,343,447,038** | **3,828,973,373** | **76,406,190,142** | **(15,412,487,623)** | **85,757,502,715** |
| වසරේ ශුද්ධ ලාභය | | | | | | (1,248,134,059) | (1,248,134,059) |
| ආදායම් බදු හා සැලකී ලාභාංශ බදු | | | | | | (159,286,861) | (159,286,861) |
| විලම්භිත බදු | | | | | | 342,904,325 | 342,904,325 |
| වර්ෂය තුළ ලැබීම්/හුවමාරු කිරීම | | | 309,246,372 | | | 981,624,385 | 1,290,870,757 |
| වත්කම් ප්‍රත්‍යාගණන සංචිත | | | | | 74,637,731 | 327,998,925 | 402,636,656 |
| **2010 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **470,551,932** | **7,120,827,853** | **13,652,693,410** | **3,828,973,373** | **76,480,827,873** | **(15,167,380,908)** | **86,386,493,533** |
| **2011 ජනවාරි 01 දිනට ශේෂය** | **470,551,932** | **7,120,827,853** | **13,652,693,410** | **3,828,973,373** | **76,480,827,873** | **(15,167,380,908)** | **86,386,493,533** |
| වසරේ ශුද්ධ ලාභ/පාඩු | | | | | | **782,230,857** | 782,230,857 |
| ආදායම් බදු හා සැලකී ලාභාංශ බදු | | | | | | (199,634,813) | (199,634,813) |
| | | | | | | | - |
| වර්ෂය තුළ ලැබීම්/හුවමාරු කිරීම | | | 1,121,118,261 | | | (1,173,151,560) | (52,033,299) |
| | | | | | | | - |
| වත්කම් ප්‍රත්‍යාගණන සංචිත | | | | | (51,813,929) | 51,813,929 | 0 |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **470,551,932** | **7,120,827,853** | **14,773,811,671** | **3,828,973,373** | **76,429,013,944** | **(15,706,122,496)** | **86,917,056,278** |
| <u>**ඒකාබද්ධ කරන ලද**</u> | | | | | | | |
| **2010 ජනවාරි 01 දිනට ශේෂය** | **470,551,932** | **7,120,827,853** | **13,343,447,038** | **3,828,973,373** | **76,406,190,142** | **(15,312,209,077)** | **85,857,781,261** |
| වසරේ ශුද්ධ ලාභය | | | | | | (1,190,188,287) | (1,190,188,287) |
| ආදායම් බදු හා සැලකී ලාභාංශ බදු | | | | | | (185,056,463) | (185,056,463) |
| ලාභාංශ | | | | | (1,000,000) | (1,000,000) | |
| විලම්භිත බදු | | | | | | 342,904,325 | 342,904,325 |
| වර්ෂය තුළ ලැබීම්/හුවමාරු කිරීම | | | 309,246,372 | | | 981,624,385 | 1,290,870,757 |
| වත්කම් ප්‍රත්‍යාගණන සංචිත | | | | | 74,637,731 | 327,998,925 | 402,636,656 |
| **2010 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **470,551,932** | **7,120,827,853** | **13,652,693,410** | **3,828,973,373** | **76,480,827,873** | **(15,034,926,191)** | **86,518,948,250** |
| **2011 ජනවාරි 01 දිනට ශේෂය** | **470,551,932** | **7,120,827,853** | **13,652,693,410** | **3,828,973,373** | **76,480,827,873** | **(15,034,926,191)** | **86,518,948,250** |
| වසරේ ශුද්ධ ලාභය | | | | | | 853,913,883 | 853,913,883 |
| ආදායම් බදු හා සැලකී ලාභාංශ බදු | | | | | | (206,894,530) | (206,894,530) |
| ලාභාංශ | | | | | | (1,000,000) | (1,000,000) |
| | | | | | | | - |
| වර්ෂය තුළ ලැබීම්/හුවමාරු කිරීම | | | 1,121,118,261 | - | | (1,173,151,560) | (52,033,299) |
| වත්කම් ප්‍රත්‍යාගණන සංචිත | | | | | (51,813,929) | 51,813,929 | 0 |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **470,551,932** | **7,120,827,853** | **14,773,811,671** | **3,828,973,373** | **76,429,013,944** | **(15,510,244,469)** | **87,112,934,304** |

| මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය | සටහන | | ශ්‍රී ලං ව. අ. 2011 රු: | 2010 රු: | ඒකාබද්ධ කරන ලද 2011 රු: | 2010 රු: |
|---|---|---|---|---|---|---|
| **ආදායම් බදු වලට පෙර හා ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ පසු ශුද්ධ ලාභය** | | | **782,230,857** | **(1,248,134,059)** | **846,144,495** | **(1,195,854,813)** |
| ගැලපීම් කරන ලද්දේ | | | | | | |
| ආශ්‍රිත සමාගමේ ලාභ/පාඩු කොටස | | | | | 7,769,389 | 5,666,526 |
| ගිය වසරේ ගැළපීම් | | | (1,173,151,560) | 327,059,756 | (1,173,151,560) | 327,059,756 |
| ජංගම නොවන වත්කම් ක්ෂයවීම් | | | 4,230,474,308 | 4,683,438,453 | 4,233,508,663 | 4,685,605,720 |
| ආයෝජන ආදායම - ලාභාංශ | 121 | 3.1.1 | (754,586,596) | (595,172,163) | (754,586,596) | (595,172,163) |
| පොලී ලැබීම් | 125 | 1.3.3. | (708,968,562) | (682,889,098) | (714,832,445) | (686,349,139) |
| ගෙවිය යුතු පොලී - විදේශ ණය | 124 | 1.3.1 | 1,371,750,365 | 1,225,174,176 | 1,371,750,365 | 1,225,174,176 |
| ජංගම නොවන වත්කම් විකිණීම මත ලාභ/පාඩු | | | (8,727,600) | 1,225,174,176 | 1,371,750,365 | 1,225,174,176 |
| විදේශ විනිමය (ලැබීම්/පාඩු) | | | 3,543,239,055 | 4,409,809,021 | 3,543,239,055 | 4,409,809,021 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභ/පාඩු** | | | **7,282,260,267** | **8,101,731,174** | **7,351,113,766** | **8,158,384,172** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | | | | |
| වට්ටෝරු භාණ්ඩවල වැඩිවීම/අඩුවීම | 133 | 3.2.1/3.2.2 | 667,158,080 | 329,929,731 | 667,158,080 | 329,929,731 |
| වෙළඳ ණයගැතියන් හා වෙනත් ලැබීම් වල වැඩිවීම/අඩුවීම | 134 | 3.2.3 | 3,526,601,814 | 8,747,957,660 | 3,561,001,867 | 8,817,597,904 |
| සේවක ණය හා අත්තිකාරම් වල වැඩිවීම/අඩුවීම | 134 | 3.2.5 | 911,955,014 | 211,804,739 | 922,560,362 | 207,705,114 |
| කෙටි කාලීන ආයෝජන වල වැඩිවීම/අඩුවීම | 135 | 3.2.7 | (686,188,135) | (2,679,044,939) | (686,188,135) | (2,679,044,939) |
| තැන්පතු හා වෙනත් ලැබිය යුතු දේ වල වැඩිවීම/අඩුවීම | 135 | 3.2.8 | (7,718,006) | (21,641,138) | (7,290,809) | (21,714,738) |
| ණයකරුවන් හා උපචිත ගාස්තුවල වැඩිවීම/අඩුවීම | 137 | 5.1 | 198,354,524 | 106,772,098 | 179,954,779 | 74,012,762 |
| දීර්ඝකාලීන ණය ගැනීම් වල ජංගම කොටස් වැඩිවීම/අඩුවීම | 138 | 5.2 | 1,415,265,363 | (218,205,454) | 1,415,265,363 | (218,205,454) |
| තැන්පතු හා අත්තිකාම් ගෙවීම්වල වැඩිවීම/අඩුවීම | 138 | 5.3 | 450,970,753 | 1,885,698,515 | 450,705,330 | 1,886,227,748 |
| කෙටිකාලීන ප්‍රතිපාදනවල වැඩිවීම/අඩුවීම | 138 | 5.4 | (725,192,790) | (3,071,421,952) | (723,826,791) | (3,071,985,645) |
| හිමිකම්පෑම් සඳහා ප්‍රතිපාදන වල වැඩිවීම/අඩුවීම | 139 | 5.6 | (43,409,474) | (51,597,866) | (43,409,474) | (51,597,866) |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනිත මුදල්** | | | **12,990,057,410** | **13,341,982,567** | **13,087,044,338** | **13,431,308,789** |
| ගෙවන ලද ආදායම් බදු | 139 | 5.5.1 | (103,467,511) | (140,171,902) | (114,523,427) | (200,516,385) |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල්** | | | **12,886,589,899** | **13,201,810,665** | **12,972,520,911** | **13,230,792,404** |
| | | | | | | |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | | | |
| ජංගම නොවන වත්කම් අත්කර ගැනීම | | | (957,914,205) | (635,978,302) | (958,960,569) | (649,583,287) |
| ජංගම නොවන වත්කම් විකිණීම මත ඉදිරියට ගෙන ඒම | | | 9,376,735 | 26,531,885 | 9,376,735 | 26,531,885 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | 132 | 3.1.2 | (25,986,921,579) | (41,236,936,555) | (25,986,921,579) | (41,236,936,555) |
| ආයෝජන ආදායම් - ලාභාංශ | 125 | 1.3.3 | 754,586,596 | 595,172,163 | 754,586,596 | 595,172,163 |
| පොලී ලැබීම් | | | - | - | (1,000,000) | - |
| Interest Received | 124 | 1.3.1 | 708,968,562 | 682,889,098 | 714,832,445 | 686,349,139 |
| ගෙවිය යුතු පොලිය - විදේශ ණය | | | (1,371,750,365) | (1,225,174,176) | (1,371,750,365) | (1,225,174,176) |
| ආයෝජන | 132/133 | 3.1.3/3.1.4 | (414,784,178) | (483,893,196) | (414,784,178) | (483,893,196) |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජන | | | - | - | (7,769,389) | (5,666,526) |
| **ආයෝජන කටයුතු වලින් (යෙදවූ) ශුද්ධ මුදල්** | | | **(27,258,438,434)** | **(42,277,389,083)** | **(27,262,390,304)** | **(42,293,200,553)** |
| | | | (14,371,848,535) | (29,075,578,418) | (14,289,869,393) | (29,062,408,149) |
| **මුල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය** | | | | | | |
| වරාය සංවර්ධන ණය (ජපන් ණය) ප්‍රතිපූර්ණයන් | 137 | 4.3.1 | (4,883,747,288) | (4,308,553,909) | (4,883,747,288) | (4,308,553,909) |
| ණය ගිණුම් | 135 | 3.2.6 | 839,368 | 11,799,565 | 839,368 | 11,799,565 |
| කොළඹ වරාය පුළුල් කිරීමේ ADB ණය - ප්‍රතිපූර්ණය කිරීම | 137 | 4.3.2 | 9,730,693,847 | 6,887,360,755 | 9,730,693,847 | 6,887,360,755 |
| හම්බන්තොට වරාය සංවර්ධන ණය - ප්‍රතිපූර්ණය | 137 | 4.3.3 | 3,071,598,360 | 11,456,531,531 | 3,071,598,360 | 11,456,531,531 |
| අනෙත් වරායයන් සංවර්ධන ණය | 137 | 4.3.4 | 2,003,447,414 | (21,868,140) | 5,087,236,223 | (21,868,140) |
| අනෙත් වරායයන් සංවර්ධන ණය | 137 | 4.3.4 | 3,083,788,809 | - | - | - |
| වෙනත් ව්‍යාපෘති ණය | 137 | 4.3.4 | - | 10,378,949,563 | - | 10,378,949,563 |
| දීර්ඝ කාලීන පාරිතෝෂික ප්‍රතිපාදන | | 4.3.5 | 435,908,814 | 3,700,367,289 | 435,908,814 | 3,700,367,289 |
| පාරිතෝෂික හා දඩ අරමුදල් | 136 | 4.2.2 | 5,383,401 | 5,710,521 | 5,383,401 | 5,710,521 |
| ප්‍රතිපාදන හා වෙනත් සංචිත | 136 | 4.2.1 | 1,115,734,859 | 1,049,076,833 | 1,115,734,859 | 1,049,076,833 |
| **මුල්‍ය කටයුතු වලින් (යෙදවූ) ශුද්ධ මුදල්** | | | **14,563,647,584** | **29,159,374,008** | **14,563,647,584** | **29,159,374,008** |
| | | | | | | |
| **මුදල් සමක වලින් ශුද්ධ වැඩිවීම /අඩුවීම** | | | **191,799,045** | **83,795,588** | **273,778,191** | **96,965,859** |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමක | 136 | 3.2.9 | 497,324,681 | 413,529,093 | 581,351,691 | 484,385,835 |
| | | | 689,123,726 | 497,324,681 | 855,129,877 | 581,351,691 |
| **වසර අවසානයේදී මුදල් හා මුදල් සමක** | 136 | 3.2.9 | 689,123,726 | 497,324,681 | 855,129,877 | 581,351,691 |
| | | | | | | |
| | | | 689,123,726 | 497,324,681 | 855,129,877 | 581,351,691 |

**සංස්ථාපිත තොරතුරු**

**පොදු කරුණු**

1984 අංක 07 හා අංක 35 දරණ පනත්වලින් සංශෝධිත 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මඟින් 1979 අගෝස්තු 01 වැනි දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවනු ලැබීය.

**ප්‍රධාන කටයුතු මෙහෙයුම් කටයුතු වල ස්වභාවය**

නැව් භාණ්ඩ වාහක කටයුතු (ස්ටෙවඩෝරු), නැව්ගත කිරීම හා ප්‍රතිනැව්ගත කිරීම, ගොඩබෑම හා ගුදම්ගත කිරීම, වාප්පු කටයුතු, යාත්‍රාවලින් යාත්‍රාවලට ද නියමු ගාස්තු සඳහා බංකර සහ ගබඩා අතර ද කිමිදුම් කටයුතු සඳහා යාත්‍රා බැඳ තැබීමට සහ මුහුද යට නැව් අළුත්වැඩියා කටයුතු, ඊට ආනුශාංගික සේවාවන් සැපයීම සඳහා යාත්‍රාවලට ජලය, ඉන්ධන සහ විදුලිබලය සැපයීම.

**මුදල් වර්ෂය**

අධිකාරියේ මුදල් වර්ෂය දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වේ.

**ලියාපදිංචි කාර්යාලය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 01, තැ.පෙ.595, චෛත්‍ය පාර, අංක: 19 දරණ ස්ථානයෙහි පිහිටා ඇත.

**සේවක සංඛ්‍යාව**

2011 දෙසැම්බර් 31 දින සේවක සංඛ්‍යාව 10,982 (2010 – 12,824)

**විශේෂිත ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති සාරාංශය**

**පිළියෙළ කිරීමේ පදනම**

ශේෂ පත්‍රය, ලාභ අලාභ ගිණුම්, ස්කන්ධගත වෙනස්වීම් වල ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාෂ, ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති සහ සටහන් පොදුවේ පිළිගත් ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති වලට හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කර දක්වා ඇති ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි පිළියෙළ කොට ඇති අතර ඓතිහාසික පිරිවැය පදනමක් මත ඒවා උපයෝගී කර ගෙන ඇත. මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපාන උද්ධමනකාරී සාධක සඳහා ගැළපුම් කරනු නොලැබේ.

ආර්ථික සහයෝගීතාවය සඳහා වන අරමුදල (OCEF) හරහා ජපාන රජය විසින් ප්‍රදානය කරන ලද ණය හැර සියළුම විදේශ විනිමය ගණුදෙනු එම ගණුදෙනුව සිදුවන වකවානුවේ පැවති විනිමය අනුපාතයන් අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ඇත.

**ඒකාබද්ධ කිරීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුදල් ප්‍රකාශය තුළ කොළඹ, ගාල්ල හා ත්‍රිකුණාමලය වරායන්හි ඒකාබද්ධ මුදල් ප්‍රකාශන අන්තර්ගත වේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙන්ම 100% ක්ම අධිකාරියට අයත් අනු සමාගමක් වන ජය බහළු පර්යන්ත පුද්ගලික සමාගමේ මුදල් වර්ෂයේ අවසානයට ඒකාබද්ධ ප්‍රතිඵලය වත්කම් හා වගකීම් අන්තර්ගත වේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආශ්‍රිත ආයතනයන් වන ශ්‍රී ලංකා වරාය කළමනාකරණ සහ උපදේශන සමාගම තුළ සිදුකරන ලද ආයෝජන ගිණුම්කරණ ස්කන්ධ ක්‍රමය යටතේ ගිණුම්ගත කර ඇත. අදාළ වර්සය අවසානයට ආශ්‍රිත සමාගමේ ඒකාබද්ධ ලාභ කොටස වර්ෂය සඳහා වූ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය තුළ ගිණුම්ගත කරනු ලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගිණුම් ප්‍රකාශන තුළ අනු සමාගම් හා ආශ්‍රිත ආයතනයේ ආයෝජනය ගණනය කර ඇත්තේ පිරිවැයට වන අතර, ආදායම ගණන් ගෙන ඇත්තේ ලැබූ ලාභාංශ ප්‍රමාණය මතය.

**සංසන්ධනාත්මක තොරතුරු**

අධිකාරිය විසින් ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව නිරතුරුවම කටයුතු කර ඇති අතර ඒවා පෙර වසරවල ගිණුම් ප්‍රතිපත්තිවලට අනුරූප වේ. වෙනස් වීමක් සිදු වී ඇති සෑමවිටම ගිණුම් සඳහා වන සටහන් මගින් ඒවා විස්තර කරනු ලැබ ඇත. පෙර වර්ෂයේ ඉලක්කම් සහ සටහන් අවශ්‍යා අවස්ථාවන්හිදී පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට අනුකූලව වෙනස් කර ඇත.

**ඛණ්ඩ තොරතුරු**

කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය යන ප්‍රධාන භූගෝලියමය ප්‍රදේශවල පිහිටි වරායයන් නිරූපනය වනසේ පිළියෙළ කරනු ලබන ඛණ්ඩ තොරතුරු අධිකාරියේ විශේෂිත අංගයකි. ආදාම් එකතුකිරීමේදී සකසනු ලබන සේවා වර්ග අනුව මෙම ඛණ්ඩ තොරතුරු තවදුරටත් උප කොටස් වලට බෙදනු ලැබේ. වැය විශ්ලේෂණය කිරීමේදී හඳුන්ගත් මෙම ඛණ්ඩ කොට්ඨාශයන් නමින් හැඳින්වේ.

**ස්ථාවර වත්කම් හා තක්සේරු කිරීම**

**ස්ථාවර වත්කම්**

ස්ථාවර වත්කම් එදිනට සමුච්චිත ක්ෂයවීම් අඩුකර ප්‍රති තක්සේරු මුදලට සඳහන් කර ඇත. මිලදී ගැනුම් වටිනාකම රු: 5,000/- සහ ඊට වැඩි වටිනාකමකින් යුත් අයිතමයන් වත්කම් ලේඛණයට ඇතුළත් කර ඇත.

**(අ)** ස්ථාවර වත්කම් සඳහන් කර ඇත්තේ අදාළ දිනට සමුච්චිත ක්ෂයවීම් අඩුකර පිරිවැයට හෝ තක්සේරු කිරීම මත වේ.

**(ආ) පසුව කෙරෙන වියදම්**

පසුව කෙරෙන වියදම, දේපළ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අයිතමයෙහි සඳහන් ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන්නේ නම් එය ප්‍රාග්ධනගත කෙරේ. අනිකුත් සියළු වියදම් දැරීමට සිදු වූ වැයක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කෙරේ.

**ක්ෂයවීම්**

ස්ථාවර වත්කම් වල පිරිවැය/ඇස්තමේන්තුගත අගය අපේක්ෂිත උපයෝගී කාලය තුළ ලියා ඉවත් කිරීමට හැකිවන සේ ක්ෂයවීම සරල රේඛීය පදනමක් මත සලසා ඇති අතර අවශේෂ වටිනාකම 0.1% ක් වනසේ පහත සඳහන් ප්‍රමාණයන් මත ඇස්තමේන්තු කර ඇත.

| වත්කම් වර්ගය(ප්‍රභේද) | ක්ෂයවීම් අනුපාතය (පරාසය %) |
|---|---|
| මෙහෙයුම් ගොඩනැගිලි සහ ව්‍යුහන් | 2% - 20% |
| | 2% - ගබඩා අංගන |
| | 2.5% - ස්ථිර ව්‍යුහන් |
| | 2.9% - ස්ථිර ගොඩනැගිලි |
| | 4% - අනෙකුත් ගොඩනැගිලි සහ ව්‍යුහයන් |
| | 10% - පොල්තෙල් නළ මාර්ගය |
| | 5% - 20% - දුම්රිය මාර්ගය |
| පාවෙන උපකරණ | 6.7% - 12.5% |
| | 6.7% - 12.5% වානේ බත්තල් |
| | 10% - 50% බෝට්ටු සහ ලෝන්ච් යාත්‍රා |
| | 10% - 12.5% බෝට්ටු සඳහා පොම්ප |
| මෙහෙයුම් උපකරණ | 8.3% - 50% |
| | 8.3% - 50% ග්‍රැන්ට් සහ අනෙකුත් දොඹකර |
| | 12.5%- 50% ටේනර් රථ සහ බර කිරුම් යන්ත්‍ර |
| | 10% - 20% අඩුළුසවුම් සහ ප්‍රයිමුවර් රථ |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 10% - 50% |
| | 10% - 50% උපාංග |
| | 12.5% - 50% උබකරණ (විද්‍යුත්ජනක) |
| | 5% - 20% යන්ත්‍ර |
| කාර්යාල සුහසාධක ගොඩනැගිලි | 1.3% - 50% |
| | 1.3% - 50% ස්ථිර කාර්යාල ගොඩනැගිලි |
| | 2.9%-50% අනෙකුත් ගොඩනැගිලි (ගරාජ් ආදිය) |
| කුළියට ගත් ගොඩනැගිලි | 2.9% - 6.7% |
| | 2.9% - 6.7% ස්ථිර ගොඩනැගිලි |
| පරිගණක දෘඩකාංග හා මෘදුකාංග | 20% - 50% |
| විදුලි සහ විද්‍යුත් උපකරණ | 5% - 50% |
| | 5% - විදුලි පහන් කණු |
| | 5% - 50% දුරකථන සහ අනෙකුත් උපකරණ |
| | 12.5% - 50% උපකරණ (විදුලිජනක) |
| කාර්යාල ගෘහභාණ්ඩ සහ | 6.7% - 50% |
| | 6.7% - 50% ගෘහභාණ්ඩ (දැවමය) |
| | 16.6%-50% ගෘහභාණ්ඩ සහ උපකරණ (වානේ) |
| | 33.3% පුස්තකාල පොත් |
| රථවාහන | 20% - 50% |
| වෙනත් වත්කම් | 5% - 50% |
| | 5% - 50% විවිධ උපකරණ |
| | 5% - 50% විවිධ අයිතමයන් (විදුලිජනක) |
| | 5% - 50% මුළුතැන්ගෙයි උපකරණ |

සින්නක්කර බුක්තිය ඇති ඉඩම් හැර සියළුම ස්ථාවර වත්කම් සඳහා ක්ෂවීම ගණනය කෙරෙනුයේ පාවිච්චිය අත්පත් කරගත් මාසයේ සිට වන අතර ඒවා බැහැර කරනු ලබන වර්ෂයේදී ක්ෂයවීමක් සඳහා ගණනය කිරීමක් නොකෙරේ.

**සමාගම් කොටස්වල ආයෝජන**

අනු සමාගම්වල ආයෝජන ජංගම නොවන වත්කම් සේ සලකනු ලබන අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශවල පිරිවැයට අනුව සටහන් කර ඇත. අනු සමාගමේ නම සී/ස ජයබහළු පර්යන්ත (පුද්ගලික) සමාගම වේ.

අනු සමාගම්වල ආයෝජනයන් ජංගම නොවන වත්කම් සේ සළකනු ලබන අතර කොටස්වල රඳවාගත් වත්කම් තුළ ශ්‍රී ලංකා

**ආශ්‍රිත සමාගම්වල ආයෝජන**

ආශ්‍රිත සමාගම්වල ආයෝජනයන් ජංගම නොවන වත්කම් සේ සළකනු ලබන අතර කොටස්වල රඳවාගත් වත්කම් තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොටස්වල අනන්‍යතාවය ප්‍රත්‍යාවේක්ෂණය කිරීම සඳහා ගිණුම්කරණයේදී ජංගම නොවන වත්කම් ස්කන්ධගත පදනම මත ගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල ආයෝජන සටහන් කර ඇත්තේ පිරිවැයට වේ. ලාභාංශ ආදායම මුදල් පදනම මත පිළිගනු ලැබේ. ආශ්‍රිත සමාගමේ නම සී/ස ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා සමාගම වේ.

**මූල්‍ය වත්කම්වල ආයෝජන**

සියලුම ආයෝජනවල අගය නාමික අගයට සඳහන් කරනු ලැබේ.

**තොග පිළිබඳ තක්සේරුව හා මිළ නියම කිරීම**

යාත්‍රා සහ නැව් බඩු මෙහෙයුම් උපකරණ සඳහා අමතර කොටස්, වාහන සඳහා ඉන්ධන සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාවිච්චිය සඳහා ඇති ලිපි ද්‍රව්‍ය වැනි අනිකුත් භාණ්ඩ අයිතමයන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තොවලට අයත් වේ. ඉහත සියළුම අයිතමයන් පාවිච්චිය සඳහා මිස නැවත විකිණීම සඳහා නොවේ. එම නිසා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සිය භාණ්ඩ තොග පොත්වල සඳහන් වටිනාකම මත තක්සේරු කරයි. කෙසේ වුවද අභ්‍යන්තර විගණන කොට්ඨාශය විසින් නිත්‍ය වට්ටෝරු භාණ්ඩ ක්‍රමවේදය පවත්වා ගෙන යනු ලැබේ. ගාල්ල හා ත්‍රිකුණාමලය වරායයන්හි තොග භෞතික සත්‍යෝක්ෂණයෙන් පසු පිරිවැය මත වටිනාකම තක්සේරු කර ඇත. වරායයන්හි තුනෙහිම තොග නිකුතුව, පළමු ලැබීම් - පළමු නිකුතු ක්‍රමයට සිදුකෙරේ.

**ණය ගැතියන් සහ ලැබිය යුතු මුදල්**

වෙළඳ ණය ගැතියන් සඳහන් කර ඇත්තේ බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් අනතුරුවය.

**බොල් සහ අඩමාන ණය ප්‍රතිපාදන**

2011 දෙසැම්බර් 31 දිනට කාල විශ්ලේෂණයට අනුව බොල් හා අඩමාන ණය ගණනය කරනු ලැබේ. ප්‍රතිශතයන් පහත දක්වා ඇත.

| **ණයකරුවන්ගේ ස්වභාවය** | **ප්‍රතිශතය** |
|---|---|
| සේවාවේ යෙදී සිටින නැව් නියෝජිතයින් | 5% |
| මෙහෙයුම් නොකරන නැව් නියෝජිතයින් | 100% |
| නෛතික ක්‍රියාමාර්ග වලට යටත් නියෝජිතයින් | 100% |
| ශ්‍රී ලංකා සන්නද්ධ බලකාය | |
| දෙසැම්බර් - ජුලි | - |
| ජනවාරි - ජුනි 2011 | 5% |
| 2010 | 5% |
| අත්හිටවු නැව් නියෝජිතයින් | 100% |
| රජයේ දෙපාර්තමේන්තු/ආයතන | 10% |

**මුදල්, මුදල් සමක සහ මුදල්**

මුදල් සහ මුදල් සමකයන් විස්තර කොට ඇත්තේ අතෙහි, බැංකු වල හා ඒක්ෂණ තැන්පතු වල ඇති මුදල් හා නිශ්චිත මුදල් ප්‍රමාණයන්ට නොපමාව පරිවර්ථනය කරගත හැකිවූත් වටිනාකමේ වෙනසෙහි අවදානම නොසැලකිලිමත් එකක් වන්නාවූත් අනිකුත් අතිශය ද්‍රවශීලි ආයෝජනයන්ය. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාර්යය සඳහා මුදල් සහ මුදල් සමක සමන්විත වන්නේ අතේ ඇති මුදල්, බැංකුවල ඇති ඒක්ෂණ තැන්පතු සහ හිඟ බැංකු අයිරා අණකරවල ශුද්ධ ප්‍රමාණය ආදියෙනි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශන වක්‍ර ක්‍රමය උපයෝගී කර පිළියෙළ කරනු ලැබ ඇත.

**බැරකම් හා ප්‍රතිපාදන**

**බැරකම්**

වැදගත් හා සැලකිය යුතු සියළුම බැරකම් ශේෂ පත්‍රයේ දිනට ගිණුම්වල ඇතුළත් කොට ඇති අතර බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් සලසා ඇත.

**ප්‍රතිපාදන**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය පහත සදහන් ප්‍රතිපාදන සලසා ඇත.

**සේවකයන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ - පාරිතෝෂික**

විශ්‍රාම පාරිතෝෂික දීමනා සඳහා ගිණුම් තුළ ප්‍රතිපාදන සලසා ඇත. එම ගෙවීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එක් වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සෑම සේවකයෙකු සඳහාම සලසා ඇත.

**පරිමාන ප්‍රතිදාන**

මේවා 2011 වසරේ මෙහෙයවන ලද නැව්බඩු ප්‍රමාණයන් මත නැව් ඒජන්තවරුන්/නැව් සේවාවන් සඳහා වන ප්‍රතිදාන වේ.

**උපචිත වියදම්**

2011 වසරේ දැරීමට සිදු වූ වියදම් මත එහෙත් 2012 වසරෙහි ගෙවීමට ඇති

**බදු සඳහා ප්‍රතිපාදන**

වසර සඳහා වූ ජාතික අයවැය මාර්ගෝපදේශයන් හා අදාළ අවස්ථා වල වූ ඇස්තමේන්තුකරණයන් මත වේ.

**හිමිකම්පෑම සඳහා ප්‍රතිපාදන**

ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව ඉදිරිපත් විය හැකි හිමිකම්පෑම් වල ප්‍රතිශතයක් වශයෙන් ප්‍රතිපාදන සලසා ඇත.

**වරාය සංවර්ධනය ණය (ජපන් ණය)**

ජපාන රජයෙන් ප්‍රදානය කරනු ලැබූ ණය මුදල් 1995 ජනවාරි 01 වැනි දින සිට "ස්ථාවර ප්‍රමාණයක්" අනුව නැවත සකසා ඇති අතර ඒ අනුව ආපසු ගෙවීම සම්බන්ධයෙන් වන විදේශ විනිමය පාඩුව හෝ වාසි ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැරිය යුතුව තිබේ. කෙසේ වෙතත් ණය ආපසු ගෙවීම ආපසු ගෙවන දිනට පවතින ස්ථානීය විනිමය අනුපාතය අනුව සිදු කෙරේ. එම ස්ථානීය ප්‍රමාණය හා ස්ථාවර ප්‍රමාණය අතර වෙනස ලාභාලාභ ගිණුමෙහි විනිමය පාඩුව/වාසිය වශයෙන් සලකා ඇත.

**රජයේ ප්‍රදානයන්**

රාජ්‍ය ප්‍රදානයන් විලම්භනය කළ ආදායම් සේ සැලකිල්ලට ගෙන ඇති අතර වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය අනුව ක්‍රමානුකූල හා සුවිධාන පදනමක් මත ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබ ඇත.

**බදු ගෙවීම**

වර්ෂය සඳහා වූ ලාභ මත බදු ගෙවීමේ වගකීම ගෙවිය යුතු ජංගම හා විලම්භනය කළ බදුවලින් සමන්විත වන අතර ලාභාලාභ ප්‍රකාශයෙහි පෙන්නුම් කර ඇත. ගෙවිය යුතු වත්මන් බද්ද වනුයේ ශේෂ පත්‍රයෙහි දිනට ක්‍රියාත්මකව පවතින බදු ප්‍රමාණ උපයෝගී කර ගෙන වර්සය සඳහා වූ බද්දට යටත්වන ආදායම මත ගෙවනු ලැබීමට අපේක්ෂිත බද්ද සහ පසුගිය වර්ෂය වෙනුවෙන් වූ බද්දෙහි යම් ගැළපීම් වේ නම් ඒවාද වේ.

මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ගෙනයනු ලබන වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කරනු ලබන බදු ගෙවීම සඳහා උපයෝගී කරගනු ලබන ප්‍රමාණයන් අතර වූ කාල ප්‍රභේදයන් අනුව ශේෂ පත්‍රයේ බැරකම් ක්‍රමය උපයෝගී කර ගෙන 2000 අංක 38 සහ 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලව ගණනය කරමින් විලම්භනය කළ බදු සඳහා ප්‍රතිපාදන සැලසේ.

**විදේශ විනිමය ලැබීම්**

තොරතුරු සැපයීම අරමුණු කර ගනිමින් ඇස්තමේන්තුගත විදේශ විනිමය ගණනය කරනුයේ ප්‍රති නැව්ගත කිරීම් හා නිවාක කටයුතු සම්බන්ධ ආදායම සඳහා 100% ප්‍රමාණයක් ද අනෙකුත් මෙහෙයුම් කටයුතු සඳහා 73% ප්‍රමාණයක් ද ලෙසිනි.

| **ආදායම** | **ගණනය සඳහා (සියයට) ප්‍රතිශතය** |
|---|---|
| ප්‍රතිනැව්ගත කිරීම | 100% |
| නාවික කටයුතු | 100% |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 73% |

**ආදායම් ප්‍රකාශය**

**ආදායම් නිශ්චය කිරීම**

ආදායම උපචිත පදනමක් මත නිශ්චය කෙරේ. එක් එක් වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා පැමිණි නෞකා වෙනුවෙන් ඉටු කරනු ලැබූ සේවාවලින් ලැබෙන ආදායම එම අදාළ වර්ෂයේ ආදායම වශයෙන් නිශ්චය කෙරේ.

**ලාභාංශ ආදායම් නිශ්චය කිරීම**

ලාභාංශ ආදායම මුදල් පදනම මත නිශ්චය කෙරේ.

**බදු ආදායම**

බදු ආදායම උපචිත පදනම මත නිශ්චය කෙරේ.

**බදුකුළී ආදායම**

බදුකුළී ආදායම උපචිත පදනම මත නිශ්චය කෙරේ.

**පොලී ආදායම**

මූල්‍ය උපකරණ වලින් ලබන පොලී ආදායම උපචිත පදනමක් මත නිශ්චය කෙරේ.

**රාජ්‍ය හිමිකම් භාගය**

රාජ්‍ය හිමිකම් භාගය සම්බන්ධ ආදායම උපචිත පදනමක් මත නිශ්චය කෙරේ.

**විශ්‍රාම ප්‍රතිලාභ**

**නිශ්චිත දායක මුදල් සළසුම - සේවක අර්ථසාධක අරමුදල/සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල**

සියළුම සේවකයන්ට අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් සඳහා සුදුසුකම් ලැබේ. සේවක අර්ථසාධක අරමුදලට සේවකයන්ගේ දළ වැටුපෙන් 15% ක ප්‍රමාණයකින් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවකයන්ගේ දළ වැටුපෙන් 3% ක ප්‍රමාණයකින් අධිකාරිය දායක වේ. ඉහත සඳහන් අරමුදල් සඳහා වන දායකත්වය වැය වශයෙන් නිශ්චය කෙරේ.

**වියදම්**

ව්‍යාපාර කටයුතු පවත්වා ගෙනයාමේදී සහ වත්කම් නඩත්තු කිරීමේදී දරණ ලද සියළුම වියදම් වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී ආදායමට අයභාර කොට ඇත.

**ණය මුදල් ගැනීමේදී සිදුවන පිරිවැය**

ණය මුදල් ගැනීමේදී සිදුවන පිරිවැය, එම පිරිවැය වියදම් වූ වර්ෂයේ වියදම් ලෙස නිශ්චය කෙරේ. එහෙත් ණය මුදල් ගැනීමේදී සිදුවන පිරිවැය ඉදිකිරීම් පවරා ගැනීම් හෝ කිසියම් දේපළක් නිෂ්පාදනය සඳහා ඍජුවම ආරෝපනය වන්නේ නම් හා සමස්ථ පූර්ණය සඳහා අවශ්‍ය වන්නේ නම් එය ව්‍යාපෘතිය අවසානයේදී ප්‍රාග්ධනගත කෙරේ.

**පර්යේෂණ හා සංවර්ධන පිරිවැය සහ විලම්භනය වූ වියදම්**

සැලසුම් හා සංවර්ධන කොට්ඨාශය විසින් දරනු ලබන වැටුප් ඇතුළු සියළුම වියදම් පවත්වා ගෙන යනු ලබන කාර්යයක කොටසක් වශයෙන් සලකනු ලැබේ. ඒ අනුව එය ප්‍රවර්තන වියදමක් වශයෙන් සැලකේ.

**විදේශ මුදල් ගණුදෙනු**

ගණුදෙනුව සිදුවන දිනයේදී පවත්නා විනිමය අනුපාතයන්ට අනුව විදේශ මුදල් ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්ථනය කරනු ලැබේ. ශේෂපත්‍ර දිනයට විදේශ විනිමය ලෙස නම් කර ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් ශේෂපත්‍ර දිනයේදී පවත්නා ආසන්න අගය භාවිතා කරමින් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ. ගණුදෙනු තුළදී පැන නඟිනු ලබන විදේශ විනිමය වෙනස්වීම් ආදායම් ප්‍රකාශනයේ පෙන්නුම් කෙරෙනු ඇත.

ශේෂ පත්‍ර දිනට අදාළ විනිමය අනුපාත පහත සදහන් පරිදි වේ.

| | |
|---|---|
| ඇ.ඩො. | 111.44 |
| යෙන් | 1.49 |

**සම්බන්ධ පාර්ශව හා ගණුදෙනු**

සම්බන්ධ පාර්ශවකරුවන් හා සිදුවන ගණුදෙනු සාමාන්‍ය වාණිජ කොන්දේසි මත සිදුවේ. මූල්‍ය ප්‍රකාශනයේ 6.2.1 සටහන තුළ අදාළ අනාවරණ දක්වා ඇත.

**සංසන්දනාත්මක සංඛ්‍යා**

| | තොග කඩන, තොග සහ දියර | 3,125,631,019 | 2,534,456,686 | | |
| | වෙනත් | 11,320,597,439 | 10,128,747,385 | | |
| | | **31,250,473,744** | **28,279,299,849** | | |
| (ඇ) | **ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීම සහ බදු හැර වියදම්** | | | | |
| | කොළඹ වරාය | 26,682,903,079 | 28,243,702,320 | | |
| | ගාල්ල වරාය | 587,854,145 | 622,009,992 | | |
| | ත්‍රිකුණාමලය වරාය | 602,872,605 | 661,721,597 | | |
| | ශ්‍රී ලං ව අ මුළු වියදම් | 27,873,629,830 | 29,527,433,908 | | |
| | ජයබහළු පර්යන්ත සමාගම | 156,172,502 | 172,828,790 | | |
| | මුළු වියදම | **28,029,802,331** | **29,700,262,699** | | |
| (ඉ) | **ලාභය ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමට පෙර බදු හා විදේශ විනිමය ලාභ** | | | | |
| | **බදු හා විදේශ විනිමය ලැබීම්වලට පෙර ලාභය** | | | | |
| | කොළඹ වරාය | 7,385,285,811 | 3,889,790,846 | | |
| | ත්‍රිකුණාමලය වරාය | (317,963,323) | (382,939,643) | | |
| | ගාල්ල වරාය | (147,239,519) | (345,176,241) | | |
| | ජයබහළු පර්යන්ත සමාගම | 63,913,638 | 52,279,246 | | |
| | ශ්‍රී ලං ව කළමනාකරණ හා උපදේශන සේවා සමාගම | 7,769,388 | 5,666,526 | | |
| | | **6,991,765,995** | **3,219,620,734** | | |
| (ඊ) | **වත්කම් හා වගකීම්** | | | | |
| | ජංගම නොවන වත්කම් | 208,963,087,071 | 185,835,429,920 | 209,016,180,786 | 185,882,742,237 |
| | ජංගම වත්කම් | 13,563,331,051 | 17,784,180,143 | 13,693,487,570 | 17,877,790,119 |
| | මුළු වත්කම් | 222,525,845,041 | 203,618,197,613 | 222,709,668,356 | 203,760,532,355 |
| | වත්කම් විස්තරය | | | | |
| | ජංගම වත්කම් | 14,720,741,449 | 13,328,585,778 | 14,708,113,656 | 13,337,053,354 |
| | ජංගම නොවන වත්කම් | 120,888,047,315 | 103,903,118,302 | 120,888,047,315 | 103,903,118,302 |
| (උ) | **මුදල් ප්‍රවාහ** | | | | |
| | මෙහෙයුම් මුදල් ප්‍රවාහය | 12,886,589,899 | 13,201,810,665 | 12,972,520,911 | 13,230,792,404 |
| | ආයෝජන මුදල් ප්‍රවාහය | (27,258,438,434) | (42,277,389,083) | (27,262,390,304) | (42,293,200,553) |
| | මූල්‍යමය මුදල් ප්‍රවාහය | 14,563,647,584 | 29,159,374,008 | 14,563,647,584 | 29,159,374,008 |

**9 අසම්භාව්‍යයන්**

2011 වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට හිලව් වශයෙන් මුළු හිමිකම් පෑම රු: 815,250,290 /= ශ්‍රී ලංකා වරාය අධිකාරිය වසරේ ලාභයෙන් හිලවු ලෙස රු: 245,275,087/= ක මුදලක් ප්‍රධාන නීති නිලධාරිණියගේ උපදෙස් මත ලබාදී තිබේ. ඉහත අනාවරණය කර ඇති වගකීම් හැරෙන්නට ශ්‍රී ලංකා වරාය අධිකාරියට වෙනත් වගකීම් නොමැත.

**10 සන්සන්දනාත්මක දත්ත**

සැසඳීමේ පහසුව සඳහා පසුගිය වර්සයට සම්බන්ධිත අදාළ ශේෂ පවත්නා වර්ෂයේ වර්ගීකරණයෙන් සහ ඉදිරිපත් කිරිම සහතික කරනු පිණිස ප්‍රතිවර්ගීකරණය කර ඇත.

**11 ලෙජරයේ ඇතුළත් කළ ශේෂ පත්‍ර සිදුවීම**

1 2007/08 තක්සේරු වර්ෂය සඳහා නිකුත් කරන ලද තක්සේරුවට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනය සම්බන්ධව දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් විසින් ප්‍රකාශිත අභියාචනා ආදායම් බදු නිර්ණය කිරීමට අදාළව බදු ආයාචනා කොමිසම වෙත ආයාචනයක් ඉදිරිපත් කිරීම පහසු කරලනු වස් බදු ආයාචනා කොමිසම නමින් රු: 763,911,439 ක මුදලක් සඳහා වූ බැංකු ඇපකරයක් ලංකා බැංකුවෙන් ලබා ගෙන ඇත. මෙම බැංකු ඇපකරයේ වටිනාකම වන්නේ දේශීය ආදායම් කොමසාරිස් විසින් තක්සේරු කරන ලද මුදලින් (රු: 3,055,645,755) 25% කි.

2 2003 අගෝස්තු 31 දින සිට 2012 ජනවාරි 11 දක්වා කාලය සඳහා ඇ.ඒ.ජ.ඩො.1,193,715 ට සමානව රු: 192,271,057 ක මුදලක් සහ LIBOR + 2% යටතේ ගණන් බලන ලද පොලියකුත් සමඟ සම්පූර්ණ මුදලක් SAGT ආයතනයෙන් ලැබී ඇත. මෙය රජයේ ඇස්තමේන්තු අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා වූ දොඹකර වෙනුවෙන් ගණන් බලන ලද මුදල වන ඇ.ඩො.මිලියන 4.811 ක් සහ SAGT ආයකනය විසින් ශ්‍රි ලංකා වරාය අධිකාරිය වෙත නිකුත් කරන ලද ද්‍රව්‍යමය භාණ්ඩවල වටිනාකම වන

SAGT ආයකනයේ අතිරේක ද්‍රව්‍යමය භාණ්ඩ කොටස වෙනුවෙන් ඇ.ඩො.මිලියන 2.425 ක මුදල සඳහා වූ අතිරේක ද්‍රව්‍යමය භාණ්ඩ වෙනුවෙන් වූ කොටස් නිකුත් කිරීමට ද්‍රව්‍යමය භාණ්ඩ වෙනුවෙන් වූ කොටස් නිකුත් කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය හිමිකම් ලබයි. මෙම මුදල ද්‍රව්‍යමය භාණ්ඩ සඳහා වූ කොටස් වශයෙන් දායකත්වය සැපයීම සඳහා ද අදාළ වේ. අදියර පහසුකම් සඳහා තවදුරටත් ප්‍රාග්ධනය අවශ්‍ය වන අවස්ථාවක ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මුදලින් දායකත්වය සැපයීමේදී සමගාමීව භාවිතා කිරීමේ පදනම මත මෙය සිදුවේ.

3 ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ වසර 5 ට අඩු සහ ඉදිරි සේවා කාලය වසර 2 ට වැඩි අයදුම්කරුවන්ට ගෙවීම් කිරීම සඳහා රු: මිලියන 921.874 ක මුදලක් ඇස්තමේන්තුගත කර ඇත.

**12 මූල්‍ය අවදානම් කළමනාකරණය**

2011 වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අවදානම් කළමනාකරණය සඳහා විශේෂිත පියවර ගෙන නොමැත

**අ විදේශ විනිමය අවදානම**

විශේෂිත වූ අවදානම් කළමනාකරණයන් නොමැත

**ආ වෙළඳ ණයගැති පිළිබඳ අවදානම**

යික නැව් බඩු නියෝජිතයින් සම්බන්ධ වෙළඳ ණයගැති අවදානම ආවරණය වනුයේ 250,000/- ක බැංකු ඇපකරයන් මත වන අතර නැව් නියේජිත සේවා සමාගම් සඳහා එම ඇපකරය රු: 500000/- ෙ

**13 ඇස්තමේන්තුගත හා තීරණ**

ඇස්තමේන්තු හා තීරණ නිරන්තරයෙන් ගණනය කළේ හේතු සහගත තත්ත්වයන් යටතේ ආනගතයේදී සිදුවේ යැයි බලාපොරොත්තු වන සිද්ධීන් ද ඇතුළත්ව අතීත අත්දැකීම් ද පදනම් කර ගෙනය.

**අ විවේචනාත්මක ගිණුම් ඇස්තමේන්තු සහ උපකල්පන**

අනාගතය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උපකල්පනයන් හා ගිණුම් ඇස්තමේන්තු පිළියෙල කරනු ලබයි. ප්‍රතිඵල තත්‍ය ප්‍රතිඵල හා සමාන වනුයේ ඉතාමත් විරල වශයෙනි. භෞතිකමය වශයෙන් ගැලපීම් සිදු කිරීමේ අවදානමක් පවත්නා ඇස්තමේන්තු හා උපකල්පනයන් පහත දක්වා ඇත.

**ආ ආදායම් බදු**

අවසන් බදු ප්‍රතිඵලය උපකල්පනයට වඩා වෙනස් වන අවස්ථාවලදී එම වෙනස්වීම් වසරේ ආදායම් බදු ප්‍රතිපාදන සඳහා බලපෑම් ඇතිවේ.

**ආ ආදායම් හඳුනාගැනීම**

සලසන ලද සේවාවන් සඳහා වන ආදායම රු: 717,802,687/= ලැබිය යුතු යැයි හඳුනා ගෙන තිබුණා ද මේ දක්වා බිල්ගත කර නැත. අතීත අත්දැකීම් අනුව මෙම ආදායම ලැබෙනු ඇතැයි අධිකාරිය අපේක්ෂා කරයි.

**ආ හිමිකම් වෙනුවෙන් බැඳීම**

පසුගිය අවුරුදු තුන ඇතුළත සැලකිය යුතු ආර්ථික වර්දනයක් සිදු නොවුන ද අවිනිශ්චිත තත්ත්වයක් සැලකිල්ලට ගෙන රු: 245,275,087/= මුදලක් සලසා ඇත

| විෂයාන්ට අනුව වියදම් | ශ්‍රී ලංවඅ | | ඒකාබද්ධ කරන ලද | |
|---|---|---|---|---|
| **විස්තරය** | **2011** | **2010** | **2011** | **2010** |
| | රු: | රු: | රු; | රු; |
| **සේවක පඩිනඩි** | | | | |
| වැටුප් වේතන හා දීමනා | 9,306,793,162 | 10,011,012,969 | 9,403,455,609 | 10,112,800,003 |
| අතිකාල | 3,176,981,109 | 3,322,603,870 | 3,176,981,109 | 3,322,603,870 |
| | **12,483,774,271** | **13,333,616,839** | **12,580,436,718** | **13,435,403,873** |
| **සේවක මණ්ඩල විශ්‍රාමයාම වෙනුවෙන් වෙන් කිරීම** | **423,724,658** | **754,134,518** | **423,724,658** | **754,134,518** |
| **ක්ෂයවීම්** | **4,118,246,682** | **4,682,142,711** | **4,121,115,836** | **4,684,128,596** |
| **වත්කම් නඩත්තු කිරිම** | | | | |
| අලුත්වැඩියා සහ නඩත්තු සඳහා කොන්ත්‍රාත් වැඩ | 337,821,461 | 197,238,708 | 338,153,011 | 197,123,205 |
| අලුත්වැඩියා සහ නඩත්තු සඳහා නිකුත් කළ ද්‍රව්‍ය | 1,035,283,632 | 939,753,924 | 1,043,534,788 | 941,545,315 |
| | **1,373,105,093** | **1,136,992,631** | **1,381,687,799** | **1,138,668,519** |
| **ඉන්ධන, විදුලිය හා ජලය** | | | | |
| ඉන්ධන, විදුලිය හා වෙනත් වියදම් | 2,027,622,501 | 1,658,337,186 | 1,946,067,126 | 1,587,259,703 |
| ජලය සඳහා පිරිවැය | 173,240,683 | 169,212,073 | 174,260,946 | 170,488,902 |
| | **2,200,863,184** | **1,827,549,259** | **2,120,328,072** | **1,757,748,605** |
| **විදේශ ණය මත පොලිය** | **1,371,750,365** | **1,225,174,176** | **1,371,750,365** | **1,225,174,176** |
| **ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ වියදම්** | 2,594,613,057 | - | 2,594,613,057 | - |
| **ප්‍රතිදාන** | **1,122,939,591** | **917,807,895** | 1,122,939,591 | 917,807,895 |
| **වෙනත් වියදම්** | | | | |
| ගමන් යැපීම් හා ඉන්ධන දීමනා | 8,880,542 | 15,128,522 | 8,880,542 | 15,128,522 |
| බාහිර කුළී ගාස්තු/කොන්ත්‍රාත් | 626,277,860 | 461,771,787 | 626,277,860 | 461,771,787 |
| සන්නිවේදන වියදම් | 32,580,088 | 30,902,087 | 33,643,865 | 32,244,300 |
| වරිපනම් හා බදු | 26,825,901 | 25,720,864 | 28,881,002 | 28,622,144 |
| රක්ෂණ හා බලපත්‍ර | 22,337,841 | 15,519,076 | 23,191,737 | 16,033,965 |
| කාර්යාල අවශ්‍යතාවයන් | 73,475,759 | 62,863,270 | 73,909,937 | 63,360,278 |
| පුහුණු කිරීමේ වියදම් | 29,080,817 | 11,779,966 | 29,080,817 | 11,779,966 |
| සුභසාධක වියදම් | 150,516,365 | 104,681,865 | 154,083,893 | 108,395,326 |
| ප්‍රචාරක හා මහජන සම්බන්ධතා | 31,430,641 | 70,058,357 | 32,150,276 | 70,398,782 |
| විවිධ වියදම් | 77,689,604 | 97,051,491 | 80,229,798 | 100,220,757 |
| වෙනත් ගාස්තු | 22,087,258 | 805,461 | 46,290,754 | 30,841,376 |
| ලියාහරින ලද විවිධ ශේෂ ගිණුම් | 9,487,573 | - | 9,487,573 | - |
| බොල් සහ අඩමාණ ණයකරුවෝ | (80,279,169) | 109,739,677 | (79,668,393) | 111,955,936 |
| ජී එස් ටී සහ වැට් මත වියදම් | 35,491,891 | 35,417,441 | 35,318,060 | 35,633,315 |
| මුද්දර ගාස්තු | 917,349 | 722,375 | 956,790 | 722,375 |
| එන් බී ටී ගෙවීම් | 137,126,143 | 148,697,998 | 142,299,708 | 157,688,541 |
| මූල්‍ය ගාස්තු | 26,275,993 | 38,859,187 | 27,023,409 | 39,680,632 |
| විගණන ගාස්තු | 1,434,158 | 1,508,078 | 1,769,158 | 1,813,078 |
| අන්තර්ග්‍රහණය නොකළ මුළුතැන්ගෙයි වියදම් | 4,349,604 | 8,979,358 | 4,349,604 | 8,979,358 |
| සමාජ වගකීම් ව්‍යාපෘති | - | - | 56,934 | 328,545 |
| විදේශ විනිමය පාඩු/(ලැබීම්) | 3,543,239,055 | 4,409,809,021 | 3,543,239,055 | 4,409,809,021 |
| සමාජ වගකීම් බද්ද | - | 2,353,993 | - | 2,353,993 |
| *ණයගැති එකතුකිරීමේ ශත ගැලපීම* | 715 | - | 715 | - |
| | **4,779,225,986** | **5,652,369,873** | **4,821,453,092** | **5,707,761,996** |
| **සමස්ථ වියදම** | **30,468,242,887** | **29,529,787,901** | **30,538,049,187** | **29,620,828,178** |

**සේවක ඉපැයීම් ප්‍රකාශය**

| විස්තරය | | 2011 | | | ශ්‍රී ලංවඅ | |
|---|---|---|---|---|---|---|
| | | කොළඹ වරාය රු: | ත්‍රිකුණාමලය වරාය රු: | ගාල්ල වරාය රු: | 2011 රු: | 2010 රු: |
| සේවකයින් | | 10,083 | 466 | 433 | 10,982 | 12,824 |
| වැටුප්, වේතන, දීමනා සහ පාරිතෝෂික | රු: මිලි: | 9,102 | 398 | 352 | 9,852 | 10,902 |
| අතිකාල | රු: මිලි: | 3,087 | 102 | 56 | 3,245 | 3,396 |
| එකතුව | රු: මිලි: | **12,188** | **500** | **408** | **13,097** | **14,298** |
| සේවකයෙකු වෙනුවෙන් සාමාන්‍යය වාර්ෂිකව | | | | | | |
| වැටුප්, වේතන දීමනා හා පාරිතෝෂිත | රු: | 902,689 | 854,067 | 812,986 | 897,089 | 850,104 |
| අතිකාල | රු: | 306,126 | 218,806 | 129,872 | 295,471 | 264,840 |
| එකතුව | රු: | 1,208,816 | 1,072,873 | 942,858 | 1,192,561 | 1,114,945 |
| සාමාන්‍ය මාසික | | | | | | |
| වැටුප්, වේතන දීමනා හා පාරිතෝෂිත | රු: | 75,224 | 71,172 | 67,749 | 74,757 | 70,842 |
| අතිකාල | රු: | 25,511 | 18,234 | 10,823 | 24,623 | 22,070 |
| එකතුව | රු: | 100,735 | 89,406 | 78,572 | 99,380 | 92,912 |

**සටහන**

මුළුතැන්ගෙවල් සේවකයින්ගේ වේතන වැටුප් හා දීමනා සහ අතිකාල පහත පරිදි වේ.

| | 2011 | 2010 |
|---|---|---|
| වැටුප් වේතන හා දීමනා (රු: මිලියන) | 122.32 | 137.59 |
| අතිකාල (රු: මිලියන) | 68.89 | 74.71 |
| | **191.20** | **212.30** |

| විස්තරය | 2011<br>රු: මිලි. | 2010<br>රු: මිලි. | 2009<br>රු: මිලි. | 2008<br>රු: මිලි. | 2007<br>රු: මිලි. | 2006<br>රු: මිලි. | 2005<br>රු: මිලි. | 2004<br>රු: මිලි. | 2003<br>යළි ප්‍රකාශිත<br>රු: මිලි. | 2002<br>රු: මිලි. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රකාශනය** | | | | | | | | | | |
| **මුළු ආදායම** | **31,250** | **28,279** | **23,331** | **25,142** | **25,913** | **23,004** | **20,550** | **17,861** | **16,356** | **15,667** |
| **ශුද්ධ ආදායම** | **31,250** | **28,279** | **23,331** | **25,142** | **25,913** | **23,004** | **20,550** | **17,861** | **16,356** | **15,667** |
| **මෙහෙ. අලුත්වැඩියා හා නඩත්තු සහ පරිපාලන වියදම්** | **(22,959)** | **(23,892)** | **(21,390)** | **(22,201)** | **(22,415)** | **(17,101)** | **(13,183)** | **(11,111)** | **(10,149)** | **(11,736)** |
| **මෙහෙයුම් ලාභ** | **8,292** | **4,387** | **1,942** | **2,941** | **3,498** | **5,903** | **7,367** | **6,750** | **6,207** | **3,931** |
| **අගය කර විකිණීම තුළින් ලත් ආදායම** | - | - | - | - | **7** | - | - | - | - | - |
| විදේශ ණය මත පොලිය | (1,372) | (1,225) | (1,159) | (1,211) | (1,147) | (1,116) | (1,186) | (1,356) | (1,111) | (1,134) |
| **විදේශ විනිමය උච්චාවචනයට පෙර ලාභය** | **6,920** | **3,162** | **782** | **1,729** | **2,357** | **4,787** | **6,181** | **5,394** | **5,096** | **2,797** |
| විදේශ විනිමය උච්චාවචනය | (3,543) | (4,410) | 591 | (11,791) | (3,945) | (1,168) | 7,059 | (5,666) | (4,766) | - |
| **විදේශ විනිමය උච්චාවචනයට පසු ලාභය** | **3,377** | **(1,248)** | **1,373** | **(10,062)** | **(1,588)** | **3,619** | **13,239** | **(272)** | 330 | - |
| ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ වියදම | (2,595) | - | - | - | - | | - | (1) | (2,524) | - |
| **බදුවලට පෙර ශුද්ධ ලාභය** | **782** | **(1,248)** | **1,373** | **(10,062)** | **(1,588)** | **3,619** | **13,239** | **(273)** | **(2,193)** | - |
| අඩුකළා : ආදායම්, සැළකී ලාභාංශ බද්ධ හා අධිභාර | (200) | (159) | (510) | (508) | (1,063) | (3,253) | (3,051) | (2,701) | - | (1,814) |
| විලම්භිත බදු | 0 | 343 | 1250 | | | | | | | |
| **බදු වලට පසු ශුද්ධ ලාභය** | **583** | **(1,065)** | **2,114** | **(10,570)** | **(2,651)** | **366** | **10,189** | **(2,973)** | **(2,193)** | **983** |
| **විශේෂ බද්ද** | - | - | - | - | **(115)** | **(115)** | **(115)** | **(95)** | - | - |
| | **583** | **(1,065)** | **2,114** | **(10,570)** | **(2,766)** | **251** | **10,074** | **(3,068)** | **(2,193)** | **983** |
| සුනාමි ව්‍යාවසනයෙන් හානි වු වත්කම් සඳහා ප්‍රතිපාදන | - | - | - | - | - | - | (2) | **(162)** | - | - |
| **අති විශේෂ අයිතමයන්ට සහ බදුවලින් පසු ශුද්ධ ලාභය** | **583** | **(1,065)** | **2,114** | **(10,570)** | **(2,766)** | **251** | **10,072** | (3,230) | (2,193) | - |
| **පෙර වසරට අදාළ ගැළපුම්** | **(1,173)** | **982** | **140** | **145** | **(4,755)** | | - | - | **(3)** | **(2)** |
| පෙර වාර්තා කළ පරිදි ආරම්භක රඳවාගත් ලාභය | (15,167) | (15,412) | (17,678) | (7,270) | - | | - | - | (1,766) | (2,747) |
| **මූලික වැරදි නිවැරදි කිරීම්**<br>(අයකරගත් විශේෂ බද්ද) | - | - | - | - | - | | - | - | 2,361 | - |
| ඉවත් කළ වත්කම් මත නැවත තක්සේරු කළ සංචිත ගණනය කිරීම | 52 | 328 | 11 | 17 | - | - | - | - | - | - |
| **යළි සඳහන් කොට ඇති පරිදි ආරම්භක රඳවාගත් ඉපැයීම** | **(15,116)** | **(15,084)** | **(17,667)** | **(7,253)** | - | - | - | **(3,416)** | **595** | - |
| **වසරේ ශුද්ධ ලාභය** | **(591)** | **(83)** | **2,254** | **(10,425)** | **(7,520)** | **251** | **10,072** | **(3,230)** | (2,196) | 981 |
| **ඉදිරියට ගෙන ආ සමුච්ත ලාභය** | **(15,116)** | **(15,084)** | **(17,667)** | **(7,253)** | **251** | - | **(6,646)** | - | - | - |
| **රඳවාගත් ලාභය/පාඩුව** | **(15,706)** | **(15,167)** | **(15,412)** | **(17,678)** | **(7,270)** | **251** | **3,426** | **(6,646)** | **(1,601)** | **(1,766)** |
| **ණය නිදහස් කිරීමේ සංචිතයට මාරු කළ මුදල** | - | - | - | - | - | | **(3,426)** | - | (1,815) | - |
| **ඉදිරියට ගෙන යන ලාභය/පාඩුව** | **(15,706)** | **(15,167)** | **(15,412)** | **(17,678)** | **(7,270)** | **251** | - | **(6,646)** | **(3,416)** | **(1,766)** |

| විස්තරය | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 | 2005 | 2004 | 2003 යළි ප්‍රකාශිත | 2002 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ශේෂ පත්‍රය** | | | | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | **202,807** | **180,094** | **142,962** | **124,752** | **122,651** | **126,064** | **42,920** | **44,420** | 43,354 | 44,497 |
| **ආයෝජන** | **6,155** | **5,740** | **5,256** | **5,135** | **4,480** | **3,849** | **3,190** | **3,750** | 2,415 | 2,260 |
| **උප එකතුව** | **208,963** | **185,834** | **148,218** | **129,887** | **127,131** | **129,914** | **46,110** | **48,170** | **45,769** | **46,757** |
| **විලම්භිත ආදායම/විදේශ විනිමය උච්චාවචනය** | - | - | - | - | - | | - | - | - | 9,590 |
| **ප්‍රතිපාදන , ජංගම නොවන මුළු වත්කම්** | **208,963** | **185,834** | **148,218** | **129,887** | **127,131** | **129,914** | **46,110** | **48,170** | **45,769** | **56,347** |
| **ජංගම වත්කම්** | **13,564** | **17,371** | **23,514** | **18,371** | **18,586** | **18,192** | **17,690** | **14,347** | 13,659 | 22,470 |
| **ජංගම වගකීම්** | **(14,721)** | **(12,914)** | **(14,574)** | **(12,345)** | **(11,273)** | **(10,723)** | **(11,365)** | **(10,776)** | (8,730) | (9,729) |
| **කාරක ප්‍රාග්ධනය** | **(1,157)** | **4,457** | **8,940** | **6,025** | **7,313** | **7,469** | **6,324** | **3,571** | 4,929 | 12,741 |
| | **207,806** | **190,291** | **157,158** | **135,913** | **134,444** | **137,383** | **52,434** | **51,741** | **50,698** | **69,088** |
| **යෙදවූ ප්‍රාග්ධනය** | **7,591** | **7,591** | **7,591** | **7,591** | **7,591** | **7,591** | **7,591** | **7,591** | 7,591 | 7,591 |
| **සංචිත හා ප්‍රතිපාදන** | **95,032** | **93,962** | **91,026** | **78,865** | **77,765** | **90,996** | **4,573** | **1,223** | 517 | 20,080 |
| **ලාභ/අලාභ රඳවා තබාගත් ලාභ** | **(15,706)** | **(15,167)** | **(15,412)** | **(17,678)** | **(7,270)** | **251** | **-** | **(6,646)** | (3,416) | (1,766) |
| **ජංගම නොවන වගකීම්** | **120,888** | **103,903** | **84,261** | **67,134** | **56,357** | **38,545** | **40,270** | **49,574** | 46,006 | 43,183 |
| | **207,805** | **190,290** | **157,158** | **135,913** | **134,443** | **137,383** | **52,434** | **51,741** | **50,698** | **69,088** |
| **මෙහෙයුම් සහ මූල්‍ය වැදගත් අවස්ථා** | | | | | | | | | | |
| **පැමිණි නැව් සංඛ්‍යාව** | **5,153** | **4,657** | **5,162** | **5,430** | **5,366** | **5,117** | **5,092** | **4,932** | **4,976** | **4,789** |
| **ධාරිතාවය** | | | | | | | | | | |
| ප්‍රතිනැව්ගත කිරීම | 3,216,001 | 3,205,197 | 2,712,305 | 2,874,067 | 2,578,166 | 2,330,189 | 1,716,045 | 1,531,103 | 1,370,119 | 1,197,277 |
| දේශීය බහළු | 1,046,886 | 932,244 | 751,992 | 813,271 | 803,076 | 748,896 | 739,252 | 689,422 | 589,217 | 567,417 |
| **මුළු වි.ස. ඒ.** | **4,262,887** | **4,137,441** | **3,464,297** | **3,687,338** | **3,381,242** | **3,079,085** | **2,455,297** | **2,220,525** | **1,959,336** | **1,764,694** |
| **බහළු වි.ස.ඒ.(එස් ඒ ජී ටී හැර)** | **2,299,446** | **2,167,173** | **1,714,488** | **1,960,898** | **1,834,734** | **1,743,669** | **1,523,794** | **1,320,845** | **1,334,900** | **1,206,694** |
| සාම්ප්‍රදායික මෙ.ටො. | **6,265,388** | **5,463,238** | **4,984,390** | **5,863,920** | 5,977,546 | 6,286,583 | 5,893,669 | 5,150,067 | 5,295,937 | 4,959,561 |
| දියර මෙ.ටො. | **4,678,404** | **4,349,830** | **4,192,148** | **4,228,839** | 4,432,070 | 4,427,376 | 4,062,599 | 4,270,425 | 3,639,726 | 3,943,602 |
| **එකතුව** | **10,943,792** | **9,813,068** | **9,176,538** | **10,092,759** | **10,409,616** | **10,713,959** | **9,956,268** | **9,420,492** | **8,935,663** | **8,903,163** |
| **සේවක මණ්ඩල** | | | | | | | | | | |
| සේවක සංඛ්‍යාව | 10,982 | 12,824 | 13,367 | 13,658 | 12,824 | 13,691 | 13,527 | 13,233 | 13,443 | 17,909 |
| විදේශ විනිමය ඉපැයීම් (රු: මිලියන) | 22,749 | 20,858 | 16,897 | 17,921 | 18,216 | 16,198 | 14,986 | 12,806 | 11,791 | 11,218 |
| **නැව්බඩු ටොන් ඒකකයකට** | | | | | | | | | | |
| මෙහෙයුම් හා වෙනත් ආදායම | 800 | 780 | 786 | 749 | 814 | 746 | 743 | 526 | 536 | 552 |
| මෙහෙයුම් හා වෙනත් වියදම් | (623) | (693) | (760) | (698) | (740) | (591) | (520) | 537 | 525 | 454 |
| ටොන් ඒකකයකට ශුද්ධ ලාභය | 177 | 87 | 26 | 52 | 74 | 155 | 223 | (11) | 11 | 99 |
| **වැටුප් මත වියදම්** | 12,907 | 14,088 | 12,592 | 13,388 | 14,013 | 8,936 | 6,503 | **5,426** | **4,825** | **5,695** |
| වැටුප් පත/මුළු වියදම | 53% | 56% | 56% | 57% | 59% | 49% | 45% | 30% | 38% | 44% |
| වැටුප් පත/මුළු ආදායම | 41% | 50% | 54% | 53% | 54% | 39% | 32% | 30% | 29% | 36% |

| | | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 | 2005 | 2004 | 2003* | 2002 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | යළි ප්‍රකාශිත | |
| <u>ලාභත්ව අනුපාතයන්</u> | | | | | | | | | | | |
| ආදායමට මෙහෙයුම් ලාභ | % | 26.53 | 15.51 | 8.32 | 11.70 | 13.50 | 25.66 | 35.84 | 37.79 | 37.95 | 25.09 |
| බදුවලට පෙර ශුද්ධ ලාභය හා විදේශ විනිමය ලාභය/(පාඩුව) | % | 22.14 | 11.18 | 3.35 | 6.88 | 9.07 | 20.81 | 30.07 | 30.19 | 15.73 | 24.86 |
| බදුවලට පසු ආදායමට ශුද්ධ ලාභය | % | 1.86 | (3.76) | 9.06 | (42.04) | (10.67) | 1.09 | 49.01 | (17.18) | (13.41) | (29.09) |
| වාර්ෂික ආදායම වර්ධනය | % | 10.51 | 21.21 | (7.20) | (2.97) | 12.65 | 11.94 | 15.05 | 9.20 | 4.40 | (4.40) |
| ප්‍රාග්ධන යෙදවුම් මත ලාභය | % | 3.99 | 2.31 | 1.24 | 2.16 | 2.60 | 4.29 | 14.05 | 13.05 | 12.24 | 5.69 |
| ණයගැති ස්කන්ධගත අනුපාත | | 1.34 | 1.16 | 0.91 | 0.60 | 0.41 | 0.39 | 3.31 | 22.87 | 9.8 | 1.67 |
| <u>ද්‍රවශීලී අනුපාතයන්</u> | | | | | | | | | | | |
| වත්මන් අනුපාතය | වාර ගණ | 0.9 | 1.3 | 1.6 | 1.5 | 1.3 | 1.7 | 1.5 | 1.4 | 1.6 | 2.3 |
| ක්ෂණික අනුපාතය | වාර ගණ | 0.8 | 1.1 | 1.4 | 1.3 | 1.5 | 1.6 | 1.4 | 1.3 | 1.4 | 2.2 |
| පොලී ආවරණ | වාර ගණ | 6.0 | 3.6 | 1.7 | 2.4 | 3.0 | 5.3 | 6.2 | 5.0 | 3.3 | 4.4 |
| <u>ඵලදායීතා අනුපාතයන්</u> | | | | | | | | | | | |
| විස්සේ සම ඒකකයකට මුළු ආදායම | රු: | 13,590 | 13,049 | 13,608 | 12,822 | 16,756 | 17,226 | 13,486 | 13,522 | 12,253 | 12,983 |
| විස්සේ සම ඒකකයකට මෙහෙයුම් වියදම | රු: | 6,909 | 7,633 | 8,787 | 8,124 | 10,065 | 8,871 | 5,762 | 4,877 | 5,288 | 6,012 |
| විස්සේ සම ඒකකයකට මුළු වියදම | රු: | 12,122 | 13,625 | 12,807 | 17,953 | 17,861 | 13,727 | 9,507 | 13,923 | 12,005 | 15,257 |
| ටොන් ඒකකයකට මුළු ආදායම | රු: | 800 | 780 | 786 | 749 | 814 | 746 | 743 | 727 | 687 | 700 |
| ටොන් ඒකකයකට මෙහෙයුම් වියදම | රු: | 407 | 456 | 508 | 475 | 489 | 384 | 317 | 262 | 297 | 324 |
| ටොන් ඒකකයකට මුළු වියදම | රු: | 714 | 815 | 740 | 1,049 | 868 | 633 | 624 | 748 | 673 | 822 |
| බදුවලට සහ විදේශ විනිමය ලාභය/පාඩුවට පෙර ශුද්ධ ලාභය | රු: | 177 | 87 | 26 | 52 | 74 | 155 | 223 | 219 | 108 | 174 |
| සේවකයෙකුට අනුව නැව්බඩු මෙහෙයුම් | ටොන් | 3,556 | 2,826 | 2,221 | 2,456 | 2,329 | 2,256 | 2,045 | 1,858 | 1,771 | 1,250 |
| රුපියල් මිලියනයක ස්ථාවර වත්කම් අනුව නැව් බඩු මෙහෙයුම් | ටොන් | 5,145 | 4,775 | 3,910 | 4,419 | 4,192 | 4,060 | 3,644 | 3,238 | 3,136 | 2,949 |
| රුජියල් මිලියනයක ස්ථාවර වත්කම් අනුව නැව් බඩු මෙහෙයුම් | ටොන් | 188 | 190 | 189 | 247 | 237 | 224 | 528 | 475 | 470 | 324 |
| සේවකයෙකුට අනුව ටොන් ප්‍රමාණය | ටොන් | 3,556 | 2,826 | 2,221 | 2,456 | 2,329 | 2,256 | 2,045 | 1,858 | 1,771 | 1,250 |
| සේවකයින් අනුව විස්සේ සම ඒකකයකට සේවකයි | වි.ස.ඒ. | 209 | 169 | 128 | 144 | 113 | 128 | 113 | 100 | 99 | 67 |

එස් ඒ ජී ටී ටොන් ප්‍රමාණයන් ඉහත අනුපාතයන් හැර වේ.

මුළු ආදායමට මෙහෙයුම් ආදායම සහ වෙනත් ආදායම් ඇතුළත් වේ.

ගිණුම් ප්‍රතිපත්ති : මූල්‍ය ප්‍රකාශ සකස් කොට ඉදිරිපත් කිරීම සඳහා ව්‍යවසායකයන් විසින් අනුගමනය කරනු ලබන නිශ්චිත මූලධර්ම, පදනම් සම්ප්‍රදායන්, රීති හා පිළිවෙත් වේ.

**උපචිත පදනම :** ආදායම එකතු කර ගත් විට නොව ඉපයූ විට පිළිගන්නා ගිණුම්කරණ පිළිවෙතකි. එසේම වියහියදම් ද ගෙවූ විට නොව දැරූ විට පිළිගන්නා ක්‍රමයකි.

**වත්කම් :** ව්‍යාපාරයක් සතු ආර්ථික සම්පත්

**බොල් ණය :** එකතු කර ගත නොහැකි යැයි සැලකෙන ගිණුමක හෝ ණය මුදලක හෝ ලැබිය යුතු මුදලක මුළු ප්‍රමාණය හෝ කොටසක්

**යොදවන ලද ප්‍රාග්ධනය :** මුළු වත්කම්, කෙටිකාලීන බැරකම් හා වෙනත් ප්‍රතිපාදන

**මුදල් පදනම :** ආදායම් හා වියදම් ඒවා ලැබූ විට හා ගෙවූ විට වාර්තාගතකරණ පොත් තැබීමේ ක්‍රමය

**මුදල් සහ මුදල් සමක :** පිළිගත් මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් ම හැරවිය හැකි සහ වටිනාක වෙනස් වීමේ නොසැලකිය යුතු අවධානමකට යටත් කෙටි කාලීන අධි ද්‍රවශීලී ආයෝජන

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ :** මව් සමාගමේ සහ එහි අනු සමාගම් එකක හෝ කිහිපයක ඒකාබද්ද මූල්‍ය ප්‍රකාශ එක් ආර්ථික ඒකකයක් වශයෙන් සැලකීම

**ජංගම වත්කම් :** තනි මෙහෙයුම් චක්‍රයක් ඇතුළත හෝ එක් එක් වර්ෂයේ එක් චක්‍රයකට වඩා නිමවූ විට වර්ෂයක් ඇතුළත මුදල් වලට හැරවිය හැකි යැයි හෝ විකිණිය හැකි යැයි හෝ පරිභෝජනය කළ හැකි යැයි හෝ සාධාරණව අපේක්ෂා කළ හැකි වත්කම්

**ජංගම බැරකම් :** ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කොට ඇති පවත්නා සම්පත් උපයෝගී කර ගැනීමේදී හෝ අනෙකුත් ජංගම වගකීම් ඇතිවීමේදී අවශ්‍ය කෙරෙන බැඳීම.

**ජංගම අනුපාත :** ජංගම වත්කම් ජංගම බැරකම්වලින් බෙදීමෙන් ද්‍රවශීලීතාවය මැනීම සඳහා උපයෝගී කරගන්නා අනුපාතයකි.

**විලම්භිත බදු :** පුණරීක්ෂණයට භාජිත කාලසීමාව හැර වෙනත් කාලසීමාවක් තුළ බදු මුදල්වල සහ ගිණුම් මූලධර්මය අතර කාලසීමා හෝ මිණුම් වෙනස්වීම නිසා ගෙවීමට සිදුවන්නා වූ බදු සඳහා වරාය අධිකාරියේ ගිණුම්වලට වෙන් කොට ඇති මුදල

**අතිවිශේෂ අයිතමයක් :** අසාමාන්‍ය ස්වභාවය සහ ඉඳහිට ඇතිවීම අනුව විශේෂිත වූ සිද්ධීන් සහ ගණුදෙනුවේ අතිවිශේෂ අයිතමයන් අදාළ ආදායම් බදු ප්‍රමාණය අඩුකොට ආයතනයේ ආදායම් හෝ මෙහෙයුම් ප්‍රකාශයේ වෙන වෙන්ම දක්වා ඇත.

**ස්කන්ධ ක්‍රමය :** මව් සමාගමට අනුයුක්ත කොට ඇති ආයෝජක සමාගමේ ශුද්ධ වත්කම් කොටස් වෙනස්වීම් වලට අනුරූප වන අයුරින් සෑම ශේෂ පත්‍ර දිනකම ආයෝජනය නවීකරණය කරනු ලබන ගිණුම් ක්‍රමයකි.

**නියම කොට තිබෙන මිළ (මුහුණත අංගය) :** බැඳුම්කරයක් හෝ නොට්ටුවක් කල් පිරිමේදී ලැබිය යුතු මුදල

විදේශ විනිමය ලාභය/පාඩුව : අත්පිට අනුපාතයේ සහ ස්ථාවර අනුපාතයේ වෙනස විනිමය ලාභය/පාඩුව වශයෙන් සළකනු ලැබේ.

විදේශ විනිමයක් අගය කළ කිසියම් වත්කමක් හෝ වගකීමක් ශේෂ පත්‍රයේ සඳහන් දිනට ශ්‍රී ලංකා රුපියල් වල පරිවර්ථනය කිරීමේදී උපලබ්ධි වන ලාභය හෝ පාඩුව

**ආදායම් ප්‍රකාශය :** එක්තරා කාලසීමාවක ආදායම් වල සහ වියදම් වල ප්‍රතිඵලයෙහි සාරාංශය

**කල් බද්ද :** බද්ද යනු ගිවිසගත් කාලසීමාවක් සඳහා යම් දේපළක් පාවිච්චි කිරීමේ හිමිකම ලබා දීමේදී බදුකරු විසින් බදු හිමියාට ගෙවනු ලබන ගෙවීමක් හෝ ගෙවීම් කිහිපයක් සඳහා නිකුත් කරනු ලබන ගිවිසුම් පතකි.

**දිගුකාලීන බැරකම් :** පොලී අදාළ සියළුම ණය මුදල්

**පූර්ව ගෙවීම් :** කලින් ගෙවන ලද මුදල් ගිණුම්ගත කිරීම සඳහා ඇති කරනු ලබන ගිණුම හෝ ගිණුම් (උදා : වත්මන් වර්ෂයට කොටසකුත් ඊළඟ වර්ෂයට ඉතිරියත් අදාළ වන රක්ෂණ වාරිකය)

**ප්‍රතිපාදන :** අපේක්ෂිත අනාගත ගෙවිම් ගිණුම්ගත කිරීම සඳහා ඇති කරනු ලබන ගිණුම හෝ ගිණුම් (ව්‍යාපාරයක් සඳහා බිල්පතක් අපේක්ෂිත එහෙත් මෙතෙක් නොලැබුණු)

**සම්බන්ධිත පාර්ශව :** ව්‍යාපාරයේ මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කළ හැකි හෝ ඒවාට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි පාර්ශවකරුවන් වේ.

**යළි මිලයට ගැනීමේ ගිවිසුම (රිපෝස්) :** විකිණුම්කරු විසින් එක්තරා කාලසීමාවක් තුළදී එක්තරා මිලකට යළි මිලයට ගන්නා බවට වූ නියමයන් යටතේ ආයතනයක් විසින් කොටස් මිලයට ගන්නා වූ ගිවිසුමකි.

**සංචිතය :** වියහිදයම් සඳහා ලබා ගත නොහැකි බව පෙන්නුම් කෙරෙන ස්කන්ධ හෝ අරමුදල් ශේෂයේ කොටසක් වෙන් කර දැක්වීමේ වෙන් කර දැක්වීමේ ගිණුම්

**බද්දට යටත් ආදායම :** අනුමත නිදහස් කිරීම් සහ අඩුකිරීම් වලින් පසුව බදු වර්ෂය තුළ බදු ගෙවන්නකුගේ ගැළපුම් ගත මුළු ආදායම සාමාන්‍යයෙන් බද්දට යටත් ආදායමට සමාන වේ.

**එකතු කළ ආදායම :** ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කටයුතු වලින් උත්පාදනය වන ධනස්කන්ධයේ ප්‍රමාණය වේ.

**කාරක ප්‍රාග්ධනය (ශුද්ධ ප්‍රවර්තන වත්කම්) :** ජංගම බැරකම්වලට වැඩියෙන් වූ ජංගම වත්කම් වශයෙන් ගණන් බලනු ලබන එදිනෙදා මෙහෙයුම්වලට අවශ්‍ය මූලධනය වේ.

**දැනට කර ගෙන යන කාර්යයන් :** නිම කිරීමට සහ නිමකළ වට්ටෝරු ලේඛණයට මාරු කිරීමට අපේක්ෂිත කොටසක් නිම කළ භාණ්ඩ ඇතුළත් වට්ටෝරු ලේඛණ වේ.

ටීසී/බී/එස්එල්පීඒ/එෆ්ඒ/2011 2013 ජනවාරි 08 දින

**සභාපති**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**
---------------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 33 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරික්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරනයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි සහ අභ්‍යන්තර පාලනය තිරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර් වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැළසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳවමතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූලය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 09 ප්‍රකාර මුදල් ප්‍රවාහ ප්‍රකාශය කිරීමේදී පාරිතෝෂික වෙන් කිරීම් මූල්‍ය නොවන ගණුදෙනුවක් වශයෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ ලාභ/අලාභයට ගැලපීම් කළ යුතු අතර තථ්‍ය පාරිතෝෂික ගෙවීම් මෙහෙයුම් ක්‍රියාකාරීම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයෙන් අඩුකර පෙන්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 10 ප්‍රකාර රු. 1,173,151,560 ක් වූ ඉකුත් වර්ෂ ගණුදෙනු සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව කපා හැරීමට හෝ/සහ අතීතයානුයෝගී ව්‍යවහාරය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශනවල ගලපා දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 ප්‍රකාර ගිණුම් කාල පරිච්ඡේදයට සකස් කළ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන දිනය අනාවරණය කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 14 ප්‍රකාර විලම්භිත බදු බැරකම ජංගම නොවන වගකීම යටතේ දැක්විය යුතු වුවද එම බැරකම සංචිත හා වෙන්කිරීම් යටතේ දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අධිකාරියේ ආශ්‍රිත සමාගමක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවන ලද රු. 2,054,052 ක් වූ වරිපනම් ගාස්තුව ආදායමට එරෙහිව කපා හැර තිබුණි.

(ආ) රක්ෂිත වටිනාකම රු. 597,854,000 ක් වූ මෙහෙයුම් ගොඩනැගිලි සහ රු. 1,646,000 ක් වූ විදුලි හා විද්‍යුත් උපකරණ පෞද්ගලික සේවා සමාගමක් විසින් 2008 ජුලි මාසයේ සිට අධිකාරියට පවරා තිබුණ ද 2008 සිට 2010 දක්වා වූ

වර්ෂ තුළ ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේදී ගිණුම් ගත කර තිබුණි. කෙසේ වෙතත් එම වත්කම් පිළිගත් තක්සේරුකරුවකු විසින් සිදුකල ප්‍රත්‍යාගණන වටිනාකමට නොව රක්ෂිත වටිනාකම පදනම් කර ගෙන ගිනුම්ගත කර තිබුණි.

(ඇ) අධිකාරියට අයත් නොවන ප්‍රත්‍යාගණන වටිනාකම රු. මිලියන 700 ක් වූ ඉඩම් කැබලි 2 ක් වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

2011 දෙසැම්බර් 31 දිනට අධිකාරියට ලැබිය යුතු ලෙස සහ ගෙවිය යුතු ලෙස ගිණුම්වල පැවති ශේෂයන් පිළිවෙලින් රු. 2,554,985,069 ක් සහ රු. 6,392,540,290 කි. ඒ පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නැව් නියෝජිත ආයතනවලින් 2011 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 1,356,456,543 ක් වූ ලැබිය යුතු ශේෂය සහ එකතුව රු.653,061,825ක් වූ ගෙවිය යුතු ශේෂය ගැලපීමෙන් පසු ශුද්ධ ශේෂය ලෙස රු. 703,394,718 ක් දක්වා තිබුණි. කෙසේ වෙතත් මෙම ශේෂ තුල වර්ෂයකට වඩා පැරණි හිඟ හිටි ශේෂය රු. 315,949,594 ක් වූ අතර වර්ෂ 5 කට වඩා හිඟ හිටි ශේෂය රු.9,354,510 ක් විය.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට වෙළඳ නොවන ණයගැතියන් යටතේ දැක්වෙන අධිකාරිය විසින් දේපළ හා සුභ සාධන ආපන ශාලා පවත්වා ගෙන යාම සඳහා ලබාදුන් පරිශ්‍රවල විදුලිය පරිභෝජනය වෙනුවෙන් අයවිය යුතු රු. 74,642,387 ක් හා පරිශ්‍ර කුළියට හා බද්දට දීම වෙනුවෙන් අයවිය යුතු රු. 40,657,163 ක් වූ ශේෂ තුළ පිළිවෙලින් රු. 1,790,016 ක් හා රු. 36,069,403 ක් වර්ෂ 05 කට වඩා වැඩි පැරණි ශේෂයන් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේදී අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කළ යුතුව තිබුණු වියදමින් රු. 1,477,418 ක් වර්ෂ 5ට වැඩි කාලයක සිට අයවිය යුතුව තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| විෂය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් | 693,925,000 | බදුකුළි ලැබීම් හා ප්‍රයෝජනයට ගැනීම් විස්තර |
| ජංගම වත්කම් | 1,928,430,391 | ශේෂ සනාථ කිරීම් |
| ජංගම වගකීම් | 643,220,982 | - එම - |
| නාවික ගොඩබෑම් සහ වාප්පු මෙහෙයුම් මත දඩ මුදල් සහ අධිභාර අයකිරීම | 17,123,199 | විස්තරාත්මක උපලේඛණ |

### 2.2.5 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරුණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1992 අංක 2 දරණ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත මඟින් සංශෝධනය කරන ලද 1979 අංක 51 දරණ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 6 (එ) උප වගන්තිය | එක් එක් වරාය ස්වයංපෝෂිත ව්‍යවසායක් ලෙස පවත්වා ගෙන යායුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ ත්‍රිකුණාමලය හා ගාල්ල වරායයන් පිළිවෙලින් රු.317,963,323ක් හා රු.147,239,519ක් වශයෙන් බදුවලට පෙර පාඩු ලබා තිබුණි. |
| (ආ) | 2000 අංක 38 දරණ දේශීය ආදායම් පනතේ III (අ) වගන්තිය | 2010 හා 2011 වර්ෂවලදිත් පිළිවෙලින් රු. 514,567,075ක් හා රු.323,656,476ක් වු උපයන විට බදු සේවකයන්ගෙන් අයකරනු වෙනුවට අදිකාරියේ අරමුදලින් ගෙවා තිබුණි. |

### 2.2.6 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

නාගරික සංවර්ධන අධිකාරිය සතු ගාලු මුවදොර පිටියේ හරිත සංවර්ධන ව්‍යාපෘතිය නඩත්තු කිරීම වෘත්තිය සමිතියකට සම්බන්ධිත පෞද්ගලික සමාගමකට පවත්වා ගෙන යාමට අවකාශය සලසා දී තිබුණි.

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

(i) අදාළ සමාගම විසින් අධිකාරියේ නිල ලාංඡනය භාවිතා කරමින් ටිකට්පත් මුද්‍රණය කර ගාලු මුවදොර පිටියේ කඩකාමර වලින් කුලී, වාහන නැවතීමේ ගාස්තු හා විවිධ උත්සව සඳහා පිටිය ලබාදීමෙන් නිත්‍යානුකූල වූ බලයකින් තොරව හා අවිධිමත් ලෙස 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.මිලියන 70 ක ආදායම් එකතු කර තිබුණි. කෙසේ වෙතත් මෙම අදායම් ඔවුන් විසින් ගාලු මුවදොර පිටියේ කිසිදු නඩත්තු කටයුත්තක් සඳහා වැය කර නොතිබුණි.

(ii) අධිකාරියට අයත් සේරුවාවිල 2 යාත්‍රාව අධිකාරියේ නිලධාරින් යොදවා ත්‍රිකුණාමල වරායේ මගී ප්‍රවාහන කටයුතු සඳහා යොදවා තිබුණි. එමඟින් උපයන ලද ආදායම දළ වශයෙන් රු. මිලියනයකට අධික වුවත් එම ආදායම ඉහත සමාගමට ලබා ගැනීම සඳහා ඉඩ දී තිබුණි.

(iii) අධිකාරියේ නිසි අවසරයකින් හා අනුදැනුමකින් තොරව ඉහත සමාගම කොළඹ වරායේ සහ අධිකාරිය නඩත්තු කටයුතු කරන ගාලු මුවදොර භූමියේ පිහිටි වෙළඳ සැලවල සිසිල් බීම අලෙවි කිරීමේ ඒකාධිකාරී අයිතිය පුද්ගලික සමාගමකට ගිවිසුමක් මඟින් පවරා ඉන් රු. මිලියන 5.5 ක මුදලක් ලබා ගෙන තිබුණි.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 8,291.833ක ලාභයක් වූ අතර එය රු. මිලියන 31,250.474ක් වූ වර්ෂයේ මුළු පිරිවැටුමෙන් 26.53% ක් විය. එයට අනුරූපී ඉකුත් වර්ෂය සඳහා වූ රු. මිලියන 4,386.849ක මෙහෙයුම් ලාභය රු. මිලියන 28,279.239ක් වූ එම වර්ෂයේ මුළු පිරිවැටුමෙන් 15.51% ක් විය. මේ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 3,904.984 කින් හෙවත් 89.02% කින් වර්ධනය වී තිබුණි.

කෙසේ වෙතත්, මෙම වාර්තාවේ 2.2.1 (ආ) ඡේදයෙන් දැක්වෙන්නා වූ ගැලපීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට ගලපා තිබුණේ නම් රු.මිලියන 8,291.833ක් වූ ලාභය රු.මිලියන 7,118.681ක් දක්වා අඩුවිය හැකිව තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචිතය

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙකක් සඳහා සංඛ්‍යාත්මක තොරතුරු පහත දක්වා ඇත.

| | වර්ෂය | | |
|---|---|---|---|
| | **2011** | **2010** | **2009** |
| මුළු ආදායම (රු.මිලියන) | 31,250 | 28,279 | 23,331 |
| මුළු වියදම (රු.මිලියන) | 26,926 | 25,118 | 22,549 |
| බදුවලට පෙර ශුද්ධ ලාභය /(පාඩුව) (රු.මිලියන) | 782 | (1,248) | 1,373 |
| බදුවලට පසු ශුද්ධ ලාභය /(පාඩුව) (රු.මිලියන) | 583 | (1,065) | 2,114 |
| භාණ්ඩ හැසිරවීම (මෙට්‍රික් ටොන්) | 39,055,978 | 36,246,744 | 29,685,685 |
| මෙට්‍රික් ටොන් එකකට ශුද්ධ ලාභය/(රු.) | 177 | 87 | 26 |
| සේවක සංඛ්‍යාව | 10,982 | 12,824 | 13,667 |

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 2 ක් සසඳා අනුපාත විශ්ලේෂණය පහත දක්වා ඇත.

| | වර්ෂය | | |
|---|---|---|---|
| | **2011** | **2010** | **2009** |
| පිරිවැටුමට මෙහෙයුම් ලාභය | 26.53% | 15.51% | 8.32% |
| පිරිවැටුමට සේවක මන්ඩල පිරිවැය | 41.30% | 49.81% | 53.97% |
| ජංගම අනුපාතය | 0.92:1 | 1.33:1 | 1.61:1 |
| ක්ෂණික අනුපාතය | 0.78:1 | 1.13:1 | 1.41:1 |
| ණය ස්කන්ධ අනුපාතය | 1.41:1 | 1.21:1 | 0.89:1 |

පහත සඳහන් නිරීක්ෂණයන් විය

(i) ජංගම අනුපාතය 2:1 ට ආසන්න මට්ටමක පැවතිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ එම අගය 0.92:1 වැනි අඩු අගයක් ගැනීමෙන් ජංගම වගකීම් පියවීමට තරම් ප්‍රමාණවත් ජංගම වත්කම් අධිකාරිය සතුව නොතිබුණි.

(ii) ක්ෂණික වත්කම් අනුපාතය 1:1 ට ආසන්න මට්ටමක පැවතිය වුවද සමාලෝචිත වර්ෂයේ එම අගය 0.78:1 වැනි අගයක් ගෙන තිබුණි. එමගින් ජංගම වගකීම් පියවීමට ප්‍රමාණවත් ක්ෂණික වත්කම් ප්‍රමාණයක් නොමැති බව නිරීක්ෂණය විය.

(iii) ණය මුදල ඉක්ම වූ ස්කන්ධයක් අධිකාරිය සතුව පැවතිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ණය ස්කන්ධ අනුපාතය 1.14:1 ක් වීමෙන් ස්කන්ධය (හිමිකම) ඉක්ම වූ වගකීමක් දක්නට ලැබුණි. මෙය ආයතනයක යහපත් ලක්ෂණයක් නොවේ.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

විගණනයට ලබාදී තිබූ තොරතුරු අනුව, මෙහෙයුම් කටයුතුවලට අදාළ වූ සංඛ්‍යාලේඛණ හා වාර්තා විශ්ලේෂණය කිරීමේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) කොළඹ වරාය**

**(i) නාවික යාත්‍රා පැමිණීම**

| යාත්‍රා වර්ගය | වර්ෂය 2011 | 2010 | 2009 | විචලනය වාසි/(අවාසි) 2010/11 % | 2009/10 % |
|---|---|---|---|---|---|
| බහළුම් | 3,187 | 3,076 | 3,304 | 3.6 | (6.9) |
| සම්ප්‍රදායික | 68 | 56 | 140 | 21.4 | (60) |
| වෙනත් | 869 | 778 | 670 | 11.7 | 16.1 |
| | **4,124** | **3,910** | **4,114** | **5.5** | **(4.9)** |
| පසුගිය වසරට සාපේක්ෂව සමස්ථ වැඩිවීම/(අඩුවීම) | 214 | (204) | (310) | | |

2009 වර්ෂය හා සැසඳීමේදී 2010 වර්ෂයේදී කොළඹ වරායට නැව් පැමිණීම 204 ක අඩුවීමක් එනම් 5% පිරිහීමක් වූ අතර 2010 වර්ෂය හා සැසඳීමේදී 2011 වර්ෂයේදී නැව් පැමිණීම 214 ක වැඩිවීමක් එනම් 5.5% ක වර්ධනයක් විය.

**(ii) බහළු මෙහෙයුම් (විස්සේ සම ඒකක TEUS)**

| කොළඹ වරාය | වර්ෂය 2011 | 2010 | 2009 | විචලනය වාසි/(අවාසි) 2010/11 % | 2009/10 % |
|---|---|---|---|---|---|
| දේශීය | 1,046,886 | 932,244 | 751,992 | 12.29 | 23.97 |
| ප්‍රතිනැව්ගත කිරීම් හා යළි ඇසිරීම් | 3,216,001 | 3,205,197 | 2,712,305 | 0.34 | 18.17 |
| **එකතුව** | **4,262,887** | **4,137,441** | **3,464,297** | **3.03** | **19.43** |
| ඉකුත් වසරට සාපේක්ෂව සමස්ථ වැඩිවීම | 125,446 | 673,144 | (223,041) | | |
| ඉකුත් වසරට සාපේක්ෂව ප්‍රතිනැව්ගත කිරීම් වැඩිවීම/(අඩුවීම) | 10,804 | 492,892 | (161,762) | | |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2009 වර්ෂය හා සැසඳීමේදී 2010 වර්ෂයේදී කොළඹ වරායේ බහළු මෙහෙයුම් විස්සේ සම ඒකක 673,144 කින් එනම් 19.43% කින් වර්ධනය වී තිබුණු නමුත් 2010 වර්ෂය හා සැසඳීමේදී 2011 වර්ෂයේ දී එය 125,446 කින් එනම් 3.03% ක වර්ධනයක් පමණක් පෙන්වා තිබුණි.

ප්‍රතිනැව්ගත කිරීම් හා යළි ඇසිරීම් මත ගාස්තු අයකිරීමෙන් අධිකාරියට වැඩිම ආදායමක් ලැබී තිබුණි. එබැවින් ප්‍රතිනැව්ගත කිරීම් වැඩි ප්‍රමාණයක් කොළඹ වරාය වෙත ලබා ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිනැව්ගත කිරීම් 0.33% වැනි ඉතාම සුළු ප්‍රමාණයකින් පමණක් වැඩි වී තිබුණි.

2001 වර්ෂයේ සිට 2011 වර්සය දක්වා දස අවුරුදු කාලය තුළ කොළඹ වරාය තුළ අධිකාරිය බහළුම් මෙහෙයවීමේ ධාරිතාවය මුළු බහළුම් හැසිරවීමේ ප්‍රතිශතයක් ලෙස සැලකීමේ දී 81% සිට 54% දක්වා සීඝ්‍ර ලෙස පහත වැටී තිබුණි.

(ආ) **ත්‍රිකුණාමලය වරාය**

2009 වර්ෂය හා සැසඳීමේදී 2010 වර්ෂයේ දී ත්‍රිකුණාමලය වරාය වෙත නාවික යාත්‍රා පැමිණීම යාත්‍රා 201 කින් එනම් 64.84% කින් පිරිහී තිබුණු අතර 2010 වර්ෂය හා සැසඳීමේදී 2011 වර්ෂයේදී එය 17 කින් එනම් 15.59% කින් වර්ධනය වී තිබුණි.

(ඈ) **ගාල්ල වරාය**

2009 වර්ෂය හා සැසඳීමේ දී 2010 වර්ෂයේ ගාලු වරායට යාත්‍රා පැමිණීම යාත්‍රා 16 කින් එනම් 50% කින් වර්ධනය වී තිබුණු අතර 2010 වර්ෂය හා සැසඳීමේදී 2011 වර්ෂයේ දී එය 25 කින් එනම් 52% කින් වර්ධනය වී තිබුණි.

(ඈ) **සියලුම වරායයන් (කොළඹ, ත්‍රිකුණාමලය හා ගාල්ල)**

2009 වසර හා සැසඳීමේදී 2010 වර්ෂයේ දී සියළු වරායයන්හි භාණ්ඩ හැසිරවීම විස්සේ සම ඒකක වර්ධනය 12,461,925 ක් එනම් 25.54% ක් වු අතර 2010 වර්ෂය හා සැසඳීමේදී 2011 වර්ෂයේදී එය 3,813,376 කින් එනම් 6.22% කින් වර්ධනය වී තිබුණි.

(ඉ) **මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය**

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වරාය විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් නැව් 3 ක් ද, නාවික කපිතාන්වරු පුහුණු කිරීම් නැව් 3 ක් ද, වැලිගත කිරීම් නැවක්ද, පොත් ප්‍රදර්ශන නැවක් ද, භාණ්ඩ නැව් 3 ක් සහ යොට් යාත්‍රා 2 ක් වශයෙන් එකතුව නැව් 13 ක් පැමිණ තිබුණි. 2010 නොවැම්බර් මස මෙම වරාය විවෘත කළ අවස්ථාවේ සිට සමාලෝචිත වර්ෂය අවසානය වන විට වසරකට වැඩි කාලයක් ගතව ඇතත් ඉතාම අඩු නැව් ප්‍රමාණයක් මෙම වරායට පැමිණ තිබු බැවින් වරාය වෙත නැව් ගෙන්වා ගැනීම සඳහා සඵලදායී ක්‍රියාමාර්ග කෙරෙහි අධිකාරියේ අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන අතර, වරායේ මෙහෙයුම් කටයුතු කඩිනම් කිරීම සඳහා ග්‍රැන්ට් දොඹකර ඉතා කඩිනමින් සවිකිරීමේ අවශ්‍යතාවය කෙරෙහි ද අවධානය යොමු කෙරේ.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) දොඹකර 02 ක මිලදී ගැනීමේ අත්‍යවශ්‍යතාවය පිළිබඳ නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර 2008 වර්ෂයේදී රු. මිලියන 444 ක් වැය කර ලෙවල් ලෆින් පෝටල් දොඹකර 02 ක් මිල දී ගෙන තිබුණි. වසර 4 කට වඩා වැඩි කාලයක් තිස්සේ මෙම දොඹකර 02 ප්‍රයෝජනයට ගෙන තිබුණේ පැය 50 කටත් වඩා අඩු කාලයකි.

(ආ) අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද තොග කාල විශ්ලේෂණයට අනුව අවුරුදු 5 ඉකුත් වු තොගය රු. 959,252,462 ක් එනම් මුළු තොග වටිනාකමින් 57.45% ක් විය. එහෙයින් අධිකාරියට අයත් වු ගබඩා වල සීමිත ඉඩකඩ ප්‍රමාණය ඵළදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණු අතර තොග පිළිබඳ පාලනය ද දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) ඉඩමේ අයිතිය අධිකාරියට පවරා නොගෙන මාතර ප්‍රදේශයේ ඉඩමක පුහුණු ආයතනයක් ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 8.339 ක් වැය කර 2006 වර්ෂයේ සිට කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත්, මෙම වියදම සමාලෝචිත වර්ෂයේදී අයහාර වියදමක් ලෙස කපා හැර තිබුණි.

(ඈ) මෝටර් ගරාජයේ වර්ෂ ගණනාවක සිට යතුරු පැදි 13 ක් දිරාපත් වීමෙන් පැවතුණු අතර එම බයිසිකල් වෙන්දේසි කර විකිණීමට හෝ පොත් වලින් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මෝටර් ගරාජය වෙත 2005 නොවැම්බර් 11 සිට පත්කළ ව්‍යාපෘති සංවර්ධන විමර්ෂණ සහකාරවරයාට රාජකාරි පැවරීමකින් තොරව 2011 ඔක්තෝබර් දක්වා වැටුප් හා දීමනා ලෙස රු. 4,045,416 ක් ගෙවීම් කර තිබුණි.

(ඊ) අධිකාරිය සතු එකතුව රු. මිලියන 474.5 ක් වූ ඉඩම්වලින් ඇතැම් ඉඩම් සමාලෝචිත වර්ෂය වන විටත් පර්චසයක් සඳහා මාසිකව රු. 300 සිට රු. 2,000 ක් තරම් වූ අඩු මුදලකට දීර්ග කාලීනව බදු ගිවිසුම් යටතේ බදු දී තිබුණි. එහෙයින් වාර්ෂිකව විශාල ආදායමක් අධිකාරියට අහිමි වෙමින් පැවතුණි.

(උ) ප්‍රත්‍යාගණන වටිනාකම රු. මිලියන 546 ක් වූ කොළඹ වරායෙන් පිටත පිහිටා ඇති අධිකාරිය සතු ඉඩම් නිෂ්ක්‍රීයව පැවතුණු අතර මෙම ඉඩම් බදු දීමට කටයුතු නොකිරීම නිසා වසර ගණනාවක සිට ලබාගත හැකිව තිබූ විශාල බදු කුළී ආදායමක් අධිකාරියට අහිමි වී තිබුණි.

(ඌ) රු. මිලියන 6 කට ප්‍රත්‍යාගණනය කරන ලද අධිකාරිය සතු පරිශ්‍ර සහ ඉඩම් පෞද්ගලික සමාගමකට බදු දී තිබුණු බදු කුළී ගිවිසුම 2000 වර්ෂයේ අවසන් වී තිබුණ ද දේපළේ භුක්තිය නිරවුල් කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. මේ නිසා අධිකාරියට වසර 11 කට අධික කාලයක් පුරා ලබාගත හැකිව තිබූ කුළී ආදායමක් අහිමි වී තිබුණි.

(ඔ) දියකාවා යාත්‍රාව මුහුදු බත්වීම නිසා කොළඹ වරායේ චීන පාලමේ වර්ග මීටර් 720 කට ආසන්න ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයකට පත්වී තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ත්‍රිකුණාමල වරායේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය ඉතා දුර්වල මට්ටමක පැවති අතර පහත පරිදි දිගින් දිගටම පාඩු ලබමින් තිබුණි.

| වර්ෂය | පාඩුව (රු.මිලියන) |
|---|---|
| 2007 | 405 |
| 2008 | 379 |
| 2009 | 319 |
| 2010 | 383 |
| 2011 | 318 |

(ආ) ගාලු වරාය වෙත පැමිණෙන නැව් සංඛ්‍යාව අඩුවීම මත මෙහෙයුම් ක්‍රියාකාරීත්වය ඉතා දුර්වල මට්ටමක පවත්නා බැවින් පහත වර්ෂවලදී දිගින් දිගටම පාඩු ලබා තිබුණි.

| වර්ෂය | පාඩුව (රු.මිලියන) |
|---|---|
| 2007 | 275 |
| 2008 | 279 |
| 2009 | 399 |
| 2010 | 345 |
| 2011 | 147 |

### 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ගාලු මුවදොර හරිත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.17,199,371 ක් වැය කර ආහාර සැපයීමේ මධ්‍යස්ථානයක් සහ පොදු සනීපාරක්ෂක ගොඩනැගිලි පද්ධතියක් ඉදිකර 2008 වර්ෂයේදී අවසන් කර තිබුණ ද ඒවා මෙතෙක් කුළියට දීමට හෝ මහජනයා සඳහා විවෘත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.5 ආර්ථික නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) **ඔලුවිල් නාවික අභ්‍යාස පුහුණු ආයතනය**

(i) වසරකට රු. මිලියන 54 කට වඩා අධික වියදමක් දරමින් ඔලුවිල් නාවික අභ්‍යාස ආයතනය පවත්වා ගෙන ගිය ද වසරකට මෙම ආයතනනයෙන් පාඨමාලා සම්පූර්ණ කරන ශිෂ්‍ය සංඛ්‍යාව ඉතාම පහළ මට්ටමක පැවතිණි. 2011 වර්ෂයේ අගෝස්තු දක්වා පුහුණුව සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව 05 කි. ඒ අනුව එක් ශිෂ්‍යයෙකු වෙනුවෙන් දරනු ලබන පිරිවැය ඉතා ඉහළ අගයක් ගෙන තිබුණි. 2010 වසරේ දී එක් ශිෂ්‍යයෙකු සඳහා දරන ලද වියදම රු. මිලියන 4 කට වඩා වැඩි වූ අතර 2011 දී එය රු.මිලියන 8.4 ක් විය.

(ii) තවද මෙම පාඨමාලා දින 15 කට සීමාවන කෙටි කාලීන පාඨමාලා ලෙස සැලකු කල වසරේ වැඩි කාලයක් පාඨමාලා පැවැත්වීමෙන් තොරව මෙම ආයතනය පවත්වා ගෙන යනු ලැබ තිබුණි.

(iii) පාඨමාලා සඳහා මිලදී ගෙන තිබුණු වටිනා යන්ත්‍ර සූත්‍ර කිසිදු ප්‍රයෝජනයකට නොගෙන 2004 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතිණි.

ආ) අධිකාරියේ පරිශ්‍ර 3 ක් වෙළඳපලේ වටිනාකමට වඩා ඉතා අඩු නාමික කුළියක් අයකරමින් බැංකු කටයුතු පවත්වා ගෙන යාම සඳහා බැංකු 2 කට ලබාදී තිබුණි.

ඇ) අධිකාරිය විසින් පුද්ගලික සමාගම් දෙකක 2000 හා 2008 වර්ෂ වලදී පිළිවෙලින් රු. 500,000 ක් සහ රු. 2,000,000 ක් ආයෝජනය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

### 4.6 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) රේඛිය අමාත්‍යාංශයේ අමාත්‍යවරයෙකුගේ කාර්ය මණ්ඩලය සඳහා පරිහරණයට ලබා දුන් වාහනයක් වසර 4 ½ කට පෙර අනතුරකට පත්වීමෙන් සිදු වූ අලාභය රක්ෂණය මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබු හෙයින් අධිකාරියට සිදුව තිබු පාඩුව රු. මිලියන 2 කට අධිකය.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා සමාගම හරහා ඉතාම සුළු සේවාවන් පවා ඉටුකර ගැනීමට කටයුතු කිරීම වෙනුවෙන් රු. 31,151,474 ක අමතර කොමිස් වියදමක් දරා තිබුණි.

(ඇ) දකුණු ආසියාවේ කේන්ද්‍රගත වරායක් වශයෙන් මෙහෙයුම් කටයුතු සාර්ථකව කර ගැනීමට නම් අධිකාරිය සතුව නිසියාකාරව නඩත්තු කරන ලද ස්ථිර ටග් යාත්‍රා ප්‍රමාණවත් සංඛ්‍යාවක් තිබිය යුතු විය. නමුත් එසේ කටයුතු කර නොතිබීම හේතුවෙන් අධිකාරිය විසින් දිනකට ඩොලර් 4,000 බැගින් ටග් යාත්‍රා 02 ක්

කුලියට ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී කුලී ගාස්තුව ලෙස රු.271,850,955 ක් ද ඉකුත් වර්ෂයේ රු. 54,785,298 ක් ද ගෙවා තිබුණි.

(ඈ) කොළඹ වරායේ ප්‍රධාන පිවිසුම් මාර්ගයේ ගැඹුරු කිරීමේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු නාවික තදබදය මත ප්‍රමාද වීමේ හේතුවෙන් කොන්ත්‍රාත්කරුට රු.8,897,600 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවා තිබුණි.

(ඉ) මු.පි.කො. 7180 දරණ පිඹුරේ කැබලි අංක 05 ඉඩම අත්පත් කර ගැනීමේ දී නියමිත දිනට වන්දි මුදල් නොගෙවීම නිසා වන්දි මුදලට අමතරව රු. 50,662,672 ක පොළී මුදලක් ද ගෙවා තිබුණි.

(ඊ) පැරණි පාවෙන යාත්‍රා 6 ක් විකිණීමට 2006 වර්ෂයේදී ප්‍රත්‍යාගණන වාර්තාවෙන් නිර්දේශ කර තිබුණ ද වසර කිහිපයකට පසු රු. 95,150,000 කට ප්‍රත්‍යාගණනය කරන ලද පාවෙන යාත්‍රා 3 ක් රු.11,645,866 කට විකුණා තිබුණි. මෙමගින් අධිකාරියට අහිමි වී තිබු ආදායම රු. 83,504,134 ක් විය. අනෙක් පාවෙන යාත්‍රා 3 විකණීමට සුදුසු ලෙස නිර්දේශ කර වසර 5 කට වැඩි කාලයක් ගතවී තිබුණ ද මේ දක්වා විකිණීමට කටයුතු කර නොතිබුණි.

(උ) දියකාවා යාත්‍රාව විකිණීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන කළමනාකරු (සැපයුම්) විසින් සභාපතිවරයා වෙත යොමු කළ ලිපිය අනුව වැඩිම මිල රු. 17,884,800 ක් වුවද එය නොසලකා කැබලි යකඩ ලෙස විකිණීමෙන් ලැබු මුදල රු. 9,578,710 ක් වුයෙන් අධිකාරියට ඉන් සිදු වී තිබු පාඩුව රු. 8,306,090 ක් විය.

## 4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා ජපන් බැංකු (JBIC) ආධාර වැඩ සටහන යටතේ රු. මිලියන 6,000 ක නිර්මාණ කොන්ත්‍රාත්තුව මඟින් ගාලු වරායේ දියකඩනයක් ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 455.5 ක් වැය කර තිබුණු අතර 2008 දෙසැම්බර් 31 දින කොන්ත්‍රාත්තුව අතර මඟ නවතා දමා තිබුණි.

(ආ) ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ කොළඹ වරාය කාර්යක්‍ෂම සහ වරාය පුළුල් කිරීම සඳහා වු උපදේශක සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා රු. මිලියන 1,175.20 ක මුදලක් ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය එක්ව වියදම් කර තිබුණි. එයින් රු. මිලියන 391 ක් පමණ කොළඹ වරාය කාර්යක්‍ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වැය කර තිබුණ ද එම යෝජනාව ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබු බැවින් මෙතෙක් වැය කර තිබු රු. මිලියන 391 ක් වු මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.

## 4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩපයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛණයේ 8.3.9 ඡේදයට පටහැනිව සැපයුම් සේවා, ආරක්ෂක වියදම්, පරිපාලන හා වැටුප් ලෙස එකතුව රු. 1,615,658 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රේඛිය අමාත්‍යාංශය වෙනුවෙන් දරා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය පාලනය

අධිකාරිය විසින් 2011 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සකස් කර තිබුණ ද තථ්‍ය වශයෙන් දැරූ ආදායම් හා වියදම් අතර සැලකිය යුතු

ප්‍රමාණයේ විචලතාවයන් දක්නට ලැබුණි. ඒ අනුව ඵලදායී කාරකයක් ලෙස අයවැය යොදා ගැනීමට කළමණාකරනය අපොහොසත් වී තිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරික්ෂණය වූ අඩුපාඩු පිළිබඳ වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුමත් කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ප්‍රසමපාදන ක්‍රියාවලිය
(ඈ) වාහන පරිහරණය
(ඉ) ආයෝජන
(ඊ) තොග පාලනය
(උ) ණයගැති හා ණයහිමි



**එච්.ඒ.එස්.සමරවීර**
**විගණකාධිපති**

TC/B/SLPA/FA/2011          FD/FA/C/82-XV/2011/14(2)(c)          2013 මාර්තු 08 දින

**විගණකාධිපති**
**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(අ) 2012 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ආ) ඉකුත් වර්ෂ ගනුදෙනු සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව කපා හැරීමට අප විසින් කටයුතු කර ඇත.

(ඇ) 2012 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඈ) 2012 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ජේ.සී.ටී සමාගම වෙනුවෙන් ගෙවන ලද වරිපණම් ගාස්තුව 2012 වසරේදී අයකර ගෙන ඇත.

(ආ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2012 වර්ෂයේ සිට නව ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව (SLFRSs) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ අතර එහිදී දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම පිරිවැය පදනම් ක්‍රමය (Cost Model) තෝරාගෙන ඇත. ඒ අනුව පසුගිය වර්ෂයන්ට අදාල ගැළපීම් එනම් දේපළ, පිරියත හා උපකරණ වල ප්‍රත්‍යාගණන අගයන් එහි සැලකි පිරිවැය (Deemed Cost) ලෙස ගෙන අදාල ගැළපීම් මෙම නව පදනම මත සිදුකර ඇති අතර මේ වන විට දේපළ, පිරියත හා උපකරණ වල සාධාරණ අගය (Fair Value) පොත්වල නිරූපණය වන බැවින් විගණන වාර්තාවේ සඳහන් වත්කම් සඳහා නැවත ප්‍රත්‍යගණනය කිරීමක් අවශ්‍යය නොවේ.

(ඇ) මෙම ඉඩම් කැබලි දෙකෙන් රු. මිලියන 300 ක් වූ ඉඩම (Ingreen Ltd) වරාය අධිකාරියට අයත් නොවන බැවින් 2012 වසර තුල වත්කම් ලේඛණයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇති අතර ඉතිරි රු මිලියන 400 ක් වූ ඉඩම 1985.07.05 දින අංක 356/19 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1971 අංක 35 දරණ ව්‍යාපාර (අත්පත් කර ගැනීමේ) පනත යටතේ රජයට අත්පත් කරගෙන ඇත. එම ඉඩම සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සඳහා ගැසට් නිවේදනයෙන් අනතුරුව විධිමත් පරිදි පාර්ලිමේන්තු අනුමැතිය ලබාගෙන තිබේද යන්න තහවුරු කරගත යුතුය. එබැවින් එය පාර්ලිමේන්තුවෙන් අදාල සනාථ කරගැනීම සඳහා මේ වනවිට යොමු කර ඇත.

### 2.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) 2011.12.31 දිනට වර්ෂයකට වඩා පැරණි ණයගැති ශේෂ අතුරින් පෞද්ගලික නැව් නියෝජිතයන්ගෙන් අයවිය යුතු සම්පූර්ණ මුදලම 2012 වසර තුළදි

අයකරගෙන ඇත. නමුත් රාජ්‍ය ආයතන සහ නිතීමය කටයුතු වලට යොමු කර ඇති ණයගැති ශේෂ රු. 228,780,867/= ක් මේ වන විට ඉතිරිව පවති. තවද වර්ෂ 5 කට වඩා වැඩි ශේෂයෙන් පෞද්ගලික නැව් නියෝජිතයන්ගෙන් අයවිය යුතු රු. 13,706/= ක් 2012 වසරේදී අයකරගෙන ඇති අතර ඉතිරි මුදල් රාජ්‍ය ආයතන වලින් අය විය යුතුව ඇත.

(ආ) 2011.12.31 දිනට විදුලි පරිභෝජනය වෙනුවෙන් අය විය යුතු ශේෂය වන රු. 74,642,387/= න් රු. 43,385,730/= ක් මේ වන විට අයකරගෙන ඇත. ඉතිරි ශේෂ්‍ය වන රු. 30,060,933/= න් රු 28,900,099 ක් ශ්‍රී ලංකා රේගුවෙන් අය විය යුතු මුදල්ය. එම මුදල් ගෙවන ලෙස එම ආයතනයට දන්වා ඇත.

වසර 5කට වඩා පැරණි ශේෂය වු රු. 1,790,016/= න් රු 54,645 ක් මේ වන විට අයකරගෙන ඇත. ඉතිරි ශේෂයෙන් රු. 1,195,991/= ක මුදල 2004.11.01 දිනට පෙර ආපනශාලා 19 ක් පවත්වාගෙන ගිය බදුකරුවන් 10 දෙනෙකුට අදාල වේ. මෙම මුදල් අයකර ගැනීමට නීති මාර්ගයෙන් ක්‍රියා කිරීමට කටයුතු මේ දිනවල සිදුවෙමින් පවති. තවද වර්තමානයේදී ආපන ශාලා බදුදීමේදී හා ඉදිරියේදී ඔවුන්ට බදු දීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කල නොහැකි වන අයුරින් ක්‍රියා මාර්ග ගෙන ඇත. {2011.12.31 දිනට අයවිය යුතු බදුකුලී ශේෂය වන රු 40,657,163/= ක් වු ශේෂයෙන් රු 4,587,760/= ක් වසර 05 කට වඩා අඩු වන අතර එයින් රු. 1,350,203/= ක් හැර ඉතිරිය මේ වන විට අයකරගෙන ඇත. වසර 05 කට වැඩි බදු කුලී ආදායමෙන් රු. 3,101,681/= ක් අයකරගෙන ඇත. තවදුරටත් අයවිය යුතු කුලී ආදායමෙන් රු. 15,411,732/= ක් සඳහා නීතිමය කටයුතු සඳහා යොමු කර ඇති අතර මින් රු. 2,656,871/= ක් රජයේ ආයතන 2 ක් සඳහා වේ. එම ආයතන 2 සඳහා නීතිමය පියවර ගත නොහැකි බව නීතිපතිවරයා දන්වා ඇත. නීතිමය පියවර ගත නොහැකි ඉතිරි ශේෂයන් අයකර ගැනීමට එම ආයතන සමඟ සාකච්ඡා කරමින් පවතී.}

(ඇ) 2013 වසරේදී පොත්වලින් ලියා ඉවත්කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**ඉඩම් රු. 693,925,000 /=**

මෙම ඉඩම් සම්බන්ධයෙන් ඔබගේ අංක SC/A/SLPA/2012/08/01 හා 2012.01.12 දිනැති විගණන විමසුම සඳහාද අප විසින් පිළිතුරු සපයා ඇත. එමගින්ද දන්වා ඇති පරිදි ඊම්වර්ක් ආයතනය සඳහා බදු දී තිබූ ඉඩම් මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය "නෙළුම් කුළුණ" ඉදිකිරීම සඳහා යොදාගෙන ඇති අතර ඒ සඳහා ඉදිරියේදී වන්දි ලබා ගැනීමට නියමිතය. එහි සඳහන් අනෙකුත් පරිශ්‍ර සියල්ල වරාය අධිකාරිය භාරයේ පවතින අතර අනාගත වරාය සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමේ අපේක්ෂාවෙන් මෙම ඉඩම් ගොඩනැගිලි ඉදිකිරීට හෝ වෙනත් භාවිතයන්ට ලබානොදී ආරක්ෂා සහිතව පවත්වා ගනු ලැබේ.

**ජංගම වත්කම් හා ජංගම වගකීම්**

ශේෂ සනාථ කර ගැනීම සඳහා ලිපි යැවීම නියමිත පරිදි සිදුවන අතර, ශේෂ සනාථ කර ආපසු එවීම අපගේ පරිපාලනයෙන් බැහැරව සිදුවන බැවින් ප්‍රායෝගිකව අපට එය පාලනය කල නොහැක.

**නාවික ගොඩබෑම් හා වාප්පු මෙහෙයුම් මත දඩ අයකර ගැනීම රු. 17,123,199/=**

මෙය ආදායමක් බැවින් උපලේඛන ඉදිරිපත් කරන්නේ නැත.

පාලන ගිණුම් වලට අදාලව පමණක් අප විසින් උපලේඛණ කාල විශ්ලේෂන හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කරන අතර අනෙකුත් ගිණුම් සම්බන්ධයෙන් ඔබ විසින් ඉල්ලු විට පමණක් අදාල තොරතුරු සැපයේ.

**2.2.5 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් ආදිය**

(අ) **ගාල්ල**

මෙහෙයුම් ආදායම අඩුවීම හේතුකොටගෙන මෙසේ පාඩු තත්ත්වයක් උද්ගත වී ඇත. එය පෙර වර්ෂවලට සාපේක්ෂව අඩුවීමක් පෙන්නුම් කර ඇත. කෙසේ වුවද 2010 වර්ෂයට වඩා ආදායම රුපියල් මිලියන 164 කින් වැඩි වීමක් පෙන්නුම් කරන අතර වියදම රුපියල් මිලියන 34 කින් අඩු වීමක්ද පෙන්නුම් කෙරේ.

තවදුරටත් ආදායම් වර්ධනය කර ගැනීමේ අරමුණින් වරාය ආශ්‍රිත සංචාරක කර්මාන්ත ආරම්භ කිරීමට පියවර ගෙන ඇති අතර මේ වසර තුල රුවල් යාත්‍රා අංගනයක් හා කුඩා ප්‍රමාණයේ යාත්‍රා අළුත් වැඩියා කිරීමේ අංගනයක් ස්ථාපනය කිරීම සඳහා වැඩ කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

**ත්‍රිකුණාමල වරාය**

රජය මගින් ගන්නා ලද තීරණයක් මත ජෙට්වල මෙහෙයුම් කටයුතු Stevedore, Harbour Tonnage, Dockage, Landing and Delivery Extra Operation ප්‍රිමා හා ටෝකියෝ සමාගම් වලට සිදු කිරීමට අවසර දීම මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ආදායම් ලැබීම් සීමා වි ඇත. එයට පිළියමක් වශයෙන් වරාය ආශ්‍රිත කර්මාන්තශාලා, කෘෂිකාර්මික කර්මාන්ත ශාලා, වටිනාකම් එකතු කිරීමේ කර්මාන්ත ශාලා (Value added Industry ) ආදි කර්මාන්ත ශාලා සහිත කාර්මික පුරවරයකට වරායන් සතු පරිශ්‍රයන් බද්ද ට හා කුලියට දිමෙන් ආදායම් ලබා ගැනීම සඳහා ආයෝජකයින්ගෙන් යෝජනා කැඳවීම්ද ( Request For Proposal) මේ වන විට කැඳවා ඇගයීම් කටයුතු සිදුවෙමින් පවතී. එමෙන්ම වියදම් පාලනය කර ගැනීම මගින්ද එම පාඩුව අවම කිරීමට හැකි සෑස ප්‍රයත්නයක්ම දරනවා ඇත.

(ආ) වරාය අධිකාරියේ සේවකයින්ගේ උපයන විට බදු ගෙවීම් දරනු ලබන්නේ වරාය අධිකාරිය විසිනි. 1997 ජනවාරි මස 09 දින අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය සහිතව නිකුත් කරන ලද අංක PA/HD/28 දරණ ලිපිය මගින් මෙය අනුමත කර ඇත.

**2.2.6 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

i) මෙම ගණුදෙනු සම්බන්ධයන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විනය නීති මාලාව අනුව මූලික පරීක්ෂණයක් පැවැත්වුණි. අදාළ මුදල් ආපසු වරාය අධිකාරිය වෙත ලබා ගැනීමට නීතිපති වරයාගේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජොෂ්ඨ කළමනාකරුවෙකු විසින් සිදුකළ මූලික පරීක්ෂණ වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීමට හා මෙම සිද්ධිකට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා විධිමත් උපදෙස් ලබාදෙන ලෙස වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගෙන් ඉල්ලා ඇත.

ii) 2010 වසරේ සේරුවාවිල 2 යාත්ත්‍රාවේ මාසික ආදායම් සහ වියදම් සලකා බැලීමේදී යාත්‍රාව ධාවනයේ යෙදුනු ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා කාලය තුල රු. 650,000/= ක සාමාන්‍ය මාසික දළ ලාභයක් ලභාගැනීමට හැකි වු අතර එතැන් සිට දෙසැම්බර් දක්වා කාලය තුල යාත්‍රාව අළුත් වැඩියාව සඳහා නවතා තිබු

බැවින් ආදායමක් ලබා ගැනීමට නොහැකිවුණි. මෙම තත්ත්වය පසුගිය වසර වලද මෙලෙසම වු බැවින් මෙය සැලකිල්ලට ගෙන සේරුවාවිල 2 යාත්‍රාව සහ මහවැලි දේවි යාත්‍රාව ඒවායේ සේවක මඩුල්ලත් සමග ශ්‍රී ලංකා නිදහස් සේවක වරාය (පෞද්ගලික) සමාගම වෙත පැවරීමට 2010.08.04 සහ 2010.11.03 දින වලදි රැස් වු කළමණාකරන කමිටුව විසින් තීරණය කර ඇත. ඒ අනුව සේරුවාවිල 2 යාත්‍රාව 2011.01.06 වෙනි දින සිට ඉහත කී සමාගම විසින් අදාල ගමන් වාර ආරම්භ කරන ලද අතර 2011.04.05 දින සිට කාර්මික දෝෂයක් හේතුවෙන් නවතා දමන ලදී.

සේරුවාවිල 2 යාත්‍රාව වෙනුවෙන් මසකට රු. 600,000/= ක මුදලක් වරාය අධිකාරිය වෙත ගෙවිය යුතු බවටද කළමනාකරණ කමිටුව තීරණය කොට තිබිණි. එයට අමතරව සේවක වැටුප් ඉන්ධන සුළු අලුත්වැඩියාවන් ද එම සමාගම විසින් කළ යුතු බවට තීරණය කොට තිබුණි.

මේ වන විට මෙම යාත්‍රාවේ එන්ජිම අලුත්වැඩියා කටයුතු නාවුක ඉංජිනේරු කොට්ඨාශය මගින් සිදු කරනු ලබයි. කෙසේ වුවද මුතූර් දක්වා ගොඩබිම් මාර්ගය මේවන විට සකස් වී ඇති බැවින් අලුත් වැඩියාවෙන් පසු මෙම සේවාව තව දුරටත් පවත්වා ගැනීමෙන් වරාය අධිකාරියට මූල්‍යමය ආදායමක් ලබා ගැනීමට නොහැකි වන අතර මෙම සේවාව තව දුරටත් පවත්වා ගෙන යාම ජීව්‍ය නොවන ( not viable) නිසා මුතූර් ජැටිය අලුත්වැඩියාව නාවුක හමුදාව ඉල්ලා සිටි නමුත් අළුත්වැඩියා සිදු නොකරන ලදි.

iii) 2.2.6 හි (i) පිළිතුරු අදාළ වේ.

**3 මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණන වාර්තාවේ සදහන් "2.2.1 (ආ) ඡේදයෙන් දැක්වෙන්නාවු ගැලපිම කළේ නම්" යන ප්‍රකාශය හැර පළමු ඡේදයේ සඳහන් සංඛ්‍යා දත්ත හා එකඟ වේ. (සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභය ගණනය කිරීමේදී ඉකුත් වර්ෂ වලට අදාළ ගනුදෙනු ගැලපීමක් කිසිවිටෙක නොකරන අතර එසේ ගැලපීමක් කළේ නම් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභය නිවැරදි නොවනු ඇත. මන්ද මෙහෙයුම් ලාභය හෝ අලාභය ඇතිවන්නේ එම වර්ෂයේ මෙහෙයුම් අදායම හා මෙහෙයුම් වියදම ගැලපීමෙන් ඇතිවන ප්‍රතිඵලය මතයි. එබැවින් අප විසින් නිවැරදි ලෙස මෙහෙයුම් ලාභය සෙවීමෙන් අනතුරුව ඉකුත් වර්ෂ වලට අදාළ ගනුදෙනු ගැලපීම් සිදුකර ඇත.)

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) සඳහන් සංඛ්‍යා තොරතුරු නිවැරදිය.

(ආ) සඳහන් අනුපාත විශ්ලේෂණය නිවැරදිය.

(i) / (ii) / (iii)

පසුගිය වර්ෂයන්ට වඩා 2011 වර්ෂයේදී ජංගම වත්කම් අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපෑවේ කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද අත්තිකාරම් නිරවුල් කිරීමය. අත්තිකාරම් නිරවුල් කරන්නේ කොන්ත්‍රාත් වැඩ නිමකිරීමේ ප්‍රතිශතය පදනම් කරගෙනය. මෙයින් අදහස් වන්නේ මෙම වසරේ ඔවුන්ගේ ව්‍යාපෘති නිසි පරිදි කාර්යක්ෂමව නිමකර ගෙනයාමය. මෙය ජංගම වත්කම් අඩුවීමට බලපෑ නමුත්

අනෙක් අතින් ජංගම නොවන වත්කම් වැඩිවීමට බලපා ඇති බැවින් එය යහපත් ප්‍රවනතාවයකි.

එමෙන්ම වගකීම් දෙස බැලීමේදී විවිධ ව්‍යාපෘති වෙණුවෙන් ණය ලබා ගැනීම වැඩිවීමක් පෙන්නුම් කලද මෙය වරාය සංවර්ධන කටයුතු වෙනුවෙන් අත්‍යාවශයෙන්ම කලයුතු වූවක්ය. මෙහි ප්‍රතාලාභ ලැබීමට දිගුකාලයක් ගත වුවද ජාත්‍යයන්තර තරඟකාරිත්වය හමුවේ වරාය කටයුතු අඛණ්ඩව හා කාර්යක්ෂමව සිදුකිරීමට නවීන ජාත්‍යයන්තර වරායන්වල ඇති අංගෝපාංග අප විසින්ද ස්ථාපිත කලයුතුව ඇත. එබැවින් විශාල නැව් මෙහෙයවිය හැකි ආකාරයට යටිතල පහසුකම් ස්ථාපිත කිරීමට එනම් වරාය පුළුල් කිරීම, ගැඹුරු කිරීම, නවීන දොඹකර හා වෙනත් උපකරණ මිළදී ගැනීමටද, කොළඹ වරායේ නාවික තදබදය අඩුකර වඩා කාර්යක්ෂම කටයුතු කිරීමේ පියවරක් ලෙස නවීන අංගෝපාංග සහිත නව වරායක් හම්බන්තොට ඉදිකිරීම සඳහා මෙම ණය ලබාගෙන ඇත.

එබැවින් තාවකාලික ලෙස ජංගම අනුපාතයේ ක්ෂණික අනුපාතයේ අඩුවීමක් හා ණය ස්කන්ධ අනුපාතයේ වැඩිවීමක් පෙන්නුම් කලද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දිගුකාලීන උපාය මාර්ගික වශයෙන් කටයුතු කරඇති බැවින් හැකි සෑම අවස්ථාවකම එම අනුපාතයන්ද යහපත් මට්ටමක පවත්වාගෙන යාමට හැකි සෑම උත්සාහයක්ම දරනවා ඇත.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### (අ) කොළඹ වරාය

#### (i) නාවික යාත්‍රා පැමිණීම

සඳහන් සංඛ්‍යා තොරතුරු නිවැරදිය.

2009 වර්ෂය සඳහා සැසදීමේදී 2010 වර්ෂයේ පැමිණි නැව් සංඛ්‍යාව අඩුවීමක් වාර්තා වුවද එසේ වීමට හේතුව විශාලත්වයෙන් වැඩි නැව්වල පැමිණීමත් එක් නැවකින් ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ ප්‍රමාණයේ (ටොන් ප්‍රමාණය / බහලු ප්‍රමාණය) සාමාන්‍යය වැඩි වීමත්, 2009 වර්ෂයේ වරායට පැමිණි නැවක දළ ටොන් ප්‍රමාණය 29,217 ක්ද , 2010 වර්ෂයේ වරායට පැමිණි නැවක දළ ටොන් ප්‍රමාණය 30,412 ක්ද විය. 2010 වර්ෂයේ පැමිණි නැව් සංඛ්‍යාවේ අඩු වීමට ලෝක ආර්ථික අවපාතයද තවත් හේතුවක් විය.

2010 වර්ෂය හා සැසදීමේදී 2011 වර්ෂයේ පැමිණි නැව් සංඛ්‍යාව 214 දක්වා එනම් 5.5% න් වර්ධනය වී ඇත. ලෝක ආර්ථික අවපාතය 2010 වර්ෂයේ අවසන් වීමත් සමඟම 2011 වර්ෂයේ ජාත්‍යයන්තර නාවික ක්ෂේත්‍රයේ අඩු වර්ධනයක් පෙන්නුම් කරයි.

#### (ii) බහලු හැසිරවීම (විස්සේ සම එකක TEUS)

සඳහන් සංඛ්‍යා තොරතුරු නිවැරදිය

(i), හා (ii), 2010 වර්ෂයේ ලෝක ආර්ථික අවපාතය අවසාන වීමත් සමඟ ජාත්‍යයන්තර නාවික ක්ෂේත්‍රයේ වර්ධකයක් පෙන්නුම් කළ බැවින් කොළඹ වරායේ මෙහෙයුම් විස්සේ සම ඒකක 673,144 කින් එනම් 19:43% ක වර්ධනයක් පෙන්නුම් කරයි. එහෙත් 2011 වර්ෂයේ ඇමරිකාවේ මූල්‍ය ආර්ථික

අර්බුදය, යුරෝ මුදල් කලාපයේ ආර්ථික අර්බුදය ජපානයේ සුනාමි තත්ත්වය නිසා ජපාන ආර්ථිකයට සිදුවී ඇති බලශක්ති නිෂ්පාදයේ පහත වැටීම් හා මැද පෙරදිග යුධමය තත්ත්වය නිසා ජාත්‍යයන්තර නාවික ක්ෂේත්‍රයේ පහත වැටීමක් ඇති වී තිබියදී කොළඹ වරායට බහලු මෙහෙයුම් විස්සේ සම ඒකක 125,446 කින් එනම් 3:03% ක වර්ධනයක් ලබා ගැනීමේ කොළඹ වරායේ ප්‍රගතිය පැසසිය යුතුමය.

(iii) රාජ්‍ය ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රියාත්මක කළ නොහැකි වාණිජමය තීරණ ක්‍රියාත්මක කිරීමට පෞද්ගලික අංශයේ බහලු පර්යන්තයක් වන SAGT සමාගමට හැකියාව ඇත. එවැනි ක්‍රියා මාර්ග තුළින් ගණුදෙනුකරුවන් ආකර්ශණය කර ගැනීමෙන් මෙහෙයුම් වැඩිකර ගැනීමට SAGT සමාගමට හැකිය. 2006 වර්ෂයේදී P & O නැව් සමාගම විසින් එවකට ලෝක බහලු මෙහෙයුම් ධාරිතාවයෙන් 18% ක් හිමිකරගෙන සිටී. Mersk නැව් සමාගම මිළට ගන්නා ලදි. SAGT සමාගම 26% ක හිමිකාරත්වය P & O නැව් සමාගම සතු බැවින් වරායක් සහ නැව් සමාගමක් ඒකාබද්ධව ගතහැකි සැළසුම් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් SAGT සමාගම සතුවිය. මෙම හේතු නිසා SAGT සමාගමේ මෙහෙයුම් ප්‍රමාණය ඉහල ගිය බව පැහැදිලිය.

ඒ අනුව මුල් කාලයේදී වරාය අධිකාරියේ වෙළඳ පොළ කොටස අඩු වී SAGT සමාගමේ වෙළඳපල කොටස වැඩි විය. එහෙත් එය දිගින් දිගටම අඛණ්ඩව පවතින තත්ත්වයක් නොවන බවට මෙයට පෙරද කරුණු දක්වා ඇත. එම කරුණු දැක්වීම සනාථ කරමින් මේ වනවිට වරාය අධිකාරියේ වෙළඳපල කොටස වර්ධනය වෙමින් පවතින බවට 2010 වර්ෂය වෙළඳපල කොටස 52.4% , 2011 වර්ෂයේ වෙළඳපල කොටස 53.94% , 2012 වර්ෂය වෙළඳපල කොටස 55.3% , දක්වා වර්ධනය මගින් පැහැදිලි වේ.

**(ආ) ත්‍රිකුණාමලය වරාය**

සඳහන් සංඛ්‍යා තොරතුරු නිවැරදිය.

2009 වර්ෂයේ ත්‍රිකුණාමල වරායට පැමිණි නැව් සංඛ්‍යාව සහ මෙහෙයුම් ප්‍රමාණයට වඩා 2010 වර්ෂයේ පැමිණි නැව් සංඛ්‍යාව සහ මෙහෙයුම් ප්‍රමාණය අඩුවී ඇත. මෙසේ නැව් සංඛ්‍යාව අඩු වීමට හේතුව උතුරේ පැවති මානුෂීය මෙහෙයුම් කාලයේදී ප්‍රවාහණයට එකතු වූ සරණාගතයින් සහ වෙරළාසන්න භාණ්ඩ ප්‍රවාහනය නතර වීම වේ.

2010 වසරේදී නාවික යාත්‍රා 147 ක් මෙහෙයවන ලද අතර 2011 දී එය යාත්‍රා 163 දක්වා වර්ධනය කර ගැනීමට හැකිවිය. ටෝකියෝ සමාගමට සිමෙන්ති නෞකා සහ ප්‍රීමා සමාගමට පැමිණි තිරිගු ආනයන අපනයන නෞකා වල වර්ධනයක් දක්නට ලැබීම මීට එක් හේතුවක් වන අතර විදේශීය ආනයන අපනයන නෞකාවල පැමිණීමද ඊට ඉවහල් විය. මීට අමතරව විදේශීය මුහුදු ගමන් මාර්ගයේ යාත්‍රා නෞකාවල හදිසි නඩත්තු කටයුතු, ජලය, ඉන්ධන හා ආහාර පාන ලබා ගැනීම සඳහා ත්‍රිකුණාමලය වරාය වෙත පැමිණීම තවත් එක් හේතුවක් විය. 2010 වසරට සාපේක්ෂව 2011 වසරේදී ජිප්සම් (Gypsum) ගොඩබෑම සඳහා අෂ්රොෆ් ජැටිය වෙත පැමිණි නෞකාවල වැඩිවීමද තවත් එක් සාධකයක් ලෙස පෙන්නුම් කළ හැක.

**(ඇ) ගාල්ල වරාය**

2009 වර්ෂයේ ගාල්ල වරායට පැමිණි නැව් සංඛ්‍යාව සහ මෙහෙයුම් ප්‍රමාණයට වඩා 2010 වර්ෂයේ පැමිණි නැව් සංඛ්‍යාව සහ මෙහෙයුම් ප්‍රමාණය අඩු වී ඇත.

ගාලු වරායට ප්‍රධාන වශයෙන් ගෙන එනු ලබන්නේ සිමෙන්ති සෑදීමට අවශ්‍ය අමු ද්‍රව්‍යයි 2010 වර්ෂය තුල දී සිමෙන්ති අමුද්‍රව්‍ය ආනයනය කිරීම අඩුවිය. මෙම කරුණු මෙහෙයුම් ප්‍රමාණය සහ නෞකා පැමිණීමේ අඩු වීමට හේතුවක් විය.

2010 වර්ෂය සඳහා සැසඳීමේ දී 2011 වර්ෂයේ සිමෙන්ති සඳහා රටතුල පැවති ඉල්ලුම වැඩිවිය. ඒ නිසා එම අමුද්‍රව්‍ය ආනයනය කිරීම වැඩි විය. මෙම කරුණු මෙහෙයුම් ප්‍රමාණය සහ නෞකා පැමිණීමේ වැඩි වීමට විශේෂ හේතුවක් විය.

**(ඈ) සියලුම වරායන් (කොළඹ ත්‍රිකුණාමලය හා ගාල්ල)**

සඳහන් ප්‍රකාශය පහත සඳහන් පරිදි නිවැරදි විය යුතුය.

2009 වර්ෂය හා සැසඳීමේදී 2010 වර්ෂයේදී සියලු වරායන්හි භාණ්ඩ හැසිරවීම වර්ධනය වේ. ටොන් ඒකක 12,461,925 කින් එනම් 25.54% වූ අතර 2010 වර්ෂය හා සැසඳීමේදී 2011 වර්ෂයේදී භාණ්ඩ හැසිරවීමේ වර්ධනය මෙට්‍රික් ටොන් ඒකක 3,813,376 ක් නම් 6.22% ක් විය.

**(ඉ) මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය**

2010 නොවැම්බර් මස වනවිට දියකඩනය ඉදිකිරීම, නැංගුරම් පොළවල් ඉදිකිරීම, වරාය දෝනිය හැරීම හා නාවික පිවිසුම් මාර්ගය හැරීම යනාදී ප්‍රධාන ඉදිකිරීම් අංග අවසන් වී තිබුණි. නමුත් නැව් පැමිණීම සඳහා අවශ්‍ය කරන වෙනත් යටිතල පහසුකම් අවසන්ව නොතිබුණි. එනම් වරාය අභ්‍යයන්තර මාර්ග ඉදිකිරීම, වරායේ සහ වෙනත් උපකාරක සේවාවන් සපයන ආයතනවල සේවකයින් සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම යනාදි කටයුතු නිමාකොට නොතිබුණි. ග්‍රැන්ට් දොඹකර මිළදී ගැනීම සඳහා ඉල්ලුම් කරඇති පළමු අදියරේ අතිරේක ණය මුදල මේ වනවිටත් අනුමත වෙමින් පවතී. දැනට වෙනත් යටිතල පහසුකම් සැලකිය යුතු ප්‍රමාණයකට අවසන්ව ඇති හෙයින් ග්‍රැන්ට් දොඹකර අවශ්‍ය නොවන රථවාහන මෙහෙයුම කටයුතු සහ ඒවායේ ප්‍රති අපනයන කටයුතු ඉතා සාර්ථකව සිදුවෙමින් පවතී. පළමු අදියරේ අතිරේක ණය මුදල ප්‍රදානය කළ පසු ඉතා කඩිනමින් ග්‍රැන්ට් දොඹකර මිළදී ගෙන සියලු මෙහෙයුම් කටයුතු ඉතා සාර්ථකව සිදුකිරීමට පියවර ගනු ඇත.

මීට අමතරව වරාය ආශ්‍රිත කර්මාන්ත සඳහා ආයෝජකයින්ගේ යෝජනා කැඳවීමේ අදියර 01 (RFP 1 ) අවසන්ව, ඒ අනුව තොරාගත් කර්මාන්ත 07 ක් ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එම ආයෝජකයින් සමඟ ගිවිසුම් වලට එළඹීමේ කටයුතු සිදුවෙමින් පවතී. මෙහි අදියර 01 අවසන් පසුවද ආයෝජකයින්ගේ ලැබුණු අධික ඉල්ලීම් සැළකිල්ලට ගෙන වරාය ආශ්‍රිත කර්මාන්ත සඳහා ආයෝජකයින්ගේ යෝජනා කැඳවීමේ අදියර 02 (RFP 2 ) ක්‍රියාත්මක වෙමින් පවතී.

## 4.2 කළමණාකරන අකාර්යක්ෂමතා

(අ) මෙම දොඹකර අලුතින් සවි කලද ඒවා ධාවනය කිරීම සඳහා තිබූ යකඩපීලි ඒ සඳහා සුදුසු තත්ත්වයක නොතිබුණි. ඒ අනුව නැවත එය අලුතින් තැනවූ අතර, ඒ සඳහා වසරකට ආසන්න කාලයක් ගතවිය. මීට අමතරව නව දොඹකර පාවිච්චිය සඳහා පැරණි දොඹකර සඳහා අයකරන ලද ගාස්තුව වූ පැයකට ඇමෙරිකානු ඩොලර් 6 ප්‍රමාණවත් ගාස්තුවක් නොවූ අතර, එය වැඩිකර අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වීමද මෙම දොඹකර සේවා කටයුතු සඳහා යොදවා ගැනීම ප්‍රමාදවීමට තවත් හේතුවක් විය. කෙසේ වුවද මේ වන විට මෙම දොඹකර දෙක

(02) පැයකට ඇමෙරිකානු ඩොලර් 40 බැගින් අයකර ගෙන (භාණ්ඩාගාර අනුමැතිය මත) මෙහෙයුම් කටයුතු සඳහා සාර්ථකව යොදවාගෙන ඇත.

(ආ) ගබඩා තොග ගිණුම සමන්විත වන්නේ ඒකක ගබඩා 13 සහ ඉන්ධන ගබඩාවේ පැවති ශේෂයන් වල එකතුවෙනි. මෙයින් ඒකක ගබඩා 06 ක්ම අමතර කොටස් ගබඩා වේ. මෙම අමතර කොටස් ගබඩාවලද ඇති තොග වටිනාකම සමස්ථ තොග වටිනාකමෙන් 90% කට වැඩි වටිනාකමක් / දායකත්වයක් දක්වයි. මෙම අතර කොටස් ගබඩාවල ඇති තොග (අමතර කොටස්) අවුරුදු 10 – 15 ක් හෝ එයටත් වඩා වැඩි කාලයක් රැස්කර තබා ගන්නේ අදාල යන්ත්‍රෝපකරණ එපමණ කාලයක් හෝ එයටත් වඩා වැඩි කාලයක් පරිහරණයට ගන්නා නිසාය. එසේම අධික මූල්‍ය වටිනාකම් ඇති යන්ත්‍ර සූත්‍ර මිළදී ගැනීමේදී ඒ සමඟ බොහෝ විට අමතර කොටස් ලබාදීමද සිදුවේ.

සාමාන්‍යයෙන් විශාල මිළ ගණන් සහිත යන්ත්‍ර මිළදී ගැනීමේදී යන්ත්‍රයේ වටිනාකමෙන් 1% පමණ වන උපාංග නොමිළයේ සපයනු ලැබේ. එම අමතර කොටස් වල වටිනාකම් ද තොග ගිණුම් තුළ අන්තර්ගතවේ.

සමහර අමතර කොටස් එම යන්ත්‍ර සූත්‍ර සඳහා යෙදවීමට සිදුවන්නේ අවුරුදු 10 -15 ක් පමණ ඉක්මගිය පසුවය. එසේම මෙම බොහෝ අමතර කොටස් විවෘත වෙළඳපොලේදී ඉක්මණින් මිළදී ගත නොහැක. සමහර අමතර කොටස් විදේශ වලින් ඇනවුම් කර ලබාගත යුතුවේ. අදාළ යන්ත්‍රෝපකරණ නඩත්තුව හෝ හදිසි අළුත්වැඩියා සඳහා අවශ්‍ය විටක ඉක්මනින් වෙළඳ පොලේදී මෙම අමතර කොටස් මිළදී ගත නොහැකි නිසා මෙසේ ගබඩාකර තබාගත යුතුව පවතී.

එසේම සෑම වර්ෂයකම අදාල තොග පිළිබඳව මනා දැනුමක් ඇති ඉංජිනේරු මහතුන් / වැඩ අධිකාරිවරුන් හා අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ නිළධාරීන්ගෙන්ද සමන්විත කමිටුවක් මගින් තොග සමීක්ෂණය කර තව දුරටත් අවශ්‍ය නොවන තොග නිසි පරිපාටි ප්‍රකාරව ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

(ඇ) මෙය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත අයහාර වියදමක් ලෙස කපා හැර ඇත.

(ඈ) විගණන වාර්තාවේ සඳහන් යතුරු පැදි සියල්ලම තවදුරටත් අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයක පැවතුණි. බොහොමයක් යතුරු පැදි වසර 15 කටත් වඩා පැරණිය. එම යතුරු පැදි අතරින් බොහොමයක් දැනටමත් ටෙන්ඩර් මගින් විකුණා මෝටර් ගරාජයෙන් ඉවත් කරගෙන ගොස් ඇත.

(ඉ) ඔහු මෝටර් ගරාජය වෙත අනුයුක්ත කල දා සිට අමතර කොටස් ඇණවුම් කිරීමේ ලිපි ලේඛණ සකස් කිරීම, මෝටර් වාහන අළුත්වැඩියාවන් සඳහා පිරිවැය ගණනය කිරීම ආදී කාර්යයන් සිදුකළ අතර 2012.06.01 දින සිට ඔහු සේවා සැපයුම් කොට්ඨාශයට මාරුකර යවා ඇත.

(ඊ) අධිකාරිය සතු ඉඩම් බදු දීමේදී එහි බදු කුළිය තීරණය කරනු ලබන්නේ රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුවය.

(උ) වරාය අධිකාරිය සතුව මෙවැනි ඉඩම් සීමිත ප්‍රමාණයක් පවතින අතර අනාගත වරාය පුළුල් කිරීම් හෝ නගර සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට මෙම ඉඩම් වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම් හෝ භාවිතාවන්ට ලබානොදී ආරක්ෂා සහිතව පවත්වා ගනී. දැනට රජය මගින් යෝජිත විශාල ප්‍රමාණයේ නගර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමග එක්ව කටයුතු කරනු ලබයි.

(ඌ) මෙම පරිශ්‍රය වරාය කොමිෂන් සභාව විසින් පරන්තන් කෙමිකල්ස් කම්පැණි ලිමිටඩ් ආයතනය වෙත 1975 සිට වසර 25 ක කාලයකට බදුදී ඇත. පසුව ඔවුන් විසින් මෙම ඉඩම් කොටස පවරා ගැනීමට කටයුතු කර ඇති අතර, එහිදී ඇති වූ තත්ත්වය මත බදුකුලී ගෙවීමට කටයුතු කර නොමැත. මෙම පරිශ්‍රය නැවත පවරා ගැනීමට කීප අවස්ථාවකදීම කටයුතු කළද සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් බැවින් අදාළ කාර්යාලය ඉවත් කර ගැනීමට සහන කාලයක් ලබාදී ඇත. ඉදිරියේදී වරාය අධිකාරියේ වෙනත් පරිශ්‍රයක් ඔවුන් වෙත බදු වශයෙන් ලබාදී මෙම පරිශ්‍රය නැවත වරාය අධිකාරියට ලබා ගැනීමට පියවර ගෙන ඇත.

(ඔ) මෙම මුහුදුබත් වූ කොටස දැනට නැව් නැංගුරම් ලෑම සඳහා භාවිතා නොකරන නොගැඹුරු ප්‍රදේශයක රදවා ඇති අතර එම ප්‍රදේශය කුඩා නාවික යාත්‍රා පමණක් මෙහෙයවන ප්‍රදේශයකි.

අපගේ ඉදිරි සැලසුම් වල මෙම කොටස ගොඩකර පර්යන්ත විශාල කිරීමට අරමුණු කර ඇති බැවින්ද මෙය ගොඩගැනීම හා ඉවත් කිරීම සඳහා විශාල පිරිවැයක් යෙදිය යුතු බැවින් එය ආර්ථිකමය ඵලදායී නොවන කාර්යයකි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### (අ) ත්‍රිකුණාමල වරාය

රජය මගින් ගන්නා තීරණයක් මත ජෙටිවල මෙහෙයුම් කටයුතු Stevedore, Harbour Tonnage, Dockage, Landing and Delivery Extra Operation ප්‍රීමා හා ටෝකියෝ සමාගම් වලට සිදු කිරීමට අවසර දීම මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අදායම් ලැබීම් සීමා වී ඇත. එයට පිළියමක් වශයෙන් වරාය ආශ්‍රිත කර්මාන්තශාලා, කෘෂිකාර්මික කර්මාන්ත ශාලා, වටිනාකම් එකතු කිරීමේ කර්මාන්ත ශාලා (Value Added Industry) ආදී කර්මාන්ත ශාලා සහිත කාර්මික පුරවරයකට වරායන් සතු පරිශ්‍රයක් බද්දට හා කුලියට දීමෙන් ආදායම් ලබා ගැනීම සඳහා ආයෝජකයින්ගෙන් යෝජනා කැඳවීම්ද (Request For Proposals) මේ වනවිට කැඳවා ඇගයීම් කටයුතු සිදුවෙමින් පවතී. එමෙන්ම වියදම් පාලනය කර ගැනීම මගින්ද එම පාඩුව අවම කිරීමට හැකි සෑම ප්‍රයත්නයක්ම දරනවා ඇත.

### (ආ) ගාල්ල වරාය

සිමෙන්ති ආශ්‍රිත අමුද්‍රව්‍ය ආනයනය අඩුවීම නිසා මෙහෙයුම් අදායම අඩුවීමෙන් 2007 වසරේ සිට දිගින් දිගටම පාඩු ලබා ඇත. කෙසේ වුවද 2010 වසරේ අදායම වැඩිවීමත් සේවක සංඛ්‍යාව අඩුවීම නිසා වාර්ෂික වියදම අඩුවීම නිසාත් පාඩු තත්ත්වය පෙර වසරවලට සාපේක්ෂව අඩුවීමක් පෙන්නුම් කරයි. තව දුරටත් අදායම් වර්ධනය කරගැනීමේ අරමුණින් වරාය ආශ්‍රිත සංචාරක කර්මාන්ත ආරම්භ කිරීමට පියවර ගෙන ඇති අතර මේ වසර තුල රුවල් යාත්‍රා අංගනයක් හා කුඩා ප්‍රමාණයේ යාත්‍රා අළුත්වැඩියා කිරීමේ අංගනයක් ස්ථාපනය කිරීම සඳහා වැඩ කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

## 4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ඉතාමත් කඩිනමින් ආහාරපාන සැපයුම් මධ්‍යස්ථාන හා සනීපාරක්ෂක පහසුකම් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

## 4.5 ආර්ථික නොවූ ගණුදෙනු

(අ)

I නාවික අභ්‍යාස ආයතනය හුදෙක් කේෂ්ත්‍රයේ පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා උචිත පරිදි යන්ත්‍ර සූත්‍ර හා වැඩ අංශ පිහිටුවා ඇත. එබැවින් එහි ප්‍රධාන අරමුණ වී ඇත්තේ නාවික කේෂ්ත්‍රයේ පුහුණු පාඨමාලා පැවැත්වීමයි. නමුත් මේ වනතෙක් නාවික කේෂ්ත්‍රයට අදාල පුහුණු ආරම්භ කර නැත. දැනට පවත්වාගෙන යනු ලබන්නේ වැද්දුම්කරු/ විදුලි කාර්මික/ යන්ත්‍රකරු යන වෘත්තීය පාඨමාලා පමණි. මෙහ හුදෙක් නාවික කේෂ්ත්‍රයේ පුහුණු පාඨමාලාවලට අයත්වන උපකොටසක් පමණි. මෙය NVQ සහතිකය මට්ටමේ පිළිගැනීමෙක් නොවීමත් නිසා මෙයට සහභාගීවන ශිෂ්‍ය සංඛ්‍යාව අවම වී ඇත.

එමෙන්ම මෙම ආයතනය පවත්වනු ලබන පාඨමාලා මුදල් ගෙවා හැදෑරිය යුතුව ඇත. මුල් වකවානුවල මෙම පාඨමාලා පවත්වගෙන යෑම සඳහා NGO සංවිධාන මැදිහත් වීම මගින් ශිෂ්‍යයන් වෙනුවෙන් මුලා වියදම් දරණ ලදී. ප්‍රවාහන අපහසුතා/වෘත්තීය පාඨමාලා/අඩුළුසවුම් පාඨමාලා සඳහා රියදුරු බලපත්‍රය වසර 3 ක් වීම යනාදී හේතු මත මෙම පාඨමාලා සඳහා සහභාගීවන ශිෂ්‍ය සංඛයාව අවම වී ඇත.

එසේම මෙම ආයතනයේ පිරිවැය වැඩි වශයෙන් දරනු ලබන්නේ ළමුන්ගේ පුහුණු කටයුතු සඳහා නොව ආයතනයේ වෙනත් නඩත්තු කටයුතු සඳහාය.

II මෙම ආයතනයේ පැවැත්වෙන පාඨමාලා සඳහා NVQ මට්ටමේ සහතික පත්‍ර ලබාදීමට නොහැකි වීමත් එමෙන්ම ආයතනයේ අරමුණ සඳහා වන පාඨමාලා මෙතෙක් ආරම්භ නොකිරීමත් නිසාත් දැනට පැවැත්වෙන පාඨමාලා ගණන අවම වී ඇත. මෙයට පිළියමක් වශයෙන් ඉදිරියේදී දැනට පැවැත්වෙන පාඨමාලා වලට අමතරව බෝට්ටුකරු පුහුණු පාඨමාලා වලට අමතරව බෝට්ටුකරු පුහුණු පාඨමාලාව (Fishing Boatman) බෝට්ටුපදවන්නා පුහුණු පාඨමාලාව (Coxwine) නව තාක්ෂණික පාඨමාලාව (CDC Course) නාවික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (Diploma in Marine Engineering Programme) ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

III. පාඨමාලා පවත්වාගෙන යෑම සඳහා ඇති යන්ත්‍ර සූත්‍ර 2004 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව නොපැවතුණ අතර අවශ්‍ය අවස්ථාවලදී ප්‍රයෝජනයට ගන්නා ලදි. මෙම යන්ත්‍ර සූත්‍ර හුදෙක් නාවික ක්ෂේත්‍රයේ පාඨමාලා හා වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා ගැණුනු ඒවා වේ.

(ආ) වරාය අධිකාරියේ අත්‍යාවශ්‍යතාවය මත අධිකාරිය වෙත කරනු ලබන ගෙවීම් කටයුතු වෙනුවෙන් ලංකා බැංකුව වෙත මුදල් එකතු කිරීමේ මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට කළමණාකාරීත්වයේ අනුමැතිය පරිදි කුලී රහිතව පරිශ්‍ර 03 ක් ලබා දී ඇත. මෙම පරිශ්‍ර බලපත්‍ර කාර්යාලයේ කැනල් අංගනයේ හා පැලියගොඩ ගබඩා සංකීර්ණයේ පිහිටා ඇත. එකී මධ්‍යස්ථාන තුල සාමාන්‍ය බැංකු කටයුතු සිදුනොවන අතර වරාය භාවිතා කරන්නන් විසින් අධිකාරියට ගෙවනු ලබන ගෙවීම් කටයුතු වලදී මුදල් භාර ගැනීම සඳහා පමණක් භාවිතා කරනු ලැබේ.

හැටන් නැෂනල් බැංකුව වෙත ලබා දී ඇති පරිශ්‍ර තුනෙන් එම බැංකු කාර්යාලය පවත්වාගෙන යනු ලබන පරිශ්‍රය සඳහා රජයේ තක්සේරුකරුගේ තක්සේරුවට අනුව බදු කුලිය අය කරනු ලැබේ. ඒටීඑම් (ATM) යන්ත්‍ර පවත්වාගෙන යනු ලබන්නේ වරාය සේවකයින්ගේ සුභසාධනය සඳහා වන අතර එම යන්ත්‍ර වරාය පරිහරණය කරන්නන් හා අධිකාරියේ සේවකයින් පමණක් භාවිතා කරනු ලැබේ.

මෙම කරුණු සැලකිල්ලට ගෙන හැටන් නැෂනල් බැංකුවේ ඒටීඑම් (ATM) යන්ත්‍ර පවත්වාගෙන යන පරිශ්‍ර 02 පමණක් නාමික කුලියට ලබාදී ඇත.

(ඇ) 1. **EDI නෙට්වර්ක් පුද්ගලික සමාගම (රු. 500,000/=)**

පොත් වලින් ලියා ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට ලිපියක් යවා ඇති නමුත් එයට පිළිතුරු වශයෙන් අමාත්‍යාංශ ලේකම් ප්‍රධාන ගිණුම් නිලධාරියා වශයෙන් කටයුතු කරන බැවින් පොත්වලින් ලියා ඉවත් කිරීමට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ප්‍රමාණවත් බව මහා භාණ්ඩාගාරය විසින් දැණුම් දී ඇත.

වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉහත මුදල පොත් වලින් ලියා ඉවත් කිරීමට අනුමැතිය සඳහා දැනටමත් ලිපියක් යවා ඇත.

11. **සී/ස ලංකා කොල් පුද්ගලික සමාගම (2,000,000/=)**

ඉහත සමාගම 2011 වසර වාණිජමය මෙහෙයුම් සඳහා වූ පළමු වසර විය. කෙසේ වෙතත් ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම සඳහා ලද ලාභය ප්‍රමාණවත් නොවීය. නමුත් නුදුරු අනාගතයේදී ලාභ ඉපයීමට අපේක්ෂා කෙරේ.

**4.6 හඳුනාගත් පාඩු**

(අ) මේ සම්බන්ධයෙන් තඹුත්තේගම උසාවියේ නඩුවක් විභාග වෙමින් පවතින අතර, එහි අවසන් තීන්දුවෙන් පසු මේ පිළිබඳව කටයුතු කරනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා වරාය කළමණාකරන හා උපදේශක සේවා සමාගම විසින් සපයන ඇතැම් සේවාවන් වන (නෞකා මෙහෙයුම් කටයුතු වලදී ජය බහලු පර්යන්තය විසින් සැපයිය යුතු සහායක සේවාවන් වන) බහලු වල අගුලු දැමීම / අගුලු නිදහස් කිරීම හා ශීත කල බහලු වල උෂ්ණත්වය අධීක්ෂණය කිරීමේ සේවාවන් සඳහා වරාය අධිකාරියේ සේවකයින් යෙදවූයේ නම් විශාල වියදමක් දැරිය යුතුවේ. එම තත්ත්වය තුල දැනට ශ්‍රම වෙළඳපොළෙහි ගෙවනු ලබන ඉතා අඩු දෛනික වැටුපක් පදනම් කරගත් කොන්ත්‍රාත් මිළක් යටතේ මෙම සේවාවන් ශ්‍රී ලංකා වරාය කළමණාකරන හා උපදේශක සේවා සමාගම හරහා ලබා ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ප්‍රමාණවත් ටග් යාත්‍රා සංඛ්‍යාවක් නොමැති අතර ඇතැම් ටග් යාත්‍රා පැරණි මෙන්ම අළුත්වැඩියා කලයුතු තත්ත්වයේ පවතී. අළුතින් ටග් යාත්‍රා මිළදී ගැනීම සඳහාද අධික පිරිවැයක් දැරිය යුතු වන අතර අළුත්වැඩියා කලයුතු තත්ත්වයේ පවතින ටග් යාත්‍රා අළුත්වැඩියා කිරීම සඳහා දිගුකාලයක් මෙන්ම විශාල වියදමක්ද දැරීමට සිදු වී ඇත.

ප්‍රමාණවත් ටග් යාත්‍රා නොමැති වීම හේතුවෙන් නැව් මෙහෙයුම් කටයුතු වලදී සිදුවන ප්‍රමාදයන් මත ඇතිවන අකාර්යක්ෂමතාවය නැව් හිමියන්ගෙන් කොළඹ වරාය පිළිබඳ ප්‍රතිරූපයට අයහපත් බලපෑමක් ඇති කරයි. ජාත්‍යන්තර වරායන් අතර තරඟකාරී බවින් කොළඹ වරාය ආරක්ෂා කර ගැනීමේ පරමාර්ථයෙන් මෙහෙයුම් කටයුතු අඛණ්ඩව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ අරමුණ ඇතිව වරාය කළමණාකාරීත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඒ සඳහා සුදුසු විසඳුමක් ලෙස මෙම ටග් යාත්‍රා 2 කුලියට ලබා ගන්නා ලදි. මෙම ටග් යාත්‍රා

2 සඳහා අළුත්වැඩියා හා නඩත්තු කටයුතු අධිකාරිය විසින් නොකරන නිසාත් මෙයින් මූල්‍යමය පාඩුවක් සිදු වී නොමැත.

(ඈ) වරාය ප්‍රධාන පිවිසුම් මාර්ගය ගැඹුරු කිරීමේ ව්‍යාපෘතිය 2001 දී ආරම්භ කල අතර ප්‍රධාන පිවිසුම් මාර්ගයේ නාවික ගමනා ගමන තදබදය හේතුවෙන් වරාය ගැඹුරු කිරීමේ කටයුතු අතරමග නැවතීම් මත නියමිත කාල පරිච්ඡේදය තුල අදාල කොන්ත්‍රාත්කරුවන්ට නිම කිරීමට නොහැකි වුනි. මේ සඳහා වසර 2 ක කාලයක් ගතවුන අතර ඔවුන් විසින් අතිරේකව වැය වූ කාල පරිච්ඡේදය තුල ඒ සඳහා යොදා ගන්නා ලද යන්ත්‍ර උපකරණ හා මිනිස් ශ්‍රමය වෙනුවෙන් රු. 88,633,481/= අතිරේක මුදලක් ඉල්ලා සිටි බැවින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ලේකම් (වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය) විසින් මෙය සමතයකට පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (Institute of Engineers (Sri Lanka) ) කල ඉල්ලීමට අනුව පත්කල මැදිහත්කරු විසින් මුදල් ගෙවා නිදහස් කරන ලෙසට උපදෙස් දී ඇත.

ව්‍යාපෘති ඉංජිනේරු විසින් ඔහුගේ 2005.02.28 දිනැති වාර්තාවෙන් රු. 8,897,600/= අතිරේක මුදලකට ව්‍යාපෘති උපදේශක සහතික වී ඇති බව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පාලනය කරගත නොහැකි නාවික තදබදය හේතුවෙන් අතරමග නැවතුනු ගැඹුරු කිරීමේ කටයුතු වෙනුවෙන් දිගුකාලක් නොගෙවා තිබුණු එම මුදල ඔවුන් වෙත ගෙවන ලදි.

(ඉ) මු.පි.කො. 7180 දරණ පිඹුරේ කැබලි අංක 05 සඳහා කොළඹ දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතීම නිසා ඉඩම අත්පත් කර ගැනීමේදී වන්දි මුදල් ගෙවා නොමැත. අදාල ඉඩම සඳහා වන්දි මුදල් හා පොලී ගෙවන ලෙසට නීතිපතිගේ දැනුම්දීම මත කොළඹ ප්‍රාදේශීය ලේකම් විසින් 2010.06.14 දිනැති ලිපිය මගින් වරාය අධිකාරිය වෙත අදාල වන්දි මුදල් කොළඹ දිසා අධිකරණයේ තැන්පත් කරන ලෙසට දන්වා ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි වන්දි මුදල කොළඹ දිසා අධිකරණයේ 2010.10.12 දින තැන්පත් කරන ලද අතර ඉඩම රජයට පවරාගත් 1991.01.03 දින සිට වන්දි මුදල දිසා අධිකරණයේ තැන්පත් කල 2010.10.12 දින දක්වා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 35 වැනි වගන්තිය යටතේ සඳහන් පරිදි 7% ක පොලී මුදල දිසා අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කර ඇත.

(ඊ) පැරණි යාත්‍රාවක් තව දුරටත් අළුත්වැඩියා කර පාවිච්චි කිරීම ආර්ථිකමය වශයෙන් සුදුසු නොවන්නේ නම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පත් කරනු ලබන විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් මගින් එකී යාත්‍රාවෙහි වර්තමාන වටිනාකම තක්සේරු කර එම මිළට නොඅඩු වටිනාකමකට එකී යාත්‍රාය විකිණීම හෝ කළමණාකාරීත්ව කමිටු තීරණයට අනුව ශ්‍රී ලංකා වරාය හා කළමණාකරන උපදේශක සේවා සමාගම හරහා කැබලි කර විකිණීමට යොමු කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දැනට පවතින ක්‍රියා පිළිවෙත වේ.

**විකුණන ලද පාවෙන යාත්‍රා 03**

T/T Waruna ටග් යාත්‍රාව විශේෂ සමීක්ෂණ මණ්ඩයක් මගින් 2005.04.05 දින වෙළඳපොල වටිනාකම රු. 2,000,000/= ලෙස තක්සේරු කර ඇත. පසුව එම යාත්‍රාව 2005.07.23 දින ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මිළ ගණන් කැඳවා ඇති අතර මෙම යාත්‍රාව සඳහා M/s Master (Pvt) Ltd ආයතනය විසින් රු. 6,025,000/= ලන්සුවක් ඉදිරිපත් කර ඇත. මෙම මිළ ගණන් නිර්දේශිත විකුණුම් වටිනාකමට වඩා ඉතා ඉහළ අගයක් ගෙන ඇති බැවින් 2005.09.24 දිනැති කළමණාකාරීත්ව කමිටුවේ අංක ( 30/05 ) දරණ තීරණය මත එකී මිළට

(6,025,000.00 + 903,750.00 (Vat) = 6,928,750.00) M/s Masters (Pvt) Ltd ආයතනයට විකුණා ඇත.

එසේම M/V Kakuluwa යාත්‍රාව විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් මගින් 2006.03.08 දින රුපියල් මිලියන 18.2 කට තක්සේරු කර ඇත. පසුව 2006.05.03 දින මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ටෙන්ඩර් මගින් විකිණීමට කටයුතු කර ඇත. ටෙන්ඩර් අංක 296 යටතේ මෙම යාත්‍රාව සඳහා ශ්‍රී ලංකා වරාය කළමණාකරන හා උපදේශක සේවා සමාගම ඉදිරිපත් කළ ලන්සුව රු. 57,60,000.00 කි. මෙය නිර්දේශිත විකුණුම් මිළට වඩා අඩු අගයක් බැවින් එකී මිල යටතේ එම සමාගම අලෙවි කිරීම කළමණාකාරීත්ව කමිටුව මගින් අනුමත කර නොමැත.

එහෙත් කළමණාකාරීත්ව කමිටුව විසින් වරාය තුළ අබලි යකඩ ශ්‍රී ලංකා වරාය කළමණාකරන හා උපදේශක සේවා සමාගම මගින් අනුමත මිළ ගණන් යටතේ විකිණිය යුතු බවට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. ඒ අනුව මෙම යාත්‍රාව නැවත එම සමාගම හරහා අබලි යකඩ ලෙස විකිණීමට කටයුතු කර ඇත.

T/T Asoka යාත්‍රාවද විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් මගින් 2005.11.10 දින රුපියල් 2,000,000/= ට තක්සේරු කර ඇත. පසුව එම යාත්‍රාව 2007.03.24 දින ටෙන්ඩර් මගින් විකිණීමට කටයුතු යොදා ඇතත් පසුව එය ටෙන්ඩරයෙන් ඉවත්කර අබලි කර විකිණීම සඳහා ශ්‍රී ලංකා වරායේ කළමණාකරන හා උපදේශක සමාගමට භාරදී ඇත.

**විකිණීමට නිර්දේශ කල පාවෙන යාත්‍රා 03**

Jemes Donan යාත්‍රාව 2005 වර්ෂය වන විට මෙම යාත්‍රාව අවුරුදු 68 ක් පමණ පැරණි වන අතර, ඒ සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය වූයේ එන්ජිම රහිත මෙම යාත්‍රාව තව දුරටත් ප්‍රයෝජනයට ගත නොහැකි බැවින් වඩු කර්මාන්තය සඳහා සුදුසු ලී ඉවත් කර ඉතිරිය විනාශ කිරීමටය. ඒ අනුව කටයුතු කිරීමෙන් අනතුරුව මෙම යාත්‍රාව වට්ටෝරු භාණ්ඩ ලේඛණයෙන් ලියා ඉවත් කිරීමට කටයුතු කර ඇත.

Dhaliya marrin – 2005 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශය මත විකිණීමට තීරණය කරන ලද මෙම යාත්‍රාව මිළදී ගැනීම සඳහා 2010 ඔක්තෝබර් මස වන තෙක් කිසිදු ගැණුම්කරුවෙකු ඉදිරිපත් වී නොතිබුබ බැවින් මුහුදුබත් වී අස්ථානගත වීමට පෙර එන්ජිම රහිත මෙම යාත්‍රාව වට්ටෝරු භාණ්ඩ ලේඛණයෙන් ඉවත් කිරීම සඳහා නැවත සමීක්ෂණ මණ්ඩලයක උපදෙස් ලබාගත් අතර එම සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය වූයේ මිළදී ගැනීමට ඉදිරිපත් නොවන ඉවත් කිරීමට කටයුතු කරන ලෙසය. ඒ අනුව ඉදිරියේදී අදාළ යාත්‍රාව වට්ටෝරු භාණ්ඩ ලේඛණයෙන් ඉවත් කරනු ඇත.

M/L Manel - මෙම යාත්‍රාවද 2005 වර්ෂයේ පත් කරන ලද විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් විසින් ගර්භිත කර විකිණීම සඳහා නිර්දේශ කරන ලදුව ඒ අනුව කටයුතු කිරීමෙන් අනතුරුව යාත්‍රාව වට්ටෝරු භාණ්ඩ ලේඛණයෙන් ලියා ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

(උ) දියකාවා යාත්‍රාව ශ්‍රී ලංකා වරාය කළමණාකරන හා උපදේශක සේවා සමාගම හරහා කැබලි කර විකිණීමට දුන් අනුමැතියට එරෙහිව සී/ස ආශා ලංකා එන්ටර්ප්‍රයිසස් (පෞද්ගලික) සමාගම මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට එරෙහිව නඩු පවරමින් අතුරු තහනම් නියෝගයක් ලබාගෙන තිබුණි. මෙම නඩුව සමතයකට පත්වීමෙන් අනතුරුව නැවත මෙම යාත්‍රාව කැබලි කර විකිණීමට

ශ්‍රී ලංකා කළමණාකරන හා උපදේශක සේවා සමාගම වෙත යොමු කර ඇත. මෙම යාත්‍රාව අබලන්ව පැවැති වකවානුවේ නාවික හමුදාව පවරාගෙන තිබුණත් අලුත්වැඩියා කටයුතු සිදු නොවූ නිසාද ආශා ලංකා සමාගම සමග නඩු කටයුතු කළ කාලය තුලද තව දුරටත් අබලන් වීම හේතු කොට ගෙන මෙය මුහුදු මගින් එහා මෙහා කිරීමට නොහැකි තත්ත්වයට පත්ව තිබුණි.

ඊට අමතරව වෙනත් ප්‍රදේශයක යකඩ වලට කැපීම පරිසරයට හානිකර බැවින් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා පරිසර අධිකාරියේ අවසර ලබා ගැනීම දුෂ්කර කටයුත්තකි. එම නිසා මෙම යාත්‍රාව මුහුදුබත් වීමට ඉහත කරුණු ද බලපා ඇති බව පෙන්වා දිය හැක.

## 4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා

(අ) ප්‍රාදේශීය වානිජමය වරායක් ලෙස වැඩි දියුණු කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද මෙම ගාලු සංවර්ධන ව්‍යාපෘතිය නැව්බඩු මෙහෙයවීම හා ඒ සඳහා බහු අරමුණු ඇති පර්යන්ත හා දියකඩනය ඉදිකිරීම, වරාය පිවිසුම් මඟ හා වරාය පතුල හෑරීම, වෙනත් පහසුකම් ස්ථාපිත කිරීම සඳහා පරිපූර්ණ සැලැස්මක් 2007 වර්ෂය තුල Pacific Consultant International සමාගම නිමකල අතර ඒ සඳහා ටෙන්ඩර් කැඳවීමද සිදු කරන ලදි. කෙසේ වෙතත් ටෙන්ඩර් කැඳවීමේදී ඉංජිනේරුමය තක්සේරුවට වඩා ඉහල අගයක් එනම් එමෙන් තුන් ගුණයක පමණ ඉහල අගයක් ඒ සඳහා ලැබී තිබුණ බැවින් මෙය මූල්‍යමය වශයෙන් ජීව්‍යමය නොවන ( Not Viable ) බවටද කොළඹ වරාය පුලුල් කිරීම හා හම්බන්තොට නව වරායක් ඉදිකිරීම ආදී හේතුන් මත ගාලු වරායෙන් වානිජමය සේවා ලබා ගැනීම සඳහා ලැබෙමින් පවතින අවම ඉල්ලුම මත වානිජමය නැව්බඩු මෙහෙයවන විකල්ප වරායක් ලෙස සංවර්ධනය වීමේ අවශ්‍යතාවය අවම වෙමින් පවතින බැවින්ද එසේම මෙලෙස සකස් කරන ලද සැලැස්ම පාරිසරික උරුමයන්ට හානිවේ යැයි පදනම මත පරිසර හිතකාමීන් හා පාරිසරික රාජ්‍ය ආයතන එකී සංවර්ධන සැලැස්මවල් ක්‍රියාවට නැංවීම පිළිබඳ විරුද්ධත්වයක් ප්‍රකාශ කිරීම්ද ඇතිවිය. මෙම සියළු සාධක සලකා බැලූ ශ්‍රී ලංකා රජය සංචාරක වරායක් ලෙස ගාලු වරාය සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමුකර ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් වර්තමානයේ නව සුදුසු විකල්ප ව්‍යාපෘතීන් හඳුනාගැනීමට කටයුතු කරන අතර ඒ සඳහා කලින් ලද උපදේශණ සේවාද සුළු වෙනස්කම් වලට ලක් කරමින් උපයෝගී කර ගැනීමට කටයුතු කර ඇති බැවින් උපදේශණ සේවා වෙනුවෙන් කරන ලද වියදම සම්පූර්ණයෙන්ම අපතේ යාමක් ලෙස සැලකිය නොහැක.

(ආ) ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර යටතේ ලැබුණු මෙම මුදලින් රු. මිලියන 391 ක වියදම දරන ලද්දේ M/s Scot Wilson Kirkpatrick සමාගම විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජයබහලු පර්යන්තය හා සමඟි බහලු පර්යන්තය වෙනුවෙන් පිළියෙල කළ ව්‍යාපාර සැලසුම වෙනුවෙනි.

ඉහත සමාගමේ ව්‍යාපාර සැලසුම වූයේ ජයබහලු පර්යන්තය හා සමඟි බහලු පර්යන්තය ශ්‍රී ලංකා වරාවය අධිකාරියෙන් බැහැර වූ ස්වාධීන සංස්ථාවක් බවට පරිවර්ථනය කල යුතු බවයි. එය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ආධාර ලැබුණු නමුත් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම මගින් එම සංස්ථා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විෂය පථයෙන් හා පාලනයෙන් බැහැරවීම හා වර්තමාන රජයේ රාජ්‍ය ප්‍රතිපත්ති වලට ඍජුවම දැඩි බලපෑමක් ඇති වීමේ අහිතකර තත්ත්වයක් පැන නැගීමට ඉඩ තිබුණි. එබැවින්

එම යෝජනාව ක්‍රියාත්මක නොකර පහත අරමුණු වෙනුවෙන් එම ඉතිරි ආධාර මුදල යොදා ගැනීමට කටයුතු කර ඇත.

i. කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් හා

ii. දැනට පවතින පර්යන්තවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ඒ සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීම්, පරිගණකගත කිරීම්, මෙහෙයුම් කටයුතු ක්‍රමානුකූල කිරීම් හා මූල්‍ය කළමණාකරන කටයුතු වෙනුවෙන්

එබැවින් ඉහත කාරණා දෙස බැලීමේදී මෙම වියදම් කරන ලද මුදල අපතේ යාමක් ලෙස සැලකිය නොහැක.

## 4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

මේ වන විට අමාත්‍යාංශය වෙනුවෙන් දරණ වියදම් සීමා කර ඇති අතර, එසේ වියදමත් දැරුවේ නම් අමාත්‍යාංශය මගින් එම අවස්ථාවේදීම වියදම ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරයි.

විගණන වාර්ථාවේ සඳහන් අමාත්‍යාංශ වෙනුවෙන් දරන ලද වියදම් වන රු. 1,615,658/= න් රු. 1,477,418/= ක් 1997 වර්ෂයේ සිට පැවතෙන ශේෂයක් වේ. මෙය අමාත්‍යාංශය වෙනුවෙන් මිළදී ගන්නා ලද කාර්යාල උපකරණ හා කාර්යාල පාරිභෝජන ද්‍රව්‍ය වලට අදාලව භෞතික සමීක්ෂණයකින් මෙම වත්කම් භෞතික නොමැති බව හඳුනාගෙන ඇති අතර, මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් ලියවිලි එනම් භාණ්ඩ ලැබීමේ පත්‍රිකා (GRN) , මිළදී ගැනීමේ ඇණවුම් (PO) , ඉන්වොයිස් ආදිය සොයාගත නොහැකිවීම හේතුවෙන් මෙය ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් උදාවී ඇත. එබැවින් මෙය පොත් වලින් ලියා ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී.

ඉතිරි මුදල වන රු. 138,240 වරාය හා ගුවන්සේවා අමාත්‍යාංශය වෙනුවෙන් පුවත්පත් දැන්වීමක් ප්‍රචාරය කිරීමකට අදාල වන අතර එය පියවන ලෙස දිගින් දිගටම වරාය හා ගුවන්සේවා අමාත්‍යාංශයට දැන්වුවද එවකට එම අමාත්‍යාංශය කිසිදු ප්‍රතිචාරයක් දැක්වූයේ නැත. මේ වනවිට වරාය හා ගුවන්සේවා අමාත්‍යාංශයක් නොමැති අතර ඒ වෙනුවට ඇත්තේ වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයයි. එබැවින් මේ සම්බන්ධයෙන් වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත එම මුදල පියවන ලෙස ඉල්ලීමක් කල අතර වරාය හා ගුවන්සේවා අමාත්‍යාංශය වෙනුවෙන් අයවැය සම්පාදනය කර ගැනීමේ හැකියාවක් නොමැති බවත් වරාය අධිකාරියේ ගිණුම් කටයුතු පිළිබඳ වගකියන නිලධාරියා වශයෙන් එය පොත් වලින් ලියා ඉවත් කිරීමට විරුද්ධත්වයක් නොමැත් බවත් ලේකම් විසින් ලිඛිතව දන්වා ඇති බැවින් මෙම මුදල අධිකාරියේ පොත් වලින් ලියා ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා මේ වන විට ඉදිරිපත් කර ඇත.

## 5 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

## 5.1 අයවැය ලේඛණමය පාලනය

වාර්ෂික අපේක්ෂිත අදායම සලකා බැලීමේදී පෙර වර්ෂයේ සත්‍ය මෙහෙයුම් ධාරිතාව සලකා මෙම අදායම ඇස්තමේන්තු ගතකර තිබුණි. නමුත් මෙහෙයුම් ධාරිතාවය වැඩි වී ආදායම ඉහළ නැංවී තිබීම යහපත් ප්‍රවණතාවයක් වන අතර, ඇස්තමේන්තුගත වියදම සලකා බැලීමේදී සත්‍ය වියදම අඩුවීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිසි වියදම් කළමණාකරනයේ යහපත් ප්‍රතාඵලයකි.

එබැවින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් යහපාලනයකින් යුතුව අයවැය පාලනය සිදු කරන බව මෙයින් පිළිඹිඹු වේ.

## 6 පද්ධති පාලන

දැනටමත් විගණන වාර්තාවේ සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව මනා අභ්‍යන්තර පාලන ක්‍රම අනුගමනය කරමින් පවතී. ඒ යටතේ ටෙන්ඩර් පටිපාටිවලට අනුකූලව කටයුතු කරන අතර, ණයගැතියන් සඳහා oracle පරිගණක පද්ධතිය හඳුන්වා දී ඇත. ශේෂ සනාථකර ගැනීම සඳහා ලිපි යැවීම් නියමිත පරිදි සිදුවන අතර ශේෂ සනාථ කර ආපස් එවීම අපගේ පරිපාලනයෙන් බැහැරව සිදුවන නිසා අපහසුතාවයක්ද ඇති වේ. ආයෝජන කටයුතු වලදී ඉහළ ප්‍රතිලාභ ලැබෙන ක්ෂේත්‍රවල ආයෝජන සිදුකර ඇත. මූග්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමද පරිගණක ගතකිරීම හා 2012 වර්ෂයේ සිට නව ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව (SLFRSs) සිදුකරන නිසා ඉහත ක්ෂේත්‍ර කෙරෙහි මනා අවධානයක් යොමුකර ඇතැයි පැවසිය හැක. තවද ඉදිරියේදී පරිගණක ගත කිරීමට අදහස් කරන තොග පාලනය මිළදී ගැනීම, නැව්බඩු මෙහෙයවීම වැනි පරිගණක පද්ධති ස්ථාපනය කල පසු වඩාත් ක්‍රමවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් සිදුවනු ඇත.



**ආචාර්ය ප්‍රියත් බී. වික්‍රම**
**සභාපති**

**නම**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**ව්‍යවස්ථාපිත තත්ත්වය**

1979 අංක 51 දරණ පාර්ලිමේන්තු පනතේ විධි විධාන ප්‍රකාරව කොළඹ වරායේ කොමිෂන් සභාව, වරාය නැව්බඩු සංයුක්ත මණ්ඩලය හා වරාය සැසැඳුම් හා ආක්ෂක සේවා සංස්ථාව ඒකාබද්ධ කර 1979 අගෝස්තු 01 දින ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවනු ලැබීය.

**සංස්ථාපිත වටිනාකම**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය දේශීය ආර්ථිකයට පුළුල් දායකත්වයක් දක්වන ආයතනයකි. ආදයම් උපයන හා සේවා සපයන ප්‍රධාන පෙළේ ආයතනයක් වශයෙන් අධිකාරිය ඉටු කරනු ලබන කාර්යභාරය තුළින් එය විශිෂ්ඨ සේවාවක සෘජුවම නිරත වී ඇත. වරාය අධිකාරිය සමග විවිධ කාර්යයන්හි නිරත ආයතන හා සේවා දායකයන් සමග පවත්නා ක්‍රියාකාරි සම්බන්ධතාවය එහි දියුණුවට පදනම් වී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ගුණාංග පහත සඳහන් අයුරින් වර්ග කළ හැක.

- රඳා පැවැත්මේ හැකියාව
- කාලීනත්වය හා නිරවද්‍යතාවය
- කාර්ය සාර්ථකත්වය සඳහා වගකීම
- කණ්ඩායම් හැඟීම
- කැපවීම
- ඵලදායිතාවය හා ප්‍රත්‍යාභිඥාණය
- අවංක කාර්ය සාධනය

ඉහත සඳහන් සාර ධර්ම වරාය අධිකාරියේ සියළුම සේවක කොටස් කෙරෙහි පවත්වාගෙන යාම සභාපතිතුමාගේ, ප්‍රධාන විධියක නිලධාරි, කළමණාකාර අධ්‍යක්ෂතුමාගේ සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ කළමණාකාර කාර්ය මණ්ඩලයේ වගකීම වේ.

**ප්‍රධාන කාර්යාලය**

**කොළඹ වරාය**

අංක. 19 චෛත්‍ය පාර
කොළඹ 01

**දුරකථන:** (+94 11) 2421201, 2421231

**ෆැක්ස්:** (94 11) 2440651

**ගාල්ල වරාය**

ක්ලොසන්බර්ග් ජැටිය
මාගාල්ල
ගාල්ල

**දුරකථන**: (+94 91) 2232213, 2234936

**ත්‍රිකුණාමලය වරාය**

ඇතුල් වරාය පාර
නව පරිපාලන ගොඩනැගිල්ල
චීන වරාය
ත්‍රිකුණාමලය

**දුරකථන:** (+94 26) 2222460

**බැංකුකරුවෝ**

ලංකා බැංකු (ප්‍රධාන බැංකුකරු)
මහජන බැංකුව
හැටන් නැෂනල් බැංකුව

**විගණකයින්**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
නො.306/72,පොල්දුව පාර
බත්තරමුල්ල

**වෙබ් අඩවිය: www.slpa.lk**